
# අ.පො.ස (උසස් පෙළ)

# දේශපාලන විද්‍යාව

## 12 වන ශ්‍රේණිය

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය




සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# අ.පො.ස (උසස් පෙළ)

# දේශපාලන විද්‍යාව

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**


සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
හාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

**දේශපාලන විiාව**

**12 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය**

**2017**

© ජාතික අධ්‍යාපන ආයතනය

**සමාජයීය විiා දෙපාර්තමේන්තුව,**

**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විiා පීඨය,**

**ජාතික ආධ්‍යාපන ආයතනය**

**මහරගම - ශ්‍රී ලංකා**

**වෙබ් අඩවිය** : www.nie.lk

**විiුත් තැපෑල** : info@nie.lk

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේතයට හඳුන්වා දෙන ලදී

පර්යේෂණ වලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථකව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## සම්පත් දායකත්වය

**උපදේශකත්වය හා අනුමැතිය**

ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය :**

ඩබ්ලිව්. ඒ. කුමුදේන්දි සුදර්ශනී මිය - ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය උපදේශනය සහ අධීක්ෂණය :**

මහාචාර්ය ජයදේව උයන්ගොඩ මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය

**ලේඛක මණ්ඩලය -**

**බාහිර :**

| | |
|---|---|
| මහාචාර්ය ජයදේව උයන්ගොඩ මයා | - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය උපුල් අබේරත්න මයා | - මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| ආචාර්ය අතුල විතානවසම් මයා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| එස්. භාෂ්කරන් මයා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| ටෙරන්ස් පුරසිංහ මයා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| එම්. රංජිත් මයා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සබරගමුව විශ්ව විද්‍යාලය |
| සුමුදු වළාකුළුගේ මයා | - කථිකාචාර්ය, රුහුණු විශ්ව විද්‍යාලය |
| ඩබ්ලිව්. කේ. සී. ප්‍රියන්ති මිය | - ගුරු සේවය, විහාරමහාදේවී බාලිකා විද්‍යාලය, කිරිබත්ගොඩ |
| කල්‍යාණි චිත්‍රා ද සිල්වා මිය | - ගුරු සේවය, සුජාතා විද්‍යාලය, නුගේගොඩ (විශ්‍රාමික, වේල්ස් කුමරි විදුහල, මොරටුව) |
| එස්. සෞන්දරාජන් මයා | - ගුරු සේවය, අල්අදාන් මුස්ලිම් විද්‍යාලය, බදුල්ල |

**අභ්‍යන්තරඃ**

| | |
|---|---|
| ඩබ්ලිව්. ඒ. කුමුදේන්දි සුදර්ශනී මිය | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |

**භාෂා සංස්කරණය :**

ශ්‍රීනාත් ගණේවත්ත මයා - භාෂා සංස්කාරක,

සුසිල් සිරිසේන මයා - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, හාපිටිගම

**පරිගණක සහය :**

ඒ. එම්. එස්. නිශාන් බණ්ඩාර මයා - ගුරු සේවය, ආවේ මරියා විද්‍යාලය

ඒ. එල්. එස්. පී. අතපත්තු මෙය - කළමනාකරණ සහකාර, ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහය :**

ජී. එස්. පී. ප්‍රනාන්දු මයා - ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

## පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | දේශපාලන විද්‍යාවේ ස්වභාවය, දේශපාලන අධ්‍යයනය සහ ප්‍රවේශ | 01 |
| 2. | දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍ර | 22 |
| 3. | රාජ්‍යය | 40 |
| 4. | ආණ්ඩුක්‍රම ආකෘති | 65 |
| 5. | දේශපාලන මතවාද | 76 |
| 6. | ගැටුම් හා ගැටුම් සමථනය | 97 |
| 7. | ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනය | 116 |
| 8. | වෙස්ට්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය සහ එහි වෙනස්කම් | 125 |

# දේශපාලන විද්‍යාවේ ස්වභාවය, දේශපාලන අධ්‍යයනය සහ ප්‍රවේශ

**නිපුණතාව 01 :-** මෙම පාඩම හදාරන ශිෂ්‍යයා/ශිෂ්‍යාව දේශපාලනයේ සහ දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනාගත් පුරවැසියකු ලෙස ක්‍රියා කරයි.

(කාලච්ඡේද 25 යි)

**නිපුණතා මට්ටම :-**

I.I දේශපාලනය සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙස අර්ථකථනය කරයි.

I.II දේශපාලන විද්‍යාව දේශපාලනයේ විවිධ පැතිකඩ ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කරන ශික්ෂණ මාධ්‍යයක් ලෙස විග්‍රහ කරයි.

I.III විෂයයට අනන්‍ය වූ විවිධ ප්‍රවේශ භාවිත කරමින් දේශපාලනය හදාරයි.

**ඉගෙනුම් ඵල :-**

- දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අර්ථකථනය කරයි.
- දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර සම්බන්ධතා හා වෙනස්කම් හඳුනාගෙන පැහැදිලි කරයි.
- දේශපාලනය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීමේ ප්‍රවේශ නම් කර ඒවා එකිනෙක විස්තර කරයි.
- එකී ප්‍රවේශ විචාරාත්මක ව විමසයි.
- සමාජ ජීවිතයේ සාරධර්ම ප්‍රගුණ කිරීමට දේශපාලනය පිළිබඳ ව ඇති විචාරාත්මක අවබෝධය අදාළ වන අයුරු පැහැදිලි කරයි.

**හැඳින්වීම :-**

දේශපාලනය සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයකි. රාජ්‍යයක් තුළ උපත ලබන සෑම මනුෂ්‍යයෙක් ම දේශපාලන ජීවියෙකු වන නිසා ම, දේශපාලනය සහ මිනිස් ජීවිත අතර පවතින්නේ ඍජු, අන්‍යෝන්‍ය සහ අත්හළ නොහැකි බැඳීමකි. මෙම සම්බන්ධතාවයේ ස්වරූපය සෑම සක්‍රීය පුරවැසියෙකු ම දැනගත යුතු වන අතර ම අභිනවයෙන් දේශපාලන විද්‍යාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඒ පිළිබඳ දැනුවත් වී සිටීම අත්‍යවශ්‍ය කාරණයකි. දේශපාලන විද්‍යාව, දේශපාලනයේ විවිධ පැතිකඩ ශාස්ත්‍රීය ලෙස හදාරන විෂය බව ශිෂ්‍ය ශිෂ්‍යාවන් අවබෝධ කරගත යුතු ය.

දේශපාලන විද්‍යාව හඳුනාගෙන, ඒ හා දේශපාලනය අතර ඇති සම්බන්ධය අර්ථකථනය කිරීමට ද ඔවුන්ට හැකි විය යුතු ය. එසේ ම විෂයයට අනන්‍ය වූ විවිධ ප්‍රවේශ භාවිතා කරමින් දේශපාලන විද්‍යාව හැදෑරීමට ද හැකිවිය යුතු ය. මෙම කාරණා පිළිබඳ මූලික දැනුමකින් විෂය ය අධ්‍යයනයට යොමු වන්නන්ට දේශපාලන සහ දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනාගත් පුරවැසියෙකු ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතාව ලබා දීම මෙම පළමුවැනි ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අත්වැලක්**

**1.1. දේශපාලන විද්‍යාව හඳුනා ගැනීම.**

දේශපාලන විද්‍යාව යනු අප හැමගේ සමාජ ජීවිතයේ ප්‍රධාන පැතිකඩක් වන දේශපාලනය යන්න ශාස්ත්‍රීය ලෙස හැදෑරීමේ විෂය ක්ෂේත්‍රය ලෙස අපට කෙටියෙන් හා සරල ව තේරුම් කළ හැකි ය. දේශපාලනය යනු පුළුල් අර්ථ දක්වන සංකල්පයක් බව ද දේශපාලනය පිළිබඳ ව ශාස්ත්‍රීය ලෙස හදාරන විට අපට පෙනෙනු ඇත.

දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම පිළිබඳ ව දීර්ඝ ඉතිහාසයක් තිබේ. ක්‍රි.පූ. සිවු වන සියවස තරම් ඈත කාලයේ ග්‍රීසියේ ඇතැන්ස් නුවර දේශපාලනය හැදෑරීම, ප්‍රගුණ කිරීම, සහ පුහුණු කිරීම විශේෂ ශාස්ත්‍රාලයයක සිදු විය. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් යන සුප්‍රසිද්ධ

දාර්ශනිකයෝ දේශපාලනය පිළිබඳ මෙම ග්‍රීක සම්ප්‍රදායේ ආරම්භකයෝ ය. වර්තමානයේ පාසල්වල සහ විශ්ව විද්‍යාලවල "දේශපාලන විද්‍යාව" යන විෂයය ඉගැන්වීම මෙම සම්භාව්‍ය සම්ප්‍රදායයි තව දුරටත් ඉදිරියට ගෙන යාමකි.

''දේශපාලන විද්‍යාව හැදෑරීම'' යන අදහසෙහි ද අර්ථ කිහිපයක් තිබේ. දේශපාලනය සහ ඊට සම්බන්ධ පැතිකඩ ගැන ඉගෙන ගැනීම, පර්යේෂණ කිරීම, විග්‍රහ කිරීම, පවතින න්‍යාය සහ සංකල්ප විචාරයට ලක් කිරීම, අලුත් න්‍යාය සහ සංකල්ප ගොඩනැඟීම, පවත්නා දේශපාලන ප්‍රතිපත්ති හා ක්‍රම විචාරයට ලක් කරමින් නව විකල්ප යෝජනා කිරීම, දේශපාලනයේ යෙදෙන්නන්ට මෙන් ම පුරවැසියන්ට ද දේශපාලන අවබෝධය ලබාදීම යන මේවා එයට ඇතුළත් වේ. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ද තම ශාස්ත්‍රාලයයේ දේශපාලන විද්‍යාව ඉගැන්වීමෙන් සහ පුහුණු කිරීමෙන් ඉටු කළේ මෙම කාර්ය ය. පුරාතන ඉන්දියාවේ සහ චීනයේ ද රාජ්‍ය පාලනය පිළිබඳ විශේෂඥයෝ මෙවැනි ම කාර්යයක් ඉටු කළහ. වර්තමානයේත් පාසල්වල ද විශ්ව විද්‍යාලවල ද දේශපාලන විද්‍යාව හැදෑරීමේ න්‍යාය පත්‍රයේ මෙම අරමුණු තිබේ.

දේශපාලන විද්‍යාව යනු කුමක්දැයි හඳුනා ගැනීමේ දී මූලික කාරණ කිහිපයක් වැදගත් ය.

I දේශපාලන විද්‍යාව යනු පැරණිතම ශාස්ත්‍රීය ශික්ෂණයකි. දර්ශනවාදය, ගණිතය, තර්ක ශාස්ත්‍රය, ආචාර විද්‍යාව, සෞන්දර්ය විද්‍යාව යන ශික්ෂණයන්ට සමගාමී ව දේශපාලන විද්‍යාව ද විකාශනය වීම ආරම්භ වූයේ ක්‍රිස්තු පූර්ව හතර වැනි සියවසේ තරම් අතීතයේ සම්භාව්‍ය ග්‍රීසියේ ය.

II ශාස්ත්‍රීය ශික්ෂණයක් වශයෙන් දේශපාලන විද්‍යාවේ ස්වභාවය, විෂය පථය හා අන්තර්ගතය, විධික්‍රම, න්‍යාය සහ සංකල්ප යන මේවා විවිධ ප්‍රභවයන් වෙතින් සියවස් විසිපහකට ආසන්න දීර්ඝ කාලයක් තුළ ගොඩ නැඟුණු, වෙනස් වූ සහ වර්ධනය වූ ඒවා ය.

III දේශපාලන විද්‍යාවේ ප්‍රවේශ, න්‍යාය සහ විධික්‍රම බහුවිධ වේ. ඒවා විවිධ ගුරුකලවලට හා සම්ප්‍රදායවලට අයත් ව ඇත. දේශපාලන විද්‍යාව හැදෑරීමේ එක් ආකර්ෂණයක් වන්නේ මෙම විවිධත්වය යි.

දේශපාලන විද්‍යාව යනු දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හදාරණ ශික්ෂණය බව අපි ඉහත සඳහන් කළෙමු. මේ ප්‍රකාශනයේ වැදගත් තේමා දෙකක් ඇතුළත් ය.

I දේශපාලනය,
II දේශපාලන විද්‍යාව

☞ **දේශපාලනය යනු කුමක් දැයි හඳුනා ගැනීම**.

- දේශපාලනය යනු කුමක් ද යන්නට පොදුවේ ලැබෙන සරල පිළිතුර නම් ''දේශය පාලනය කිරීම'' යන්න යි. මෙය දේශපාලනය යන සංකල්පය පිළිබඳ ව ඇති ජනප්‍රිය, නැතහොත් එදිනෙදා ව්‍යවහාරයේ ඇති, වටහා ගැනීම යි. ඒ සමග ම එය දේශපාලනය ගැන ඇති සම්පූර්ණ අර්ථකථනයක් ද නොවේ. එය වනාහි දේශපාලනය යන සංකල්පයේ වාච්‍යාර්ථය පමණක් සලකා ගොඩ නඟා ගත්තකි.

- ශාස්ත්‍රීය වශයෙන් මෙම පදයේ ගැඹුරු අර්ථය ද හඳුනාගත යුතු ය.

- දේශපාලන විද්‍යාව මෙන් ම දේශපාලනය ද ප්‍රධාන අර්ථ දෙකකින් යුක්ත ය.

★ රාජ්‍යය, රාජ්‍ය පරිපාලනය සහ ආණ්ඩුකරණය පිළිබඳ ඇඟවෙන සංකල්පයක් ලෙස, සහ

★ රාජ්‍යයට පමණක් සීමා නොවී රාජ්‍යයෙන් බාහිර ව ද පුරවැසියන් සහභාගි වන සමාජ භාවිතයක් ලෙස,

- **දේශපාලනය යන්න රාජ්‍යය, රාජ්‍ය පරිපාලනය හා ආණ්ඩුකරණය සම්බන්ධ කොට තේරුම් ගැනීම.**

මෙය වනා හි දේශපාලනය පිළිබඳ ව තිබෙන සම්භාව්‍ය අර්ථකථනය යි.

★ පුරාතන ග්‍රීසියේ මෙන් ම ඉන්දියාවේ සහ චීනයේ දාර්ශනිකයන් ද දේශපාලනය යන්න තේරුම් කෙළේ රාජ්‍යය හා රාජ්‍ය බලය පාවිච්චි කිරීම සමඟ සම්බන්ධ කොට ගෙන ය.

ඉංග්‍රීසි භාෂාවේ පොලිටික්ස් (politics) යන්න ග්‍රීක භාෂාවේ පෝලිටිකෝස් (*politikos*) යන වචනයෙන් බිඳී ආවෙකි. ''පොලිස්'' (Polis) යනු පෞර රාජ්‍යය යි. එනම් කුඩා නගර කේන්ද්‍ර කොටගත් රාජ්‍යය යි. ''පෞර රාජ්‍යයට අයත්'' යන්න *Politikos* යන ග්‍රීක වචනයේ අර්ථය යි. ඒ මඟින් දේශපාලන විද්‍යාව යන්නෙන් අදහස් වූයේ පෞර රාජ්‍යයට සම්බන්ධ විෂය කාරණ අධ්‍යයනය කරන විද්‍යාව/ශාස්ත්‍රය යන්න යි. පෞර රාජ්‍යයට සම්බන්ධ විෂය කාරණවලට පුළුල් පරාසයක පැතිර ගිය තේමා ගණනාවක් අයත් විය.

- රාජ්‍යයේ ස්වභාවය
- රාජ්‍යයේ අරමුණු.
- රාජ්‍ය පාලන ක්‍රම
- රාජ්‍ය හා පුරවැසියා අතර සම්බන්ධය
- පාලකයන්ගේ ගතිගුණ හා කුසලතා
- ආණ්ඩුකරණ ක්‍රියාවලිය

ඉන් ප්‍රධාන තේමා කිහිපයකි.

II පුරාතන ඉන්දියාවේ මෙන් ම චීනයේ ද "දේශපාලනය"යනුවෙන් මෙම අර්ථය ම අදහස් කළ බව කෞටිල්‍ය සහ කොන්ෆියුසියස් යන චින්තකයන්ගේ කෘතිවලින් පෙනේ.

මෙම චින්තකයන් දෙදෙනා සහ ඇරිස්ටෝටල් ද පැවසුයේ පාලකයන්ට රාජ්‍යය පාලනය පිළිබඳ ව උපදෙස් දීම, දේශපාලන විශේෂඥයන්ගේ කාර්යයක් විය යුතු බව යි.

වර්තමානයේ ද මෙම සම්ප්‍රදාය ය අඩු වැඩි වශයෙන් පවතී.

- **දේශපාලනය සමාජ භාවිතයක් ලෙසඃ-**

දේශපාලනය යනු රාජ්‍යය, ආණ්ඩුව සහ රාජ්‍ය පරිපාලනය යන ක්ෂේත්‍රවලට සීමා නොකොට, ඒවායින් පිටත සමාජයේ පුරවැසියන් අතර පවත්නා භාවිතයකි යන්න මෙයින් අදහස් වේ.

උදාහරණ :-

පුරවැසියෝ පාලකයන් පත් කරති; ඔවුන්ට ආණ්ඩු කිරීම සඳහා බලය පවරා දෙති; දේශපාලන පක්ෂවල සාමාජිකයෝ වෙති. මීට අමතරව රැස්වීම්-පෙළපාළි, විරෝධතා, වැඩවර්ජන, කැරලි ගැසීම්, ස්වේච්ඡා සමිති මඟින්

පොදු වුවමනා ඉටු කිරීම යනාදි මාධ්‍යයන්ගෙන් දේශපාලන ක්‍රියාකාරිත්වයේ යෙදෙති.

මේ අනුව පාලකයන් සහ වෘත්තීය දේශපාලනඥයන් පමණක් නොව පුරවැසියෝ ද දේශපාලනය කරති. මෙය ග්‍රීක යුගය තෙක් ද දිවෙයි. "දේශපාලනය" යනු පෞර රාජ්‍යයට සම්බන්ධ කාරණයක් ය යන ග්‍රීක අදහසේ අර්ථ දෙකක් තිබිණ. ඒවා නම්;

I රාජ්‍යය හා රාජ්‍ය පාලනයට සම්බන්ධ කාරණා
II රාජ්‍ය කටයුතු සම්බන්ධ ව පුරවැසියන්ගේ කාර්යභාරය හා ක්‍රියාකාරිත්වය.

උදාහරණ :-

ග්‍රීසියේ එකල පැවති සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයේ සෘජු පුරවැසි සහභාගිත්වයක් තිබිණි. නීති සම්පාදනයට, නගර පරිපාලනයට සහ අධිකරණය සම්බන්ධ කටයුතුවලට පුරවැසියෝ ස්වේච්ඡාවෙන් සහභාගි වූහ. "සක්‍රිය පුරවැසියා" යන සංකල්පය ඇරිස්ටෝටල්ගේ *Politics* නම් කෘතියේ භාවිත වී ඇත්තේ මේ අර්ථයෙනි.

මේ අනුව පුරවැසි දේශපාලන සහභාගිත්වය යන්නට "දේශපාලනය" යන සංකල්පයෙහි විශේෂ තැනක් හිමි වී තිබේ. පුරවැසි ක්‍රියාකාරිත්වයක් සහ සහභාගිත්වයක් නැති දේශපාලනය ගැන සිතීමට පවා නොහැකි තරම් දැඩි ලෙස මෙම අර්ථය මුල් බැසගෙන ඇත.

### 1.2. දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය :-

මෙය පැති කීපයකින් දැකිය හැකි ය.
I දේශපාලනය කිරීම. (doing politics)
II දේශපාලනය හැදෑරීම. (studying politics)

I දේශපාලනය කිරීම.

මින් අදහස් වන්නේ
- ආණ්ඩු බලය ලබා ගැනීමට ක්‍රියාකාරී වීම.
- ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීම.
- මැතිවරණවලට සහභාගි වීම.
- දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වීම.
- සටන් හා විරෝධතා ව්‍යාපාර ආදියට සහභාගි වීම.

වශයෙන් පුද්ගලයන් යෙදෙන ක්‍රියාකාරකම් ය.

දේශපාලනය කරන පුරවැසියන්ට ද වෘත්තීය දේශපාලනඥයන්ට ද දේශපාලනය පිළිබඳ ශාස්ත්‍රීය දැනුමක් හෝ විශේෂඥතාවක් හෝ අවශ්‍ය වන්නේ නැත. අවශ්‍ය වන්නේ "දේශපාලනය" යන සමාජ ක්‍රියාකාරකමෙහි යෙදීමට ඇති කැමැත්ත, කැප වීම සහ අධිෂ්ඨානය යි.

II දේශපාලනය හැදෑරීම

මෙය දේශපාලනය කිරීමට වඩා වෙනස් කාර්යයකි. "දේශපාලනය හදාරන්නා" (student of politics) දේශපාලනය ප්‍රායෝගික ව කරන්නකු ලෙස හඳුන්වන්නේ නැත. එදිනෙදා ව්‍යවහාරයේ දී සිදු කරන මෙම වෙනස දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර ඇති සම්බන්ධය තේරුම් ගැනීමට ඉවහල් වෙයි.

- ශාස්ත්‍රීය ලෙස දේශපාලනය අධ්‍යයනය කිරීම සහ ප්‍රායෝගික ව දේශපාලනයෙහි යෙදීම එකිනෙකට වෙනස් භාවිත දෙකකි.
- දේශපාලන විද්‍යාවේ කාර්යය දේශපාලනය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීම ය.
- කෙනෙකු දේශපාලනය ප්‍රායෝගික වශයෙන් නොකළත් දේශපාලනය හැදෑරිය හැකි ය.
- ඒ අනුව
  - දේශපාලන පක්ෂවල හා සංවිධානවල ක්‍රියාකාරීත්වය
  - ආණ්ඩු බලය ලබාගැනීමට දේශපාලන පක්ෂ සහ බලවේග අතර ඇති වන තරගය
  - මැතිවරණ ව්‍යාපාර
  - වෘත්තීය දේශපාලනඥයන්ගේ චර්යාව
  - ඡන්ද දායකයන්ගේ චර්යාව
  - දේශපාලන ගැටුම්, විරෝධතා හා කැරලි
  - ආණ්ඩුවේ ප්‍රතිපත්ති
  - ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි
  - අන්තර්ජාතික සම්බන්ධතා සහ ගැටුම්
  - යුද්ධය හා සාමය

  ආදී පුළුල් පරාසයක විහිදී ඇති දේශපාලනික තේමා රාශියක් ම දේශපාලන විද්‍යා අධ්‍යයනයේ ප්‍රස්තුත, නැතහොත් විෂය වස්තූන්, වී ඇත.

## 1.3. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම

දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම අවුරුදු දෙදහසකට තරමක වැඩි කාලයක් තුළ වර්ධනය වූවකි. එය ක්‍රි.පූ. හතර වැනි සියවස තෙක් දිවෙයි. මේ විකාශයේ දී දේශපාලන අධ්‍යයනයේ විෂය පථය, විධික්‍රම හා ප්‍රවේශ ද පුළුල් විය. ඒ අනුව වර්තමානයේ දේශපාලන විද්‍යාව අප සලකන්නේ දේශපාලනයේ විවිධ පැතිකඩ අධ්‍යයනය කරන ශික්ෂණ මාධ්‍යයක් ලෙස ය.

දේශපාලනය හැදෑරීම යන අදහසට අර්ථ දෙකක් තිබේ.

I දේශපාලනය ව්‍යාවහාරික ඥානයක් ලෙස ලබන අවබෝධය සහ සවිඥානකත්වයඃ

මෙය අප ක්‍රමානුකූල ව ලබා ගන්නා දැනුමක් නොවේ. මෙය වනා හි එදිනෙදා ජීවිත අත්දැකීම් මත පදනම් වූ අවබෝධයකි. මෙහි අපේ සමාජ, දේශපාලන විශ්වාස සහ විනිශ්චය තිබේ. එහි පදනම වන්නේ සමාජය හා ලෝකය වෙතින්, එනම් පවුලෙන්, අසල්වැසියන්ගෙන්, හිතමිත්‍රාදීන්ගෙන් ජනමාධ්‍යයෙන් ලබා ගන්නා අවබෝධය යි. අපේ පෞද්ගලික රුචි, අරුචිකම් ද හොඳ නරක පිළිබඳ විශ්වාස ද එහි ගැබ් වී තිබේ.

උදාහරණ :- කාන්තාවන්ට පාර්ලිමේන්තුවේ නියෝජනය වැඩි කළ යුතු ද යන ප්‍රශ්නයට අප බොහෝ විට පිළිතුරු දෙන්නේ ව්‍යාවහාරික ඥානයේ

ඇති සීමාවන් ද පදනම් කොට ගෙන ය. ''කාන්තාවන්ට දේශපාලනය කරන්න තරම් ශක්තියක් නැත'' යන පිළිතුර එම ව්‍යාවහාරික ඥානය පිළිබිඹු කරන්නකි.

II දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම:

මෙය දේශපාලන ප්‍රපංචයක් හෝ ගැටලුවක් හෝ 'විද්‍යාත්මක ලෙස' අධ්‍යයනය කිරීමකි. "විද්‍යාත්මක" යන පදයේ විවිධ අර්ථ ඇතත්, එහි මූලික අදහස නම්, යම්කිසි ප්‍රපංචයක් පිළිබඳ ව ''ක්‍රමානුකූල ව, න්‍යායික ප්‍රවේශයකින් ද මඟ පෙන්වනු ලැබ නිසි ක්‍රමවේදයකට අනුව ලබාගන්නා දත්ත, තොරතුරු සහ සාක්ෂ්‍ය පදනම් කොටගෙන අධ්‍යයනය කිරීම'' යන්න යි.

උදාහරණ :- කාන්තාවන්ට පාර්ලිමේන්තු නියෝජනය වැඩි කළ යුතු ද යන ගැටලුව පිළිබඳව න්‍යායික උපන්‍යාස, තුළනාත්මක අන්තර්ජාතික අත්දැකීම්, මහජන මත විමසීම් යනාදි මාධ්‍ය උපයෝගී කරගෙන සිදුකරන අධ්‍යයනයක් වෙතින් ලබා ගන්නා දත්ත සහ සාධක පදනම් කරගෙන ගොඩනගන නිරීක්ෂණ සහ විග්‍රහ අනුව නිගමන ඉදිරිපත් කිරීම.

- **දේශපාලන අධ්‍යයනය සහ දේශපාලන පැතිකඩ :-**

දේශපාලනය ශාස්ත්‍රීය අධ්‍යයනයට ලක් කිරීම යනු දේශපාලනය යන පොදු ප්‍රපංචයේ විවිධ පැතිකඩවලට අනුරූප ව ඒවා ග්‍රහණය කර ගැනීමේ අරමුණින් සිදු කරන ව්‍යායාමයකි. පසුගිය අවුරුදු දෙදහසක විකාශනයේ විවිධ දිසානතීන්ට වර්ධනය වී තිබෙන සහ තවමත් වර්ධනයන්ට ලක්වෙමින් තිබෙන දේශපාලන විද්‍යා ශික්ෂණය විසින් හදාරනු ලබන දේශපාලනය යන්න සමාජයේ පැවතීමේ විවිධ පැතිකඩ කීපයකි. එනම් :-

I. දේශපාලන ආයතන
II. දේශපාලන භාවිතයන්
III. ආණ්ඩුකරණය
IV. දේශපාලන චර්යාව
V. දේශපාලන මතවාද

යන මේවා යි.

I දේශපාලන ආයතන

ඕනෑ ම සමාජයක දේශපාලනය යන්න ආයතනගත වී පවතී. මෙලෙස ආයතනගත වී තිබෙන දේශපාලනයේ ප්‍රකට ප්‍රකාශන වන්නේ රාජ්‍යය, ආණ්ඩුව, නිලබල ක්‍රමය, අධිකරණය, පාර්ලිමේන්තුව, දේශපාලන පක්ෂ, කැබිනට් මණ්ඩලය, පළාත් පාලන සභා යන මේවා ය. ඒවායෙහි ආයතනගත වී තිබෙන්නේ දේශපාලන බලය සහ දේශපාලන ක්‍රියාවලි ය. ඒවා අධ්‍යයනය කිරීමේ දී දේශපාලන විද්‍යාත්මක ගවේෂණයට ලක් කිරීම සිදු වේ. මෙහි ආයතනික තේමා වන්නේ ආයතනවල ආරම්භය, පරිණාමය, සංයුතිය, බලතල, වගකීම්, පරිවර්තන, සහ වෙනස්කම්, එම ආයතන සහ පුරවැසියන් අතර සම්බන්ධතා ආදිය යි.

II දේශපාලන භාවිත (Political Practices)

ආයතනගත වූ දේශපාලනය සමාජයේ පවතින්නේ දේශපාලන භාවිතය මාධ්‍ය කොටගෙන ය.

උදාහරණ :- පාර්ලිමේන්තු ආයතනයක පැවැත්ම සඳහා ඒවාට හැඩ ගැසුණු භාවිත ගණනාවක් ම පවතී. ප්‍රජාතන්ත්‍රවාදය, මැතිවරණ ක්‍රියාවලිය, නිදහස් හා සාධාරණ මැතිවරණ, බහුතරයේ කැමැත්ත සහ මහජන පරමාධිපත්‍යය පිළිගැනීම, නීති සම්පාදන ක්‍රියාවලියේ දී පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරිත්වය තීරණය කරන සම්ප්‍රදාය සහ රෙගුලාසි යනාදිය එවැනි භාවිත ය. අන් සෑම දේශපාලන ආයතනයක් ම එවැනි භාවිත සමඟ ගොඩ නැඟී තිබෙන ඒවා ය.

III ආණ්ඩුකරණය (Governance)

ආණ්ඩුකරණය යනු දේශපාලන විද්‍යා අධ්‍යයනයට භාජනය වන දේශපාලනයේ ඇති ප්‍රධානතම පැතිකඩකි. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල පුරවැසියන් ආණ්ඩු බලයට පත් කරන්නේ, තමන් ද සාමාජිකයන් වන දේශපාලන සමාජය මනා ව මෙහෙයවමින්, එම සමාජයේ පොදු අපේක්ෂාවන් සඳහා සේවය කරමින් දේශපාලනික සහ පරිපාලනික වශයෙන් සමාජය නියාමනය කිරීම සඳහා ය. මෙම ආණ්ඩුකරණ ක්‍රියාවලියට අන්තර්ගත වූ කාර්ය කිහිපයකි.

- ★ සමාජයේ යහපැවැත්මට, ගැටුම් නිරාකරණය කිරීමට, නීතිය හා සාමය පවත්වා ගැනීමට සහ ආර්ථික දේශපාලන ගමන් මග හැඩගැස්වීමට අවශ්‍යවන නීති සම්පාදනය .(law making).
- ★ රටේ ආර්ථික සහ සමාජ සංවර්ධනය මෙන් ම පරිවර්තනය ද යහ පැවැත්ම ද අරමුණු කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සහ (policy making) ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම (policy implementation)
- ★ රාජ්‍යයේ ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය පරිපාලනික කාර්ය (public administration).
- ★ පුරවැසියන්ට රාජ්‍යයේ රැකවරණය හා ආරක්ෂාව ලබා දෙමින් සමාජ ඒකාග්‍රතාව සහතික කරන නීතිය හා සාමය (Law and Order) පවත්වාගෙන යාම.
- ★ සමාජ කණ්ඩායම් අතරත්, සමාජ කණ්ඩායම් හා රාජ්‍යය අතරත් ඇති වන ගැටුම් කළමනාකරණය (conflict management).
- ★ අන්තර්-රාජ්‍ය සම්බන්ධතා (inter-state relations) කළමනාකරණය හා පවත්වා ගැනීම.

මේවා මහජනතාව ද උනන්දු වන තේමා ය. එසේ ම මේවා දේශපාලන විද්‍යා විද්‍යාර්ථීන්ගේ ද විශේෂ අවධානයට ලක්වේ. එයට හේතුව මේ කාර්ය දේශපාලනයේ අතිශයින් ම ප්‍රායෝගික උපාංග වීම යි.

IV දේශපාලන චර්යාව (Political Behaviour)

දේශපාලන සත්ත්වයෙකු වන මිනිසා වර්තමානයේ සැලැකෙනුයේ පුරවැසියකු ලෙස ය. එනම් රාජ්‍යයක සාමාජිකයකු ලෙස ය. පුරවැසියන්ට නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල ඉටු කළ හැකි වැදගත් කාර්ය ගණනාවක් ම තිබේ.

- දේශපාලනයේ යෙදීම.
- මැතිවරණයේ දී ඡන්දය පාවිච්චි කිරීම (හෝ නොකිරීම)
- මැතිවරණ ක්‍රියාවලියට සක්‍රිය ව සහභාගී වීම (හෝ නොවීම).
- දේශපාලන පක්ෂවල සාමාජිකයකු වීම (හෝ නොවීම)
- එදිනෙදා දේශපාලන සිදුවීම් ගැන උනන්දුව දැක්වීම (හෝ නොදැක්වීම)

යනාදි පුරවැසි දේශපාලන රුචි අරුචිකම් සහ ක්‍රියාකාරකම් විස්තර කරන දේශපාලන සංකල්පය නම් දේශපාලන චර්යාව යි.

V දේශපාලන මතවාද (Political Ideologies)

සමාජයක දේශපාලන ආයතන, භාවිත හා පුරවැසි දේශපාලන චර්යාව සහ ආණ්ඩුකරණ ක්‍රියාවලි ද හැඩගස්වන ප්‍රධාන සාධකයක් වන්නේ දේශපාලන මතවාද යි.

වර්තමාන ලෝකයේ දේශපාලනයේ පවත්නා, එමෙන් ම දේශපාලන සංසිද්ධි හා රාජ්‍ය ප්‍රතිපත්ති හැඩගස්වන ප්‍රධාන මතවාද කිහිපයකි. ඒවා නම්:-

- සමාජවාදය
- ලිබරල්වාදය
- ප්‍රජාතන්ත්‍රවාදය
- සමූහාණ්ඩුවාදය
- සුභසාධනවාදය
- ජාතිකවාදය
- ස්ත්‍රීවාදය යන මේවා ය.

දේශපාලන මතවාදයක් යනු සහ දේශපාලනයට බලපෑම් කරන එමෙන් ම සමාජයක දේශපාලන ක්‍රියාවලි සහ වැසියන් විශාල ප්‍රමාණයකගේ දේශපාලන තීරණ, චර්යා හා විඥානය හැඩගස්වන අදහස් සමුච්චයකි. සමාජයේ දේශපාලන මතවාද ගණනාවක් ම තිබේ. බොහෝ විට දේශපාලන පක්ෂ ද මතවාදවලට අනුකූල ව ගොඩනැගී ඇත. ආණ්ඩුවක් ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති ද මතවාදවල ආභාසය නිසා බිහි වන ඒවා විය හැකි ය. එබැවින් දේශපාලන මතවාද යනු දේශපාලනය පිළිබඳ ව ශාස්ත්‍රීය අධ්‍යයනයට භාජනය වන, දේශපාලනයේ ඇති වැදගත් පැතිකඩකි.

**1.4. දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ :-**

දේශපාලන විද්‍යාව පුළුල් විෂය පථයකින් ද ඒ නිසා ම ප්‍රවේශ ගණනාවකින් ද සමන්විත වන ශාස්ත්‍රීය ශික්ෂණයකි. එහි විෂය පථය මෙන් ම ප්‍රවේශය ද දීර්ඝ ඉතිහාසයක් තුළ විකාශනය වූ ඒවා ය. එම විකාශනයේ දී විසි වන සියවසේ දී සිදු වූ වර්ධන වැදගත් ය. දේශපාලන විද්‍යාව ස්වාධීන විද්‍යාත්මක ශික්ෂණයක් ලෙස සිය අනන්‍යතාව තහවුරු කළේ ද විසි වැනි සියවසේ දී ය. එමෙන් ම දේශපාලන විද්‍යාවේ ප්‍රවේශය ලෙස අද අප සලකන බොහෝ කරුණු විසි වන සියවසේ වර්ධනය වු ඒවා ය. ඒවා සිදු වුයේ පුළුල් වශයෙන් සමාජීය හා මානවීය විද්‍යා ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධන සහ පරිවර්තන පිළිබඳ සන්දර්භයෙහි ය.

දේශපාලන විද්‍යාවේ අධ්‍යයන ප්‍රවේශ කිහිපයකි.

- ⋆ දාර්ශනික/ප්‍රතිමානීය ප්‍රවේශය

★ තුළනාත්මක ප්‍රවේශය
★ බහු විෂයක ප්‍රවේශය
★ විද්‍යාත්මක (චර්යාවාදී) ප්‍රවේශය
★ දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය
★ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය
★ ස්ත්‍රීවාදී ප්‍රවේශය.

### 1.4.1. දාර්ශනික-ප්‍රතිමානීය ප්‍රවේශය (Philosophical-Normative Approach)

- දේශපාලන අධ්‍යයනය මුලින් ම යොදාගත් දීර්ඝකාලීන පැවැත්මක් ඇති අධ්‍යයන ප්‍රවේශය මෙය යි.
- මෙහි පුරෝගාමීන් වූයේ ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ය.
- යුරෝපා දේශපාලන චින්තනයේ ප්‍රධාන බලවේග ඉදිරිපත් කළ සිසරෝ, ශාන්ත ඔගස්ටීන්, මැකියාවෙලී, තෝමස් හොබ්ස්, ජෝන් ලොක්, එම්මානුවෙල් කාන්ට්, හේගල්, කාල් මාක්ස් මෙම ප්‍රවේශයේ ප්‍රධාන ප්‍රකාශකයෝ ය.
- විසි වන සියවසේ චින්තකයන් අතර මහත්මා ගාන්ධි, හැනා ඇරෙන්ඩ්ට්, ජෝන් රෝල්ස්, චාල්ස් ටේලර් සහ යර්ගන් හබර්මාස් ප්‍රධාන වෙති.
- මෙම චින්තකයන්ගේ දර්ශනයන්හි විවිධ වෙනස්කම් තිබුණත් ඔවුන්ට පොදු ප්‍රධාන කරුණු දෙකක් හඳුනාගත හැකි ය.

I. ඔවුන් දේශපාලන විද්‍යාඥයන් නො ව දේශපාලන දාර්ශනිකයන් වීම.
II. ඔවුන් හැම දෙනා ම දේශපාලනය යන ප්‍රපංචය දෙස බැලුවේ ප්‍රතිමානීය (Normative) දෘෂ්ටි කෝණයකින් වීම.

දර්ශනවාදී ප්‍රවේශයේ මූලික ලක්ෂණ තුනකි.

I ලෝකය පිළිබඳ අතිමූලික (fundamental) ප්‍රශ්න ඇසීම සහ විභාග කිරීම.
නිදසුන්

- ලෝකය යනු කුමක් ද?
- ලෝකයේ පැවැත්ම සිදුවන්නේ කෙසේ ද?
- ලෝකය ගැන ඥානනය කළ හැකි ද?
- මනුෂ්‍ය ජීවිතයේ හා පැවැත්මේ අර්ථයක් තිබේ ද?
- ජීවිතය යනු කුමක් ද?

දේශපාලනය සම්බන්ධ ව දේශපාලන දර්ශනවාදීන් විභාග කරන අතිමූලික ප්‍රශ්න වලට ඇති උදාහරණ :-

- දේශපාලනය යනු කුමක් ද?
- රාජ්‍යය යනු කුමක් ද? රාජ්‍යය පවතින්නේ කවර පරමාර්ථයක් සඳහා ද?
- රාජ්‍යයට මනුෂ්‍යයන් අවනත විය යුත්තේ ඇයි?
- රාජ්‍යය හා අනෙකුත් මනුෂ්‍ය සමාගම් අතර ඇත්තේ කවර සම්බන්ධයක් ද?

මෙවැනි ප්‍රශ්න අදටත් සාකච්ඡා වන, දේශපාලන දර්ශනවාදීන් මතු කරන අතිමූලික ප්‍රශ්න වේ.

II දර්ශනවාදීහු ලෝකය තේරුම් ගැනීමට අප පාවිච්චි කරන සංකල්පවල අර්ථය නිරවුල් සහ නිශ්චිත කර ගැනීමට විශේෂ උනන්දුවක් දක්වති.

උදාහරණ :- යුක්තිය, සාධාරණත්වය, සමානාත්මතාව, නිදහස, අයිතිවාසිකම්, යනාදි දේශපාලන විද්‍යාවේ මූලික සංකල්පවල අර්ථ ගැඹුරට ම සොයා යාම.

III දර්ශනවාදී ප්‍රවේශය දේශපාලනයෙහි ප්‍රතිමානීය අරමුණු ගැන දක්වන දැඩි උනන්දුව :-

- ප්‍රතිමානීය (Normative) යන්නෙහි අර්ථය "වටිනාකම් විනිශ්චයන්ගෙන් සමන්විත" යන්න යි.
- ලෝකයේ සිදු වන දේ පිළිබඳ ව අප අතර හොඳ/නරක, යහපත්/අයහපත් ආදි ලෙස වටිනාකම්, විනිශ්චය කිරීම් තිබේ. ඒවා වනාහි ප්‍රතිමානීය විනිශ්චය කිරීම් ය.

උදාහරණ :- දරුණු අපරාධකරුවන්ට මරණ දඬුවම අනිවාර්ය කළ යුතු ද යන්න පිළිබඳ හොඳ/නරක/යහපත්/අයහපත් වශයෙන් වටිනාකම් පිළිබඳ විනිශ්චය කිරීම් ඇත.

එමෙන් ම ලෝකයේ සිදුවීම් පිළිබඳ ව ගුණාත්මක ඇගයීම් කිරීමේ මිනුම් දඬු අපට සැපයෙන්නේ ද ප්‍රතිමානීය සංකල්ප විසිනි.

උදාහරණ :- නිදහස, සමානත්වය, යුක්ති ගරුකත්වය

- ලෝකය වඩාත් හොඳ ස්ථානයක් ලෙසට සකස් විය යුත්තේ කෙසේ දැයි අපට සිතන්නට අනුබල දෙනු ලබන්නේ ද ප්‍රතිමානීය අරමුණු විසිනි.

උදාහරණ :-
I සමාජය සමානාත්මතාවට ගරු කළ යුතු යි.
II දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු විය යුතු යි.

* දේශපාලන දර්ශන වාදයේ ප්‍රතිමානීය සංකල්පය තරමක් ඉහළ මට්ටමේ අර්ථ දෙකක් ඇඟවීම සඳහා භාවිත කෙරේ.

I දේශපාලන චින්තනය, අධ්‍යයනය සහ විග්‍රහය මෙන් ම දේශපාලන ආයතන සහ භාවිතයන් ද සමාජයේ පොදු අපේක්ෂා සහ යහපත වෙනුවෙන් කැප විය යුතු ය යන පිළිගැනීම.

II දේශපාලන අධ්‍යයනයේ අරමුණ විය යුත්තේ දේශපාලන ප්‍රපංච යනු මොනවා දැයි හුදෙක් විස්තර කිරීම ම නොව, දේශපාලන ආයතන සහ භාවිත කෙසේ සකස් විය යුතු ද යන්න යෝජනා කිරීම ද වීම.

* මේ වන තෙක් සිටි සෑම දේශපාලන දාර්ශනිකයකුගේ ම චින්තන වූ කලී මෙම ප්‍රතිමානීය අරමුණු දෙක වෙතින් හැඩ ගැස්වී ඇති ඒවා ය.

* දාර්ශනික-ප්‍රතිමානීය ප්‍රවේශයේ ප්‍රධාන ලක්ෂණ:

I මෙහි භාවිත කරන සංකල්පවල අර්ථ ගැඹුරින් ම ගවේෂණය කිරීම.

II දේශපාලන ලෝකය පිළිබඳ ඇති මූලික ගැටලු මතු කරමින් ඒවා විභාග කිරීම.

III දේශපාලන චින්තන විග්‍රහයේ ආයතනවල සහ භාවිතවල ප්‍රතිමානීය ලක්ෂණ හා කැපවීම් ගැන උනන්දු වීම.

**1.4.2. තුළනාත්මක ප්‍රවේශය**

* තුළනාත්මක යන්නෙහි අර්ථය ''සංසන්දනාත්මක'' යන්න යි.

* තුළනාත්මක අධ්‍යයන ප්‍රවේශය වැදගත් කොට සලකන්නේ එක් ප්‍රධාන ඥාන සම්පාදන හේතුවක් නිසා ය. එනම් යම් සමාජ දේශපාලන ප්‍රපංචයක් /ගැටලුවක්/තේමාවක් පිළිබඳ ව වඩාත් පරිපූර්ණ අවබෝධයක් ලබා ගන්නට නම් එම ප්‍රපංචය/ගැටලුව/තේමාව ප්‍රකාශයට පත් වන එක් අවස්ථාවක් නොව අවස්ථා කිහිපයක් ම සන්සන්දනාත්මක ව අධ්‍යයනය කිරීම වඩාත් ඵලදායී වන්නේ ය යන්න යි.

උදාහරණ I :- රටක දේශපාලන ස්ථාවර භාවයට තුඩුදෙන වඩාත් හොඳ ආණ්ඩු ක්‍රමය කුමක් ද? යන ගැටලුව පිළිබඳ ව අධ්‍යයනය සඳහා ලෝකයේ පවතින ජනාධිපති හා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම කිහිපයක් තුළනාත්මක ව හැදෑරිය හැකි ය.

උදාහරණ II :- ගැටුම් තියුණු වී ඇති රටක හා සාමය තහවුරු වී ඇති රටක දේශපාලන ස්ථාවර භාවය සඳහා වඩා සුදුසු ම ආණ්ඩු ක්‍රමය කුමක්ද යන්න අධ්‍යයනය කිරීමට ද තුළනාත්මක ප්‍රවේශය අවශ්‍ය වේ.

(ගුරුවරයා මේ සඳහා උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න)

දේශපාලනය තුළනාත්මක ව හැදෑරිය යුත්තේ ඇයි? මෙහි දී කෙනත් නිව්ටන් සහ ජාන් වැන්ඩත් යන දේශපාලන විද්‍යාඥයන්ගේ Foundation of Comparative Politics යන කෘතියෙන් සැපයෙන පිළිතුරු වැදගත් වේ.

1. තම රටේ දේශපාලනය මැනවින් අවබෝධ කර ගැනීමට නම් අනෙක් රටවල දේශපාලනය ගැන අවබෝධය ලබා ගැනීම වැදගත් වීම.
2. එක් එක් රටක දේශපාලන ඉතිහාසය, දේශපාලන පසුබිම සහ දේශපාලන ආයතන ගැන ලබාගන්නා සංසන්දනාත්මක අවබෝධයකින් තොර ව එම රටවල දේශපාලනය ගැන මනා අවබෝධයක් ලබාගත නොහැකි වීම.

තුළනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ධාරා තුනකි.

(අ) සම්භාව්‍ය තුළනාත්මක දේශපාලන අධ්‍යයන ප්‍රවේශය
(ආ) විසි වැනි සියවසේ තුළනාත්මක දේශපාලන අධ්‍යයනය
(ඇ) සමකාලීන තුළනාත්මක දේශපාලන අධ්‍යයනය

(අ) සම්භාව්‍ය තුළනාත්මක දේශපාලන අධ්‍යයන ප්‍රවේශය :-

මෙකී අධ්‍යයනය පුරාතන ග්‍රීක, රෝම මෙන් ම මධ්‍යතන යුරෝපීය දේශපාලන චින්තනය කරා ගමන් කරයි. ඇරිස්ටෝටල් *The Politics* නම් කෘතියේ එකල ග්‍රීක

සමූහාණ්ඩුවල පැවති ආණ්ඩුක්‍රම වර්ගී කරණය සඳහා යොදා ගත්තේ තුලනාත්මක විධි ක්‍රමය යි. ආණ්ඩුවල ස්වභාවය වර්ග කිරීම සඳහා ඔහු මිනුම් දඬු දෙකක් භාවිත කෙළේ ය. එනම් පාලකයන්ගේ සංඛ්‍යාව සහ ආණ්ඩුව දූෂිත ද යන්න යි. ඇරිස්ටෝටල් ග්‍රීසියේ පැවැති ආණ්ඩුක්‍රම රාජාණ්ඩු, වංශාධිපති ආණ්ඩු, ප්‍රජාපීඩිත ආණ්ඩු, කතිපයාධිකාරී ආණ්ඩු සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ලෙස වර්ගීකරණය කෙළේ ආණ්ඩු ක්‍රම පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක් පදනම් කරගෙන ය.

(ආ) විසි වැනි සියවසේ තුලනාත්මක දේශපාලන අධ්‍යයනය

මෙම අධ්‍යයන ප්‍රවේශය ඇමරිකාවේ විශ්ව විද්‍යාලවල 1960 දශකයෙන් පසු ව වර්ධනය වූවකි. එය දේශපාලන අධ්‍යයනයේ විද්‍යාත්මක නැඹුරුව පසුබිම් කොටගෙන ඇති වූවකි. විද්‍යාත්මක දේශපාලන විද්‍යා ධාරාවේ ප්‍රධාන තර්කය වූයේ දේශපාලන විද්‍යා විධි ක්‍රමය ද ස්වාභාවික විද්‍යා විධික්‍රමයට අනුරූප ආනුභවික විද්‍යාවක් විය යුතු ය යන අදහස යි. මෙහි දී තුලනාත්මක දේශපාලන අධ්‍යයනයේ මාධ්‍යය විය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හෝ දේශපාලන ඉතිහාසය හෝ සංසන්දනය කිරීම නො ව ආනුභූතික ව නිරීක්ෂණය කළ හැකි වර්තමාන දේශපාලන තේමා පදනම් කොටගෙන, වෙනස් දේශපාලන ක්‍රම (Political Systems) තුලනාත්මක ව හැදෑරීම යි. එම තේමා නම් දේශපාලන නවීකරණය, දේශපාලන වර්ධනය, දේශපාලන සංස්කෘතිය දේශපාලන සමාජානුයෝජනය සහ දේශපාලන චර්යාව යනාදිය යි.

මේ ප්‍රවේශය යොදාගත් ප්‍රධාන තුලනාත්මක දේශපාලන විද්‍යා කෘති කිහිපයක් නම්:-

1. ගේබ්‍රියල් ඒ. ආමන්ඩ් - ''තුලනාත්මක දේශපාලන ක්‍රම'' නම් ලිපිය (1956, *The Journal of Politics* වෙළුම 18-අංක 3)
2. ගේබ්‍රියල් ඒ. ආමන්ඩ් සහ ජේම්ස් එස්. කෝල්මන් - 1960, *The Politics of the Developing Areas* (සංවර්ධනය වන කලාපවල දේශපාලනය) නම් ග්‍රන්ථය.
3. සීමුවර් මාටින් ලිප්සට්, 1960, **''දේශපාලන මිනිසා : දේශපාලනයේ සමාජ පදනම''** (*Political Man: The Social Bases of Politics*) යන ග්‍රන්ථය.
4. ගේබ්‍රියල් ඒ. ආමන්ඩ් සහ සිඩ්නි වර්බා - 1963 **''පුරවැසි දේශපාලන සංස්කෘතිය: රටවල් පහක දේශපාලන ආකල්ප සහ ප්‍රජාතන්ත්‍රවාදය''** (*The Civic Culture: Political Attitudes and Democracy in Five Nations* ) නම් ග්‍රන්ථය.
5. සැමුවෙල් පී. හන්ටින්ටන් - 1968 **''වෙනස් වන සමාජවල දේශපාලන පර්යාය''** (*Political Order in Changing Societies*) නම් ග්‍රන්ථය.

(ඇ) සමකාලීන තුලනාත්මක දේශපාලන අධ්‍යයනය

සමකාලීන තුලනාත්මක දේශපාලන විද්‍යා සාහිත්‍යය පරීක්ෂා කරන විට පහත සඳහන් පැතිකඩවල් නිරීක්ෂණය කළ හැකි ය.

(i) මෙහි දී අධ්‍යයනයට ලක් කළ හැකි විෂය පථය බෙහෙවින් නම්‍යශීලී ය. දේශපාලන ආයතන, දේශපාලන ක්‍රියාවලි, දේශපාලන පරිවර්තනය, සමාජ දේශපාලන ගැටුම්, සාම ක්‍රියාවලි, රාජ්‍යයේ ස්වභාවය සහ පරිවර්තන, ප්‍රජාතන්ත්‍රීය පරිවර්තනයේ දිශානති, පුරවැසි ක්‍රියාකාරිත්වය, ජාතිකවාදී දේශපාලනය, සිවිල් සමාජ දේශපාලන ක්‍රියාකාරිත්වය, මානව අයිතිවාසිකම්, ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වය යන තේමා උදාහරණ යි.

(ii) තුළනාත්මක දේශපාලන විග්‍රහය කළ යුත්තේ දේශපාලන සංවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පරමාදර්ශී මාදිලීන් වෙතින් ලබා ගන්නා මිනුම් දඬු භාවිත කරමින් නොවන අතර එවැනි සුසමාදර්ශී මාදිලි අවශ්‍ය නැත.

(iii) තුළනාත්මක විග්‍රහයේ අරමුණ විය යුත්තේ එක් එක් රටවල දේශපාලන යථාර්ථයන් වෙතින් තුළනාත්මක පාඩම් උකහාගෙන දේශපාලන විග්‍රහය ශක්තිමත් කිරීම යි.

**1.4.3. බහු විෂයක ප්‍රවේශය** -

මෙම ප්‍රවේශයෙන් සිදු වන්නේ දේශපාලන විද්‍යාවෙන් බාහිර ශික්ෂණයන්ගේ න්‍යාය, සංකල්ප හා විධික්‍රම දේශපාලන විද්‍යා විග්‍රහයට යොදාගැනීම යි. දේශපාලන විද්‍යාවේ ඉතිහාසය දෙස බලන විට දේශපාලන විද්‍යාව සෑම විට ම අනෙක් ශික්ෂණ හා සම්බන්ධ වී, ඒවායෙන් පෝෂණය වී ඇති බව පෙනේ.

උදාහරණ :-

| | |
|---|---|
| ග්‍රීක යුගයේ | - දර්ශනවාදය |
| රෝම යුගයේ | - දේවධර්ම ශාස්ත්‍රය, ඉතිහාසය සහ නීති විද්‍යාව |
| 19 වන සියවසේ දී | - අර්ථ ශාස්ත්‍රය, ඉතිහාසය, නීති විද්‍යාව |
| 20 වන සියවසේ දී | - සමාජ විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව, භූගෝල විද්‍යාව, කලාව, සාහිත්‍යය |

බහු විෂයක ප්‍රවේශයක් දේශපාලන විද්‍යාවට අවශ්‍ය වීමට හේතු කිහිපයකි.

⋆ දේශපාලනය යන්න සමාජයේ අනෙකුත් පැතිකඩවලින් හුදෙකලා ව, වියුක්ත ව පවතින දෙයක් නොව, ඒවා සමඟ බද්ධ වී තිබෙන සහ සමාජය වෙතින් ම පැන නඟින ප්‍රපංචයක් වීම.

උදාහරණ :- ප්‍රජාතන්ත්‍රවාදය හා කුල සාධකය අතර සම්බන්ධය. මෙය ලංකාවේ හා ඉන්දියාවේ දේශපාලන සංස්කෘතියේ වැදගත් තේමාවක් මෙන් ම උභතෝකෝටිකයක් ද වෙයි. එය මැනවින් අවබෝධ කර ගැනීමට නම් සමාජ විද්‍යා සහ මානව විද්‍යා ප්‍රවේශ දේශපාලන විද්‍යා විග්‍රහයට අවශ්‍ය වේ.

බහු විෂයක යන සංකල්පයේ අර්ථ තුනක් තිබේ.

I නිශ්චිත ශාස්ත්‍රීය විෂයයක් ලෙස අනන්‍ය වී තිබුණත් සමාජයේ අනෙකුත් පැතිකඩ සමඟ ද දේශපාලනය අඩු වැඩි වශයෙන් සම්බන්ධ බව පිළිගැනීම.

II දේශපාලන විද්‍යාවේ එයට ම ආවේණික න්‍යාය හා සංකල්ප තිබුණ ද, අනෙකුත් විෂයයන්ගේ න්‍යාය සහ සංකල්ප සමඟ ඒවා බැඳී තිබීම සහ ඒවායින් පෝෂණය ලැබීම.

III න්‍යායවලට හා සංකල්පවලට අමතර ව විධික්‍රම සම්බන්ධ ව ද දේශපාලන විද්‍යාව වෙනත් ශික්ෂණ ධාරාවන් සතු විධික්‍රම සමඟ සම්බන්ධ වීම හා ඒවායින් පෝෂණය ලැබීම.

1.4. විද්‍යාත්මක (චර්යාවාදී) ප්‍රවේශය.

- "දේශපාලන විද්‍යාව" යන්නට විසි වැනි සියවසේ දෙන ලද අර්ථයක් වන්නේ ''විද්‍යාත්මක විධික්‍රමය'' (scientific method) භාවිත කරමින් දේශපාලනය අධ්‍යයනය කිරීම ය යන්න යි.

- මෙම නව අර්ථයෙන්, දේශපාලන විද්‍යාව සැබෑ සහ නිර්ව්‍යාජ විද්‍යාවක් බවට පත්විය හැක්කේ එය ස්වාභාවික විද්‍යාවන් ද ආර්ථික විද්‍යාව සහ මනෝ විද්‍යාව ද විසින් භාවිත කරනු ලැබූ විද්‍යාත්මක විධික්‍රමය තම විධි ක්‍රමය ලෙස යොදාගත් විට පමණි ය යන අදහස ගම්‍යමාන විය.

- මෙය 1930 දශකවල දී සහ 1940 දශකවල දී ප්‍රධාන වශයෙන් ඇමරිකානු දේශපාලන විද්‍යාඥයන් කණ්ඩායමක් අතර ප්‍රචලිත වූ අදහසකි.

- ආර්ථික හා සමාජ විද්‍යාඥයන් ද අතර මුල් බැසගෙන තිබූ මෙයින් ප්‍රකාශ වූයේ සමාජය, ආර්ථිකය හා දේශපාලනය ගැන කරන අධ්‍යයන වෙතින් "වලංගු", "විශ්වසනීය" සහ "නිවැරදි" දැනුම ගොඩ නඟන්නට නම්, ඒවායේ ක්‍රම විද්‍යාව නව දිශානතියකට යොමු විය යුතු බව යි.

- ඒ නව මඟ නම් ස්වාභාවික විද්‍යාවන් ඒ වන විට සාර්ථක ව යොදා ගෙන ඇති " විද්‍යාත්මක" සහ "ආනුභවික" විධික්‍රමය යි.

- විද්‍යාත්මක ප්‍රවේශයේ මූලධර්ම :-

  - සමාජ දේශපාලන අධ්‍යයනයේ ඉලක්කය විය යුත්තේ "ආනුභාවික පර්යේෂණ" වෙතින් ලබා ගන්නා කරුණු, සාක්ෂ්‍ය සහ දත්ත මත පදනම් වූ දැනුමක් නිෂ්පාදනය කිරීම ය. "ආනුභවික පර්යේෂණ" කෙරෙන්නේ නිරීක්ෂණය සහ ප්‍රත්‍යක්ෂණය කළ හැකි කරුණු සහ දත්ත සමාජ දේශපාලන ප්‍රපංචයන් පිළිබඳ ව සොයා ගැනීම යි.

  - විද්‍යාත්මක ව ගොඩනඟන සමාජ-දේශපාලන විග්‍රහය "වාස්තවික" (objective) විය යුතු ය. එනම් විද්‍යාත්මක ව ගොඩනඟන ඥානය, අපේ පෞද්ගලික, එනම් ආත්මීය නිගමන විශ්වාස, අගති, යනාදියෙන් නිදහස් විය යුතු අතර, විද්‍යාත්මක දේශපාලන දැනුම පර්යේෂකයාගේ ද ආත්මීය/ පෞද්ගලික නිගමනවලින් නිදහස් විය යුතු ය යන මූලධර්මය යි.

  - එසේ ම සමාජ දේශපාලන ප්‍රපංච පිළිබඳ ව අප ගොඩ නඟන දැනුම සහ නිගමන, වටිනාකම් විනිශ්චයන්ගෙන් තොර (value free) විය යුතු ය.

  - යම්කිසි ප්‍රපංචයක් ගැන අධ්‍යයනය කරමින් එහි හොඳ/නරක, යහපත /අයහපත ගැන විනිශ්චයයන් ඉදිරිපත් නොකළ යුතු අතර, ආනුභවික සහ වාස්තවික දත්ත සහ සාක්ෂ්‍ය මත පමණක් පදනම් ව විශ්ලේෂණ, නිරීක්ෂණ සහ නිගමන ගොඩනගා ගැනීම කළ යුතු ය.

  - මෙහි ඇති මූලධර්මය නම් "වටිනාකම්" විනිශ්චයන්ගෙන් නිදහස් ඥානය (Value free knowledge) යන්න යි. එය ස්වාභාවික විද්‍යා විධික්‍රමයෙන් සමාජ විද්‍යාවන්ට පැමිණි මූලධර්මයකි.

- විද්‍යාත්මක ප්‍රවේශය සහ චර්යාවාදය :-

  - දේශපාලන විද්‍යාවේ චර්යාවාදය (Behaviourism/Behaviouralism) යනු පුද්ගල දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම සිය ප්‍රධාන විද්‍යාත්මක ප්‍රස්තුතය බවට සැලකූ දේශපාලන විද්‍යා විෂය ධාරාව යි.

  - 1920 ආරම්භ වූ මෙය 1930 සහ 1940 දශක වලදී වඩා ප්‍රචලිත ව දේශපාලන න්‍යාය පත්‍රයට කළ බලපෑම කොතෙක් ද යත්, එම මැදිහත් වීම "චර්යාවාදී විප්ලවය" (Behavioural Revolution) යනුවෙන් 20 වන සියවසේ දේශපාලන විද්‍යාවේ විකාශනය පිළිබඳ ඇති වෘත්තාන්තවල ප්‍රකාශ කෙරිණි.

  - චර්යාවාදී ප්‍රවේශයේ ප්‍රධාන තර්කය මෙසේ ය. ආනුභවික අධ්‍යයනයට ලක් කළ හැකි දේශපාලන ප්‍රපංචය නම් සමාජයේ තනි තනි පුද්ගලයන්, දේශපාලන ක්‍රියාවලිය තුළ ක්‍රියා කරන ආකාරය, එනම් දේශපාලන චර්යාව සහ එම චර්යාවන්ට බලපාන සාධක යි.

  - පුද්ගලයෝ දේශපාලන ක්‍රියාවලියට සහභාග වෙති. දේශපාලන තීරණ ගනිති; තම දේශපාලන චර්යාවට බලපාන දේශපාලන විශ්වාස සහ මත ඔවුන්ට තිබේ. ඒවා වනාහි දේශපාලන චර්යාව යි. එම චර්යා ආනුභවික පර්යේෂණයට ලක් කළ හැකි ය. එම ආනුභවික පර්යේෂණ මඟින් ප්‍රමාණාත්මක දත්ත ලබා ගත හැකි ය.

    උදාහරණ :- මැතිවරණයක දී ඡන්දදායකයන් ඡන්දය දීම පිළිබඳ ව ආනුභවික හා ප්‍රමාණාත්මක දත්ත පහසුවෙන් ලබා ගත හැකි ය. එම දත්ත ස්ත්‍රී/ පුරුෂ, අධ්‍යාපන මට්ටම, වෘත්තිය, ග්‍රාමීය/නාගරිකතාව, වයස් මට්ටම, ආදි වශයෙන් වර්ගීකරණය කළ හැකි ය. ඒ මත ලබාගන්නා දත්ත විශ්ලේෂණය කරමින් චර්යා රටා, ප්‍රවණතා, ගති ලක්ෂණ සංඛ්‍යාත්මක දත්ත ඔස්සේ (වගු, ප්‍රස්තාර, ප්‍රතිශත ආශ්‍රයයෙන්) නිරාවරණය කරගත හැකි ය.

- චර්යාවාදයේ මෑත කාලීන ප්‍රවණතා

  - චර්යාවාදී අධ්‍යයනයේ මෑත කාලීන ප්‍රවණතාව වූයේ පුරවැසියන්ගේ දේශපාලන සහභාගිත්වය (Political Participation) පිළිබඳ ව අධ්‍යයනය කිරීම යි. මෙය ද ආනුභවික පර්යේෂණ මඟින් අධ්‍යයනය කළ හැකි ක්‍රියාදාමයකි. ඇමරිකානු චර්යාවාදීන් මෑත කාලීන ව මේ පිළිබඳ ව බෙහෙවින් උනන්දුවක් දක්වා ඇත.

  - චර්යාවාදය 1920 දශකයේ ආරම්භ වී 1950 - 60 දශකවල දී එහි අධිපති ධාරාව බවට පත් වුව ද 1970 දශකවල පසුබෑමට ලක් විය.

  - ඊට තිබූ විවේචනයක් වූයේ, දේශපාලන චර්යාව පමණක් අධ්‍යයනය කිරීම යන්න අවධාරණය කිරීම නිසා දේශපාලන විග්‍රහයේ විෂය පථය අතිශයින් පටු වීමට එය තුඩු දුන් බව යි.

  - දේශපාලන චර්යාව දේශපාලනයේ එක් පැතිකඩක් පමණක් නිසා අනෙක් පැතිකඩ නොසලකා හැරීම දේශපාලනයේ වැදගත් ම අංග දේශපාලන අධ්‍යයන න්‍යාය පත්‍රයෙන් ඉවත් කිරීමක් බවට පත් විය.

  - ඒ අනුව 1970 දශකයේ දී චර්යාවාදී ප්‍රවේශයේ වැදගත්කම අඩුවෙමින් දාර්ශනික, ඓතිහාසික සහ සමාජ විද්‍යාත්මක ප්‍රවේශවල වැදගත්කම යළිත් මතුවන්නට විය.

- මේ වෙනසත් සමඟ චර්යාවාදය 1970, 80 දශකවල දී පශ්චාත් චර්යාවාදී (Post- Behavioral) අවධියකට සම්ප්‍රාප්ත විය. මේ අවධියේ වූ තවත් ප්‍රවණතාවක් වන්නේ ආනුභවික හා ප්‍රත්‍යක්ෂ මූලවාදී දේශපාලන ගුරුකුලයේ ආධිපත්‍යය ද බිඳ වැටෙන්නට වීම යි.

- මේ වෙනස කෙරෙහි මාක්ස්වාදී - නව මාක්ස්වාදී - ලිබරල්, දාර්ශනික - ස්ත්‍රීවාදී සහ පශ්චාත් නූතනවාදී ධාරා වෙතින් එල්ල වූ අභියෝග ද තීරණාත්මක විය.

**1. 4. 5. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය.**

දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය (Political Economy Approch) වර්තමානයේ සම්පූර්ණයෙන් ම අනන්‍ය වී තිබෙන්නේ මාක්ස්වාදී න්‍යාය හා ප්‍රවේශය සමඟ ය. 19 වන සියවසේ යුරෝපයේ බිහිවූ චින්තනයක් වූ මාක්ස් වාදයේ දාර්ශනික, ආර්ථික විද්‍යාත්මක, දේශපාලන සහ සමාජ විද්‍යාත්මක පැතිකඩ තිබේ.

දේශපාලන අර්ථ ශාස්ත්‍රය යන සංකල්පය මුලින් ම භාවිත වූයේ 18 වන සියවසේ යුරෝපීය චින්තකයන් අතර ය.

- භාණ්ඩ නිෂ්පාදනය
- වෙළෙඳාම
- ජාතික ආදායම

යන ආර්ථික ක්‍රියාවලිය ආණ්ඩුවේ ප්‍රතිපත්ති සමඟ ද සම්බන්ධ වන ආකාරයත්, ආර්ථික ක්‍රියාවලියට ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල බලපෑමත් අධ්‍යයනය කිරීම එහි මුල් කාලීන න්‍යාය පත්‍රය විය. මෙම චින්තනයේ ප්‍රධාන නියෝජිතයන් වූවෝ

- ඇඩම් ස්මිත්
- ඩේවිඩ් රිකාඩෝ
- ජෝන් ස්ටුවට් මිල්
- තෝමස් මැල්තස්

යන අය යි.

කාල්මාක්ස් දේශපාලන අර්ථශාස්ත්‍රය පිළිබඳ මෙම සාම්ප්‍රදායික වටහා ගැනීම වෙනස් කෙළේ ය. කාල්මාක්ස් ගේ විග්‍රහයේ දක්නට ලැබුණු නව සහ විශේෂ ලක්ෂණයක් වූයේ ආර්ථික ක්ෂේත්‍රය ගැන ගැඹුරින් හදාරන අතර ම 19 වන සියවසේ දේශපාලන අර්ථ ශාස්ත්‍රඥයන් නොකළ ආකාරයේ න්‍යායික පද්ධතියක් (a theoretical system) ගොඩනැගීම යි. එම ප්‍රවේශය "ඓතිහාසික භෞතිකවාදය" (historical materialism) යනුවෙන් හැඳින්වේ. එය මනුෂ්‍ය ඉතිහාසය, සමාජ ව්‍යුහය, ආර්ථිකය, දේශපාලනය සහ චින්තනය යන මේවා සමස්තයක් ලෙස සලකා, එම සමස්තයත්, එහි එකිනෙක පැති සහ සමස්තය අතර ඇති සම්බන්ධතාත් අධ්‍යයනය කිරීම සඳහා යෝජනා වූ න්‍යායික හා විධික්‍රම ප්‍රවේශයකි. මෙම ඓතිහාසික භෞතිකවාදී ප්‍රවේශයේ ප්‍රධාන න්‍යායික අංගෝපාංග කිහිපයකි. ඒවා නම්,

I මනුෂ්‍ය සමාජය අධ්‍යයනය කිරීමේ දී අප ඒ සඳහා ප්‍රවිෂ්ට විය යුත්තේ, මුළු සමාජය ම සමස්තයක් (totality) ලෙස සලකාගෙන ය. "සමාජ සැකැස්ම" (social formation) යනු මෙම සමාජ සමස්තය හැඳින්වීමට යොදාගත් න්‍යායික සංකල්පය යි.

II සමාජ සැකැස්මක් මූලික වශයෙන් තල / මට්ටම් දෙකකින් සමන්විත ය. ඒවා නම්

1 ආර්ථික පදනම (economic base)

2 සමාජ, දේශපාලන, සංස්කෘතික මතවාදී යන මේවායින් සමන්විත උපරි ව්‍යූහය (superstructure) යන මේවා යි.

III සමාජ සැකැස්මේ උපරි ව්‍යූහයේ - එනම් සමාජ දේශපාලන, සංස්කෘතික හා මතවාදී ක්ෂේත්‍රවල-සිදුවන පරිවර්තන සහ වෙනස් වීම්, එකිනෙකින් ස්වාධීනව, හුදෙකලා ව සිදු වන වර්ධන ම නොවේ. ඒවාට යම්කිසි ස්වාධීන පැවැත්මක් තිබිය හැකි වුවත්, අවසාන විග්‍රහයේ දී එම වෙනස්කම් සිදු වන්නේ ආර්ථික පදනමේ සිදුවන ක්‍රියාකාරිත්වයට සහ පරිවර්තනයන්ට ප්‍රතිචාර වශයෙන් සහ ඒවායේ ප්‍රකාශන ලෙසට යි.

IV ආර්ථික, සමාජ, සහ දේශපාලන පරිවර්තනයේ මූලික ගතිකත්වයක් වන්නේ, ඕනෑ ම සමාජයක පවතින 'පන්ති අරගලය' (class strugle) යි. එය වූ කලි සමාජය එකිනෙකට පසමිතුරු අභිලාෂ ඇති පන්තිවලට බෙදීමේ ප්‍රතිඵලයකි. මෙම බෙදීම සිදු වන්නේ ද ආර්ථික හේතු අනුව ය. සමාජයේ ආර්ථික සම්පත්වලට හිමිකම තිබීම හෝ නොතිබීමත් පන්ති විභේදනයේ පදනම යි. පන්ති අරගලය සිදු වන්නේ ආර්ථික බලය හිමි සහ අහිමි පන්ති අතර ය.

මෙම මූලික මාක්ස්වාදී න්‍යායික අදහස් පදනම් කර ගෙන දේශපාලන අර්ථශාස්ත්‍රීය ප්‍රවේශය දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට පැමිණියේ ආනුභවික/ප්‍රත්‍යක්ෂමූලවාදී චර්යාවාදී දේශපාලන විද්‍යා ප්‍රවේශයට විකල්පයක් වශයෙනි.

දේශපාලන අර්ථශාස්ත්‍රීය ප්‍රවේශය අවධාරණය කළ දේශපාලන විද්‍යාඥයන් ඉදිරිපත් කළ විද්‍යාත්මක/චර්යාවාදී දේශපාලන විද්‍යාව පිළිබඳ විවේචන කිහිපයකි.

I චර්යාවාදී දේශපාලන විද්‍යාව සැබැවින් ම අධ්‍යයනය කරන්නේ දේශපාලනයේ ඇති නියම, හරාත්මක තේමා නොව, එහි මතුපිට ප්‍රකාශන ය.

II චර්යාවාදී දේශපාලන විද්‍යාව, දේශපාලනික වශයෙන් ගතානුගතික ය.

III එයින් සිදු වන්නේ සමාජයේ දේශපාලන ව්‍යූහයන් වෙනස් කිරීම, හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ නොව ඒවා පවත්වාගෙන යෑම ය. එය පවත්නා අධිපති බලයට සේවය කරයි.

මාක්ස්වාදී ආභාසය ලැබූ දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයේ ආභාෂය ලැබූ දේශපාලන චින්තකයන් ඉදිරිපත් කළ විකල්ප දේශපාලන විද්‍යා ප්‍රවේශයේ ලක්ෂණ සහ පැතිකඩ කිහිපයකි.

I දේශපාලන ප්‍රපංචයක් විග්‍රහ කිරීමේ දී එහි ඇති ආර්ථික, හා සමාජ පන්ති මූලයන් ද හඳුනාගෙන එම සමස්තය ආශ්‍රිත ව තම විග්‍රහය ගොඩනැගීම.

II දේශපාලනය, ආර්ථික හා සමාජ පන්ති යන සාධකවලින් තීරණය කරන බව පිළිගැනීම.

III දේශපාලනයේ ඇති මූලික (fundamental) තේමාවන් ලෙස බලය, ආධිපත්‍යය, පන්ති විභේදනය, පන්ති ගැටුම, රාජ්‍යය, ආධිපත්‍ය විරෝධ සමාජ ප්‍රතිචාර යන මේවා සැලකීම.

IV දේශපාලන අධ්‍යයනය, සමාජ, දේශපාලන, ආර්ථික මතවාදී ආදි ක්ෂේත්‍රවල පවත්නා ආධිපත්‍යධාරී බල ව්‍යූහයන් රැඩිකල් විවේචනයට පාත්‍ර කිරීම ඉලක්ක කර ගැනීම.

V සමාජ, දේශපාලන පරිවර්තනය සඳහා විචාරාත්මක දේශපාලන අධ්‍යයනය කැප විය යුතුයැයි විශ්වාස කිරීම.

**1. 4. 6. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය.**

සමාජ විද්‍යාව (Sociology) දේශපාලන විද්‍යාවට ඉතා සමීප ශාස්ත්‍රීය විෂයයකි. මේ විෂය දෙක එකිනෙකින් වෙන් වූයේ 19 වන සියවසේ ඇමරිකානු විශ්ව විද්‍යාලවලදීය. 20 වන සියවසේ මුල එම වෙන් වීම තහවුරු වුවත් එම විෂය දෙක අතර අන්තර්සම්බන්ධතා අද ද පවතී. "දේශපාලන සමාජ විද්‍යාව" (Political sociology) යනු දේශපාලන හා සමාජ විද්‍යා ප්‍රවේශ අතර ඇති අන්‍යොන්‍යත්වය පිළිගැනීම මඟින් ගොඩ නැඟුණු දේශපාලන විද්‍යාවේත් සමාජ විද්‍යාවේත් ඇති උපක්ෂේත්‍රයකි.

දේශපාලන විද්‍යා අධ්‍යයනය සහ විග්‍රහය, සමාජ විද්‍යාවේ න්‍යාය, ප්‍රවේශ සහ විධි ක්‍රම ආදියෙන් බෙහෙවින් පල ලබා ඇත. එමෙන් ම 19 වැනි සියවසේ සහ විසි වැනි සියවසේ මුල් අවධියේ එම විෂය ක්ෂේත්‍ර දෙක පැවැතියේ එකිනෙකට සම්බන්ධ ව ය.

- 20 වන සියවසට පෙර සිටි, ඔගස්ත් කොම්ත්, කාල් මාක්ස් සහ මැක්ස් වෙබර් යන චින්තකයෝ නූතන දේශපාලන විද්‍යාවේ මෙන් ම සමාජ විද්‍යා න්‍යායයේත්, විධි ක්‍රමයේත් පුරෝගාමීහු ය.

- 20 වන සියවස මැද භාගයේ දී ඉතා බලපෑම් සහගත පර්යේෂකයන් පිරිසකගෙන් සමන්විත වූ ෆැන්ක්ෆර්ට් ගුරුකුලය විසින් පර්යේෂණය කරන ලද ක්ෂේත්‍ර සමාජ විද්‍යාව සහ දේශපාලන විද්‍යාව යන විෂය දෙකට ම සම්බන්ධ ඒවා විය.
- දේශපාලන විද්‍යාවට සමාජ විද්‍යාවෙන් සහ මානව විද්‍යාවෙන් ලැබී ඇති ආභාසය දේශපාලන විද්‍යාවේ විධික්‍රම සහ න්‍යායික පරිමාව යන අංශ දෙකෙහි ම දැකිය හැකි ය.

- තේමාත්මක ව සමාජ විද්‍යා අධ්‍යයනය සමන්විත වී තිබෙන්නේ සමාජ ව්‍යුහය, සමාජ සංවිධාන, සමාජ ඒකක, මනුෂ්‍යයා සහ සමාජය අතර සම්බන්ධතා, සමාජ ස්තරායණය, සමාජ පරිවර්තනය සහ ඒ සියල්ල ම සම්බන්ධ ව සිදු වන මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය තේරුම් ගැනීම අරමුණු කරගෙන ය.

- සමාජ විද්‍යාවේ ම උපවිෂය ක්ෂේත්‍රයක් වන මානව විද්‍යාව උනන්දුව දක්වන්නේ සමාජ, සංස්කෘතික ආගමික ආදි සන්දර්භයන් මඟින් වඩාත් සමීප ව මනුෂ්‍යයාගේ සමාජ ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීමට ය.

- දේශපාලන විද්‍යාවේ අධ්‍යයනය කරන සමහර ගැටලු සහ තේමා පිළිබඳ ව සමාජය ආශ්‍රිත ව පුළුල් හා ගැඹුරු අවබෝධයක් ලබාගැනීමට ඉහත දැක්වූ සමාජ විද්‍යා හා මානව විද්‍යා ප්‍රවේශ ඉතා ප්‍රයෝජනවත් වේ.

  උදාහරණ :-

  දේශපාලන පක්ෂ යනු දේශපාලන විද්‍යා අධ්‍යයනයේ තේමාවකි. දේශපාලන විද්‍යාඥයන් පක්ෂ ගැන සාම්ප්‍රදායික ව අධ්‍යයනය කළේ,

  - පක්ෂවල වැඩපිළිවෙළ
  - මැතිවරණ ප්‍රකාශන
  - පක්ෂවල ඉතිහාසය

- පක්ෂ නායකයන් කරන කථා
- පුවත්පත් වාර්තාවලින් ලැබෙන තොරතුරු
- පක්ෂ නායක සම්මුඛ සාකච්ඡා පදනම් කොට ගෙන ය.

මේවා සමාජය තුළ ක්‍රියා කරන ආකාරයේ ඉතා වැදගත් පැතිකඩවල් ය. එහෙත් ඒ මඟින් දේශපාලන පක්ෂ ගැන සම්පූර්ණ විග්‍රහයක් ඉදිරිපත් නොකෙරේ.

★ දේශපාලනය සහ දේශපාලන පක්ෂ යන්න සමාජයේ ක්‍රියාත්මක වන ආකාරය තේරුම් ගැනීමට අපට සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක ප්‍රවේශ බෙහෙවින් ප්‍රයෝජනවත් ය. දේශපාලනයට පුරවැසියන් සහභාගි වන්නේ ඇයි? ග්‍රාමීය හා ප්‍රජා මට්ටමෙන් දේශපාලන පක්ෂවල බලය තිබෙන්නේ කා සතු ව ද? ධනය, කුලය, පවුල් පසුබිම, ස්ත්‍රී පුරුෂ භාවය යනාදි සාධක පුරවැසියන්ගේ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වයට බලපාන්නේ කෙසේ ද? දේශපාලනය සහ දේශපාලන පක්ෂ ප්‍රජාව අතර සජීව ලෙස පවතින සබඳතාව අවබෝධ කරගන්නට නම් අපට මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගැනීම අවශ්‍ය වේ. එහෙත් ඒ සඳහා ප්‍රවේශයක් හා විධික්‍රම අවශ්‍ය ය. දේශපාලන විද්‍යාඥයන්ට සමාජවිද්‍යා හා මානව විද්‍යා ප්‍රවේශ බෙහෙවින් ඵලදායි ලෙස භාවිත කළ හැකි ය.

### 1. 4. 7. ස්ත්‍රීවාදි ප්‍රවේශය :-

දේශපාලන හා සමාජ අධ්‍යයනයට විශාල බලපෑමක් කළ ස්ත්‍රීවාදය ශාස්ත්‍රීය ධාරාවක් බවට පත් වූයේ 1970 දශකයේ දී ය. එය ස්ත්‍රීවාදී ශාස්ත්‍රීය ධාරාවේ ද ප්‍රධාන පැතිකඩක් වෙයි. ස්ත්‍රීවාදී ප්‍රවේශය දේශපාලනය පිළිබඳ ව අතිමූලික ප්‍රශ්න කිරීමක් සිදුකළා පමණක් නොව 'දේශපාලනය' යන සංකල්පයේ අර්ථය පවා සංවර්ධනය කිරීමට සමත් විය.
දේශපාලන විග්‍රහයේ දී ස්ත්‍රීවාදී පර්යාලෝකයෙන් ආභාසය ලබා මතු කරන ප්‍රශ්න සාම්ප්‍රදායික දේශපාලන විද්‍යාවේ ඇතැම් ප්‍රශ්නවලට වඩා වෙනස් ය.

උදාහරණ වශයෙන්

I දේශපාලනය යන ක්ෂේත්‍රයෙන් ස්ත්‍රීන් බැහැර කර තිබෙන්නේ ඇයි?
II දේශපාලනය පුරුෂයන්ගේ ක්ෂේත්‍රයක් බවට පත් කර තිබීම තව දුරටත් පිළිගත යුතු ද?
III සමාජය ඓතිහාසික වශයෙන් ස්ත්‍රීන් ද්වීතීය තත්ත්වයට, ආන්තිකකරණයට, පීඩාවට, සහ වෙනස්කම් කරනු ලැබීමට භාජනය කර තිබෙන්නේ ඇයි? එසේ කිරීම තව දුරටත් පවත්වාගෙන යා යුතු ද?
IV ස්ත්‍රීන් පීඩනයට පත් කරන සමාජ, දේශපාලන, සංස්කෘතික මතවාදී ව්‍යූහ මොනවා ද?
V සමාජ හා මානව විමුක්තිය පිළිබඳ ලිබරල්වාදයේ සහ සමාජවාදයේ පර්යාලෝක ප්‍රමාණවත් ද?

මෙවැනි ප්‍රශ්න ගවේෂණය කිරීම මඟින් ස්ත්‍රීවාදය විසින් දේශපාලන හා සමාජ විග්‍රහයට නව න්‍යායික / සංකල්පමය ප්‍රභේද ගණනාවක් ද එකතු කරනු ලැබිණ.

- ස්ත්‍රී පුරුෂ සමාජ භාවය (Gender)
- ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනය (Male-Female division of labour)
- පිතෘ මුලිකත්වය (Patriarchy)
- ස්ත්‍රී පීඩනය (Women's oppression)
- පුරුෂ කේන්ද්‍රීයත්වය (Androcentrism)
- පුරුෂ ආධිපත්‍යය (Male domination)
- ස්ත්‍රී විමුක්තිය (Women's liberation)

යන සංකල්ප ඒවා අතර වැදගත් වේ.

දේශපාලන විද්‍යා අධ්‍යයන විමර්ශනය සහ න්‍යාය ස්ත්‍රීවාදී ප්‍රවේශය වෙතින් වෙනස් වූ ආකාරය කෙටියෙන් මෙසේ දැක්විය හැකි ය.

(I) රාජ්‍යය, දේශපාලන බලය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය, නිදහස, සමානාත්මතාව ය, යුක්තිය, සාධාරණත්වය, අයිතිවාසිකම්, වෙනස්කම් කිරීම්, සූරා කෑම, පීඩනය, විරෝධතාව, රාජ්‍ය ප්‍රතිපත්ති, පුරවැසි භාවය යනා දි දේශපාලන විද්‍යාවේ එන අතිමූලික සංකල්ප සියල්ල ම, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය (Gender) යන ප්‍රභේදය ආශ්‍රයයෙන් යළි විමර්ශනය කිරීම හා ඒවායේ විෂය පථයට ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ප්‍රවේශය එකතු කිරීම.

(II) පන්තිය, ජාතිය, සමාජය, පුරවැසියා යන දේශපාලන විද්‍යාවේ ඇති අභිමූලික අනන්‍යතා සංකල්ප අතරට, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය යන්න එකතු කිරීම.

(III) දේශපාලනය යනු මහජන පරිමණ්ඩලයේ (Public Sphere) සිදුවන ක්‍රියාවලියකි, යන ග්‍රීක දේශපාලන දාර්ශනිකයින්ගෙන් ආරම්භ වූ අදහස වෙනස් කොට, පෞද්ගලික පරිමණ්ඩලය ද (Private Sphere) දේශපාලනය සිදුවන ක්ෂේත්‍රයක් බවට පිළිගැනීම.

(IV) මනුෂ්‍ය හා සමාජ විමුක්තිය (Emancipation ) පිළිබඳ ව සාම්ප්‍රදායික ඉදිරි දර්ශනයට 'ස්ත්‍රී විමුක්තිය' (Emancipation of Women) යන්න ද එකතු කිරීම.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් :-**

1. පහත සඳහන් නිදසුන් අනුව ප්‍රශ්නාවලි සකස් කිරීමට සිසු/සිසුවියන් යොමු කරවීම.

   නිදසුන් 1. ප්‍රතිමානීය අධ්‍යයනයේ නියැළුණු දේශපාලන චින්තකයන් දෙදෙනෙකු නම් කරන්න.
   I. .......................................................
   II. .......................................................

   නිදසුන් 2. පහත සඳහන් කෘති රචනා කරන ලද දේශපාලන චින්තකයෝ කවරහු ද?
   I. සමූහාණ්ඩුව .......................................................
   II. දේශපාලනය .......................................................

2. පහත සඳහන් මාතෘකා යටතේ කණ්ඩායම් ඉදිරිපත් කිරීම් සැලසුම් කර පනතියට ඉදිරිපත් කරන්න.

   දේශපාලන විද්‍යාවේ,
   I. දාර්ශනික/ප්‍රතිමානීය ප්‍රවේශය.
   II. තුළනාත්මක ප්‍රවේශය.
   III. බහු විෂයක ප්‍රවේශය.
   IV. විද්‍යාත්මක (චර්යාවාදී ප්‍රවේශය).
   V. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය.
   VI. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය.

V. ස්ත්‍රීවාදී ප්‍රවේශය.

## ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි

01. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (2007), ***දේශපාලන විද්‍යාවේ මූලිකාංග 1***, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

02. Goodin, Robert E (ed) (2009), *The Oxford Hand book of Political Science*, Oxford, Oxford University Press.

03. Grisby, Elleen, 2009, *Analyzing Politics; An Introduction to Politics Science, Belmont,* CA, USA: Cengage Learning.

04. Heywood, Andrew, 2013, *Politics*, London: Palgrave Macmillan.

05. Hineman, Robert A (1995), *Political Science An Introducion*, New York, Mc Graw Hill Provessional.

## 02. දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍ර

**නිපුණතාව 02 :-** දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍ර හඳුනාගනිමින් දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරයි.

(කාලච්ඡේද 20 යි)

**නිපුණතා මට්ටම :-**

2. 1 දේශපාලන විද්‍යාව සමන්විත වන උපවිෂය ක්ෂේත්‍රවල ස්වභාවය සහ අන්තර්ගතය හදාරයි.

2. 2 සමාජයේ දේශපාලන ජීවිතය තුළ ඒවායේ කාර්යභාරය විමර්ශනය කරයි.

**ඉගෙනුම් ඵල :-**

- දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍ර නම් කර විස්තර කරයි.
- ඒ එක් එක් ක්ෂේත්‍ර දේශපාලන විද්‍යා අධ්‍යයන විෂය ක්ෂේත්‍රය පරිපූර්ණ (holistic) කරන ආකාරය පැහැදිලි කරයි.
- එම විෂය ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධය දේශපාලන ලෝකය පිළිබඳ විචාරාත්මක ව සිතීමට ආධාර කර ගනියි.

**හැඳින්වීම :-**

දේශපාලන අධ්‍යයනය ශතවර්ෂ 24ක පමණ කාලයක් පුරා වර්ධනය වූ සහ විකාශනය වූ ශාස්ත්‍රීය ශික්ෂණයකි. දේශපාලන විද්‍යා විෂයයේ වර්තමාන අන්තර්ගතය හඳුනාගැනීම මෙම පාඩමේ දී සිදු කෙරේ.

සම්භාව්‍ය ග්‍රීක යුගයේ සිට මේ වන තෙක් දේශපාලන අධ්‍යයනය සමන්විත වන ප්‍රධාන උපක්ෂේත්‍රයක් ලෙස දේශපාලන දර්ශනය හඳුන්වා දිය හැකි ය. දේශපාලන ක්‍රියාවලියේ වැදගත් කාර්යයක් ඉටු කරන තවත් සාධකයක් වන්නේ දේශපාලන මතවාද ය. නූතන දේශපාලන සහ සමාජ චින්තනය මඟින්, සමාජයේ සිදුවන සංසිද්ධි එසේ සිදුවන්නේ මන්දැයි පැහැදිලි කරන දේශපාලන න්‍යාය තවත් වැදගත් ක්ෂේත්‍රයක් වෙයි. දේශපාලන විද්‍යා විෂය අන්තර්ගත වන තවත් වැදගත් තේමාවක් වන්නේ දේශපාලන ආයතන යි. විධිමත් හා අවිධිමත් යන වර්ගීකරණ ඔස්සේ මෙම ආයතන හදාරනු ලැබේ. ඒ අනුව මෙම නිපුණතාව දේශපාලන දර්ශනය, දේශපාලන මතවාද, දේශපාලන න්‍යාය හා දේශපාලන ආයතන යන තේමා ඔස්සේ අධ්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ.

**පාඩම් සංවර්ධනය සඳහා මඟ පෙන්වීමක්,**

### 1. දේශපාලන විද්‍යා විෂය සමන්විත ක්ෂේත්‍ර හඳුනාගැනීම.

#### 1.1. දේශපාලන දර්ශනය.

දේශපාලන දර්ශනවාදය ප්‍රධාන තේමා තුනක් පිළිබඳ ව අවධානය යොමු කරයි.

(අ) දේශපාලන විග්‍රහයේ භාවිත කරන සංකල්පවල අර්ථනිරූපණය පැහැදිලි කිරීම.
උදාහරණ :- රාජ්‍යය, බලය, පුරවැසි භාවය, නිදහස, අයිතිවාසිකම් සමානාත්මතාව.

(ආ) දේශපාලනය පිළිබඳ ඇති මූලික ප්‍රශ්න මතු කරමින් ඒවා ගවේෂණය කිරීම.
උදාහරණ :- රාජ්‍යය යනු කුමක් ද? රාජ්‍යයක් අවශ්‍ය වන්නේ ඇයි? රාජ්‍යයේ සම්භවය කෙසේ වී ද? දේශපාලනය යනු කුමක් ද?

(ඇ) දේශපාලන ක්‍රියාකාරිත්වය ,දේශපාලන ආයතන, රාජ්‍ය ප්‍රතිපත්ති යන මේවාට මඟ පෙන්වන ප්‍රතිමානීයක නිෂ්ඨාවන් යෝජනා කිරීම.

උදාහරණ :- නිදහස, සමානාත්මතාව, සාධාරණත්වය, පොදු යහපත, සමාජ විමුක්තිය.

සම්භාව්‍ය ග්‍රීක යුගයේ සිට වර්තමානය තෙක් දේශපාලන දර්ශනවාදීන් උනන්දුවක් දක්වා ඇති තේමා කිහිපයක් ලෙස යුක්තිය, සාධාරණත්වය, අයිතිවාසිකම්, නිදහස, සමානාත්මතාව, දේශපාලන විමුක්තිය සහ රාජ්‍යයේ ස්වභාවය හා අරමුණු යන මේවා ඉදිරිපත් කළ හැකි ය. කෙසේ වෙතත් මෙම තේමා පිළිබඳ ව දේශපාලන දාර්ශනිකයන් අතර පොදු ඒකමතික භාවයක් නොමැති අතර, ඒවා සාකච්ඡාවට, විවාදයට සහ මතභේදයට ලක් වෙමින් හුදු සදාතන සංකල්පමය ප්‍රභේද වශයෙන් පවතී.

දේශපාලන දර්ශනවාදීන් උනන්දුව දක්වා ඇති තේමා සහ ඒවා ගවේෂණය කළ දේශපාලන දාර්ශනිකයන් පිළිබඳ සරල අවබෝධයක් පහත වගුවෙන් ලබාගත හැකි ය.

| **තේමාව** | **සම්භාව්‍ය/මධ්‍යකාලීන සහ මුල් නූතන දේශපාලන දාර්ශනිකයෝ** | **සමකාලීන දේශපාලන දාර්ශනිකයෝ** |
|---|---|---|
| යුක්තිය/ සාධාරණත්වය | ප්ලේටෝ, ඇරිස්ටෝටල්, සාන්ත ඔගස්තීන්, සාන්ත ඇක්වයිනාස්, තෝමස් හොබ්ස්, ඩේවිඩ් හියුම්, ඉම්මානුවෙල් කාන්ට්, රූසෝ, ජෝන් ස්ටුවර්ට් මිල්, කාල් මාක්ස් | ජෝන් රෝල්ස්, රොබට් නොසික්, මයිකල් සැන්ඩල්, මාර්තා නස්බවුම්, මහත්මා ගාන්ධි |
| සමානත්වය | ඇරිස්ටෝටල් හොබ්ස්, ජෝන් ලොක්, රූසෝ , මිල්, මාක්ස්, ඇලෙක්සි ද තොක්විල්, හර්බට් ස්පෙන්සර්, හියුගෝ ග්‍රෝෂියස්, ඉම්මානුවෙල් කාන්ට්, මිල්, මාක්ස් | මහත්මා ගාන්ධි, මයිකල් වෝල්ට්සර්, චාල්ස් ටේලර්, රොනල්ඩ් ඩ්වෝකින් |
| අයිතිවාසිකම් | කාන්ට්, ද තොක්විල්, ලොක්, හියුම්, ඇඩම් ස්මිත්, මාක්ස්, මොන්ටෙස්කියු | අයිසයා බර්ලින්, රොනල්ඩ් ඩ්වෝකින්, ජෝන් රෝල්ස්, චාල්ස් ටේලර් |
| නිදහස | ප්ලේටෝ, ඇරිස්ටෝටල් හොබ්ස්, ලොක්, මාක්ස්, ජෙරමි බෙන්තම් | අයිසයා බර්ලින්, ෆෙඩ්රික් හයෙක්, ජෝන් රෝල්ස්, පිලිප් පෙටිට් |
| දේශපාලනයේ ස්වභාවය | ප්ලේටෝ, ඇරිස්ටෝටල්, සාන්ත ඔගස්තීන්, මැකියාවෙල්ලි, හොබ්ස්, ලොක්, රූසෝ, කාන්ට්, හේගල්, මාක්ස් | සී රයිට් මිල්ස්, යර්ගන් හබර්මාස්, චාල්ස් ටේලර්, මිෂෙල් ෆූකෝ |
| රාජ්‍යයේ ස්වභාවය | හොබ්ස්, ලොක්, රූසෝ, මැකියාවෙල්ලි, මාක්ස් | ජෝන් රෝල්ස්, යර්ගන්, හබර්මාස්, චාල්ස් ටේලර් |

19 වන සියවස දක්වා යුරෝපයේ දර්ශනවාදයට දේශපාලන විග්‍රහයේ ඉහළ ම ස්ථානයක් හිමි වුව ද විසි වැනි සියවස මැද භාගයේ එය යම් පසුබෑමකට ලක් විය. එසේ වූයේ අනුභූතිවාදි/ප්‍රත්‍යක්ෂ මූලවාදී දේශපාලන විද්‍යා ප්‍රවේශය නැගීමේ පසුබිමෙහි ය. එසේ වුවත් 1970 දශකයේ මුලදී යළිත් දේශපාලන විද්‍යාවේ දර්ශනවාදයට ඇති අවධානය ඉස්මතු වන්නට විය. එයින් දේශපාලන විද්‍යා විග්‍රහයේ නැති වූ කීර්තිය සහ ස්ථානය යළිත් ලැබෙන්නට විය. එම වෙනස ඇතිවූයේ 1971 දී පළ වූ ඇමරිකානු දේශපාලන දාර්ශනික ජෝන් රෝල්ස් ගේ *A Theory of Justice* (**යුක්තිය පිළිබඳ න්‍යායයක්**) නම් ග්‍රන්ථය හේතු කොට ගෙන යි. ඒ සමඟ දාර්ශනිකයන්, දේශපාලන විද්‍යාඥයන් හා සමාජන්‍යායවේදීන් අතර ඇති වූ සාකච්ඡා හා විවාද දේශපාලන දර්ශනවාදය යළි ඔසවා තැබීමට පාදක විය.

## 2. 2 දේශපාලන මතවාද

- ලිබරල්වාදය, සමාජවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, පැසිස්ට් වාදය, රාජ්‍ය සුභසාධන වාදය, නව ලිබරල් වාදය, ජාතික වාදය, වැනි දේශපාලන මතවාද ලෝක දේශපාලනයෙහි ලා විශාල කාර්යභාරයක් ඉටු කළ ඒවා ය.

- දේශපාලන මතවාදයක් යනු සමාජයේ දේශපාලනයට බලපෑම් කරන, දේශපාලන ක්‍රියාකාරිත්වයට හා ගමනට මඟ පෙන්වන, සමාජයේ විශාල ජන කොටසක් ආකර්ෂණය කර ගැනීමට සමත් වන, දේශපාලන මතිමතාන්තර හා විශ්වාස ආදියෙන් සමන්විත නිශ්චිත අදහස් සමුච්චයකි. ඕනෑ ම දේශපාලන මතවාදයක්

  - ⋆ එකිනෙකට සංගත අදහස් මාලාවකින් සමන්විත වේ.
  - ⋆ සමාජයේ යම් යම් කොටස්වල දේශපාලන විඥානය, විශ්වාස සහ ඉදිරි දැක්ම හැඩ ගැස්වීමට ද සමත් වේ.
  - ⋆ සමාජ කොටස් දේශපාලන ක්‍රියාකාරිත්වයට යොමු කිරීමේ හැකියාව ද සහිත ය.
  - ⋆ මෙය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කළ හැකි.

### I ලිබරල් වාදය -

- දේශපාලන මතවාදයක් ලෙස ලිබරල්වාදයේ ප්‍රධානතම මූලධර්මය වන්නේ පෞද්ගලික නිදහස යි. පෞද්ගලික නිදහස, සමාජයේ නිදහසේ මුල් ගල බවත්, එය ආර්ථික, සමාජ, සංස්කෘතික යන ක්ෂේත්‍රවල දී මූලික මූලධර්මය විය යුතු බවත් ලිබරල් වාදය විශ්වාස කරයි.

- ලිබරල් වාදය ඓතිහාසික වශයෙන් වර්ධනය වූයේ යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදය බිහි වීමේ පසුබිමෙහි ය.

- නිදහස් වෙළඳපොළ පිළිබඳ ලිබරල්වාදී ආර්ථික මූලධර්මය ''නිදහස'' පිළිබඳ ලිබරල්වාදී තේරුම් ගැනීම සමඟ බද්ධ වී තිබිණ. දේශපාලන ක්ෂේත්‍රය ද ''නිදහස්'' එකක් විය යුතු ය යන ලිබරල් දේශපාලන මතවාදය, පසු ව ප්‍රජාතන්ත්‍රවාදය සමඟ බද්ධ විය. ''ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය'' යන්න බිහි වූයේ ඒ වෙතිනි.

- වර්තමාන ලෝකයේ දේශපාලන ආයතන, මූලධර්ම සහ භාවිතයන් හැඩ ගැස්වීමට ලිබරල් දේශපාලන මතවාදය ප්‍රධාන සාධකයක් වී තිබේ. එලෙස ලිබරල් වාදයේ ආභාසයෙන් ගොඩ නැගුණු ආයතන, මූලධර්ම සහ භාවිත මෙසේ ය.

  ආයතන - පාර්ලිමේන්තුව, ජනමාධ්‍ය, නිදහස් අධිකරණය, සීමිත බලතල සහිත ආණ්ඩුව.

මූලධර්ම - පුද්ගල නිදහස, බලතල වෙන් කිරීම, සංවරණ සහ තුළන ක්‍රම, නීතියේ ආධිපත්‍යය, මූලික අයිතිවාසිකම්, පෞද්ගලික දේපළ අයිතිය.

භාවිත - නිදහස් මැතිවරණ, පුරවැසි අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ රාජ්‍යයේ වගකීම, පුද්ගල නිදහස සහතික කිරීම, රාජ්‍යය ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයේ අවම ලෙස මැදිහත් වීම, ආගම සහ රාජ්‍යය වෙන් කිරීම. දේශපාලන බලයට සීමා පැමිණවීම.

II **සමාජවාදය** -

- 19 වැනි සියවසේ දෙවන භාගයේ ආරම්භ වූ සමාජවාදය විසි වැනි සියවසේ දී ප්‍රබල දේශපාලන මතවාදයක් ලෙස පැතිරිණ. එය බිහි වූයේ ලිබරල්වාදයට සහ ධනවාදයට විවේචනයක් මෙන් ම විකල්පයක් ද වශයෙනි.

- 19 වැනි සියවසේ මුල් භාගයේ දී ප්‍රංශය, ජර්මනිය හා බ්‍රිතාන්‍යය යන රටවල, කාර්මික විප්ලවයත් සමඟ ඇති ව තිබූ සමාජ ආර්ථික විෂමතා ඉදිරියේ, සමාජවාදයෙන් ඉදිරිපත් වූ ප්‍රධාන අදහස නම් සමාජ සමානත්වය සහ දේපළවල පොදු සමාජීය අයිතිය යි.

- එම මූලික අදහස තව දුරටත් වර්ධනය වෙමින් ''සමාජවාදය'' යන්න ප්‍රබල මතවාදයක් බවට පත් කරන ලද්දේ මාක්ස්වාදය විසිනි. සමාජවාදය පිළිබඳ ව මාක්ස්වාදය ඉදිරිපත් කළ ප්‍රධාන ප්‍රවාදය වූයේ, සැබෑ සමාජවාදය ඇති කළ හැක්කේ ධනවාදී ක්‍රමය පෙරළා දමා, කම්කරු පන්තිය, පාලක පන්තිය බවට පත් කරන සමාජවාදී විප්ලවයකින් ය යන්න යි.

  විසි වැනි සියවසේ දේශපාලනයෙහිලා සමාජවාදය ප්‍රධාන කාර්ය හතරක් ඉටු කෙළේ ය.
  - (අ) නිදහස, සමානත්වය සහ සමාජ-දේශපාලන විමුක්තිය පිළිබඳ ලිබරල්වාදී මතවාදයට ප්‍රබල විකල්පයක් ගොඩ නැඟීම.
  - (ආ) ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයට විකල්ප වශයෙන් සමාජවාදී රාජ්‍යය පිළිබඳ ඉදිරි දැක්මක් ඉදිරිපත් කිරීම.
  - (ඇ) ධනවාදය හා බැඳුණු සූරාකෑම, සමාජ පීඩනය හා සමාජ අසමානතාව පිළිබඳ ව දැඩි විවේචනයක් ඉදිරිපත් කරමින්, පීඩිත ජන කොටස්වල සමානත්වය, අයිතිවාසිකම් හා සමාජ විමුක්තිය පිළිබඳ තේමාව දේශපාලන චින්තනයේ කේන්ද්‍රය වෙතට ගෙන ඒම.
  - (ඈ) යුරෝපීය මෙන් ම යුරෝපීය නොවන ලෝකයේ ද සමාජ /දේශපාලන නිදහස සඳහා වූ බහුජන ව්‍යාපාරවලට මඟ පෙන්වූ ප්‍රබල දේශපාලන මතවාදයක් වීම.

III **ජාතිකවාදය** -

- දහවැනි සියවසේ පටන් ලෝකය පුරා පැවතුණු ප්‍රබලතම මතවාදයකි.

- පළමුවෙන් යුරෝපයෙන් මතු වී පසු ව ආසියානු, අප්‍රිකානු සහ ලතින් ඇමරිකානු රටවල ප්‍රබල දේශපාලන මතවාදයක් බවට පත් විය.

- දේශපාලන මතවාදයක් ලෙස ජාතිකවාදය ඉටු කර ඇති සහ තව මත් ඉටු කරන කාර්ය රැසක් වේ.
  - (අ) රාජ්‍යයක් ලෙසට සංවිධානය විය හැකි පොදු අනන්‍යතාවක් ඇති දේශපාලන ප්‍රජාවක් ලෙසට තමන් ගැන ම පරිකල්පනය කිරීමේ මතවාදීය හා සංකල්පීය රාමුව ප්‍රජාවන්ට සපයන්නේ ජාතිකවාදය යි. භාෂාව, ආගම, සංස්කෘතිය සහ භූමි ප්‍රදේශය,

එලෙස පොදු ප්‍රජාවක් හැටියට තමන් ගැන ම පරිකල්පනය කිරීමට ප්‍රජාවලට ඉඩ සලසන අනන්‍යතා සාධක ය.

(ආ) නූතන ජාතික රාජ්‍යය (Nation State) මූලික වශයෙන් හැඩගැසී තිබෙන්නේ ජාතිකවාදය විසින් ජාතිය සහ රාජ්‍යය පරිකල්පනය කර ඇති ආකාරය අනුව ය. භෞමික ඒකාග්‍රතාව, සංස්කෘතික ඒකත්වය, ජාතිය සහ රාජ්‍යය එකට සමපාත විය යුතු ය යන නූතන රාජ්‍යයේ පදනම් වාදී මූලධර්ම හැඩගැසී තිබෙන්නේ ජාතිකවාදී දේශපාලනයේ විවිධ ප්‍රකාශයන් ලෙස ය.

- මේ අනුව පෙනී යන කරුණක් නම්, දේශපාලන මතවාද සමාජයේ දේශපාලන චින්තනය, විඥානය සහ භාවිතය සමඟ සමීප ව බැඳී තිබෙන්නා වූත්, දේශපාලන ආයතන සහ දේශපාලන පරිවර්තනයේ ගමන් මඟ හැඩ ගැස්වීමට දායක වන්නා වූත් තීරණාත්මක දේශපාලන සාධයක් වන බව යි.

## 2. 3. දේශපාලන න්‍යායය

නූතන දේශපාලන සහ සමාජ චින්තනයේ "න්‍යාය" යන සංකල්පය සාමාන්‍යයෙන් භාවිත වන්නේ සමාජයේ සිදුවන සංසිද්ධි එසේ සිදු වන්නේ මන්දැයි පැහැදිලි කිරීමට සහ විග්‍රහ කිරීමට ශාස්ත්‍රඥයන් භාවිත කරන විධික්‍රමික මෙවලමක් හැටියට ය. පහත සඳහන් උදාහරණ වලින් එය තේරුම් ගත හැකි ය.

| සිදුවීම | අධ්‍යයන ක්ෂේත්‍රය | න්‍යායය |
|---|---|---|
| අවකාශයට ඇතුළුවන ද්‍රව්‍ය වස්තුවක් මහ පොළොව මතට පතිත වන්නේ ඇයි? වෙනත් දිශාවක ගමන් නොකරන්නේ ඇයි? | භෞතික වාදය | ගුරුත්වාකර්ෂණ න්‍යායය |
| වෙළෙඳපොළේ භාණ්ඩ හිගවන විට ඒවායේ මිල ඉහළ යන්නේ ඇයි? | ආර්ථික විද්‍යාව | ඉල්ලුම සැපයුම පිළිබඳ න්‍යායය |
| සමාජ ආර්ථික පරිවර්තන සිදුවන විට සමහර සමාජකොටස් අතර ක්‍රම විරෝධී හැඟීම් සහ කැරලි ඇති වන්නේ ඇයි? | දේශපාලන විද්‍යාව | සාපේක්ෂ විහීනතා න්‍යායය (Relative deprivation theory) |

විද්‍යාවේ "න්‍යායය" යනුවෙන් හඳුන්වන දෙය කෙටි සංකල්පයක් බවට සූත්‍රගත කළ හැකි, හේතුඵල සම්බන්ධතාවේ තර්කණය අනුව ගොඩනගන විද්‍යාත්මක ප්‍රකාශයකි. විද්‍යාත්මක න්‍යාය සාමාන්‍යයෙන් ඉටු කරන කාර්යය නම්, ස්වාභාවික හෝ සමාජ හෝ දේශපාලන හෝ ලෝකයේ, අප නිරීක්ෂණය කරන සිදුවීම් එක එකක් ගැන නො ව, ඒවා සමන්විත වන අංග රාශියක්, එනම් සමස්ත ප්‍රපංචය, ගැන විග්‍රහ කිරීම් ඉදිරිපත් කිරීම යි. මේ අනුව න්‍යායයක් යනු ලෝකයේ සිදුවන පොදු ප්‍රපංචයන් ගැන පැහැදිලි කිරීමට විද්‍යාඥයන් භාවිත කරන ශාස්ත්‍රීය මෙවලමකි. න්‍යාය ගොඩනැගීම ස්වාභාවික මෙන් ම සමාජීය විද්‍යාවන්ගේ එක් වැදගත් කාර්යයකි. දේශපාලන විද්‍යාවේ න්‍යාය යන සංකල්පයට අර්ථ දෙකක් තිබේ.

1 ප්‍රතිමානීය න්‍යායය (Normative Theory)
2 විද්‍යාත්මක න්‍යායය (Scientific Theory)

★ ප්‍රතිමානීය න්‍යායය යනු දේශපාලන දර්ශනය සහ දේශපාලන චින්තනය සමඟ අනන්‍ය වී ඇති න්‍යායය යි. එය ප්ලේටෝගේ සිට වර්තමානය පවතින දේශපාලන දර්ශන සම්ප්‍රදායය සමඟ සම්බන්ධ වී ඇත. එම සම්ප්‍රදායය දේශපාලන න්‍යාය ලෙස ඉදිරිපත් කර තිබෙන්නේ ප්‍රධාන වශයෙන් ම දේශපාලනය, රාජ්‍යය, දේශපාලන බලය, ආණ්ඩුකරණය හා රාජ්‍ය ප්‍රතිපත්ති කෙසේ විය යුතු දැයි යෝජනා කරන සෛද්ධාන්තික මූලධර්ම ය (axiomatic principles). රාජ්‍යය පිළිබඳ ඇරිස්ටෝටල්ගේ න්‍යායය, සමාජ ගිවිසුම පිළිබඳ හොබ්ස්ගේ හා ලොක්ගේ න්‍යායය, බලය පිළිබඳ ලිබරල්වාදී න්‍යායය යන මේවා ප්‍රතිමානීය න්‍යාය පිළිබඳ සම්භාව්‍ය උදාහරණ යි.

- ඒ සඳහා විසිවැනි සියවසේ උදාහරණ වන්නේ යුක්තිය පිළිබඳ ව ජෝන් රෝල්ස්ගේ න්‍යායය, සමූහාණ්ඩුවාදී නිදහස පිළිබඳ ව පිලිප් පෙටිත්ගේ න්‍යාය, මහජන පරිමණ්ඩලය පිළිබඳ හබර්මාස්ගේ න්‍යාය යන මේවා ය.

- **විද්‍යාත්මක න්‍යායය**

  - දේශපාලන විද්‍යාවට විද්‍යාත්මකත්වය පිළිබඳ න්‍යායාත්මක අදහස එකතුවූයේ 1930 දශකයේ ය. එය සමාජීය විද්‍යාවන්ගේ ''විද්‍යාත්මක හැරීම'' පිළිබඳ පසුබිමෙනි. මෙම විද්‍යාත්මක වාදී සමාජීය විද්‍යා සම්ප්‍රදායෙහි දී න්‍යායය යන්න අර්ථකථනය කරනු ලැබූයේ, ස්වාභාවික විද්‍යා සම්ප්‍රදායෙහි දී න්‍යාය සංකල්පගත කළ ආකාරයට ම ය. එනම්, න්‍යායයේ කාර්යය වන්නේ ලෝකයේ සිදුවන දේ එසේ සිදුවන්නේ මන්දැයි එසේ සිදුවන නීතියකට අනුව පැහැදිලි කිරීම ය. න්‍යායය යනු එවැනි නීති ගොඩනැගීමකි. ඒ අනුව න්‍යායයක් යනු ස්වාභාවික හෝ සමාජ හෝ ලෝකයේ සිදුවන දේ පැහැදිලි කිරීමේ නීතියකි. විද්‍යාඥයන් තම පරීක්ෂණ මගින් න්‍යාය ගොඩ නගන්නේය යන්නෙහි අරුත ආනුභාවික දත්ත සහ සාක්ෂ්‍ය නිරීක්ෂණයට සහ විශ්ලේෂණයට භාජනය කර ''නීති'' පද්ධති ගොඩ නැගීම යි.

    - සමාජීය විද්‍යාවේ ප්‍රත්‍යක්ෂ මූලවාද රාමුව ඇතුළත ගොඩනැගුන බැවින් දේශපාලන විද්‍යාවේ මෙම න්‍යායික ධාරාව හඳුන්වන්නේ ප්‍රත්‍යක්ෂ මූලවාදී දේශපාලන විද්‍යා න්‍යායය (Pasitivist Political Theory) යනුවෙනි. චර්යාවාදය, තුළනාත්මක දේශපාලන විද්‍යා විග්‍රහය, දේශපාලන නවීකරණය, හා දේශපාලන ක්‍රම පද්ධති යන 1930 දශකයෙන් පසු ව බිහි වූ දේශපාලන විද්‍යා ප්‍රවේශ දේශපාලන න්‍යාය යන්න දුටුවේ මෙම පර්යාලෝකය ඔස්සේ ය.

    - වර්තමාන දේශපාලන විද්‍යාවේ අප ඉහත දක්වූ ප්‍රතිමානීය සහ විද්‍යාත්මක යන ප්‍රවේශ දෙක ම භාවිත වේ. මේ අතර විසිවැනි සියවසේ පැවැති සහ සමකාලීන ව පවත්නා දේශපාලන විද්‍යාව න්‍යායික ක්ෂේත්‍ර, ප්‍රවේශ හා මතධාරා ගණනාවකින් ම සමන්විත එකක් බව ද අපට නිරීක්ෂණය කළ හැකි ය. එවැනි ප්‍රධාන න්‍යායික ධාරා වන්නේ පහත සඳහන් ඒවා ය.

(අ) ලිබරල් දේශපාලන න්‍යායය
(ආ) සමූහාණ්ඩුවාදී දේශපාලන න්‍යායය
(ඇ) මාක්ස්වාදී දේශපාලන න්‍යායය
(ඈ) පශ්චාත් - මාක්ස්වාදී දේශපාලන න්‍යායය
(ඉ) දේශපාලන නවීකරණ න්‍යායය
(ඊ) ස්ත්‍රීවාදී දේශපාලන න්‍යායය

(උ) පශ්චාත් - නූතනවාදී/පශ්චාත් ව්‍යූහවාදී දේශපාලන න්‍යායය
(ඌ) පශ්චාත් - යටත්විජිතවාදී දේශපාලන න්‍යායය

## 2.4. දේශපාලන ආයතන

දේශපාලනය අධ්‍යයනය කිරීමේදී අප දේශපාලන ආයතන ගැන උනන්දුව දක්වන්නේ සමාජයේ දේශපාලනය විවිධ ආකාරයෙන් ආයතනගත වී ඇති නිසා සහ බොහෝ දේශපාලන ක්‍රියාදාම සහ භාවිත දේශපාලන ආයතන ආශ්‍රිත ව සකස් වී ඇති නිසාත් ය. ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව, දේශපාලන විද්‍යාව හා නීතිය යන ශාස්ත්‍රීය ක්ෂේත්‍ර ගණනාවක් ම "ආයතන" අධ්‍යයනය තම ශික්ෂණයට වැදගත් කොට සලක යි.

ආයතන ගැන අධ්‍යයනය කිරීමේ දී දැකිය හැකි දෙයක් නම් ඒවා නීතිරීති, රෙගුලාසි, චර්යා පද්ධති යන මේවායින් සමන්විත සංවිධාන බව යි. ඒ අතර සමාජයේ පවත්නා ආයතන යම් යම් නිශ්චිත අරමුණු සඳහා ගොඩ නැඟී ඇති සංවිධාන ද වෙයි.

- සමාජයේ පවත්නා ආයතන, විධිමත් (formal) සහ අවිධිමත් (Informal) යනුවෙන් වර්ගීකරණය කළ හැකි ය.

    - ⋆ පාසල්, විශ්ව විද්‍යාල, නගර සභා, පාර්ලිමේන්තුව යන මේවා විධිමත් ආයතන වේ. ඒවා නිශ්චිත නීතිරීති, රෙගුලාසි, පිරිස් සහ ගොඩනැගිලි යන මේවායින් සමන්විත දෘශ්‍යමාන ව පවතින ආයතන යි.

    - ⋆ පවුල, ඥාතිත්වය, කුල, පන්ති, පිතෘ මූලිකත්වය සමාජයේ පවත්නා වැදගත් ආයතන වුවත් ඒවා පවතින්නේ අවිධිමත් ස්වභාවයකිනි. ඒවා අප ඉදිරියේ භෞතික වශයෙන් දෘශ්‍යමාන ව නැතත් අපට ඒවායේ පැවැත්ම, ක්‍රියාකාරිත්වය හා ප්‍රතිඵල සංජානනය කළ හැකි ය.

- දේශපාලන අධ්‍යයනයට අදාළ වන ප්‍රධාන පෙළේ ආයතන හතරක් ගැන මෙම පාඩමේ දී සාකච්ඡා කළ යුතු ව ඇත. ඒවා නම් රාජ්‍යය හා ආණ්ඩුව, දේශපාලන පක්ෂ, බලපෑම් කණ්ඩායම් සහ සිවිල් සමාජය වේ.

### 2.4.1. රාජ්‍ය හා ආණ්ඩුව දේශපාලන ආයතන වශයෙන්

- ඕනෑ ම සමාජයක පවතින මූලික සහ කේන්ද්‍රීය දේශපාලන ආයතන වන්නේ රාජ්‍ය සහ ආණ්ඩුව යි. සමාජයේ ඇති අනෙක් බොහෝ දේශපාලන ආයතන ප්‍රභවය ලබන්නේ ද රාජ්‍යය සහ ආණ්ඩුව වෙතිනි.

    නිදසුන් - පාර්ලිමේන්තුව, කැබිනට් මණ්ඩලය, අධිකරණය, පළාත් පාලන ආයතන, සන්නද්ධ හමුදා, පොලීසිය, සිරගෙවල්, පාසල්, විශ්ව විද්‍යාලය, දෙපාර්තමේන්තු යනාදිය.

- රාජ්‍යය සහ ආණ්ඩුව එකිනෙකට සම්බන්ධ වුවත්, ඒ දෙක එකක් ම නොවේ. නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල රාජ්‍යය යනු සාපේක්ෂ වශයෙන් දීර්ඝකාලයක් ස්ථාවර ව පැවති සමාජයේ ඇති අතිමූලික දේශපාලන සංවිධානය යි. ආණ්ඩුවක් යනු රාජ්‍යයේ කටයුතු සහ වගකීම් ඉටු කිරීම සඳහා මහජනතාව විසින් කෙටි කාලයකට බලය ලබා දෙනු ලබන සංවිධානය යි.

- පූර්ව-ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල රාජ්‍ය හා ආණ්ඩුව අතර මේ වෙනස නොපැවතිණි.

  නිදසුන් - රාජාණ්ඩු ක්‍රමවල මහජනතාව තෝරාගත් ආණ්ඩුවක් නොතිබුණ අතර, රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙන් කිරීමක් ද නොතිබිණි. රජතුමා රාජ්‍යය ද, ආණ්ඩුව ද විය.

- රාජ්‍යය සහ ආණ්ඩුව අතර ආයතනික වෙන් වීම යුරෝපයේ වැඩවසම් දේශපාලන ව්‍යුහය හා රාජාණ්ඩුව බිඳවැටුණාට පසු බිහි වූ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයක් විය.

- දේශපාලන ආයතනයක් ලෙස රාජ්‍යය වනාහි මනා ව සංවිධානය වී තිබෙන්නකි. නූතන රාජ්‍ය සංවිධානය වී තිබෙන්නේ නිශ්චිත භූගෝලීය/භෞමික ප්‍රදේශයක ය. රාජ්‍යයට නිශ්චිත දේශ සීමා තිබේ. නිශ්චිත භෞමික ඒකකයක් තුළ දේශපාලන වශයෙන් සංවිධානය වී සිටින පුරවැසි ප්‍රජාවක් මත තම ආධිපත්‍යය සහ බලය පවත්වා ගැනීමේ අයිතියක් සහ අධිකාරයක් ද රාජ්‍යයට තිබේ. එය දේශපාලන විද්‍යාවේ හඳුන්වන්නේ ''ස්වාධිපත්‍ය බලය'' යනුවෙනි. මේ අධිකාරි බලය පවත්වා ගැනීමට තවත් ආයතන ගණනාවක් ම රාජ්‍යයට ඇත. ආණ්ඩුව එයින් එක ආයතනයකි.

- දේශපාලන ආයතනයක් වශයෙන් රාජ්‍යයට මූලික නෛතික ව්‍යුහයක් තිබේ. එය නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යි. රාජ්‍යයේ ස්වභාවය, ව්‍යුහය, ආයතනික සංයුතිය යන මේවා තීරණය කර ඇත්තේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙනි. එමෙන් ම තම අධිකාරි බලය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍යය සතු ප්‍රධානතම ආයතන නම් ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය, සන්නද්ධ හමුදා සහ නිලධර තන්ත්‍රයයි. ඒ හැම උපආයතනයක ම ඒවාට නිශ්චිත නීති, රීති, රෙගුලාසි පිරිස් බල යන මේවා ද ඇත.

- දේශපාලන ආයතනයක් ලෙස ආණ්ඩුව ක්‍රියා කරන්නේ රාජ්‍යයේ බලතල ක්‍රියාත්මක කරන ප්‍රධානතම නියෝජිත ආයතනය වශයෙනි. නීති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම, මහජනයා සමඟ සම්බන්ධතා පැවැත්වීම සහ අනෙකුත් රාජ්‍යයන් සමඟ සම්බන්ධතා පැවැත්වීම යනු රාජ්‍යය වෙනුවෙන් ආණ්ඩුව ඉටු කරන ප්‍රධාන කාර්ය ය.

- එකිනෙකට වෙනස් වුවත්, එකිනෙක සමඟ සම්බන්ධ ආයතනික සමස්තයක් හැටියට ගත් විට, රාජ්‍යය සහ ආණ්ඩුව සංවිධානය වී තිබෙන ආකාරය තේමා හතරකට බෙදිය හැකි ය.

  1. ව්‍යවස්ථාදායක ආයතනය - පාර්ලිමේන්තුව, සන්ධීය ව්‍යවස්ථායක මණ්ඩල, පළාත් සභා.
  2. විධායක ආයතන - කැබිනට් මණ්ඩලය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, නිලබල ක්‍රමය.
  3. අධිකරණ ආයතන - ශ්‍රේෂ්ඨාධිකරණයේ සිට පහළට විහිදෙන අධිකරණ පද්ධති
  4. ආරක්ෂක, නීතිය හා සාමය පිළිබඳ ආයතන - සන්නද්ධ හමුදා, පොලීසිය, බන්ධනාගාර

- රාජ්‍යය දේශපාලන විද්‍යා විග්‍රහයේ අතිශයින් ම කේන්ද්‍රීය තේමාව ද පැරණිතම තේමාව ද වේ. ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ සිට අද වන දේශපාලන විග්‍රහයේ ''රාජ්‍යය'' යන්න ගවේෂණය කර අවසන් නොවන තේමාවකි.

- දේශපාලන දාර්ශනිකයන් හා න්‍යායය වේදීන් රාජ්‍යය පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානයට ලක්කර ඇති තේමා මෙපරිදි ය.

  (අ) රාජ්‍යයේ ස්වභාවය
  (ආ) රාජ්‍යයේ සම්භවය
  (ඇ) රාජ්‍යයේ අරමුණ
  (ඈ) රාජ්‍යයේ බලය සහ ස්වාධිපත්‍ය බලය
  (ඉ) රාජ්‍යය සහ පුරවැසියා/සමාජය
  (ඊ) රාජ්‍යය බලයේ සීමා
  (උ) රාජ්‍යයේ පරිවර්තන සහ මාදිලි

- මේ අතර ''ආණ්ඩුව'' යනුවෙන් අද අප තේරුම් ගන්නා අර්ථයෙන් ආණ්ඩුව ගැන කරන සාකච්ඡා, සම්භාව්‍ය දේශපාලන චින්තනයේ නැත. බොහෝ විට ආණ්ඩුව හා රාජ්‍යය එක ම අර්ථයකින් භාවිත කර තිබේ. එයට හේතුව අප ඉහත දී කියූ පරිදි රාජ්‍යය හා ආණ්ඩුව වෙන් කිරීම, 18 වැනි සියවසෙන් පසු සිදු වූ වර්ධනයක් වීම ය.

- දේශපාලන විද්‍යා සාහිත්‍යයේ ''ආණ්ඩුව'' යන තේමාව බහුලව අධ්‍යයනය කර තිබෙන්නේ, වෙන් වෙන් ආණ්ඩු ක්‍රම මාදිලීන් හඳුනා ගැනීමට සහ එම ආණ්ඩුක්‍රම තුලනාත්මක ව හැදෑරීමට ය. දේශපාලන විද්‍යාවේ හඳුනාගෙන සහ අධ්‍යයනය කර ඇති එවැනි ආණ්ඩු පහත සඳහන් පරිදිය.

  (අ) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු
  (ආ) ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආණ්ඩු
  (ඇ) පූර්ව-ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු
  (ඈ) සමූහාණ්ඩුවාදී ආණ්ඩු
  (ඉ) ඒකීයවාදී ආණ්ඩු
  (ඊ) සන්ධීයවාදී ආණ්ඩු
  (උ) සභාග ආණ්ඩු
  (ඌ) ධනවාදී ආණ්ඩු
  (එ) සමාජවාදී ආණ්ඩු
  (ඒ) පශ්චාත්-සමාජවාදී ආණ්ඩු

### 2.4.2. දේශපාලන පක්ෂ

- දේශපාලන පක්ෂ නූතන දේශපාලනයේ, විශේෂයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ, නැති ව ම බැරි අංගයකි.

- දේශපාලන පක්ෂ දීර්ඝ ඉතිහාසයකට හිමිකම් නොකියයි.

- යුරෝපයේ සහ ඇමරිකාවේ දේශපාලන පක්ෂ බිහි වූයේ 19 වන සියවසේ මැද භාගයේ පටන් ය. ලංකාව, ඉන්දියාව වැනි රටවල විසිවැනි සියවසේ මැද භාගයේ එම ක්‍රියාවලිය ආරම්භ විය.

- එහෙත් දේශපාලනයෙහිලා දේශපාලන පක්ෂ සිදු කරන කේන්ද්‍රීය කාර්යභාරය නිසා ම ඒවා පිළිබඳ ඉතා පුළුල් සහ තව මත් පුළුල් වෙමින් පවතින ශාස්ත්‍රීය සාහිත්‍යයක් දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ නිර්මාණය වෙමින් ඇත.

- දේශපාලන පක්ෂ පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනය අතින් වැදගත් දේශපාලන ආයතන ලෙසට යුරෝපයේ සහ ඇමරිකාවේ දේශපාලන පක්ෂවල කාර්යභාරය තහවුරු වූයේ විසිවැනි සියවස ආරම්භයේ දී ය.

- එම පසුබිමෙහි වූ ප්‍රධාන සාධක 2කි.

  i නියෝජන ආණ්ඩුක්‍රමය ව්‍යාප්ත වීම.
  නියෝජන ආණ්ඩුක්‍රමයේ ප්‍රධානතම ආයතනික යාන්ත්‍රණය හැටියට දේශපාලන පක්ෂවල කාර්යභාරය ඉදිරියට ම පැමිණීම ය.

  ii ඡන්ද බලය ව්‍යාප්ත වීම.
  මීට පෙර අභිලාෂ කණ්ඩායම් (interest groups) ලෙස පැවතුණු දේශපාලන කණ්ඩායම් පුළුල් සාමාජිකත්ව සහ සංවිධාන ව්‍යුහයක් සහිත ව වර්ධනය වීම එයට හේතු විය.

- දේශපාලන පක්ෂයක් යනු

  - මැතිවරණ හෝ වෙනත් මාධ්‍යයක් හෝ මඟින් ආණ්ඩු බලය ලබා ගැනීම අරමුණු කර ගෙන ගොඩනඟා ඇති සංවිධානයකි.

  - ඇන්ඩ්‍රෑ හේවුඩ් , සමාජයේ ඇති දේශපාලන කණ්ඩායම් සහ සමාජ ව්‍යාපාර වලින් දේශපාලන පක්ෂයක් වෙන් කොට හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ හතරක් (Andrew Heywood, *Politics*) දක්වා ඇත.

    ▲ දේශපාලන පක්ෂ උත්සාහ කරන්නේ දේශපාලන බලය ලබාගැනීම මඟින් ආණ්ඩුබලය ක්‍රියාත්මක කිරීමටය.
    ▲ දේශපාලන පක්ෂ "සාමාජික කාඩ්පත" හිමි සාමාජිකයන්ගෙන් සමන්විත වන සංවිධානගත ඒකකයකි.
    ▲ ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අදාළ වන විෂය ගණනාවක් අවධාරණය කරන ප්‍රතිපත්ති රාමුවක් පැවතීම (සමහර විට තනි ප්‍රතිපත්තීමය කරුණක් පමණක් ඉදිරියට දමන කුඩා පක්ෂද පවතී)
    ▲ දේශපාලන පක්ෂයකට ප්‍රතිපත්තීමය සහ මතවාදී අනන්‍යතාවක් පැවතීම (දක්ෂිණාංශික වාමාංශික මධ්‍යස්ථවාදී, ජාතිකවාදී, සුභ සාධනවාදී වශයෙන්).
    ▲ සියවසක කලක් මඳක් ඉක්මවා ගිය ශාස්ත්‍රීය සාහිත්‍යයක් සහිත දේශපාලන පක්ෂ පිළිබඳ අධ්‍යයනයේ දී, දේශපාලන විද්‍යාඥයන් උනන්දුව දක්වා ඇත්තේ පහත සඳහන් තේමා කෙරෙහි ය.

    **1 දේශපාලන පක්ෂ වර්ගීකරණය**

      ▲ කේඩර මත පදනම් වූ පක්ෂ (Cadre parties) සහ බහුජන පදනමක් සහිත පක්ෂ (mass parties)
      ▲ මහජන මතය නියෝජනය කරන පක්ෂ (representative parties) සහ මහජන මතය හැඩගස්වන පක්ෂ (intergrative parties)
      ▲ ව්‍යවස්ථාවාදී පක්ෂ (constitutional) සහ විප්ලවකාරී (revolutionary) පක්ෂ
      ▲ වාමාංශික පක්ෂ සහ දක්ෂිණාංශික පක්ෂ

**2 දේශපාලන පක්ෂවල කාර්ය**

- නියෝජනය (Representation)
- දේශපාලන ප්‍රභූ ස්තර නිර්මාණය කිරීම හා එයට අලුත් කොටස් බඳවා ගැනීම (Elite formation and recruitment)
- සමාජ කණ්ඩායම්වල දේශපාලන අරමුණු සම්පාදනය කිරීම. (setting political goals)
- මහජන ඡන්ද දායක අභිලාෂ දේශපාලන ක්‍රියාවලිය ඇතුළට ගෙන ඒම (interest articulation and aggregation)
- මහජනයා දේශපාලන ක්‍රියාකාරිත්වයට මෙහෙයවීම හා නායකත්වය දීම (mobilization and leadership)
- ආණ්ඩුවේ කටයුතු සංවිධානගත කිරීම.

**3 පක්ෂ ක්‍රම**

- තනි පක්ෂ ක්‍රම.
- ද්වි පක්ෂ ක්‍රම.
- අධිපති තනි පක්ෂ ක්‍රම.
- අධිපති ද්වි පක්ෂ ක්‍රම.
- බහු පක්ෂ ක්‍රම.

**4 පක්ෂ ක්‍රියාකාරිත්වය හා උපක්‍රම**

- දේශපාලන පක්ෂවල මතවාද.
- මැතිවරණ උපාය සහ උපක්‍රම.
- සාමාජිකයන් බඳවා ගැනීම් සහ අරමුදල් ගොඩ නැගීමේ විධි ක්‍රම.
- දේශපාලන පක්ෂවල සමාජ පදනම.
- පක්ෂවල සංවිධාන ව්‍යූහය.
- සේවාදායක-සේවාදායී සම්බන්ධතාව වැනි සමාජ ජාල.

දේශපාලන පක්ෂ ගැන කර ඇති අධ්‍යයන දෙස බලන විට ඉන් බහුතරය යුරෝපය සහ ඇමරිකාව, එනම් දියුණු කාර්මික ධනවාදී සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල අත්දැකීම් මත පදනම් කර ඇති බව පැහැදිලි වේ. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් කෙටි ඉතිහාසයක් ඇති කාර්මික කරණයට හා නවීකරණයට අඩුවෙන් භාජනය වී ඇති සමාජවල පවත්නා දේශපාලන පක්ෂවල ස්වභාවය, ක්‍රියාකාරිත්වය හා ගති ලක්ෂණ වෙනස් ස්වභාවයක් පෙන්නුම් කළ හැකි ය.

නිද :- ලංකාවේ, ඉන්දියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමරිකානු සහ ආසියාතික රටවල මෑත කාලයේ කර ඇති අධ්‍යයනවලින්, මේ වෙනස් වීම්වල ස්වභාවයන් හඳුනාගත හැකි ය.

### 2.4.3. බලපෑම් කණ්ඩායම් (Pressure Groups) :-

★ මේවා යුරෝපීය සහ ඇමෙරිකානු දේශපාලන විද්‍යාවේ විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් වූ දේශපාලන සමාජ කණ්ඩායම් වර්ගයකි.

★ මේ සඳහා ඇමෙරිකාවේ බහුල ව භාවිත වන්නේ අභිලාෂ කණ්ඩායම් (Interest Groups) සහ ලොබි කණ්ඩායම් (Lobbing Groups) යන පද දෙක යි. බ්‍රිතාන්‍යයේ භාවිත කරන්නේ බලපෑම් කණ්ඩායම් යන්න යි. මේ පද තුනේ වචනාර්ථ මෙසේ දැක්විය හැකි ය.

- බලපෑම් කණ්ඩායම් යනු කණ්ඩායමක් හැටියට සංවිධානය වී, නීති, රාජ්‍ය, ප්‍රතිපත්ති, රජයේ තීරණ යන මේවාට බලපෑම් කරන සංවිධානාත්මක පුරවැසි කණ්ඩායම් ය.

- අභිලාෂ කණ්ඩායම් යනු නිශ්චිත අභිලාෂයක්/අරමුණක්/පල ප්‍රයෝජනයක් පදනම් කරගෙන තම සාමාජිකයන්ගේ වුවමනා සහ අභිලාෂ ඉටු කර ගැනීමට ක්‍රියා කරන සංවිධානාත්මක පුරවැසි කණ්ඩායම් ය.

- ලොබි කණ්ඩායම් යනු නීතිය, රාජ්‍ය ප්‍රතිපත්ති හා රජයේ තීරණ ආදියට, බලපෑම් කිරීමට මහජන නියෝජිතයන්, දේශපාලඥයන්, නිලධාරීන් හමු වෙමින්, ඔවුන්ගේ තීරණවලට තමන්ට අවශ්‍ය බලපෑම් සිදු කරන, නැතහොත් වෙනත් සමාජ කණ්ඩායමක් හෝ ආණ්ඩුවක් හෝ වෙනුවෙන් මුදලට එම කාර්යය සිදු කරන සංවිධිත කණ්ඩායම් ය. ලොබි කණ්ඩායම් පුරවැසි කණ්ඩායම් විය හැකි අතර එසේ නොවීමට ද පුළුවන.

  නිදසුන් - ඇමරිකාවේ පුරවැසි කණ්ඩායම් හෝ විදේශ ආණ්ඩු හෝ වෙනුවෙන් ලොබි කණ්ඩායම් කරන, එමඟින් ආදායම් උපයන ව්‍යාපාරික සමාගම්.

★ බලපෑම්, අභිලාෂ සහ ලොබි යන කණ්ඩායම් දේශපාලන විද්‍යා අධ්‍යයනයට වැදගත් වන්නේ, ඒවා නීති සම්පාදනයට, රාජ්‍ය ප්‍රතිපත්තිවලට සහ ආණ්ඩුවල තීරණවලට බලපෑම් කරන, දේශපාලන පක්ෂවලට අමතර ව සහ සමාන්තර ව පවතින ආයතන නිසා ය.

★ මේවා විධිමත් සංවිධාන වන අතර බටහිර රටවල මෙන් ම ලංකාවේ ද තිබෙන්නේ සමිති සමාගම් හැටියට ය. ඒවායේ සාමාජිකයෝ සහ නිලධාරී මණ්ඩල සිටිති. ව්‍යවස්ථා, කාර්යාල, සහ වැටුප් ලබන කාර්ය මණ්ඩල ද සහිත ය.

★ ව්‍යාපාරිකයන්, කර්මාන්ත කරුවන්, ගොවීන්, විධායක නිලධාරීන්, ආගමික කණ්ඩායම්, වෘත්තීය කණ්ඩායම්, ස්ත්‍රීන් ආදි බොහෝ සමාජ කොටස් බලපෑම්/අභිලාෂ/ලොබි කණ්ඩායම් පිහිටුවාගෙන ඇත.

★ ලංකාවෙන් ගත හැකි නිදසුන් -
- සුළු තේ වතු හිමියන්ගේ සංගමය.
- වැවිලි කරුවන්ගේ සංගමය.
- ලංකා වාණිජ මණ්ඩල.
- ලංකා මහිලා සමිතිය.
- රාජ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය.
- සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය.
- පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගමය.

★ දේශපාලන විද්‍යා සාහිත්‍යයේ දී වෘත්තීය සමිති සහ සමාජ ව්‍යාපාර බලපෑම්/අභිලාෂ/ලොබි කණ්ඩායම් ලෙස නොසැලකෙයි. ඒවා වෙන ම ප්‍රභේදයක දේශපාලන ආයතන ලෙස සැලකේ.

★ දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම් අතර ඒවායේ අරමුණු දිනා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් බලන විට ප්‍රධාන වෙනසක් තිබේ.

- දේශපාලන පක්ෂ ආණ්ඩු ඇතුළට ගොස් එ මඟින් රාජ්‍ය ප්‍රතිපත්ති තීරණ ආදියට බලපෑම් කිරීමට උත්සාහ දරති.

- බලපෑම්/අභිලාෂ/ලොබි කණ්ඩායම්වල මූලෝපායය වන්නේ, ආණ්ඩු තුළට නොයා ආණ්ඩුවට පිටතින් සිට ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට හා තීරණවලට බලපෑම් කිරීම ය.

- ඇතැම් බලපෑම් කණ්ඩායම් තනි තේමාවක් මත ගොඩ නැඟී තිබෙන සංවිධාන වේ.

  නිද :- පරිසරය රැකීම, විශ්‍රාමිකයන්ගේ අයිතිවාසිකම් රැකීම, බස් මඟීන්ගේ අයිතීන් සුරැකීම, නිර්යාත වෙළෙඳාමේ යෙදී සිටින සමාගම්වල අයිතීන් රැක ගැනීම, මරණ දඬුවමට විරුද්ධ වීම.

- ඇතැම් බලපෑම් කණ්ඩායම් ඊට වඩා පුළුල් න්‍යාය පත්‍ර හා ඉලක්ක සහිත ඒවා වේ.

  නිද :- ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම්, ස්ත්‍රී අයිති, සිවිල් අයිතිවාසිකම් ආදී න්‍යාය පත්‍ර.

★ බලපෑම්/අභිලාෂ/ලොබි කණ්ඩායම්වලට පක්ෂ ව හා විපක්ෂ ව තර්ක පවතී.

**පක්ෂ ව ඇති තර්ක**

- දේශපාලන පක්ෂ තම න්‍යාය පත්‍රයට ඇතුළත් කර නොගන්නා, එහෙත් නිශ්චිත පුරවැසි කණ්ඩායම්වලට අදාළ සහ වැදගත් වන දුක් ගැනවිලි, ඉල්ලීම්, අභිලාෂ සහ අවශ්‍යතා පිළිබඳ ව සමාජයේත්, ආණ්ඩුවේත් අවධානය යොමු කිරීමේ මාධ්‍යයක් වීම.

- දේශපාලන පක්ෂවල ඌනපූරණයක් ලෙස ක්‍රියා කරමින් පුරවැසි දේශපාලන සහභාගිත්වයේ අවකාශය පුළුල් කිරීම.

- රාජ්‍ය ප්‍රතිපත්ති හා තීරණ ගැන, උනන්දුව දක්වන පුරවැසියන් සංවිධානය කිරීම හා ඔවුන් අතර ඒ පිළිබඳ සාකච්ඡා සහ විවේචනය ප්‍රවර්ධනය කිරීම මඟින් සමාජයේ මහජන දේශපාලන සාකච්ඡාව ගැඹුරු කිරීම හා ඒ මඟින් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම.

- තම ප්‍රතිපත්ති හා තීරණ පිළිබඳ ව ආණ්ඩු දක්වන හිතුවක්කාර චර්යාවට සංවරණයක් ලෙස ක්‍රියා කරමින් සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදි ශක්‍යතාව ශක්තිමත් කිරීම.

**විපක්ෂ ව ඇති තර්ක**

- මේවාට බැඳෙන්නෝත්, ක්‍රියාකාරකයන් වන්නෝත් උගත්, ධනවත් සහ වරප්‍රසාද ලත් පුරවැසියන් ය. එබැවින් මෙවැනි සංවිධාන බල ප්‍රභූත්ව (elite) ගති ලක්ෂණයක් තිබෙන අතර ඒවායින් ප්‍රතිලාභ ලබන්නේ ද, සමාජයේ ප්‍රභූ ස්තරයන් වීම.

- මේවා නියෝජනය කරන්නේ සමාජ කණ්ඩායම්වල පටු සහ නිශ්චිත අවශ්‍යතා නිසා, ඒවායින් සමාජයේ වැඩි දෙනාගේ සහ පොදු යහපතට සිදුවන සේවාව පහළ මට්ටමක පැවතීම.

- සමහර රටවල මෙවැනි කණ්ඩායම්වලට බොහෝ සමාජ බලයක් හිමි ය. එය වනාහි ජනතාව වෙතින් ලබන බලයක් නොවේ. එබැවින් ඒවා සතු බලය සුජාත භාවයකින් යුක්ත නොවීම.

- ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය විවෘත වූවක් වූවත්, මෙම සංවිධාන ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා තීරණ ආවෘත වූවක් බවට පත් කිරීම.

**2.4.4. සිවිල් සමාජය :-**

★ සිවිල් සමාජය යනු ''රාජ්‍යයෙන් පරිබාහිර ව සහ ස්වාධීන ව පුරවැසියන් තම පොදු අරමුණු වෙනුවෙන් එකට/සංවිධානය වී සහ සාමූහික ව ක්‍රියා කරන සමාජ අවකාශය යි.'' මීට අමතර ව එවැනි අවකාශයක් ඇතුළත ක්‍රියා කෙරෙන පුරවැසි සංවිධාන හැඳින්වීමට ද ''සිවිල් සමාජය'' යන පදය භාවිත වේ. මෙය වනාහි සිවිල් සමාජය යන්නට දී ඇති පටු අර්ථයකි. මෙම පුළුල් සහ පටු අර්ථ දෙකෙන් ම 'සිවිල් සමාජය' යන සංකල්පය වර්තමාන දේශපාලන හා සමාජ න්‍යායයේ භාවිත කෙරේ.

★ වත්මන් ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායයෙහි ද සිවිල් සමාජය පිළිබඳ සංකල්පයට වැදගත් තැනක් හිමි වේ. ශක්තිමත් හා සක්‍රීය සිවිල් සමාජයක් තිබීම, ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක ලක්ෂණයක් සහ ප්‍රතිඵලයක් බව ද සිවිල් සමාජය පිළිබඳ න්‍යායවලින් කියැවේ. .

★ දේශපාලන හා සමාජ න්‍යායයේ සිවිල් සමාජය යන්නට ඇති සංකල්පීය ඉතිහාසය තුළ එය අර්ථ හතරකින් භාවිත කරනු දැකිය හැකි ය.

1. **සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථය :-**

   එනම් රාජ්‍ය සහ පවුල අතර පුද්ගල ක්‍රියාකාරිත්වය සඳහා ඇති සමාජ අවකාශය. ඉම්මැනුවෙල් කාන්ට් සහ ෆෙඩ්රික් හේගල් නම් වූ ජර්මන් දාර්ශනිකයන් පෙන්වා දුන් පරිදි සිවිල් සමාජය වනාහි ධනවාදී වෙළෙඳපොළ පිළිබඳ අවකාශය ද වෙයි.

2. **සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය :-**

   සිවිල් සමාජය යනු ධනවාදී වෙළෙඳපොළය, යන හේගල් ගේ අදහස තව දුරටත් ඉදිරියට ගෙනයමින්, කාල් මාක්ස් එම සංකල්පය පාවිච්චි කළේ ධනවාදී සමාජය යන්නට තවත් පර්යාය පදයක් හැටියට ය. මෙම මාක්ස්වාදී අර්ථයට අනුව සිවිල් සමාජයේ සිදු වන්නේ සෑම කෙනෙකුට ම තම පෞද්ගලික සහ ආත්මාර්ථකාමී අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට ඔවුනොවුන් සමඟ තරග වැදීම යි. ඒ අනුව සිවිල් සමාජය තුළ සිදුවන්නේ පුද්ගලයන් එකිනෙකාගෙන් වෙන් වී හුදෙකලා වී තම ශක්‍යතාවන් ඉටු කරගත නොහැකි තත්ත්වයකට ඇද වැටීම යි.

3. **සාංගමික ප්‍රජාතන්ත්‍රවාදී අර්ථය :-**

   මේ අනුව සිවිල් සමාජය යනු රාජ්‍යයෙන් ස්වාධීන ව, තම පොදු අවශ්‍යතා ඉටු කර ගැනීමට සමිති සමාගම් පිහිටුවා ගෙන පොදුවේ ක්‍රියා කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී

දේශපාලන ව්‍යුහයන් තුළ පුරවැසියන්ට ලැබෙන සමාජ අවකාශය යි. සිවිල් සමාජය සාංගමික ප්‍රජාතන්ත්‍රවාදයේ (associational democracy) අවකාශ ලෙස පළමුවෙන් අදහස් කළේ 19 වැනි සියවසේ සිටි ප්‍රංශ ජාතික දේශපාලන චින්තකයකු වූ ඇලෙක්සිස් ද තොක්විල් ය. එහෙත් ඔහු ''සිවිල් සමාජය'' යන පදය පාවිච්චි කර නැත. ඔහු ඊට භාවිත කළේ 'පුරවැසි ජීවිතය' (Civil Life) යන්න යි. ඒ මාර්ගයෙන් ද තොක්විල් විග්‍රහ කළේ සිවිල් සමාජය යනුවෙන් අද අප හඳුන්වන ප්‍රපංචය ම ය.

**4. නව මාක්ස්වාදී ග්‍රාම්ෂියානු අර්ථය :-**

අන්තෝනියෝ ග්‍රාම්ස්ෂි නම් ඉතාලි ජාතික මාක්ස්වාදී චින්තකයා 1930 දශකයේ දී ලියූ ලේඛනවල 'සිවිල් සමාජය' යන්නට අලුත් මාක්ස්වාදී අර්ථයක් දුන්නේ ය. ඒ අනුව සිවිල් සමාජය යනු රාජ්‍යය හා පුරවැසියන් අතරමැද ඇති සමාජ සංස්කෘතික අවකාශය යි. පාලක පන්තීන් තම ආධිපත්‍යය සමාජය මත පවත්වා ගැනීමේ දී අවශ්‍ය මහජන කැමැත්ත ලබා ගැනීමට අවශ්‍ය දේ කරන්නේ මෙම සමාජ සංස්කෘතික අවකාශයෙහි  කරන මැදිහත්වීම් මඟිනි. ආගම, සංස්කෘතිය, අධ්‍යාපනය යන සමාජ සංස්කෘතික ක්ෂේත්‍ර මෙන් ම, පාසල්, වෘත්තීය සමිති, ක්‍රීඩා සමිති, ජනමාධ්‍ය, පල්ලිය වැනි සමාජ සංස්කෘතික ආයතන ද, සිවිල් සමාජ පරිමණ්ඩලයට අයත් වේ.

**5. ප්‍රජාතන්ත්‍රවාදී සමාජ-දේශපාලන ක්‍රියාකාරිත්වයේ අවකාශය ලෙස :-**

සිවිල් සමාජය යන්නට මෙම අර්ථය ලැබෙන්නේ 1970 දශකයේ අග දී සහ 1980 දශකයේ මුල දී පමණ ය. ප්‍රජාතන්ත්‍රවාදය නොතිබුණු ලතින් ඇමරිකාවේ, නැගෙනහිර යුරෝපයේ සහ ආසියාවේ අධිකාරවාදී ආණ්ඩුතන්ත්‍රවලට එරෙහි ව ප්‍රජාතන්ත්‍ර දේශපාලන ව්‍යාපාර මතු වීමේ සමාජ-දේශපාලන අවකාශත්, ව්‍යාපාරත්, හැඳින්වීමට මෙම සංකල්පය යොදා ගැනිණ. මේ හැම රටක ම අධිකාරිවාදී පාලන තන්ත්‍ර යටතේ දේශපාලන පක්ෂ නොපැවති නිසා, එම පාලන තන්ත්‍රයට එරෙහි සමාජ දේශපාලන ක්‍රියාකාරිත්වය මතු වූයේ වෘත්තීය සමිති, ආගමික සංවිධාන, ගොවි ව්‍යාපාර, සංස්කෘතික හා කලා සංවිධාන, ශිෂ්‍ය ව්‍යාපාර ආදිය මාධ්‍ය කොටගෙනයි. මේ ව්‍යාපාරවල කාර්ය භාරය, දේශපාලන පක්ෂවලින් නොකෙරුණ කාර්ය භාරයක් විය. එවැනි ව්‍යාපාර පසු ව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සමාජවල ද, දේශපාලන පක්ෂවලට සමානාන්තර ව, විකල්ප දේශපාලන ක්‍රියාකාරිත්වයක යෙදෙන්නට පටන් ගති. දේශපාලන පක්ෂ නොවන දේශපාලන සැකසීම් (non-party political formations) යන හැඳින්වීම සිවිල් සමාජ ව්‍යාපාරවලට ලැබුණේ ඒ නිසා ය.

**6. සිවිල් සමාජය සමාජ ව්‍යාපාර හා ඒවායේ අවකාශය ලෙස :-**

ප්‍රජාතන්ත්‍රවාදී මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී නොවන සමාජවල සමාජයේ පුළුල් දේශපාලන අභිලාෂ මතු කරන බහුජන ව්‍යාපාර පැන නඟී.

නිද :- ගොවි ව්‍යාපාර, තරුණ ව්‍යාපාර, ස්ත්‍රී ව්‍යාපාර, ආගමික ව්‍යාපාර, වෘත්තීය සමිති ව්‍යාපාර, පරිසර ව්‍යාපාර, මානව අයිතිවාසිකම් ව්‍යාපාර, පුවත්පත් නිදහස සඳහා වූ ව්‍යාපාර.

- මෙවැනි ව්‍යාපාර ද දේශපාලන පක්ෂවලින් වෙන් වේ. ඒවා දේශපාලන පක්ෂ මෙන් ක්‍රමානුකූල සංවිධාන ව්‍යුහ හා සාමාජිකත්වය ඇති ඒවා නො ව විවෘත ව්‍යාපාර යි. ඒවාට නිශ්චිත මතවාද හා ක්‍රියමාර්ග තිබේ. පුළුල් බහුජන කොටස් සෘජු

දේශපාලන ක්‍රියාකාරිත්වයට යොමු කිරීම (Mass Action) ඒවායේ විශේෂත්වයකි. මෙවැනි බහුජන ව්‍යාපාර ද සිවිල් සමාජ ව්‍යාපාර ලෙස හැඳින්වේ.

දේශපාලන විද්‍යාව සිවිල් සමාජය ගැන උනන්දු වීමට හේතු

- සිවිල් සමාජ ව්‍යාපාර, දේශපාලන පක්ෂවලට අමතර ව සහ සමාන්තර ව, දේශපාලන ක්‍රියාකාරිත්වය සිදු කරණ ආයතන යි.
- රාජ්‍යයෙන් ද, දේශපාලන පක්ෂවලින් ද, ස්වාධීන ව හා වෙන් වූ සමාජ-දේශපාලන අවකාශයක්, සිවිල් සමාජයෙන් නියෝජනය වේ.
- පුරවැසි දේශපාලන සහභාගිත්වයට, දේශපාලන පක්ෂවලින් නොසැපයෙන අලුත් අවකාශයක් සිවිල් සමාජය වෙතින් ලැබේ.
- සක්‍රිය සිවිල් සමාජයක් පැවතීම, රටක ප්‍රජාතන්ත්‍රවාදය ගැඹුරු කිරීමට දායක වෙයි.
- දේශපාලන බල මුළු ගැන්වීමේ දී, දේශපාලන පක්ෂ අමතක කරන නැතහොත් සුදුසුකම් නැති, තේමා සහ අරමුණු මත පුරවැසියෝ සංවිධානය කරති.
- සංවිධානය හා බල මුළු ගැන්වීම් මඟින් පුරවැසියන් දේශපාලන වශයෙන් සවිබල කිරීමට දායක වේ.

**2.5. තුළනාත්මක දේශපාලනය (Comparative Politics) :-**

- 1950 දශකයෙන් පසු දේශපාලන විද්‍යාවේ නිශ්චිත ධාරාවක් ලෙස තුළනාත්මක දේශපාලනයේ වර්ධනය සිදු විය.
- එය ඇමෙරිකානු දේශපාලන විද්‍යාව තුළ ආරම්භ වී, පසු ව දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ 'අධ්‍යයන ධාරාවක්' සහ 'අධ්‍යයන විධි ක්‍රමයක්' ලෙස ද ව්‍යාප්ත විය.
- තුළනාත්මක දේශපාලනය හැදෑරීමේ ඉතිහාසය ඇරිස්ටෝටල්ගෙන් ආරම්භ වන අතර වඩාත් සුදුසු ආණ්ඩු ක්‍රමයක් යෝජනා කිරීම සඳහා එකල ග්‍රීසියේ පැවති පෞර රාජ්‍යයන් ගණනාවක් ම එය අධ්‍යයනය කළේ ය.
- මැකියාවෙල්ලි ද තම දේශපාලන අධ්‍යයනය සඳහා තුලනාත්මක ප්‍රවේශයක් භාවිත කෙළේ ය.
- දේශපාලන විද්‍යාවේ සාම්ප්‍රදායික අවධානය යොමු වී තිබුණු යුරෝපයෙන් සහ ඇමෙරිකාවෙන් පිටත, ලෝකයේ වෙනත් රටවල දේශපාලන ක්‍රම ගැන අධ්‍යයනයට දේශපාලනඥයන් උනන්දු වීම, තුළනාත්මක දේශපාලනය අධ්‍යයන ධාරාවක් ලෙස වර්ධනය වීමට හේතු විය.
- ඒ අනුව තුන් වැනි ලෝකයේත්, රුසියාව ප්‍රමුඛ සමාජවාදී රටවලත්, දේශපාලනයේ සහ දේශපාලන ක්‍රමයේ ඇති විශේෂතා හඳුනා ගැනීමට දේශපාලන විද්‍යාඥයෝ ඉදිරිපත් වූහ. මෙයින් සිදුවූයේ දේශපාලන විද්‍යා විෂයයේ තිබූ ඇමෙරිකානු සහ යුරෝපීය කේන්ද්‍රීය අවධානය වෙනස් වීම යි.

- මෙසේ එක් එක් රටවල දේශපාලනය තුලනාත්මක ව අධ්‍යයනය කිරීම මඟින්, දේශපාලන ක්‍රියාවලි ගැන පොදුවේ අදාළ වන සාමාන්‍යකරණ නිගමනවලට එළඹීමට දේශපාලනඥයන් පෙලැඹීම හේතු කොටගෙන, එය විධි ක්‍රමයක් බවට පත් විය.

  උදා :- මැතිවරණ ක්‍රම, ඡන්ද දායකයන්ගේ චර්යාවට බලපාන ආකාරය රටවල් කිහිපයක් ඇසුරින් අධ්‍යයනය කර, පොදු නිගමනවලට (සාමාන්‍යකරණීය කරන ලද) එළඹීමේ හැකි යාව ලැබේ. මෙම විධික්‍රමය තුළනාත්මක විධි ක්‍රමය යැයි හඳුන්වනු ලැබේ.

- **තුළනාත්මක දේශපාලනය හා ආණ්ඩුක්‍රම හැදෑරීමට දේශපාලන විද්‍යාඥයන් උනන්දු වන්නේ කුමක් නිසා ද? :-**

  I දේශපාලනය වෙනත් රටවල් සමඟ තුලනාත්මක ව හැදෑරීමෙන් අපට අපේ රටේ දේශපාලනය ගැන වඩාත් හොඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.

  II අනෙකුත් රටවල දේශපාලනය ගැන මනා අවබෝධයකට, අප ඒ එක් එක් රටක් ගැන පමණක් නො ව, රටවල් කිහිපයක් සසඳා බැලීම ද බෙහෙවින් ප්‍රයෝජනවත් ය.

  III නූතන දේශපාලන විද්‍යා විග්‍රහයේ එක් කාර්යයක් වන්නේ දේශපාලන ගැටලු සහ තේමා පිළිබඳ සාමාන්‍යකරණය කරන ලද පොදු නිගමනවලට එළඹීම යි.

- **තුළනාත්මක ව අධ්‍යයනය කරන්නේ මොනවා ද? :-**

  - දේශපාලන විද්‍යාඥයෝ රටවල් අතර සැසඳීම කරති.

    උදා:- දේශපාලන පක්ෂ ක්‍රමය ගැන රටවල් කිහිපයක තුළනාත්මක අධ්‍යයනයක් කළ හැකි ය. (Cross-National Comparisons)

  - රටක් ඇතුළත ද තේමාත්මක සැසඳීම් කළ හැකි ය.

    උදා:- ස්ත්‍රී-පුරුෂ මැතිවරණ සහභාගිත්වයේ ප්‍රවණතා, පිළිබඳ ව ග්‍රාමීය සහ නාගරික වශයෙන් තුළනාත්මක අධ්‍යයනයක් කළ හැකි ය. (Within-Country Comparisons)

  - දේශපාලන විද්‍යාත්මක වශයෙන් වැදගත් තේමා අන්තර්ජාතික වශයෙන් තුලනාත්මක ව අධ්‍යයනය කළ හැකි ය.

    උදා:- • ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනය, ජනාධිපති ආණ්ඩුක්‍රමවල සාර්ථක-අසාර්ථක භාවය.
    • සමානුපාතික නියෝජන ක්‍රමය, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට කරන බලපෑම.
    • ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වයේ ප්‍රවණතා

    ආදිය තුළනාත්මක ව අධ්‍යයනය කළ හැකි තේමා වේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් :-**

1. දේශපාලන විද්‍යාව සමන්විත වන උපවිෂය ක්ෂේත්‍ර හොඳින් අධ්‍යයනය කර බිත්ති පුවත්පතක් හෝ සඟරාවක් හෝ සකස් කරන්න.

## ආශ්‍රිත ග්‍රන්ථ


01. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (2007), ***දේශපාලන විද්‍යාවේ මූලිකාංග 1***, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

02. ද සොයිසා, එම්. ඕ. ඒ. (2003), ***දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත***, පේරාදෙණිය, කර්තෘ ප්‍රකාශන

03. උයන්ගොඩ, ජයදේව, 2011, ***සිවිල් සමාජය, එය කුමක් ද? කාගේ ද? කුමකට ද?,*** කොළඹ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

04. Goodin, Robert E (ed) (2009), *The Oxford Handbook of Political Science*, Oxford, Oxford University Press.

05. Heywood, Andrew, 2013 *Politics, London: Palgrave Macmilan.*

06. Newton, Kenneth and Van Deth, Jan W. 2010, Foundations of Comparative Politics, Cambridge: Cambridge University Press.

# 03. රාජ්‍යය.

**නිපුණතාව 03 :-** තමා ද පුරවැසියකු වන රාජ්‍යය පිළිබඳ ව න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයකට පදනම සකසා ගනියි.

**(කාලච්ඡේද 55 යි)**

**නිපුණතා මට්ටම :-**

3.1. රාජ්‍යය යන සංකල්පය විග්‍රහ කරයි.
3.2. රාජ්‍යය පිළිබඳ වර්ගීකරණය පදනම් කොට ගෙන රාජ්‍යය යන තේමාව විමර්ශනය කරයි.
3.3. රාජ්‍යය පිළිබඳ දේශපාලන සංකල්ප ආශ්‍රයයෙන් නූතන රාජ්‍ය මාදිලි විග්‍රහ කරයි.
3.4. රාජ්‍යය හා එහි ස්වභාවය දේශපාලන විද්‍යා සංකල්ප සහ න්‍යාය ආශ්‍රයෙන් විග්‍රහ කරයි.

**ඉගෙනුම් ඵල :-**

- රාජ්‍යය අර්ථකථනය කර එහි කාර්යභාරය විස්තර කරයි.
- නූතන භෞමික රාජ්‍යයේ සහ ජාතික රාජ්‍යයේ ලක්ෂණ හඳුන්වයි.
- ගෝලීයකරණය රාජ්‍යය කෙරෙහි ඇති කරන බලපෑම විමර්ශනය කරයි.
- රාජ්‍ය මාදිලි වර්ග කර විග්‍රහ කරයි.
- රාජ්‍ය පරමාධිපත්‍යය හා පුරවැසියා යන සංකල්ප අර්ථකථනය කරයි.
- රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ න්‍යායික ප්‍රවේශ නම් කර ඒවා එකිනෙක විස්තර කරයි.
- මිනිස් නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයට වඩාත් යෝග්‍ය වන ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.

**හැඳින්වීම :-**

- රාජ්‍යය යනු දේශපාලන විද්‍යාවේ ප්‍රධාන පෙළේ තේමාවකි. ඒ සමඟ ම රාජ්‍යය යන්න අප හැම දෙනාගේ ම ජීවිතයට ඍජු ව හෝ වක්‍ර ව හෝ බලපාන සමාජ ආයතනයක් ද වෙයි. රාජ්‍යයේ බලපෑමට හසුනොවී ජීවත් වීමට සාමාන්‍යයෙන් මනුෂ්‍යයන්ට අපහසු ය. මනුෂ්‍යයකු රාජ්‍යය සමඟ සබඳතා ගොඩ නගන පළමු වන අවස්ථාව වන්නේ උපත ලියාපදිංචි කිරීම යි. එය කෙනෙකුගේ මරණය තෙක් පවතින සම්බන්ධතාවකි. රාජ්‍යයේ සාමාජිකත්වය ලැබීමෙන් පුද්ගලයෙක් පුරවැසියකු බවට පත්වේ. රාජ්‍යය ඇතුළත අයිතිවාසිකම් ලැබීමට හිමිකරුවෙක් ද වේ.

- රාජ්‍යය පිළිබඳ ව ඇති විශේෂ කාරණයක් නම් එය ඇසින් දැකිය නොහැකි, අතින් ස්පර්ශ කළ නොහැකි, එහෙත් සමාජයේ සෑම තැනක ම පවතින ප්‍රපංචයක් වීම යි. පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා නිදහස ආරක්ෂා කිරීමත්, සාමකාමී සහ ඵලදායී ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය නීතිය හා සාමය ආරක්ෂා කිරීමත්, ආර්ථික වර්ධනය හා සමාජ සුභසාධනය සහතික කිරීමත් රාජ්‍යයේ වගකීම ලෙසට සාමාන්‍යයෙන් පිළිගැනේ. පුරවැසියන් ලෙස අප ශික්ෂණය කරන්නේ සහ හීලෑ කරන්නේ රාජ්‍යය යයි අපට කිව හැකි ය.

**විෂය කරුණු හැඳින්වීමට අත්වැලක් :-**

## 3.0. රාජ්‍යය :-

- රාජ්‍යය තේරුම් ගැනීමේ ප්‍රධානතම මූලධර්මය නම්, රාජ්‍යය යනු ඓතිහාසික හා සමාජීය ප්‍රපංචයක් යන්න යි. එයින් අදහස් කරන්නේ ''රාජ්‍යය'' නිශ්චිත ඓතිහාසික තත්ත්වයන් හේතු කොට බිහි වී, විවිධ ඓතිහාසික සන්දර්භයන් ඔස්සේ විකාශනය වී, විවිධ ස්වරූප ගෙන ඇති සමාජ ආයතනයක් වේ ය යන්න යි. කෙටියෙන් කියන්නේ නම් රාජ්‍යය යනු, ඓතිහාසික වශයෙන් සුවිශේෂ වූ

නිර්මාණයකි. එය සමාජීය නිර්මාණයක් ද වේ. එහි තේරුම නම් රාජ්‍යයේ ස්වභාවය සමාජයේ ඓතිහාසික වර්ධනයන්ට අනුකූල ව වෙනස් වී ඇත යන්න යි. ගෝත්‍රික රාජ්‍යයේ සිට නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය තෙක් රාජ්‍යයේ සිදු වූ ඓතිහාසික විකාශනයෙන් පෙනෙන්නේ ඒ කරුණ යි.

## 3.1. රාජ්‍යය සහ එහි භූමිකාව :-

- රාජ්‍යය යනු සමාජයක් පාලනය කිරීමට නිර්මාණය වූ බල ව්‍යූහවලත්, ආයතනවලත්, එකතුව ලෙස අර්ථ දැක්විය හැකි ය.

- රාජ්‍යයේ කාර්යයන් සාම්ප්‍රදායික ව තේරුම් ගෙන ඇත්තේ, ප්‍රධාන කාර්ය ක්ෂේත්‍ර තුනක් ආශ්‍රය කරගෙන යි. ඒවා

  (i) ව්‍යවස්ථාදායකය - එනම් නීති සම්පාදනය.
  (ii) විධායකය - එනම් නීති ක්‍රියාත්මක කරවීම.
  (iii) අධිකරණය - එනම් යුක්තිය පසිඳලීම.

- මේ වර්ගීකරණය ''රාජ්‍යය'' යන්න තේරුම් ගැනීමට අපට ප්‍රයෝජනවත් වුවත්, රාජ්‍යයේ කාර්යභාරය ඊට වඩා පුළුල් සහ සංකීර්ණ වේ.

- සමකාලීන ලෝකයේ රාජ්‍යවල කාර්යභාරය පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

  (i) නීතියේ, සමාජ පර්යායේ හා දේපළවල භාරකාරත්වය:- මෙය රාජ්‍යයේ පැරණිතම කාර්යභාරය යි. එයට,

    (a) සුපරීක්ෂාව (Policing) මඟින් සමාජ සාමය පවත්වා ගැනීම. (අවශ්‍ය වුවහොත් සන්නද්ධ හමුදා යෙදවිය හැකි ය)
    (b) යුක්තිය පසිඳලීම, අධිකරණ පරිපාලනය හා දඬුවම් දීම.
    (c) නීති සම්පාදනය සහ නීති අර්ථකථනය.
    (d) ප්‍රතිපත්ති සම්පාදනය.

    යන කටයුතු අයත් වේ.

  (ii) ආර්ථික පරිපාලනය සහ මෙහෙයවීම.
    (a) අයබදු එකතු කිරීම.
    (b) රටේ ආර්ථික ගමන් මඟ නිර්ණය කිරීම සහ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය.

  (iii) සමාජ පාලනය, මෙහෙයවීම සහ සමාජ අධීක්ෂණය :-
  මේ යටතේ ආදායම් බෙදීයාමේ රටා නිර්ණය කිරීම සහ පාලනය කිරීම, ආර්ථික සහ වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතීන් තීරණය කිරීම, සමාජ ආරක්ෂණ සහ සුභසාධන ක්‍රියාමාර්ග, දිළිඳු සහන ප්‍රතිපත්ති, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපන, ගමනාගමන ආදි සමාජ ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති තීරණය කිරීම, රාජ්‍යය සිදු කරයි.

  (iv) සමාජයේ නීතිය හා සාමය පවත්වා ගැනීම. :-
  රාජ්‍යයේ දේශ සීමා ඇතුළත නීතිය හා සාමය පවත්වා ගැනීමත්, පුරවැසියන් රාජ්‍යයේ ආධිපත්‍ය බලයට අවනත වීම සහතික කිරීමත් සඳහා රාජ්‍යය නිරන්තරයෙන් උත්සාහ ගනියි. ඒ සඳහා අධිකාරී බලය ද, ආයතන ද, පිරිස් බලය ද, රාජ්‍ය සතු ය. පොලිසිය, අධිකරණය සහ පිරිස් බලය පවත්වා ගැනීමත් පුරවැසි සෝදිසිය සහ සුපරීක්ෂාකාරීත්වයත්

(Surveillance and policing) නීතිය හා සාමය පවත්වා ගැනීමට රාජ්‍යය සතු ආයතන සහ භාවිත ය.

(v) යුද්ධ ප්‍රකාශ කිරීම සහ යුද්ධ කිරීම සාමාන්‍යයෙන් රාජ්‍යයට පමණක් හිමි විශේෂ කාර්යයක් ලෙස සැලකේ. රාජ්‍යය අභ්‍යන්තර මෙන් ම බාහිර යුද්ධවලට ද සහභාගි වෙයි. අභ්‍යන්තර යුද්ධ අවශ්‍ය වන්නේ රාජ්‍යයේ ආරක්ෂාවට රාජ්‍යයේ දේශ සීමා ඇතුළතින් එල්ල වන තර්ජන මැඩ පැවැත්වීමට ය. රාජ්‍යයක් බාහිර යුද්ධවලට එළඹෙන්නේ, රාජ්‍යයේ ආරක්ෂාවට, වෙනත් රාජ්‍යවලින් එල්ල වන යුද තර්ජනවලට මුහුණ දීමට ය.

### 3.1.1. සමාජයෙහි පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ප්‍රකාශනය ලෙස රාජ්‍යය :-

- මනුෂ්‍යයන් සාමූහික වශයෙන් සංවිධානය වී ඇති එක් මාධ්‍යයක් වන්නේ දේශපාලන වශයෙන් ඇති වන සාමූහිකත්වය යි. එම දේශපාලන සාමූහිකත්වයේ ප්‍රධාන ප්‍රකාශනය රාජ්‍යය යි.

- මිනිසුන් සාමූහික වශයෙන් සංවිධානය වන අනෙකුත් සංවිධාන ලෙස ස්වේච්ඡා සමිති, දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති, සමාජ ව්‍යාපාර, ආගමික සංවිධාන ක්‍රියාත්මක වෙයි.

- එහෙත් රාජ්‍යය ඒ සියල්ලට ම වඩා බලගතු සහ උසස් මනුෂ්‍ය සංවිධානය යි ''රාජ්‍යය මනුෂ්‍ය සමාගමකි: එහෙත් එය මනුෂ්‍ය සමාගම් අතර ඉහළ ම සමාගම වන්නේ ය'' යන ඇරිස්ටෝටල්ගේ සුප්‍රසිද්ධ ප්‍රකාශයේ පදනම මෙයයි.

- රාජ්‍යය මනුෂ්‍ය සංවිධාන/සමාගම් අතර ඉහළ ම සංවිධානය වන්නේ ය යන ප්‍රකාශයට අර්ථ දෙකක් තිබේ.

(i) **ඇරිස්ටෝටලියානු අර්ථය :-**

- ග්‍රීක දේශපාලනික දාර්ශනික ඇරිස්ටෝටල් *Politics* යන කෘතිය ආරම්භයේ දී ම ප්‍රකාශ කරන ප්‍රවාදයක් නම් ''රාජ්‍යය මනුෂ්‍ය සමාගමක් වන අතර ම, මනුෂ්‍යයන්ගේ ඉහළ ම පොදු යහපත වෙනුවෙන් ක්‍රියා කරන නිසා එය අනෙක් මනුෂ්‍ය සමාගම්වලට වඩා උත්තරීතර වන්නේ ය'' යන්න යි.

- අනෙකුත් සමාගම් කැප වන්නේ තම සාමාජිකයන්ගේ නිශ්චිත අරමුණු දිනවා ගැනීම උදෙසා ය.

- එහෙත් රාජ්‍යය සමාජයේ සැම දෙනාගේ ම පොදු සහ උසස් යහපත ළඟා කර ගැනීම තම අරමුණ කර ගන්නා බැවින් එය උසස් ම මනුෂ්‍ය සමාගම වේ.

(ii) **වෙබේරියානු අර්ථය :-**

- 19 වන සියවසේ අග භාගයේ සහ 20 වැනි සියවසේ මුල් භාගයේ ජීවත් වූ ජර්මන් ජාතික සමාජ විද්‍යාඥයකු වූ මැක්ස් වේබර් (Max Weber) රාජ්‍යය පිළිබඳ ව කළ විග්‍රහය වෙතින් මෙය වඩා හොඳින් ප්‍රකාශ වේ.

  ''Politics as a Vocation'' (1919) (දේශපාලනය වෘත්තියක් වශයෙන්) නම් රචනයේ ඔහු දක්වා ඇත්තේ ''රාජ්‍යය යනු නිශ්චිත භූමි ප්‍රදේශයක් ඇතුළත බලහත්කාරී

බලය සුජාත ලෙස පාවිච්චි කිරීමේ ඒකාධිකාරය තිබෙන්නේ තමන්ට පමණකැයි කියාපාන මනුෂ්‍ය ප්‍රජාව යි'' යනුවෙනි.

- සමාජයේ අනෙකුත් ආයතනවලට හා පුද්ගලයන්ට බලහත්කාරී බලය (Coercive Power) පාවිච්චි කිරීමේ අයිතිය තිබෙන්නේ ඒ සඳහා රාජ්‍ය ඉඩ දෙතොත් පමණි. රාජ්‍යය යන්න සැලැකෙන්නේ ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීමේ ''අයිතිය'' හිමි එක ම මූලාශ්‍රයය ලෙසට ය. රාජ්‍යය තමන් ගැන සිතන්නේත් එපරිදි ය.

- එසේ'ම රාජ්‍යයේ දේශ සීමා තුළ සිටින සමාජ කණ්ඩායම් ද, මනුෂ්‍යයන් ද, මෙහෙයවීමේ, පාලනය කිරීමේ, හික්මවීමේ මෙන් ම දඬුවම් කිරීමේද අවසාන බලය හිමි සංවිධානය වන්නේ ද රාජ්‍යය යි. ඒ සඳහා බලය ද, නීතිරීති ද, සංවිධාන ද, පුද්ගලයෝ ද, රාජ්‍යය සතු වෙති. පාර්ලිමේන්තුව, නීති රෙගුලාසි, අධිකරණය, නිලබලතන්ත්‍රය, යුද හමුදාව, පොලීසිය, බන්ධනාගාර යනාදියෙන් සමන්විත විස්තෘත, බලගතු සහ අන් කිසි දු ආයතනයකට නොමැති වූ අධිකාරි බලයක් (authority) රාජ්‍යයට තිබේ.

- ඉහතින් දැක්වූ අධිකාරි බලය, දේශපාලන විද්‍යාවේ හඳුන්වන්නේ රාජ්‍යයේ ''පරමාධිපත්‍ය බලය'' යනුවෙනි. රාජ්‍යයේ පරමාධිපත්‍ය/ස්වාධිපත්‍ය බලය යනු එහි බලය තිබෙන භූමි ප්‍රදේශය ඇතුළත සමාජය මෙහෙයවීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය, නීති ක්‍රියාත්මක කරවීම, යුක්තිය පසිඳලීම, නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා රාජ්‍යයට පමණක් ඇති බලයකි.

- අනෙකුත් මනුෂ්‍ය සංවිධානවලට එම බලය සුළු ප්‍රමාණයකට හෝ ඇත්තේ රාජ්‍යයට යටත් ව සහ රාජ්‍යයේ අනුමතිය ඇති ව පමණි.

### 3.1.2. නූතන භෞමික රාජ්‍යය.

- නූතන භෞමික රාජ්‍යය ප්‍රධාන අංග හතරක් යටතේ සංවිධානගත කොට තිබේ.
  - I. නිශ්චිත දේශ සීමාව.
  - II. ජාතික පදනම.
  - III. ආණ්ඩුව.
  - IV. ස්වාධිපත්‍යය

**I. නිශ්චිත දේශසීමාව :-**

- නූතන ජාතික රාජ්‍යය එහි අධිකාරි බලය පැතිරෙන නිශ්චිත දේශ සීමාවක පවතී. එය පැහැදිලි දේශ සීමාවක් ඇතුළත සංවිධානය වී තිබේ.

- නිශ්චිත දේශ සීමා පැවතීම, නූතන ජාතික රාජ්‍යයේ විශේෂ ලක්ෂණයකි. එම දේශ සීමා, අනෙකුත් රාජ්‍ය සහ අන්තර්ජාතික නීතිය විසින් ද පිළිගනු ලබන ඒවා ය. පූර්ව-නූතන රාජ්‍යවල දේශ සීමා නම්‍යශීලී වූ අතර, නූතන රාජ්‍යවල දේශ සීමා සාපේක්ෂ වශයෙන් අනම්‍ය ය.

- රාජ්‍යයේ දේශ සීමා කෘත්‍රිම හෝ ස්වාභාවික හෝ සීමා හෝ එම දෙයාකාරයෙන් ම සමන්විත සීමා හෝ විය හැකි ය.

- එම රාජ්‍යයේ සීමා ගොඩබිම් සීමාවෙන්, මුහුදු සීමාවෙන් හෝ එම දෙක්න් ම ද, එම කලාපය පුරා විහිදුණු ගුවන් සීමාවෙන් ද යුක්ත වේ.

- රාජ්‍යයට අයත් භූමි ප්‍රදේශය තීරණය වන්නේ මෙම දේශ සීමාව මගිනි. රාජ්‍යයේ භෞතික සහ ද්‍රව්‍යමය පදනම එය සතු භූමිය වේ. ''භෞමිකත්වය'' (Territoriality) යන සංකල්පය රාජ්‍යයට හැම විට ම වැදගත් වී තිබෙන්නේ එබැවිනි.

- රට පිළිබඳ හැඟීම නැතහොත් දේශාභිමානය ජනිත වීම සඳහා බලපාන සාධක අතුරෙන් එක් ප්‍රබල සාධකයක් ලෙස ද, භූමිය, (Territory, Land) වැදගත්කමක් උසුලයි.

- පුරවැසියන් තමන් යම්කිසි රාජ්‍යයකට අයත් වන්නේ ය යන අදහස ඇතිකර ගන්නේ, දේශසීමාවලින් තීරණය වූ භූමිය ආශ්‍රය කොටගෙන යි.

II. **ජාතික පදනම** :-

- නූතන ජාතීන් බිහිවීමේ ක්‍රියාවලිය හා නූතන රාජ්‍යය බිහි වීමේ ක්‍රියාවලිය එකිනෙකට සමාන්තර ව සිදු වී ඇත.

- ''එක් ජාතියක් - එක් රාජ්‍යයක්'' යන සමීකරණය ඊට අදාළ වේ. එය ''ජාතික - රාජ්‍යය'' (Nation-State) යන නූතන දේශපාලන ස්වරූපයේ පදනම ද වේ.

- නූතන රාජ්‍යය බිහි වීමේ දෘෂ්ටිමය සාධකය වූයේ ''ජාතිකවාදය යි''.

- ජාතිකවාදය යනු ''රාජ්‍යයේ දේශ සීමාව තුළ වාසය කරන සියලු ජන කොටස් එක් අනන්‍යතාවක් හිමි, එක් ජාතියක් ලෙස'' සැලකීමේ දේශපාලන විඥානය ප්‍රකාශයට පත් කරන මතවාදයයි.

- එමගින් ජාතික එක්සත් භාවය හා ජාතික අනුකලනය සිදු වේ යැයි අපේක්ෂා කෙරේ. නූතන රාජ්‍යය ජාතික රාජ්‍යයක් ලෙස හැඳින්වෙන්නේ එබැවිනි.

III. **ආණ්ඩුව** :-

අප ඉහත 2.4.1 කොටසේ දී දුටු පරිදි,

- රාජ්‍යයේ ස්වාධිපත්‍යය ක්‍රියාත්මක කරන සංවිධානය ආණ්ඩුව වේ. එනම් රාජ්‍යයේ බලය ක්‍රියාත්මක කරන ආයතනික පද්ධතිය ආණ්ඩුව යි.

- ආණ්ඩුව විසින් රාජ්‍යයේ බලය ක්‍රියාත්මක කිරීමේ හා විනිශ්චය කිරීමේ ක්‍රියාවලිය සිදු කෙරේ. ඒ අනුව ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන බලතල ත්‍රිත්වය පදනම් කරගත් ආයතන පද්ධතියක් සහ ආයතනික ක්ෂේත්‍ර තුනක් නිර්මාණය වී තිබේ.

- ආණ්ඩු වර්ග විවිධාකාර වන අතර, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු, ඒකාධිපති ආණ්ඩු, අධිකාරිවාදී ආණ්ඩු, සමාජවාදී ආණ්ඩු ආදි වශයෙන් විවිධ ආණ්ඩු මාදිලි දක්නට ලැබේ. එසේ ම රාජාණ්ඩුක්‍රම, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම, ජනාධිපති ආණ්ඩුක්‍රම, මිශ්‍ර ආණ්ඩුක්‍රම යනාදි වශයෙන් විවිධ ආණ්ඩුක්‍රම ද පවතී.

IV. **ස්වාධිපත්‍යය** :-

- රාජ්‍යය සතු අධිකාරි බලය මෙයින් අදහස් වේ.

- රාජ්‍යයට හිමි ස්වාධිපත්‍යය, සමාජයේ වෙනත් කිසි දු සංවිධානයකට හිමි නොවන පරම බලය වේ.

- නීති පැනවීමටත්, මුළු බලය යොදා එම නීති ක්‍රියාත්මක කිරීමටත්, නීති කඩ කරන්නවුන්ට දඬුවම් කිරීමටත්, රාජ්‍යය වෙත පවතින වෙනත් ආයතනයක් සතු ව නැති බලය මින් අදහස් වේ.

- එම බලය වනාහි අන් අයට අණ දෙන, එහෙත් අන් අයගෙන් අණ නොලබන බලයකි.

- දේශ සීමාව තුළත් ඉන් පිටතත් රාජ්‍යය අසහාය තත්ත්වයට පත්වී ඇත්තේ ද, රාජ්‍යයේ දේශ සීමාව තුළ සෑම පුද්ගලයකු මෙන් ම, සෑම සංවිධානයක් ම රාජ්‍යයට සිය අවනත භාවය පළ කරන්නේ ද එය සතු ස්වාධිපත්‍යය බලය හේතු කොටගෙන ය.

### 3.1.3. නූතන ජාතික රාජ්‍යය.

- ජාතික රාජ්‍යය (Nation-State) යනු නූතන රාජ්‍යය හැඳින්වීමට භාවිත කරන සමාජ විද්‍යාත්මක සංකල්පයකි.

- ''ජාතික රාජ්‍යය'' යන අදහස ප්‍රථමයෙන් වර්ධනය වූයේ දහ අටවැනි සියවසේ යුරෝපයේ ය.

- එහි මූලික ඇඟවීම වන්නේ ''එක ජාතිකයකට එක රාජ්‍යයකි - එක රාජ්‍යයකට සිටින්නේ එක ජාතියකි'' යන්න යි.

- 1789 ප්‍රංශ විප්ලවයෙන් පසු ව බිහිවූ ප්‍රංශ රාජ්‍යය යුරෝපයේ පළමු වැනි ජාතික - රාජ්‍යය ලෙස සැලකේ.

- ජාතික රාජ්‍යය, නූතන රාජ්‍යයේ විශේෂ ලක්ෂණයක් ලෙස සැලකෙන්නේ, පූර්ව-නූතන රාජ්‍ය ජාතික-රාජ්‍ය නොවූ නිසා ය.

- පූර්ව-නූතන රාජ්‍යවලට නිශ්චිත භූමි ප්‍රදේශ හා නිශ්චිත දේශ සීමා තිබුණේ නැත. රාජ්‍ය බලය මධ්‍යගත වී තිබුණේ ද නැත. එක ම ජාතියක් ලෙස සැලකුණු ප්‍රජාව, විවිධ භාෂා, සංස්කෘතික හා ප්‍රදේශීය අනන්‍යතා සහිත වූවෝ යි.

- එහෙත් නූතන ජාතික රාජ්‍යය, එයට වෙනස් ය. එක ජාතියකට තිබිය යුත්තේ, එක් ජාතික හා සංස්කෘතික අනන්‍යතාවකැයි මුල දී කියැවිණි. එබැවින් සංස්කෘතික, භාෂීය සහ ආගමික වශයෙන් බහුවිධ ව පවතින සමාජවල නූතන ජාතික- රාජ්‍ය බොහොමයක්ම රාජ්‍යය හා ජාතිය ගොඩ නැගීමේ ක්‍රියාවලියේ දී මහත් අර්බුදවලට මුහුණ පා ඇත.

- එබැවින් වර්තමානයේ ජාතික රාජ්‍යය යන සංකල්පය අලුතෙන් අර්ථකථනය කළ යුතු බවට දේශපාලන විද්‍යාඥයෝ යෝජනා කළහ. ඒ අනුව ''බහුත්වවාදය'' යන සංකල්පය ගොඩනැඟී තිබේ.

- ඉන් ගම්‍ය වන අදහස වන්නේ නූතන රාජ්‍යය වාර්ගික හා සංස්කෘතික ප්‍රජාවන් ගණනාවකින් සමන්විත විය හැකි බව යි. සංස්කෘතික, වාර්ගික හා අනන්‍යතා විවිධත්වය පිළිගන්නා බහුත්වවාදී (Pluralist) රාජ්‍යයක් පිළිබඳ අදහස එයින් ඉදිරිපත් වේ.

### 3.1.4. ගෝලීයකරණය සහ රාජ්‍යය.

- නව ලිබරල්වාදී ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ විසින් පහසුකම් සපයනු ලැබූ ක්‍රියාවලියක් ලෙස ආර්ථික ගෝලීයකරණය හැඳින්විය හැකි ය. මෙම ක්‍රියාවලියෙහිලා රාජ්‍යයන්හි දක්නට ලැබුණු නව ප්‍රවණතාව වූයේ රාජ්‍යයෙන් බාහිර සහ රාජ්‍යවල සීමාව ඉක්ම වූ සාධකවල සහ බලවේගවල ආධිපත්‍යය යි.

- ප්‍රාග්ධනය, විද්‍යුත් තාක්ෂණය, පණිවුඩ අන්තර්ජාතික හුවමාරුවේ විප්ලවය, සංස්කෘතික ගෝලීයකරණය, ශ්‍රමිකයන්ගේ සංචලනය යන මේවා ජාතික රාජ්‍යයේ සීමාවන් නොතකා, එම සීමා බිඳගෙන පැතිරුණු ඒවා විය.

- මේවා ජාතික රාජ්‍යයට බලපෑම් කළේ කෙසේ ද යන්න පිළිබඳ ව සාකච්ඡාව ඉදිරියට පැමිණි අතර ඒ ගැන න්‍යායික ප්‍රවේශ දෙකක් මතු විය. එනම්,

  I ගෝලීයකරණය මඟින් ජාතික රාජ්‍යය අවසානයට පත්විය හැකි බව.
  II ජාතික රාජ්‍යය අවසන් වන්නේ නැති ව, එය යළි ව්‍යුහගත කිරීමකට ලක් වන බව.

- ගෝලීයකරණය විසින් පවත්නා ජාතික-රාජ්‍ය ක්‍රමය මහත් අර්බුදයකට ඇද දමනු ලබන බවට මතු වුණු විග්‍රහයේ නියෝජිතයකු වූ ප්‍රංශ ජාතික මහාචාර්ය ජීන්-මාරි ගෙහෙන්නො (Jean-marie Gehenno) (1995) පළ කළ *The End of the Nation State* (''ජාතික රාජ්‍යයේ අවසානය'') කෘතියේ දක්වන පරිදි, ගෝලීයකරණය මඟින් බිහි වී ඇති තත්ත්වයක් නිසා, විශේෂයෙන් ම ගෝලීයකරණය වූ සමාජ පිළිබඳ පසුබිම තුළ, භෞමිකත්වය මත පදනම් වූ ජාතික-රාජ්‍යයට දැන් පැවැත්මක් නැත. දේශ සීමාවල දැන් අර්ථයක් නැත. මන්ද ප්‍රාග්ධනයට, තොරතුරුවලට, තාක්ෂණයට සහ මනුෂ්‍යයන්ගේ සංවිධාන ජාලයන්ට ජාතික රාජ්‍යයේ සීමාවන් තව දුරටත් වැදගත් නොවනවා පමණක් නොව, ඒවා ක්‍රියා කරන්නේ ජාතික රාජ්‍යයේ දේශ සීමාවන් ද නොතකමිනි. දැන් දේශ සීමා යනු කිසි දු තේරුමක් නැති දෙයකි. ගෝලීය තොරතුරු සමාජයෙහිලා භෞමිකත්වය යන්න තව දුරටත් වැදගත් නැත.

- ඉහත තර්කයෙන් තව දුරටත් කියන්නේ ''ජාතිය'' යන අදහසට තිබූ වැදගත්කම ද අඩු වෙමින් පවතින බව යි. පොදු අරමුණක් සහ පොදු ඉරණමක් පිළිබඳ ව සිතීම තාවකාලික සම්බන්ධතා ජාල සමාජය තුළ තව දුරටත් නැති නිසා මනුෂ්‍යයන් එකට බැඳ දමා ඇත්තේ තාවකාලික, දේශපාලන වශයෙන් වැදගත් කමක් නැති ජාල සම්බන්ධතා ය. මේවාට මුහුණ දීමට ජාතික රාජ්‍යයට පුළුවන් කමක් නැති බව ද ඒ තර්කයෙන් කියැවේ.

- ජාතික රාජ්‍යය දුර්වල වීම, ගෝලීයකරණයේ ප්‍රතිඵලය යි.

- ''ජාතික රාජ්‍යය දුර්වල වීම'' පිළිබඳ ප්‍රවාදයේ තරමක් වෙනස් ඉදිරිපත් කිරීමක් වන්නේ ''ගෝලීය ප්‍රාග්ධනය රාජ්‍යයේ ග්‍රහණයෙන් මිදී රාජ්‍යයේ පාලනයෙන් ස්වාධීනතාවක් ලබා ඇත'' යන්න යි.

- ඩේවිඩ් හෙල්ඩ් 1991, ''ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික රාජ්‍යය හා ගෝලීය ක්‍රමය'' යනුවෙන් පළ කළ රචනයේ, ගෝලීයකරණය විසින් එක් තනි රාජ්‍යයක, අධිපති රාජ්‍යයක, පවා පාලනයට හසු නොවන අලුත් ගෝලීය ආර්ථික ක්‍රමයක් ගොඩ නඟමින් තිබුණු බවට තර්ක කර ඇත. මේ අනුව අලුත් ජාත්‍යන්තර දේශපාලන පර්යායක් ගොඩ නැඟේ. එනම් පාර ජාතික, සම්බන්ධතා ජාල (Transnational networks) බිහි වීම සහ ඒවා පාලනය කිරීමට රාජ්‍යයන්ට නොහැකි වීම යි. රාජ්‍යයෙන් පිටත ඇති අන්තර්ජාතික සංවිධානවලට ඉතා ම බලගතු රාජ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය පවා සීමා කිරීමට, ඒවාට බලපෑම් කිරීමට හැකියාව ලැබී තිබේ.

## 3.2. රාජ්‍ය මාදිලි සහ වර්ගීකරණය.

- **ගෝත්‍රික රාජ්‍ය.**

  - ප්‍රාථමික දේශපාලන සංවිධාන වන මේවායේ වර්තමාන සංකීර්ණ සමාජවල මෙන් දේශපාලන සංවිධාන ව්‍යුහ හෝ ආයතන හෝ දක්නට නොවී ය.

  - දේශපාලන හෙවත් පාලන බලතල සමාජය තුළ විසිර පැවතිණ.

  - ඒවායෙහි බලවත් පුද්ගලයන්ගෙන් සෑදුණු පාලක හෙවත් තීන්දු ගන්නා කණ්ඩායම් බිහි වන අතර බොහෝ විට ගෝත්‍රයක් එක් පවුලකින් එක් පුද්ගලයෙක් බැගින් එහි සාමාජිකත්වය ලබයි.

  - එම කණ්ඩායම් මඟින් ගෝත්‍රයේ එක්සත්කම පවත්වා ගත හැකි විය.

  - ගෝත්‍රික පාලන දාමවල නායකත්ව භූමිකාව ඉටු කරන ග්‍රාමීය නායකයකු ද සිටින අතර ඔහුට ඇත්තේ සීමිත අධිකාරයකි.

  - ඔහුගේ දේශපාලන බලය උත්පාද වන්නේ කණ්ඩායම තුළ තමාගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ය.

  - එම නායකයන් අනෙකුත් ගෝත්‍ර සමඟ ධනය හා ආගමික කටයුතු වෙනුවෙන් සටන් වැදී තම කණ්ඩායමට ප්‍රතිලාභ බෙදා හැර ඇති බව මානව වංශවේදීහු පවසති.

  - මෙහි දැකිය හැකි සමානත්වයක් වන්නේ නායකයන්ගේ පවුල මෙන් සියලු පවුල් තත්ත්වයෙන් එක සමාන වීම යි.

  - ආහාර හා අනෙකුත් අවශ්‍යතා සම්බන්ධයෙන් මෙම සමාජ ස්වයංපෝෂිත වේ.
  - ගෝත්‍රික රාජ්‍යවල දේශපාලන භාවිතයන් පදනම් වූයේ චාරිත්‍ර වාරිත්‍ර, පුද පූජා, අභිචාරවිධි සහ සම්ප්‍රදාය අනුව ය.

- **ග්‍රීක නාගරික (පෞර) රාජ්‍ය**

  - දේශපාලනය සම්බන්ධයෙන් සචේතන වූ ප්‍රථම රාජ්‍ය ක්‍රමය වශයෙන් සැලකෙන්නේ ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමය යි. එය ගෝත්‍රික රාජ්‍යවලට පසු ව වර්ධනය වූ රාජ්‍ය මාදිලියකි.

  - නූතන රාජ්‍යයේ පවා න්‍යායික පදනම සකසා ගැනීමේ දී බෙහෙවින් ආභාසය ලබා ගන්නේ පෞර රාජ්‍ය ක්‍රමය ආශ්‍රිත ව ගොඩ නැගුණු සම්භාව්‍ය ග්‍රීක දේශපාලන චින්තනයෙනි.

  - ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමය නිශ්චිත සහ කුඩා භූගෝලීය ඒකකයක සංවිධානය වූ ප්‍රජාවක් සහිත පාලන ක්‍රමයක් හා ජීවන රටාවක් ආශ්‍රිත ව වර්ධනය වූවකි.

  - ග්‍රීකයෝ එහි පදිංචි ව ප්‍රාථමික වශයෙන් සහ ගෝත්‍රය පදනම් කරගෙන (clan and tribe) ප්‍රජාවක් ලෙස භූ කලාප තුළ සංවිධානය වූහ. ඒවා දේශපාලන ජීවිතයේ කේන්ද්‍රස්ථාන බවට පත් විය.
  - ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමයෙන් පෙනෙන්නේ ගෝත්‍ර පරිපාලනය, ක්‍රමයෙන් ආණ්ඩුකරණය, පිළිපැදි පෙදෙස හෙවත් භූමිය පදනම් කරගෙන ආරම්භ වී ඇති බවය.

- ග්‍රීක නාගරික රාජ්‍ය වටා, එම සමාජයේ දේශපාලන, ආර්ථික, බුද්ධිමය හා සදාචාරාත්මක ජීවිතය භ්‍රමණය වන්නට විය.

- ග්‍රීක නාගරික රාජ්‍යයට අනන්‍ය වූ අදහස් දෙකක් දක්නට ලැබේ.
  - (I) නාගරික රාජ්‍ය දේශපාලනික වශයෙන් සංවිධානය වූ ඒකකයක් වීම.
  - (II) ඒවා එකිනෙකින් ස්වාධීන වූ ඒකක වීම.

- ග්‍රීක නාගරික රාජ්‍ය වෙනත් නාගරික රාජ්‍ය සමඟ අනන්‍ය වීම ග්‍රීකයන්ට නුහුරු වූ දෙයක් වූවා සේ ම එය ජනගහනය හා භූමිය අතින් සීමිත සහ කුඩා දේශපාලන ඒකකයක් ද විය.

- එකී ජනතාව තුළ තම රාජ්‍යය ගැන ඉතා උසස් හැඟීමක් තිබිණි. නගරයේ ආගම සියලු පුරවැසියන්ගේ ආගම විය.

- එසේ ම ග්‍රීක නාගරික රාජ්‍යය තුළ ස්ත්‍රීන්ට, වහලුන්ට, ආගන්තුක ශ්‍රමිකයන්ට පවා පුරවැසි භාවය හිමිවූයේ නැත. පුරවැසි භාවය යනු දේපළ හිමි පිරිමින් සතු වූ වරප්‍රසාදයකි.

- ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පැවති ඇතන්ස් වැනි පෞර රාජ්‍යවල පුරවැසියෙකු වශයෙන් ප්‍රජාවේ කටයුතු වෙනුවෙන් සක්‍රිය ලෙස මැදිහත් වීම අපේක්ෂා කෙරිණි.

- ග්‍රීක නාගරික රාජ්‍යවල විවිධ දේශපාලන මාදිලි වර්ධනය වී තිබිණ. තනි පුද්ගල පාලන තන්ත්‍ර, කතිපයාධිකාරී පාලන තන්ත්‍ර, ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍ර, ඒකාධිපති පාලන තන්ත්‍ර, ඒවාට උදාහරණ යි.

- ග්‍රීක නගර රාජ්‍ය දේශපාලන වශයෙන් වැදගත් වන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය හා පුරවැසි දේශපාලන ක්‍රියාකාරිත්වය සම්භවය ලැබුවේ ඒවා ආශ්‍රිත ව වීම නිසා ය.

- **රාජාණ්ඩු**

  - රාජාණ්ඩු යනු බොහෝ විට පරම්පරාවෙන් රාජ්‍යත්වයට උරුමකම් කියන, තනි පුද්ගලයකු විසින් පවත්වාගෙන යනු ලබන පාලන ක්‍රමයකි. එය ලෝකයේ සෑම රටක ම දක්නට ලැබුණු පූර්ව-නූතන රාජ්‍ය මාදිලියකි.

  - රජුට/රැජිනට සුජාත භාවය ලැබුණේ සම්ප්‍රදායයෙනි.

  - දේවවරම්වාදී අදහස්වලින් රජුට රාජ්‍ය කිරීම සඳහා දෙවියන්ගෙන් බලය ලැබී ඇතැයි ප්‍රකාශ වීම නිසා, සර්වබලැති රාජාණ්ඩු ක්‍රමවල දේවධාර්මික රාජ්‍යයක ලක්ෂණ ද දක්නට ලැබිණි.

  - රාජාණ්ඩු පාලකයාට අත්තනෝමතික බලතල හිමි වූ අතර නීතිය ඔහුගේ/ඇයගේ පෞද්ගලික ආඥා මඟින් උත්පාදනය විය.

  - සර්ව බලධාරී රාජාණ්ඩුක්‍රමවල දේශපාලන ආයතන පැවතියේ අඩු සංවර්ධන අවධියක ය. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ, පරිපාලන හා යුද බලතල රජු/රැජිණ වෙත කේන්ද්‍රගත වී තිබීම එයට ප්‍රධාන හේතුව විය.
  - රාජාණ්ඩුක්‍රමවල ''පුරවැසි භාවය'' පිළිබඳ සංකල්පයක් ද නොවී ය. ඒ වෙනුවට පැවතියේ ''යටත්වැසියා'' (Subject) යන අදහස යි. යටත් වැසියන්ට නූතන පුරවැසියන්ට මෙන්

අයිතිවාසිකම් නොතිබිණ. ඒ වෙනුවට පැවතියේ වගකීම් ය.

- **ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය :-**

  - ★ සීමිත රාජ්‍යය පිළිබඳ සංකල්පය ලිබරල්වාදයේ මූලික දේශපාලන සංකල්පයකි.
  - ★ ඒකාධිපති රාජ්‍ය වාදයට එරෙහි ව මිනිස් නිදහස තහවුරු කිරීම උදෙසා 17 වැනි ශතවර්ෂයේ අග භාගයේ පටන් බ්‍රිතාන්‍යය ප්‍රමුඛ බටහිර යුරෝපය සහ ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයන්හි පැතිරගිය දේශපාලන මතවාදය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය වේ.
  - ★ ලිබරල් වාදය සහ නූතන ප්‍රජාතන්ත්‍රවාදය එකිනෙකට ප්‍රතිබද්ධ ව වර්ධනය වූ දේශපාලන සංකල්ප වේ.
  - ★ ප්‍රජාතන්ත්‍රවාදය යනු මහජනයා විසින් සිදු කෙරෙන පාලනය පිළිබඳ සංකල්පයකි. එහෙයින් එය නිශ්චිත පාලන ක්‍රමයක් සමඟ බැඳුණු සංකල්පයකි.
  - ★ ලිබරල්වාදය එක්තරා නිශ්චිත ආර්ථික ක්‍රමයක් සමඟ බැඳුණු මතවාදයකි. එනම් එය ධනවාදී ආර්ථික ක්‍රමය (කාර්මික ධනවාදී) හා බැඳුණු මතවාදය වේ.
  - ★ මේ අනුව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ධනවාදී ආර්ථික ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය එකිනෙක සම්බන්ධ කරයි.
  - ★ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය මූලික වශයෙන් ධනවාදී ආර්ථික සමාජ ක්‍රමය මත පදනම් වූ දේශපාලන ක්‍රමය වේ.
  - ★ මහජන පාලනය පිළිබඳ සංකල්පය මේ යටතේ ප්‍රමුඛ වන අතර මහජන නියෝජිතයන් විසින් සිදු කරනු ලබන පාලනය හෙවත් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක මූලික ම ලක්ෂණයකි.

- නියෝජන ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය මූලික සමාජ - දේශපාලන විචල්‍යයන් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

  - නන්වැදෑරුම් නිදහස.
  - සමානාත්මතාව.
  - බහුතරයේ පාලනය.
  - මහජන පාලනය.
  - ව්‍යවස්ථානුකූල වාදය.
  - නීතියේ ආධිපත්‍යය.
  - අධිකරණයේ ස්වාධීනත්වය.
  - වගකීම සහිත ආණ්ඩුව.
  - නිදහස් මැතිවරණය.
  - තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමය.

  (ගුරුවරයා මේ පිළිබඳ ව පන්ති කාමරයේ දී සාකච්ඡාවක නිරත වන්න.)

- **සමාජවාදී රාජ්‍ය මාදිලිය :-**

- සමාජවාදී රාජ්‍යය විසි වැනි සියවසේ වර්ධනය වූ රාජ්‍ය මාදිලියකි. එම මාදිලියේ න්‍යායික සහ මතවාදී පදනම වූයේ 19 වැනි සියවසේ යුරෝපයේ බිහි වූ මාක්ස්වාදය යි. මාක්ස්වාදය යනු කාල්මාක්ස් යන ජර්මන් චින්තකයා ගොඩනැගූ න්‍යායික, දාර්ශනික සහ චින්තන පද්ධතියකි.

- මාක්ස්වාදී දේශපාලන චින්තනයේ සමාජවාදී රාජ්‍ය මාදිලිය පිළිබඳ සංකල්පය ගොඩ නැගුණේ, 19 වැනි සියවස වන විට යුරෝපයේ වර්ධනය වී තිබුණු ධනවාදී සහ ලිබරල්වාදී රාජ්‍ය මාදිලියට විකල්පයක් වශයෙනි.

- එය වනාහි ධනවාදී සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රමය කම්කරු පන්තිය විසින් පෙරළා දමනු ලැබීමෙන් පසු ව ගොඩ නැගෙන රාජ්‍ය මාදිලිය ලෙස මාක්ස්වාදී න්‍යායන් ඉදිරිපත් කරන ලදී.

- සමාජවාදී රාජ්‍යයක අරමුණ වන්නේ ශ්‍රම සූරා කෑමෙන් තොර, සමාජයේ පන්ති විභේදනයක් නැති සමානාත්මතාවාදී සමාජයක් ගොඩ නැඟීම ය.

- සමාජවාදී රාජ්‍යක දී වැඩි වශයෙන් අවධානය යොමු කරන්නේ, පුරවැසියාගේ භෞතික ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා ය. අධ්‍යාපනය, රැකියා, නිවාස, සෞඛ්‍යය ආදි මූලික මනුෂ්‍ය අවශ්‍යතා සෑම දෙනෙකුට ම සමාන අවකාශ සහිත ව සැපයීම සමාජවාදී රාජ්‍යයේ වගකීම ලෙස සැලැකිණ.

- එනිසා පෞද්ගලික ව්‍යවසාය වෙනුවට රාජ්‍ය ආධිපත්‍යය ස්ථාපනය වේ. සමාජවාදීන් විශ්වාස කළ පරිදි කම්කරු පන්ති ආඥා දායකත්වය යටතේ ආර්ථික සම්පත් සහ නිෂ්පාදන ක්‍රියාවලියේ පෞද්ගලික අයිතිය අහෝසි කොට සමාජීය පොදු අධිකාරය ස්ථාපනය කළ විට සමාජ පන්ති අභාවයට යයි. පන්ති අසමානතා ද අහෝසි වෙයි.

- පන්ති විරහිත සමාජයක දී පන්ති ආයුධයක් වන රාජ්‍යය නමැති මර්දනකාරී සංස්ථාව තව දුරටත් අවශ්‍ය නොවන බැවින් එය වියැකී යන බව ද මාක්ස්වාදී න්‍යායයෙන් අවධාරණය කෙරිණ.

- සමාජවාදී රාජ්‍යය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයට හාත්පසින් වෙනස් ය. සමාජවාදී රාජ්‍යයේ හිමිකරුවන් වන්නේ කම්කරු පන්තිය යි. එහි දේශපාලන ක්‍රමයේ පදනම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය නොව, නිර්ධන පන්ති ආඥාදායකත්වය යි.

- දේශපාලන පක්ෂ මත පදනම් වූ දේශපාලන තරගකාරීත්වයක් එහි නැත. බහු පක්ෂ ක්‍රමය වෙනුට එහි ඇත්තේ තනි පක්ෂ ක්‍රමයකි.

- රුසියාව, චීනය, කියුබාව, උතුරු කොරියාව, වියට්නාමය, කාම්බෝජය සහ නැගෙනහිර යුරෝපයේ රටවල් කිහිපයක් සමාජවාදී රාජ්‍ය ක්‍රමය අත්හදා බැලිණ.

- සෝවියට් සංගමය සහ නැගෙනහිර යුරෝපයේ සමාජවාදය බිඳවැටීමෙන් පසු සමාජවාදී රාජ්‍යය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයට විකල්පයක් ලෙස සැලකෙන්නේ නැත.

- **ෆැසිස්ට්වාදී රාජ්‍ය :-**

- ෆැසිස්ට්වාදය යනු රාජ්‍යයේ උත්තරීතර භාවය (Glorification of the state) ශ්‍රේෂ්ඨත්වය හා අසහාය භාවයත්, වර්ගවාදයත්, රණවාදයත්, මුල් කරගත් දේශපාලන මතවාදයකි.

- එය මුලින් බිහි වූයේ 1920 දශකයේ හා 1930 දශකයේ ඉතාලියේ සහ ජර්මනියේ ය. ඉතාලියේ බෙනිටෝ මුසෝලිනී, ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර් යුරෝපීය ෆැසිස්ට්වාදයේ ප්‍රධාන ම දේශපාලන නායකයෝ දෙදෙනා ය.

- ෆැසිස්ට්වාදයේ මූලික තේමාවක් ලෙස සැලකෙන අන්ත ජාතිවාදය ඇසුරින් රාජ්‍යය පිළිබඳ ව විග්‍රහ කරන හිට්ලර් පෙන්වා දෙන්නේ ''ජාතියේ ප්‍රතිමූර්තිය රාජ්‍යය'' වන බව ය.

- ෆැසිස්ට්වාදය මඟින් රාජ්‍යය සහ ජාතිය සර්වසම තත්ත්වයට පත්කර ඇති බව එමඟින් ගම්‍ය වේ.

- ෆැසිස්ට්වාදයට අනුව රාජ්‍යය, ''ජාතියේ පිළිබිඹුව වේ'' රාජ්‍යය විසින් ජාතියේ අවශ්‍යතාව නියෝජනය කරනු ලබයි. එබැවින් රාජ්‍යය සහ ජාතිය අනන්‍යසම වේ.

- රාජ්‍යය පිළිබඳ ව ඇති ෆැසිස්ට්වාදී, නිර්වචන අතරින් වඩාත් කැපී පෙනෙන නිර්වචන දෙකක් වේ. එනම් 'රාජ්‍යය පරමෝත්තම සංවිධානය වේ' යන්න සහ 'රාජ්‍යය සර්ව බලධාරී සංවිධානය වේ' යන නිර්වචන දෙක යි.

- නීට්ෂේ ඉදිරිපත් කළ ''සුපිරි මිනිසා'' (Super Man) යන සංකල්පය, රාජ්‍යය පිළිබඳ ෆැසිස්ට්වාදී මතය කෙරෙහි ප්‍රබල වශයෙන් බලපා තිබේ. එමඟින්, රාජ්‍යයේ සුපිරි භාවය, උත්කෘෂ්ට භාවය, පරමෝත්තම වේ ය යන විනිශ්චය මඟින් රාජ්‍යයට සමාන කළ හැකි අන් කිසිදු සංවිධානයක් නොමැත්තේ ය. යන්න දක්වනු ලැබේ.

- 'රාජ්‍යය සර්ව බලධාරී' වේ යන්නෙන් අදහස් වන්නේ එහි බලය අසීමිත වේ, බලය උත්තරීතර හා අසහාය බලයක් වේ යනු යි.

- ෆැසිස්ට් රාජ්‍යය සමාජ සංවිධානයක් නොව, එය සමාජයට ඉහළින් පවතින්නක් වේ. රාජ්‍යය අද්භූත, ගුප්ත ස්වභාවයක් දරන අතර එහි යථා ස්වභාවය වටහා ගැනීමට සාමාන්‍ය ජනතාවට නොහැකි වේ.

- එසේ ම රාජ්‍යයේ උපත, එහි වර්තමාන ස්වභාවය හා රාජ්‍යයේ අනාගතය පිළිබඳ ව ක්‍රමානුකූල විග්‍රහයක් ෆැසිස්ට්වාදය මඟින් ඉදිරිපත් නොකෙරේ. ''රාජ්‍යය සදාතන වේ'' යන්න අවධාරණය කෙරේ. ඉන් අදහස් වන්නේ රාජ්‍යයට ආරම්භයක් හෝ අවසානයක් හෝ නොතිබෙන බව ය.

- ''රාජ්‍යය හා සමාජය සර්ව සම වේ'' යනුවෙන් අර්ථ නිරූපණය කරන ෆැසිස්ට්වාදීහු සමාජය සහ පුද්ගලයන් නොසලකා හරිමින් රාජ්‍යයේ වැදගත්කම පමණක් ඉස්මතු කළහ. පුද්ගල විමුක්තිය සාක්ෂාත් වන්නේ රාජ්‍යයට සහ රාජ්‍යයේ ආධිපත්‍යයට පුද්ගලයා සාකල්‍යයෙන් ම අවනත වීම මඟිනි.

- සමාජයේ ජනතාව වැදගත් නොවන බවත්, වැදගත් වන්නේ රාජ්‍යය පමණක් බවත්, හුවා දක්වන ෆැසිස්ට්වාදය ''රාජ්‍යය-පාලකයා වේ'' එනම් රාජ්‍යය හා පාලකයා සර්ව සම වේ. එබැවින් රාජ්‍යයේ ප්‍රතිමූර්තිය පාලකයා වන්නේ ය යන බව පෙන්වා දුන්නේ ය.
- මේ අනුව ෆැසිස්ට් රාජ්‍යයේ පාලකයා සර්වතෝභද්‍ර ය. එනම් ඥානවන්ත බව, ගුණගරුකත්වය, මානව දයාව, රණ ශූරත්වය, වීරත්වය, රාජ්‍ය තාන්ත්‍රික භාවය, දේශ ප්‍රේමීත්වය යන

ගුණාංගවලින් ෆැසිස්ට් පාලකයා පරිපූර්ණ වේ. නායකයාට සාකල්‍යයෙන් කීකරු වීම පුරවැසියන්ගෙන් අපේක්ෂා කරන්නේ ඒ නිසා ය. නායක වන්දනය හුවා දැක්විය යුතු ය.

- ෆැසිස්ට් රාජ්‍යයේ සෑම ජන මාධ්‍යයක් ම නායක වන්දනය හුවා දැක්විය යුතු ය. දේශපාලන පක්ෂ, බලපෑම් කණ්ඩායම් සම්පූර්ණයෙන් ම තහනම් ය.

- ජනතාවගේ දේශපාලන සහභාගීත්වය ෆැසිස්ට්වාදය ප්‍රතික්ෂේප කරයි. රාජ්‍ය පාලන ක්‍රියාදාමය සම්පූර්ණයෙන් ම පාලකයාගේ ඒකාධිකාරය යටතේ සිදු වන අතර, රාජ්‍යයේ නීතිය වන්නේ පාලකයාගේ අභිමතය යි.

- සන්නද්ධ බලය ෆැසිස්ට් රාජ්‍යයේ පදනම වේ. ෆැසිස්ට් රාජ්‍යයට තමා හැර වෙනත් කිසි දු ආකාරයක සමාජ අරමුණු නැත. ''රාජ්‍යය-රාජ්‍යය ම අරමුණු කරගෙන පවතී. එනම් රාජ්‍යය-රාජ්‍යය උදෙසා පවතී''

- **යටත් විජිත රාජ්‍යය :-**

  - ''යටත් විජිත රාජ්‍යය'' යනුවෙන් හැඳින්වෙන්නේ බ්‍රිතාන්‍ය, ප්‍රංශ, ඕලන්ද, ස්පාඤ්ඤ ආදි යුරෝපීය යටත් විජිත බලවේගවල ඍජු බලයට යටත් ව සිටි, යුරෝපීය නොවන සමාජවල වර්ධනය වූ රාජ්‍ය මාදිලියයි. එම රාජ්‍ය මාදිලිය, ඓතිහාසික වශයෙන් වර්ධනය වූයේ 16 වැනි සියවසින් පසු ව ය.

  - ලංකාවේ ද යටත් විජිත රාජ්‍යයේ විකාශනය ආරම්භ වූයේ 16 සියවසේ මුල් භාගයේ පටන් ගත් පෘතුගීසි යටත් විජිත පාලනය යටතේ ය. 1815 දී මුළු දිවයින ම බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතට ගැනුණු පසු, මුළු රටෙහි ම දේශපාලන ව්‍යූහය, බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ වෙනස් විය.

  - යටත් විජිත රාජ්‍යයට පෙර පැවති පූර්ව-යටත් විජිත රාජ්‍යය එක්කෝ ලංකාව, බුරුමයේ, ඉන්දුනීසියාවේ හෝ ඉන්දියාවේ මෙන් වැඩවසම් රාජාණ්ඩු විය. නැතහොත් බොහෝ අප්‍රිකානු රටවල මෙන්, ගෝත්‍රික රාජ්‍ය විය.

  - යටත් විජිත රාජ්‍යය ප්‍රතිෂ්ඨාපනය කිරීම නිසා, මෙම යටත් විජිත සමාජයන්හි දේශපාලන ක්‍රමවල පහත සඳහන් වෙනස්කම් සිදු විය.

    (i) විශාල භූමි ප්‍රදේශ එක රාජ්‍යයක ආධිපත්‍යයට ගැනීම නිසා යටත් විජිත රාජ්‍යය, පූර්ව-යටත් විජිත රාජ්‍යවලට වඩා විශාල භෞමික රාජ්‍යය බවට පත් වීම.

    (ii) යටත් විජිත රාජ්‍යය පිහිටුවන ලද්දේ යුද්ධ ක්‍රියාමාර්ග මඟින් නිසා යටත් විජිත රාජ්‍ය වර්ධනය වූයේ මිලිටරි රාජ්‍යය වශයෙනි. දේශීය සමාජයෙන් එල්ල වූ කැරලි හා විරෝධතා මැඩපැවැත්වීමට යටත් විජිත රාජ්‍යයේ යුද්ධ ශක්තියත්, යුද හමුදාවත් නිරතුරු ව පවත්වාගෙන යනු ලැබිණ.

    (iii) යටත් විජිත රාජ්‍යය මධ්‍යගත රාජ්‍ය තන්ත්‍රයක් මත සකස් වූවක් විය. යටත් විජිත පාලනය විසින් මෙම සමාජවල ඇති කරන ලද ප්‍රධාන දේශපාලන වෙනසක් වන්නේ, මධ්‍යගත රාජ්‍යය ව්‍යූහයක් ගොඩ නැඟීම යි. පසු ව පශ්චාත්-යටත් විජිත රාජ්‍යය ගොඩ නැඟුණේ එම ව්‍යූහය පදනම් කොට ගෙනය.

    (iv) යටත් විජිත සමාජවල යටත් විජිත රාජ්‍යය ගොඩ නගන ලද්දේ මිලිටරි-නිලධාරිවාදී රාජ්‍ය වශයෙනි. එය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ද නොවී ය. දේශීය සමාජයේ නියෝජිතයන්, යටත් විජිත රාජ්‍යය ව්‍යූහයට සම්බන්ධ කරගන්නා ලද්දේ, දේශීය

සමාජයේ නියෝජිතයන් හැටියට නො ව, යටත් විජිත රාජ්‍යයේ ම නියෝජිතයන් (ඒජන්තයන්) ලෙස ක්‍රියා කිරීමට ය. යටත් විජිත රාජ්‍යයට සේවය කිරීම වෙනුවෙන් ඔවුන්ට ඉඩම්, නින්දගම්, තනතුරු සහ මූල්‍ය ප්‍රතිලාභ ලැබිණ. යටත් විජිත රාජ්‍යය වෙනුවෙන් අයබදු එකතු කිරීමත්, නීතිය සහ සාමය පවත්වා ගැනීමත්, එම දේශීය නිලධාරීන් වෙත පැවරුණු ප්‍රධාන කාර්ය විය.

- **පශ්චාත් යටත් විජිත රාජ්‍යය** -

  - පශ්චාත් යටත් විජිත රාජ්‍ය විශේෂ රාජ්‍ය මාදිලියක් ලෙස න්‍යායික ව තර්කයක් ලෙස ගොඩ නැගුවේ පකිස්තානු සම්භවයක් සහිත හම්සා අලාවි (Hamza Alavi) නම් වූ න්‍යායවේදියා ය.

  - 1972 දී *New Left Review* සඟරාවේ පළ කළ "State in Post-colonial Societies: Pakistan and Bangaladesh" යන රචනය ඊට පාදක විය.

  - හම්සා අලාවිගේ න්‍යායය සහ වෙනත් ප්‍රවේශයන් ද ඇසුරෙන් පශ්චාත් - යටත් විජිත රාජ්‍යයේ විශේෂ ලක්ෂණ මෙසේ ඉදිරිපත් කළ හැකි ය.

(I) පශ්චාත් - යටත් විජිත සමාජවල ඇති රාජ්‍යය, එම සමාජවල පැවති යටත් විජිත රාජ්‍ය ව්‍යුහය තව දුරටත් ඉදිරියට ගෙන යෑමක් විය. යටත් විජිත පාලනයෙන් ලැබුණු දේශපාලන නිදහස එම ව්‍යුහවලින් කැඩී වෙන් වීමට තුඩු දී නැත.

(II) පශ්චාත් යටත් විජිත රාජ්‍ය බොහොමයක ම ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනය සාර්ථකව හෝ කල් පවත්නා ලෙස හෝ සිදු වී නැත. හමුදා කුමන්ත්‍රණවලින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍ර පෙරළා දැමීම සහ අධිකාරවාදී පාලන තන්ත්‍ර බිහි වීම මෙම සමාජවල පොදු ලක්ෂණ වී තිබේ. එයට ව්‍යතිරේක වී තිබෙන්නේ ඉන්දියාව සහ ලංකාව වැනි පශ්චාත් යටත් විජිත සමාජ අතළොස්සකි.

(III) පශ්චාත්-යටත් විජිත රාජ්‍යයේ ඇති සුවිශේෂ ලක්ෂණය නම් එම රටවල සාපේක්ෂ වශයෙන් ශක්තිමත් සහ බලසම්පන්න මිලිටරි සහ සිවිල් නිලධර ව්‍යුහයක් රාජ්‍ය තන්ත්‍රයේ කේන්ද්‍රීය ආයතන ලෙස කටයුතු කිරීම යි. ඒවා යටත් විජිත පාලන ක්‍රමය තුළ දී ගොඩ නගනු ලැබූ ඒවා ය, යටත් විජිත වාදයෙන් ලැබුණු දේශපාලන නිදහස නිසා එම ව්‍යුහ වෙනස් වූයේ නැත. ඒවා දේශපාලන පක්ෂ සහ සිවිල් දේශපාලන ආයතනවලට වඩා බලසම්පන්න ය.

(IV) දේශපාලන පක්ෂ සිවිල් දේශපාලන ආයතනවලට වඩා බලවත් ව, මිලිටරි සහ නිලධරතාන්ත්‍රික ව්‍යුහයක් මතු වීම පශ්චාත් යටත් විජිත රාජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදීත්වයට පරිවර්තනය වීමට ඇති ව්‍යුහාත්මක බාධාවක් විය.

- **නව ලිබරල්වාදී රාජ්‍යය** ඃ-

**ආර්ථික පසුබිමඃ**

- රාජ්‍ය සුභසාධන සංකල්පය තුන් වන ලෝකයෙන් ගිලිහී යාම ආරම්භ වීමත්, සමාජ වාදය ලෝක පරිහානියට පත්වීමත් නිසා ලෝක ධනවාදී ආර්ථික හා දේශපාලන බලවේගයන්ට ලොව පුරා නිරුපද්‍රැත ව තහවුරු වීමට අවකාශය සැලසිණි.

- එම පසුබිමේ ජාතික රාජ්‍යයේ දේශසීමාව ඉක්මවා වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය ශීඝ්‍ර ව්‍යාප්තියකට ලක් විය.

- මෙම මූල්‍ය ප්‍රාග්ධනය මුල්කරගත් ධනේශ්වර වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක වීම හේතු කරගෙන ''ගෝලීයකරණය'' සංකල්පය බිහි විය.

- ධනවාදී ආර්ථික ක්‍රමයේ මුල් යුගයේ රාජ්‍ය ප්‍රතිපත්තිය වූයේ නිර්බාධවාදය යි. එමඟින් සිදුවූයේ රාජ්‍යය, ආර්ථික කටයුතුවලට මැදිහත් නොවීම හෙවත් බාධා නොකිරීම ය.

- මුල් කාලීන රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්ති අවලංගු වී ගියේ, සුභසාධක රාජ්‍ය සංකල්පය පුළුල් ලෙස පැතිරී ගිය පසුබිමක ය.

- 1960 දශකය වන විට රාජ්‍ය සුභසාධන වාදය ක්‍රමයෙන් අවලංගු වී කළමනාකාරී රාජ්‍ය සංකල්පය පැතිරිණ.

- මෙසේ ලිබරල් රාජ්‍ය ආණ්ඩු පාලනයට පමණක් සීමා කිරීම නව ලිබරල් රාජ්‍යයේ මූලික ලක්ෂණයක් විය.

- ධනවාදී වෙළෙඳපොළ ආර්ථිකය ජගත්කරණයට බඳුන් වීම නිසා ලෝකයේ දේශපාලන සන්දර්භය ප්‍රබල වෙනසකට පරිවර්තනය වූ අතර, වෙළෙඳපොළ ආර්ථිකයට අනුරූපික ලෙස ජගත්කරණය වූ සංස්කෘතියක් ද වර්ධනය විය.

- මෙවැනි තත්ත්වයක් අනුව ජාතික රාජ්‍යය හුදෙක් ම නාම මාත්‍රික භාවයට පත් වීමත්, රාජ්‍ය ආර්ථික කටයුතුවලින් විනිර්මුක්ත වීමත් අනිවාර්ය අංගයක් වන්නේ ය. එනම් ජාතික රාජ්‍යය දේශ සීමා ඉක්මවා ව්‍යාප්ත වී ඇත. වෙළෙඳපොළ හැසිරවීම සඳහා කිසි දු ප්‍රයත්නයක් දැරීමට රාජ්‍යයට අවකාශයක් නොමැත.

- වෙළෙඳපොළ ආර්ථිකයට ඉඩ දෙනු වස් ජාතික ආර්ථිකයක් විවෘත කිරීමට රාජ්‍යය පියවර ගත යුතු අතර, ජගත් ආර්ථිකය හැසිරවීමේ සම්පූර්ණ කාර්ය භාරය, ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල, අන්තර්ජාතික වෙළෙඳ සංවිධානය හා බහු ජාතික සමාගම් වැනි අන්තර්ජාතික සංවිධාන විසින් කරනු ලැබේ.

- එහෙයින් ආර්ථිකය හැසිරවීමේ කාර්යය වත්මන් රාජ්‍යයට අයත් වූවක් නොවේ. මෙවැනි පසුබිමක රාජ්‍යයට පැවරී ඇති කාර්යය වන්නේ නිදහස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය සාමකාමී පරිසරයක් ස්ථාපිත කිරීම, යුක්තිය පසිඳලීම සහ කළමනාකරණය යි.

- මෙහි දී කළමනාකරණය යනුවෙන් අදහස් කළේ ධනවාදී වෙළෙඳපොළ ආර්ථිකය යථා පරිදි පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය සියලු ආකාරයේ තත්ත්වයන් සම්පාදනය කිරීම සහ මෙහෙයවීම මුල් කරගත් කළමනාකරණය යි.

**දේශපාලන චින්තන පසුබිම:**

- නව ලිබරල්වාදී අදහස් පළ කළ දේශපාලන චින්තකයන් අතරින් රොබට් නෝසික්, ෆෙඩ්රික් වෝන් හයෙක් වැන්නෝ ප්‍රධාන වෙති.

- නව ලිබරල් වාදීන් පෙන්වා දෙන අන්දමට සෑම මිනිසකුට ම එක්තරා නිශ්චිත අයිතිවාසිකම් සමුදායක් උරුම වී පවතී. මේවා කිසි සේත් ම පැහැරගත නොහැකිය. අත්හළ නොහැකි සහ අන් සතු කළ නොහැකි ඒවා ය. ඒවා රාජ්‍ය නිසැක ව ම ලබාදුන් ඒවා නොවන බැවින් ඒවායේ සමබරතාව ඇති කිරීම සඳහා රාජ්‍ය මැදිහත් නොවිය යුතු ය.

- රොබට් නෝසික් (Robert Nozik) දක්වා ඇති අන්දමට පුද්ගලයාගේ දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍ය බලය ඉතා ම අවම වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

- රාජ්‍යයේ බලය පොලිස් බලයකට වැඩි යමක් නොවිය යුතු ය. පුද්ගලයාගේ දේපළ පිළිබඳ අයිතිය වඩාත් වැදගත් වනවා මෙන් ම එම අයිතිය නොකෙලෙසිය යුතු බව ද ඔහු පෙන්වා දෙයි. වත්මන් ධනේශ්වර ආර්ථික ක්‍රමයේ නව ප්‍රවණතාවට අනුරූපික ව රාජ්‍යයේ ස්වභාවය වෙනස් කරනු පිණිස නව ලිබරල් වාදී අදහස් මේ අයුරින් ඉදිරිපත් වී තිබේ.

- වර්තමාන දියුණු ධනේශ්වර රාජ්‍යයන්හි මෙන් ම අඩු දියුණු ධනේශ්වර රාජ්‍යවල පවා රාජ්‍ය සුභසාධන කටයුතුවලට මැදිහත් වීම මතභේදාත්මක ය. අන්තර්ජාතික මූල්‍ය සංවිධානවල නියමය වී ඇත්තේ අඩු දියුණු රාජ්‍යවල සුභසාධන රාජ්‍ය වියදම් අහෝසි කළ යුතු බව ය.

- මෙවැනි තත්ත්වයක් අනුව ඔවුන් සමාජයේ දිළින්දන් වෙනුවෙන් යෝජනා කරන විසඳුම වන්නේ, රාජ්‍ය නොවන සංවිධාන මඟින් සහනාධාර ලබාදීමේ ක්‍රියා පිළිවෙත යි. මේ අනුව අන්තර්ජාතික අධිරාජ්‍යවාදයෙන් ආධාර ලබන රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් ලෝකයේ ක්‍රියාත්මක වනු දැකිය හැකි ය.

- ධනේශ්වර ආර්ථික ක්‍රමයේ වර්ධනයට බලපෑ නිර්බාධවාදී ප්‍රතිපත්තිය එය බිඳ වැටීමට හේතු සාධක බවට පත් වූ අතර, ඊට විකල්පය වී ඉස්මතු වූ රාජ්‍ය සුබසාධන ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟීමෙන් ධනවාදී සමාජ-ආර්ථික ක්‍රමය යළි පුනර්ජීවනයට පත්ව ස්ථාවර සමාජ ක්‍රමයක් බවට පත් විය. මෙලෙස ධනවාදී ක්‍රමය ස්ථාවර වීම, දිගුකාලීන ව ඊට පැවති බලවේගයක් වූ සමාජවාදී සමාජ ක්‍රමය බෙලහීන කිරීමට සමත් විය.

**අවම රාජ්‍ය සංකල්පය:**

- එහෙයින් රාජ්‍යය සුභසාධනවාදයේ ඓතිහාසික කාර්යභාරය අවසන් කරමින් ධනේශ්වර ක්‍රමයේ සැබෑ මූල්‍යවාදී අරමුණු යළි ඉස්මතු වීම විසි වන සියවසේ අග භාගයේ දී අවම රාජ්‍ය (minimalist state) සංකල්පය පැන නැඟීම මඟින් සංකේතවත් කෙරිණි.

- අවම රාජ්‍ය සංකල්පය මඟින් නැවත වතාවක් රාජ්‍යයේ කාර්ය භාරය සීමා කිරීමට හෙවත් අවම කිරීමක් දැකිය හැකි ය. එහෙත් එය නිර්බාධ රාජ්‍යයේ තරම් සමාජ, ආර්ථික කටයුතුවලින් ඈත් වීමක් ඉවත් ව සිටීමක් හෝ මැදිහත් නොවී සිටීමක් නොවේ.

- මෙහි දී රාජ්‍ය මැදිහත් වන්නේ සමාජ, දේශපාලන කටයුතු කළමනාකරණය කිරීම සඳහා සීමිත වූ ප්‍රමාණයකිනි. එහෙත් එය සුභසාධක රාජ්‍යයේ තරම් පුළුල් හා පහසු මැදිහත් වීමක් ද නොවේ. ඒ අනුව රාජ්‍ය නිර්බාධවාදය හා සුභසාධන වාදය යන දෙකට අතරමැදි තත්ත්වයක් ලෙස අවම රාජ්‍යය හඳුනා ගත හැකි ය.

## 3.3. රාජ්‍යය පිළිබඳ දේශපාලන සංකල්ප.

### 3.3.1 රාජ්‍යය සහ ස්වාධිපත්‍යය :-

- ස්වාධිපත්‍යය යන්නෙහි අදහස ''උත්තරීතර'' යන්න යි. ස්වාධිපත්‍යය බලය යන්නෙන් අදහස් කරන්නේ රාජ්‍යය සතු උත්තරීතර බලයකි.

- මේ පදය පළමු වරට දේශපාලන විද්‍යා සාහිත්‍යයේ භාවිතයට ගනු ලැබුවේ ජීන් බොඩෑන් (Jean Bodin) විසිනි ඔහු ස්වාධිපත්‍යය අර්ථකථනය කළේ නීතියෙන් සීමා නොවූ පුරවැසියන්, යටත් වැසියන් කෙරෙහි යෙදවිය හැකි රාජ්‍ය සතු උත්තරීතර බලය යනුවින. ස්වාධිපති ධාරී සංස්ථාව වෙනත් කිසිදු සමානයකුට යටත් නොවේ.

- මේ අනුව ස්වාධිපත්‍යයට පැතිකඩ දෙකක් තිබේ.
  I අභ්‍යන්තර ස්වාධිපත්‍යය (Internal Sovereignty)
  II බාහිර ස්වාධිපත්‍යය (External Sovereignty)

- අභ්‍යන්තර ස්වාධිපත්‍යය යනු ඕනෑ ම නිදහස් රාජ්‍යයක් තම රාජ්‍යයෙහි ජීවත් වන තැනැත්තන්ගේ අවනත භාවය ලබා ගැනීමට නෛතික බලය සහිත බව ය.

- බාහිර ස්වාධිපත්‍යය යනු වෙනත් කිසිදු ස්වාධිපති බලයකට එය යටත් නොවන බවයි. මේ අනුව ස්වාධිපති රාජ්‍යයකට තම විදේශ ප්‍රතිපත්තිය බලපෑම්වලින් තොර ව පවත්වා ගැනීමට හැකියාව තිබේ.

- ස්වාධිපති බලය ස්ථාවර, සියල්ල වසා පැතිරෙන, නොබෙදිය හැකි, අන් සතු කළ නොහැකි, පැවරිය නොහැකි ඒකීය දෙයක් ලෙස සැලකේ.

- ස්වාධිපත්‍ය බලය පිළිබඳ සංකල්පය සන්ධීයවාදය හා ගෝලීයකරණ ක්‍රියාවලිය යටතේ බරපතළ අභියෝගයකට ලක් වී තිබේ. ජාතික රාජ්‍යයක් තුළ සිටින විවිධ ජන වාර්ගික කොටස් එක්සත් කිරීම සඳහා ස්වාධිපත්‍ය බලය බෙදා හැරීමේ නැඹුරුවක් වර්ධනය වෙමින් පවතී.

- තවත් අතකින්, ස්වාධිපත්‍ය බලය ගෝලීයකරණ ක්‍රියාවලිය මඟින් ද අභියෝගයකට ලක් ව තිබේ.

- වර්තමානයේ ලෝකයේ පොදු ප්‍රතිපත්ති ජාතික මට්ටමේ ස්වාධිපත්‍ය ඒකක මඟින් තීන්දු කරනවාට වඩා ප්‍රබල ව උපරිජාතික (Super-National Organzations) සංවිධානවලින් තීරණය වේ.

- ජාතික රාජ්‍යයන්ට දේශීය ව තීරුබදු ප්‍රතිපත්තිය හා අපරාධ යනු කුමක්ද යි තනි ව තීරණය කළ හැකි ව තිබූ බැවින් එහි අභ්‍යන්තර ස්වාධිපත්‍යය වලංගු ව පවතී යැයි පිළිගැනිණි.

- එහෙත් වර්තමාන ප්‍රාග්ධන ගලායාමත් සමඟ (Capital Flight) ඇති වූ වෙළෙඳාම නියාමනය කරන ලෝක වෙළෙඳ සංවිධානය වැනි ආයතන අන්තර්ජාතික මානව හිමිකම්, නීති හා සම්ප්‍රදාය සහ අපරාධ යනු කුමක්ද යි තීරණය කිරීමත් සමඟ ස්වාධිපත්‍යය ද අභියෝගයට ලක් ව ඇත.

- එබැවින් වර්තමාන ජාතික රාජ්‍ය යනු ලෝක පරිමාණ උපරි ජාතික ආයතනවලින් ගනු ලබන ප්‍රතිපත්ති දේශීය ව ක්‍රියාවට නඟන ඒජන්තවරයකුගේ තත්ත්වයට පත් ව ඇති බවට තර්කයක් මතු ව තිබේ.

- මේ පසුබිම තුළ ප්‍රබල රාජ්‍යන්හි ස්වාධිපත්‍යය වර්ධනය වී දුබල රාජ්‍යයන්හි ස්වාධිපත්‍යය නාය යෑමට ලක් ව ඇති බව යි.

### 3.3.1 රාජ්‍යය සහ පුරවැසියා :-

- පුරවැසියා යන්නෙහි සරල අදහස ''නගරයේ වසන්නා'' යන්න යි. එහි වර්තමාන අර්ථය ''රාජ්‍යයේ සාමාජිකයා'' යන්න යි.

- පුද්ගලයා තම පොදු ජීවිතය සම්බන්ධ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගි වන ආකාරය අනුව ''පුරවැසියා'' යන්න තීරණය වේ.

- ඇරිස්ටෝටල්ට අනුව පුරවැසියා යනු රාජ්‍යයේ කාර්යභාරයට සක්‍රිය ව සම්බන්ධ වන තැනැත්තා ය.

- මෙම අදහස ඔහු ඉදිරිපත් කළේ කුඩා ග්‍රීක නාගරික රාජ්‍යය යන පසුබිමෙහි ය.

- නූතන සංකීර්ණ රාජ්‍ය ක්‍රමයේ දී ග්‍රීක නාගරික රාජ්‍යවල දී මෙන් පුරවැසියන්ට රාජ්‍ය පාලන කටයුතුවලට සෘජු ව සම්බන්ධ විය නොහැකි ය. එය ක්‍රියාත්මක වන්නේ ජනතා නියෝජිතයන් මාර්ගයෙනි.

- නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යවල නීති සම්පාදකයන් හා විධායකය ජනතා නියෝජිතයන් හෝ ජනතාවට වගකියන පුරවැසියන් හෝ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන් අදහස් වන්නේ පුරවැසියන් පොදු තීරණ ගැනීමට ජනතා නියෝජිතයන් මඟින් සම්බන්ධ වන වගකිවයුතු නිලධාරීන් වන බව ය.

- එහෙයින් රාජ්‍යයේ කටයුතු සම්බන්ධයෙන් පුරවැසියන්ගේ කාර්යභාරය නූතන රාජ්‍යයේ වෙනස් වීම්වලට අනුව හැඩ ගැන්වී ඇත.

- වර්තමානයේ දී රාජ්‍යය හා පුරවැසියා අතර සම්බන්ධතාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් තිබේ.
  - I පුරවැසියන් භුක්ති විඳින දේශපාලන අයිතිවාසිකම්.
  - II පුරවැසියන්ගේ දේශපාලන වගකීම්.

- ඒ අනුව පුරවැසියා යනු රාජ්‍යයේ සුභසාධනය හා අයිතිවාසිකම් භුක්ති විඳින රාජ්‍යයට ඒ වෙනුවෙන් අවනත භාවය දක්වන්නෙකි.

- රාජ්‍යයක භූමිය තුළ ජීවත් වන්නවුන්ට පුරවැසි භාවය ප්‍රදානය කළ හැකි හා අහිමි කළ හැකි එක ම එක ආයතනය රාජ්‍ය යි. එහෙත් සැබෑ තත්ත්වය වන්නේ රාජ්‍යය පාලනය කරන අයට එය තීරණය කිරීමට හැකි වීම ය.

- T.H. Marshall වැනි අය මේ සංකල්පයට ''සමාජ පුරවැසි භාවය'' යන්න එක් කර ඇත. ඒ අයට අනුව, රැකියාවක් කිරීමට, නිවසක් හිමි කරගැනීමට ඇති අයිතිය වැනි දෑ ද සමාජ

පුරවැසි භාවය විසින් අර්ථ ගන්වනු ලබයි. මාෂල්ගේ මෙම 'සමාජ පුරවැසි භාවය' යන අදහස 'ලිබරල් පුරවැසි භාවයට' විකල්පයකි.

- රාජ්‍යයට පුරවැසියා අවනත භාවය දැක්විය යුත්තේ ඇයි දැයි යන ප්‍රශ්නයට දේශපාලන චින්තකයන් විවිධ පිළිතුරු සපයා ඇත.

  ★ ඇරිස්ටෝටල්ට අනුව රාජ්‍යයේ අවසාන අරමුණ සියලු පුරවැසියන්ගේ සුභසාධනය සහ යහපත් වූ ජීවිතයක් සලසා දීම ය. පුරවැසියාට සදාචාරාත්මක වශයෙන් උසස් වූ, සතුටු ජනක උත්තරීතර ජීවිතයක් රාජ්‍යය තුළ දී සැපයේ.

  ★ සමාජ ගිවිසුම් න්‍යායට අනුව පුරවැසියා රාජ්‍ය බිහිකර ගැනීමත් සමඟ රාජ්‍යයට අවනත භාවය දැක්වීමට එකඟතා සම්මුතියක් ඇති කරගනී. ඒ වෙනුවෙන් රාජ්‍ය පුරවැසියාට ආරක්ෂාව හා සමාජ ආරක්ෂාව සපයයි.

  ★ ලිබරල් වාදී න්‍යායට අනුව පුරවැසියාගේ ස්වාභාවික අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන්නේ රාජ්‍ය විසින් නිසා පුරවැසියා රාජ්‍යයට අවනත විය යුතු ය.

  ★ රූසෝ දක්වා සිටි පරිදි රාජ්‍යය පොදු කැමැත්ත නියෝජනය කරන අතර එමඟින් නියෝජනය වන්නේ තමන්ගේම පොදු කැමැත්ත ය. එබැවින් පුරවැසියා රාජ්‍යයට අවනත විය යුතු ය.

- **රාජ්‍යය, ආණ්ඩුව සහ පාලන තන්ත්‍රය අතර සම්බන්ධතා හා වෙනස්කම් :-**

  - ඕනෑ ම සමාජයක පවතින මූලික සහ කේන්ද්‍රීය දේශපාලන ආයතන වන්නේ රාජ්‍යය සහ ආණ්ඩුව යි.

  - සමාජයේ ඇති අනෙක් බොහෝ දේශපාලන ආයතන ප්‍රභවය ලබන්නේ ද රාජ්‍යය සහ ආණ්ඩුව වෙතිනි.

    නිදසුන් :- පාර්ලිමේන්තුව, කැබිනට් මණ්ඩලය, අධිකරණ, පළාත් පාලන ආයතන, සන්නද්ධ හමුදා, පොලිසිය, සිරගෙවල්, පාසල්, විශ්වවිද්‍යාල, දෙපාර්තමේන්තු යනා දී වශයෙනි.

  - රාජ්‍යය සහ ආණ්ඩුව එකිනෙකට සම්බන්ධ ය. එහෙත් ඒ දෙක එකක් ම නොවේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල රාජ්‍යය යනු සාපේක්ෂ වශයෙන් දීර්ඝ කාලයක් ස්ථාවර ව පවත්නා, සමාජයේ ඇති අතිමූලික දේශපාලනික සංවිධානය යි.

  - ආණ්ඩුවක් යනු, රාජ්‍යයේ කටයුතු සහ වගකීම් ඉටු කිරීම සඳහා මහජනතාව විසින් කෙටි කාලයකට බලය ලබා දෙනු ලබන සංවිධානයක් වේ.

  - පූර්ව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල මෙම වෙනස නොතිබුණි.

    නිදසුන් :- රාජාණ්ඩුවක් තුළ මහජනතාව තෝරාගත් ආණ්ඩුවක් නොතිබිණ අතර, රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙන් කිරීමක් ද නොවීය. රජතුමා, රාජ්‍යය ද ආණ්ඩුව ද විය.

- රාජ්‍යය සහ ආණ්ඩුව අතර ආයතනික වෙන් වීම, යුරෝපයේ වැඩවසම් දේශපාලන ව්‍යුහය හා රාජාණ්ඩුව බිඳ වැටීමෙන් පසු බිහි වූ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයක් විය.

- රාජ්‍යය වනාහි මනා ව සංවිධානය වූ, නිශ්චිත භෞමික ප්‍රදේශයකින් ද, දේශපාලන වශයෙන් සංවිධානය වී පුරවැසි ප්‍රජාවක් මත තම ආධිපත්‍යය සහ බලය පවත්වා ගැනීමේ අයිතියක් හා අධිකාරයක් ද සහිත දේශපාලන සංවිධානයක් වේ.

- තම අධිකාරි බලය පවත්වාගෙන යාමට රාජ්‍යයට ඇති ආයතන අතුරෙන් ආණ්ඩුව, එක් ආයතනයක් පමණක් වේ.

- රාජ්‍යයට ඇති මූලික නෛතික ව්‍යුහය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වන අතර, රාජ්‍යයේ ස්වභාවය, ව්‍යුහය, ආයතනික සංයුතිය යන මේවා එමඟින් තීරණය කරයි.

- රාජ්‍යය තම අධිකාරි බලය ක්‍රියාත්මක කරන්නේ තමන් සතු ව්‍යවස්ථාදායකය, විධායකය අධිකරණය, සන්නද්ධ හමුදා සහ නිලබල තන්ත්‍රය පදනම් කරගෙන ය.

- මෙහි දී ආණ්ඩුව ක්‍රියා කරන්නේ රාජ්‍යයේ බලතල ක්‍රියාත්මක කරන ප්‍රධානතම නියෝජිත ආයතනය හැටියට යි. නීති සම්පාදනය, සහ ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති සම්බන්ධතා පැවැත්වීම සහ අනෙකුත් රාජ්‍යයන් සමඟ සම්බන්ධතා පැවැත්වීම යන ඒවා රාජ්‍යය වෙනුවෙන් ආණ්ඩුවක් ඉටු කරගත යුතු ප්‍රධාන කාර්ය වේ.

- **පාලන තන්ත්‍රය** (Regime) :-

  - පාලන තන්ත්‍රය (Regime) යන සංකල්පය 'ආණ්ඩුව' යන්නට තරමක් සමාන වුවත්, එයට වෙනස් අර්ථයක් ඇත්තකි. ආණ්ඩුවක් යනු රාජ්‍යයේ කටයුතු කිරීම සඳහා මහජනතාව විසින් පත් කරනු ලබන ආයතනික ව්‍යුහය යැයි අපි ඉහත දී දුටුවෙමු. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ ආණ්ඩුවක් යනු පාර්ලිමේන්තුවේ බහුතරය හිමි ව සිටින අගමැති සහ කැබිනට් මණ්ඩලය විසින් නායකත්වය දෙනු ලබන ආයතනික ව්‍යුහය යි.

  - එක් එක් ආණ්ඩුවක් එහි මතවාද සමාජ පදනම් හා නායකත්වය සම්බන්ධ ව ඇති විශේෂතා පදනම් කොටගෙන එම ආණ්ඩුව හැඳින්වීමේ දී ''පාලන තන්ත්‍රය'' (Regime) යන පදය භාවිත කෙරේ. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

    - ආණ්ඩුවේ නායකත්වය අනුව ආණ්ඩුවක් හැඳින්වීම - රාජපක්ෂ පාලන තන්ත්‍රය, ජයවර්ධන පාලන තන්ත්‍රය, ඉන්දිරා ගාන්ධි පාලන තන්ත්‍රය, ආදී වශයෙන්,

    - ආණ්ඩුවේ සංයුතිය ආශ්‍රිත ව ඇති වන පාලන තන්ත්‍රය - හවුල්/සහාගත ආණ්ඩු තන්ත්‍රය (Coalition regime)

    - ආණ්ඩුවේ මතවාදී සංයුතිය ආශ්‍රිත ව - සුභසාධනවාදී පාලන තන්ත්‍රය (Welfare regime), සමාජවාදී පාලන තන්ත්‍රය (Socialist regime) අධිකාරවාදී පාලන තන්ත්‍රය (authoritarian regime)

## 3.4. රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ න්‍යායික ප්‍රවේශ :-

- **සමාජ සම්මුතිවාදය.**

  - සමාජ සම්මුතිවාදය මතු වූයේ, පශ්චාත් මධ්‍යකාලීන යුරෝපයේ රාජ්‍යයේ බලය සාධාරණීකරණය කිරීම සඳහා පැවති දේවධර්මවාදය බිඳවැටී පැවති පසුබිමක ය.

  - මෙකල පාලකයන් දෙවියන් වහන්සේගේ නියෝජිතයන් ලෙස පෙනී සිටිමින් ගෙනගිය වැඩවසම් ආර්ථික ක්‍රමය, නැඟී එන නව වාණිජවාදී පන්තියට බාධාවක් විය.

  - ධනේශ්වර ක්‍රමය නමැති සමාජ ක්‍රමය තුළ බිහි වූ නව සමාජ පන්තියට අවශ්‍ය වූයේ සාම්ප්‍රදායික වැඩවසම් රදලයන් ස්ථාපනය කර ඒ තත්ත්වය තම ආශා වෙනුවෙන් යොදා ගැනීම ය. එයට උපකාරී වූ ''සමාජය තුළින් රාජ්‍ය බිහි වීම පිළිබඳ මතවාදය'' සමාජ සම්මුති වාදය ඇසුරින් ඉස්මතු වූයේ එකී සමාජ අවශ්‍යතාව වේ.

  - මෙතෙක් දිව්‍යමය උපතක පැවතුණා යයි සැලැකූ රාජ්‍යයට සමාජමය උපතක් පවතින බව මින් පෙන්වා දෙනු ලැබී ය. එය ''සමාජයේ ඇති වූ සම්මුතියක ප්‍රතිඵලයක් වශයෙන්'' සිදු වූ බව පිළිගැනිණි.

  - මෙම මතය න්‍යායයක් ලෙස ඉදිරිපත් කළ තෝමස් හොබ්ස්, ජෝන් ලොක්, ෂොන් ෂාක් රූසෝ යන චින්තකයන් තිදෙනා ය.

  - තෝමස් හොබ්ස් එංගලන්තයේ 1642-1648 අතර ඇති වූ සිවිල් යුද්ධ කාලයේ ඇති වූ දේශපාලන අස්ථාවර භාවය අවසන් කොට ස්ථාවර දේශපාලන තත්ත්වයක් ගොඩ නැඟිය හැක්කේ ශක්තිමත් රාජාණ්ඩුවකට බව පෙන්වා දීමේ අරමුණ සඳහා මෙම න්‍යාය ඉදිරිපත් කෙළේ ය.

  - ජෝන් ලොක් ඉංග්‍රීසි විප්ලව සමයේ එංගලන්ත ඒකාධිපති රාජාණ්ඩුවේ බලය යටත් කරමින් පාර්ලිමේන්තුවේ බලය තහවුරු කිරීම අරමුණු කරගනිමින් තම විග්‍රහය ඉදිරිපත් කෙළේ ය.

  - රූසෝ ප්‍රංශයේ පැවති ඒකාධිපති රාජාණ්ඩුවට හා දූෂිත රදල බලයට එරෙහි ව මහජනතාවගේ විප්ලවයක් මඟින් රාජාණ්ඩු ක්‍රමය හා රදල බලය මුලින් උපුටා දමා බලයේ උල්පත මහජනතාව බව දක්වීමට තම න්‍යාය ඉදිරිපත් කෙළේ ය.
    (ගුරුවරයා විසින් දීර්ඝ ව පන්ති කාමරය තුළ මේ පිළිබඳ ව සාකච්ඡාවක නිරත වන්න.)

- **මාක්ස්වාදය.**

  - මාක්ස්වාදය යනු ආර්ථික සාධකය මුල් කරගෙන ඉතිහාසය හා සමාජය පිළිබඳ ව විග්‍රහ කිරීමට ඉදිරිපත් වූ පුළුල් දර්ශනයකි.

  - කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් හඳුන්වා දුන් මෙම මතවාදයෙන් රාජ්‍යයේ ප්‍රභවය, විකාශනය හා එහි අනාගතය පිළිබඳ ව ඊට පෙර නොතිබි ආකාරයේ විග්‍රහයක් ඉදිරිපත් කර ඇත.

- ඔවුන් දක්වන්නේ මිනිස් සමාජයේ මේතාක් පැවති ඉතිහාසය පන්ති සටන්වල ඉතිහාසයක් බව යි. ඉතිහාසයේ පැවති සෑම සමාජයක ම පැවති ප්‍රතිවිරෝධතාවන් මර්දනය කිරීම සඳහා රාජ්‍යය නැමති උපකරණය දේපළ හිමි පන්තිය විසින් උපයෝගි කරගනු ලබනා හෙයින් ''රාජ්‍යය දේපළ හිමි පන්තියේ උපකරණය'' වශයෙන් ද ''රාජ්‍යය මර්දනකාරී සංවිධානයක් වශයෙන් ක්‍රියාත්මක වන බව'' ද ඔවුහු දක්වා සිටියහ.

- ප්‍රාග් කොමියුනිස්ට් යුගය, වහල් යුගය, වැඩවසම් යුගය, ධනවාදී යුගය සහ සමාජවාදී යුගය ඔස්සේ මනුෂ්‍ය සමාජයේ ඓතිහාසික විකාශනය වී ඇති සහ සිදුවන බව ඉතිහාසය පිළිබඳ මාක්ස්වාදී න්‍යායයෙන් කියැවිණ. රාජ්‍යය ද, ඒ ඒ ඓතිහාසික යුගවලට අනුව විකාශනය වී ඇත.

- සම්භාව්‍ය මාක්ස්වාදයට අනුව නූතන ධනේශ්වර රාජ්‍යය යනු නිෂ්පාදන සාධක හිමි ධනපති පන්තිය විසින් ශ්‍රමය පමණක් හිමි, එහෙත් එම ශ්‍රමයේ අයිතිය පවා තමන්ගෙන් වියුක්ත කිරීමට ලක් වූ කම්කරු පන්තිය සූරාකෑම සඳහා ගොඩ නගාගත් පන්ති උපකරණය යි. එනිසා ම රාජ්‍යය අහෝසි කළ යුතු බව මාක්ස්වාදීහු විශ්වාස කරති.

- ධනේශ්වර රාජ්‍යය අහෝසි කිරීමේ ඓතිහාසික කාර්යභාරය මාක්ස්වාදීන් පවරාදෙනුයේ කම්කරු පන්තියට යි. කම්කරු පන්තිය සතු ව එකී ශක්‍යතාව ඇති නමුත් එය සංවිධානය කිරීමේ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. මාක්ස්වාදීන්ට අනුව රාජ්‍යය අහෝසි කිරීමේ ඓතිහාසික කාර්යභාරය සඳහා කම්කරු පන්තිය මෙහෙයැවීමේ වගකීම කොමියුනිස්ට් පක්ෂය විසින් සිදු කෙරේ. එහෙයින් කොමියුනිස්ට් පක්ෂය, කම්කරු පන්තියේ පුරෝගාමී දේශපාලන බලමුළුව බවට පත් වේ.

- කම්කරු පන්තිය බලය අත්කරගෙන සමාජවාදී සමාජයක් ගොඩ නැංවීමට පවා රාජ්‍ය සංවිධානය කිසියම් කාලාන්තරයක් සඳහා අත්‍යවශ්‍ය වන බව මාක්ස්වාදීහු පවසති.

- සමාජවාදී විප්ලවයකින් පසු ව ගොඩ නැඟෙන්නේ නිර්ධන පාන්තික රාජ්‍යයකි. පන්ති විරහිත සමාජවාදී සමාජයටත්, කම්කරු පන්තියටත් එරෙහි ව ධනේශ්වරය විසින් නැවත ගොඩ නැඟිය හැකි ප්‍රතිවිප්ලවය මර්දනය කිරීමේ කාර්යභාරය, පශ්චාත් විප්ලවීය නිර්ධන පාන්තික රාජ්‍යයේ අවශ්‍යතාව යන ප්‍රවාදයේ පසුබිමෙහි ඇති තර්කය වේ.

- කෙසේ වෙතත්, සමාජවාදී විප්ලවයකින් පසුව දීර්ඝකාලීන ව රාජ්‍යයේ අවශ්‍යතාවන් පැන නොනඟින බැවින් රාජ්‍යයේ අහෝසි වීම නොහොත් වියැකී යාම සිදුවන බව ඇතැම් මාක්ස්වාදීහු විශ්වාස කළහ. ලෙනින් මීට කිසියම් වෙනස් අදහසක් දරමින්, ධනේශ්වර රාජ්‍යය ඉබේ අහෝසි වීමකට වඩා කම්කරු පාන්තික නායකත්වය යටතේ අහෝසි කළ යුතු යාන්ත්‍රණයක් ලෙස විස්තර කළේ ය.

  (ගුරුවරයා දීර්ඝ ව සාකච්ඡා කරන්න)

- **ලිබරල් වාදය.**

  - 18 ශත වර්ෂය අග භාගයේ පටන් බටහිර යුරෝපයේ පැතිර ගිය නිදහස පිළිබඳ දේශපාලන මතවාදය ලිබරල්වාදය ලෙස හඳුන්වනු ලැබේ.

- දහහත් වන ශත වර්ෂය අග භාගයේ ඉංග්‍රීසි දාර්ශනික ජෝන් ලොක්, පුද්ගල නිදහස, දේශපාලන නිදහස හා දේපළ අයිතියට ඇති නිදහස පිළිබඳ ව ඉදිරිපත් කළ අදහස් ලිබරල්වාදයේ වර්ධනය හා පෝෂණය කෙරෙහි ප්‍රබල ලෙස බලපෑවේ ය.

- දහසය වන සියවසේ පටන් බටහිර යුරෝපයේ වාණිජ ධනවාදය මුල් කරගෙන බිහි වූ ආර්ථික ක්‍රමය රාජ්‍යය විසින් හසුරුවනු ලැබී ය. එහෙත් 18 වන සියවසේ අග භාගයේ දී ප්‍රභව වන කාර්මික ධනවාදය හැසිරවීම සඳහා රාජ්‍යය මැදිහත් නොවිය යුතු බවත්, එම ආර්ථික ක්‍රමය ඊට ම ආවේණික වූ බලවේග මඟින් හැසිරෙන බවත්, සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන් දෙපළක් වූ ඇඩම් ස්මිත් හා ඩේවිඩ් රිකාඩෝ ප්‍රකාශ කර සිටියහ.

- මේ පසුබිමෙහි රාජ්‍යය ආර්ථිකය හැසිර විය යුතු නැත යන මතවාදය මුල් කරගෙන රාජ්‍ය නිර්බාධවාදය නමැති සංකල්පය බිහි වූයේ ය. එය ලිබරල්වාදයේ කේන්ද්‍රීය ප්‍රවාදයකි.

- ඒ අනුව නිර්බාධවාදී රාජ්‍යයක් ගොඩ නැඟීම සඳහා වන දේශපාලන මතවාදය හැටියට ලිබරල්වාදය පැතිර ගියේ බටහිර යුරෝපයේ ස්ථාපිත වූ කාර්මික ධනවාදී ආර්ථික ක්‍රමයේ දේශපාලන ප්‍රකාශනය වශයෙනි.

- මෙලෙස විකාශනය වූ ලිබරල් වාදය ප්‍රභේද තුනක් ඔස්සේ හඳුනාගැනීමට පුළුවන.

    - ★ සම්භාව්‍ය ලිබරල්වාදය - නිර්බාධ රාජ්‍ය සංකල්පය.
    - ★ පශ්චාත්-සම්භාව්‍ය ලිබරල්වාදය - සුභසාධන රාජ්‍ය සංකල්පය.
    - ★ නව ලිබරල්වාදය - අවම රාජ්‍ය සංකල්පය.

- **සම්භාව්‍ය ලිබරල් වාදය:** දහ අටවන සියවස අග භාගයේ පැතිර ගිය මුල්කාලීන ලිබරල්වාදී අදහස් සම්භාව්‍ය ලිබරල්වාදය වේ. මෙය නිශ්චිත ව ම ආර්ථිකය හැසිරවීමට රාජ්‍යය මැදිහත් නොවිය යුතු බවත්, රාජ්‍යය සමාජයේ සාමකාමී පරිසරයක් ඇති කිරීම සහ අපක්ෂපාත ව යුක්තිය පසිඳලීමේ යෙදෙමින් පුද්ගලයාගේ කටයුතුවලට ඉතා ම අවම වශයෙන් මැදිහත් වීම ප්‍රමාණවත් බවත් ඉන් අවධාරණය කෙරිණ. ඒ අනුව අඩුවෙන් ම පාලනය කරන රාජ්‍යය හොඳ ම රාජ්‍යය වන බවත් එයින් අදහස් විය.

- පශ්චාත් සම්භාව්‍ය ලිබරල්වාදයෙන් ලද ආර්ථික නිදහස හමුවේ ධනපති පන්තියේ ලාභ උපරිම කිරීම සඳහා නිර්ධන පන්තිය සූරාකෑමේ පුළුල් ඉඩ ප්‍රස්තා ධනපති පන්තියට හිමිවිය. එමඟින් පැන නඟින සමාජ අසමානතාව හා පීඩිත පන්තිය දිගින් දිගටම මුහුණ දෙන දරිද්‍රතාව, විරැකියාව, මන්දපෝෂණය, රෝගී බව, නූගත්කම වැනි සමාජ ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් සෙවීම අවශ්‍ය විය. ඒ සඳහා නීතිය හා සාමය ආරක්ෂා කරමින් රාජ්‍යය ඉටු කරන පොලිස් රාජකාරියට අමතර ව සමාජ සුභසාධනයට ද මැදිහත් විය යුතු බව අවධාරණය කෙරිණි. මෙසේ සමාජයේ පොදු යහපත උදා කිරීම සඳහා රාජ්‍යය මැදිහත් විය යුතු බව න්‍යායාත්මක ව ඉදිරිපත් කළ අය අතර ටී. එච්. ග්‍රීන් හා හොබ් හවුස් සාමි වරයා මුල් තැන ගත්හ. ඒ අනුව රාජ්‍ය සුබසාධන සංකල්පය ලිබරල්වාදී මතවාදය තුළ මුල් බැස ගත්තේ ය.

- වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයේ ප්‍රවේශයත් සමඟ රාජ්‍ය සුභසාධන සංකල්ප අවලංගු වී කළමනාකාරී රාජ්‍ය සංකල්පය පැතිරී ගියේ ය. එලෙස ආරම්භ වන නව ලිබරල්වාදී සංකල්ප තුළින් නැවත වතාවක් රාජ්‍යයේ කාර්යභාරය සීමා කිරීමක් හෙවත් අවම කිරීමක් දක ගත හැකි වේ. එහෙත් නිර්බාධ රාජ්‍ය තරමට ම, රාජ්‍යය ආර්ථික හා සමාජ කටයුතුවලින් ඈත් ව සිටීමක්, ඉවත් ව සිටීමක් මැදිහත් නොවී සිටීමක් අවම රාජ්‍ය සංකල්පයෙහි දක්නට නොලැබෙන අතර, අවම රාජ්‍යය ආර්ථික හා සමාජ කටයුතුවලට සීමිත මැදිහත් වීමක්

කරයි. එනම් සමාජ දේශපාලන කටයුතු කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය සීමිත ලෙස මැදිහත් විය යුතු බව කියයි. මේ අනුව රාජ්‍ය නිර්බාධ වාදය හා රාජ්‍ය සුභසාධනවාදය යන දෙකට අතරමැදි තත්ත්වයක් ලෙස අවම රාජ්‍යය පිළිබඳ ප්‍රවේශය හඳුනාගත හැකි ය.

(ගුරුවරයා මේ මතවාදය දීර්ඝ ව පන්ති කාමරයේ සාකච්ඡා කරන්න)

- **ස්ත්‍රී වාදය.**

  - රාජ්‍යය සම්බන්ධ විශේෂ ස්ත්‍රීවාදී න්‍යායයක් නොමැත. එයට ඇත්තේ බලය පිළිබඳ න්‍යායයකි. එහෙත්, රාජ්‍යය හා දේශපාලනය පිළිබඳ විශේෂ ප්‍රවේශයක් යෝජනා කිරීමට ස්ත්‍රීවාදය සමත් වී තිබේ.

  - ''ලිංගිකත්වය පුමතිරිකරණය කොට තිබේ'' යන්න මේ න්‍යායයේ ප්‍රමුඛ අදහසයි.

  - ආධිපත්‍යය හා යටපත් කිරීම හරහා ශෘංගාරත්වයට නැඟීමෙන් පුරුෂයන් හා ස්ත්‍රීන් සමාජයේ ප්‍රභේද හැටියට නිර්මාණය කර ඇතැයි එය කියයි.

  - පිරිමින්ගේ ලෝක දර්ශනයට අනුව ගොඩ නැඟී ඇති පර්යාවලෝකවලින් ස්ත්‍රිය අර්ථකථනය කෙරෙන අතර එයින් ඇගේ ශරීරය වට කරනු ලැබේ. ඇගේ කථනය හැඩගස්වයි, ජීවිතය විස්තර කරයි, ස්ත්‍රීන්ගේ ජීවිතයේ අන්තර්ගතය සැකසේ. ඒ ඒ ලිංගිකත්වයට එයට අදාළ කාර්ය භාරයක් නියමකොට තිබේ.

  - ස්ත්‍රීවාදයේ විවිධ ගුරුකුල තිබේ. ලිබරල්, මාක්ස්වාදී හා රැඩිකල් යනු එම ප්‍රධාන ගුරුකුල වේ.

  - ස්ත්‍රීවාදීන් රාජ්‍යය පිළිබඳ ව දරන අදහස වන්නේ, රාජ්‍යය යනු පුරුෂ කේන්ද්‍රීය ව ගොඩ නංවන ලෝකය, ඉදිරියට ගෙන යන පුරුෂයන් සතු මෙවලමක් වශයෙනි.

  - රාජ්‍යය සම්බන්ධ ව ස්ත්‍රී වාදයට න්‍යායයක් නොමැති නිසා ම එය ලිබරල්වාදය හා මාක්ස්වාදය අතර දෝලනය වේ.

  - ලිබරල් ස්ත්‍රීවාදීහු ස්ත්‍රී විමුක්තිය සඳහා රාජ්‍යයේ මැදිහත් වීම අනුමත කරති. මාක්ස්වාදී ස්ත්‍රීවාදීහු ධනවාදී රාජ්‍යය ප්‍රතික්ෂේප කිරීමට යෝජනා කරති. එය ස්ත්‍රීන්ට සාධාරණත්වය ගෙන දෙන ක්‍රමයක් ස්ථාපනය කරන ලෙස ඉල්ලා සිටියි.

  - අවසාන වශයෙන් ස්ත්‍රීවාදීන් ප්‍රකාශ කරන්නේ අත්‍යවශ්‍යයෙන් ම පුරුෂ මූලික මෙවලමක් වන රාජ්‍යය, ස්ත්‍රීන් මත පුරුෂ ලෝකය ආරෝපණය කිරීමේ මෙවලමක් ලෙස ක්‍රියාත්මක වන බව ය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් :-**

1. කුසපත් ඇදීම මගින් තමා වෙත ලැබෙන මාතෘකාව ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීම/කථා කිරීම.
   i. දේශපාලන බලයේ කේන්ද්‍රීය ප්‍රකාශනය ලෙස රාජ්‍යය.
   ii. නූතන භෞමික රාජ්‍යය.
   iii. නූතන ජාතික රාජ්‍යය.

iv. ගෝලීයකරණය සහ රාජ්‍යය.
v. ගෝත්‍රික රාජ්‍යය.
vi. ග්‍රීක පෞර රාජ්‍යය.
vii. රාජාණ්ඩුව.
viii. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය.
ix. සමාජවාදී රාජ්‍යය.
x. පැසිස්ට්වාදී රාජ්‍යය.
xi. යටත්විජිතවාදී රාජ්‍යය.
xii. පශ්චාත් යටත්විජිතවාදී රාජ්‍යය.
xiii. නව ලිබරල්වාදී රාජ්‍යය.

2. පහත සඳහන් තේමා ඇතුළත් වන පරිදි පොත් පිංචක් සකස් කරන්න.
- රාජ්‍යය සහ සමාජ සංවිධාන.
- රාජ්‍යය හා පුරවැසි භාවය.
- රාජ්‍යය, ආණ්ඩුව සහ පාලන තන්ත්‍රය අතර සම්බන්ධතා හා වෙනස්කම්.
- සමාජ සම්මුතිවාදය.
- මාක්ස්වාදය.
- ලිබරල්වාදය.
- ස්ත්‍රීවාදය.

## ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි


01. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (2007), ***දේශපාලන විද්‍යාවේ මූලිකාංග 1***, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

02. ක්‍රොස්මන්, ආර්.එච්.එස්. (1972), ***ආණ්ඩුක්‍රම හා රට වැසියා,*** කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

03. ලැස්කි, හැරල්ඩ් ජේ. (1970), ***රාජ්‍ය පිළිබඳ සිද්ධාන්ත හා ව්‍යවහාරය***, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

04. උයන්ගොඩ, ජයදේව, 2010, ***රාජ්‍ය පිළිබඳ දේශපාලන න්‍යාය සහ භාවිතය***, කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

05. Jessop, Bob, (2015), *State: Past, Present and Future*, Cambridge, MA: Polity Press.

06. Vincent, Andrew, (1987), *Theories of the State,* Oxford: Blackwell.

## 04. ආණ්ඩුක්‍රම ආකෘති

**නිපුණතාව 04 :-** ලෝකයේ පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති ප්‍රභේද ආශ්‍රයයෙන් ආණ්ඩුක්‍රම විග්‍රහ කිරීමට ඇති හැකියාව ප්‍රකාශ කරයි.

**(කාලච්ඡේද 30 යි)**

**නිපුණතා මට්ටම :-**

04.1. රාජ්‍යයේ බලය බෙදීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති සකස් වී ඇති ආකාරය විස්තර කරයි.

04.2. විධායක බලය සංවිධානය කිරීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති සකස් වී ඇති ආකාරය විස්තර කරයි.

**ඉගෙනුම් ඵල :-**

- රාජ්‍යයේ බලය බෙදීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති හඳුනා ගනිමින් ඒවා අර්ථකථනය කරයි.
- ඒකී ආණ්ඩුක්‍රමවල ලක්ෂණ සහ වාසි, අවාසි පෙන්වා දෙයි.
- විධායක බලය සංවිධානය වීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති හඳුනා ගනිමින් අර්ථකථනය කරයි.
- එකිනෙක ආණ්ඩුක්‍රමවල ඵලදායී භාවය පිළිබඳ ව තුළනාත්මක ව අදහස් දක්වයි.
- ලංකාවේ දැනට තිබෙන ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ, උගත් ආණ්ඩුක්‍රම මාදිලි ආශ්‍රයෙන් විග්‍රහ කරයි.

**හැඳින්වීම :**

මෙම කොටසෙහි අරමුණ වන්නේ ලෝකයේ පවත්නා ආණ්ඩුක්‍රම ආකෘතින්හි ප්‍රභේද සහ ඒවායෙහි විශේෂතා හඳුනා ගනිමින්, ඒ පිළිබඳ විග්‍රහයක් සිදු කිරීමත්, රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදීම සහ විධායක බලය සංවිධානය වීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති හඳුනා ගැනීමත් ය.

මෙම පාඩම පළමු ව, රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදීම, නැතිනම් ස්වාධිපත්‍ය බලය ස්ථානගත වන්නේ කොතැන ද යන්න මත, ආණ්ඩුක්‍රම වර්ග කරමින් එම ආණ්ඩුක්‍රමවල විශේෂිත ලක්ෂණ සසඳමින් සාකච්ඡා කරයි. දෙවනු ව, එම ආණ්ඩුක්‍රමවල සාපේක්ෂ වාසි අවාසි පෙන්වා ස්වාධිපති බලය ස්ථානගත වන ආකාරය අනුව ඒකීය, සන්ධීය, අර්ධ සන්ධීය සහ සහසන්ධීය යන ආණ්ඩුක්‍රම සකස් වන ආකාරය සාකච්ඡා කරයි.

එමෙන් ම, විධායක බලය සංවිධානය වන ආකාරය අනුව ලෝකයේ පවත්නා ප්‍රධාන ආණ්ඩුක්‍රම ආකෘතිවල විශේෂතා හඳුනා ගනිමින් ඒ පිළිබඳ විශ්ලේෂණයක් ද සිදු කෙරේ. මෙහි දී ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ක්‍රියාත්මක වන කැබිනට් ආණ්ඩුක්‍රමය, ජනාධිපති ආණ්ඩුක්‍රමය සහ මිශ්‍ර ආණ්ඩුක්‍රමය මෙන් ම ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමය ද අධ්‍යයනය කරනු ඇත.

### රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදීම පදනම් කොට ගෙන පවත්නා ආණ්ඩුක්‍රම ආකෘතිඃ

**ඒකීය ආණ්ඩුක්‍රම**

ඒකීය ආණ්ඩුක්‍රමයක රාජ්‍ය ස්වාධිපත්‍ය මුළුමනින් ම රැඳී පවතින්නේ මධ්‍යම ආණ්ඩුව වෙත ය. ඒකීය ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථානුකූල උත්තරීතරත්වය මධ්‍යයට පවරා තිබීම හේතුවෙන් පළාත් ආණ්ඩු ඇතුළු ඕනෑ ම පර්යන්ත ක්‍රමයක් පවතින්නේ මධ්‍යම ආණ්ඩුවේ කැමැත්ත පරිදි ය. මෙය සංවරණය නොවූ මධ්‍යගතකරණ තත්ත්වයක් නිර්මාණය කරයි. මධ්‍යම ආණ්ඩුවට සිය අභිමතය පරිදි පළාත් ආණ්ඩු ආයතන නැවත හැඩ ගැස්වීමටත්, නැවත සංවිධානය කිරීමටත්, අහෝසි කිරීමටත්

හැකි යාව ඇත. එමෙන් ම එම ආයතනවල බලතල සහ වගකීම් පුළුල් කිරීමට මෙන් ම ඉතා පහසුවෙන් හකුළුවා දැමීමට ද හැකි ය.

ලෝකයේ බොහෝ රාජ්‍ය සංවිධානය වී ඇත්තේ ඒකීය පාලන ක්‍රමයක් ලෙස ය. විශේෂයෙන් දැඩි ජනවාර්ගික බෙදීම්වලින් තොර කුඩා ප්‍රජාතන්ත්‍රවාදී රටවල ඒකීය පාලන ව්‍යූහයන් සම්මතයක් බවට පත් ව තිබේ. සන්ධීයවාදයේ සංකීර්ණත්වය සමග සසඳන විට, ඒකීය පාලන ව්‍යූහය සැලකිය හැක්කේ සරල හා සාපේක්ෂ වශයෙන් කාර්යක්ෂම ක්‍රමයක් ලෙස ය. (කෙසේ වෙතත්, ප්‍රායෝගික ව, ඒකීය ක්‍රමවල මධ්‍යය සහ පරිධිය අතර ඇති සම්බන්ධතාව සන්ධීය ක්‍රමවල මෙන් සංකීර්ණ ය.)

**ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ**

- රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය තනි, ජාතික ආයතනයකට පවරා තිබීම.
- ඒකීය ආණ්ඩුක්‍රමවල ස්වාධිපත්‍ය බලය මුළුමනින් ම පැවරී ඇත්තේ ජාතික මධ්‍යම ආණ්ඩුව වෙත ය.
- ධුරාවලි සැලසුමකට අනුව ගොඩ නංවා ඇති ආණ්ඩු ආයතන රටාව මඟින් මධ්‍යම ජාතික ආණ්ඩුව විසින් පහළ මට්ටමේ ආයතන අහෝසි කිරීමේ අධිකාරිත්වය හිමි කරගනී.
- මධ්‍යයේ ව්‍යවස්ථාදායකයේ උත්තරීතරත්වය පිළිබිඹු වන අන්දමට ඒකීය රාජ්‍යවල ජාතික ව්‍යවස්ථාදායකය ඒක මණ්ඩලවාදය මත පදනම් වේ.
- පෙඩරල් ආණ්ඩුක්‍රමයට සාපේක්ෂ ව ඒකීය ආණ්ඩුක්‍රමය සාපේක්ෂ වශයෙන් අසංකීර්ණ සහ කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයක් ලෙස ද දක්වේ.

**ඒකීය ආණ්ඩුක්‍රමයේ ප්‍රවණතා**

ඒකීය ආණ්ඩු ක්‍රියාකාරිත්වය නිරන්තරයෙන් ම පරිපාලනමය විමධ්‍යගතකරණයට ලක් වේ. එනම් පහළ මට්ටම්වලට වැඩි වැඩියෙන් පරිපාලන වගකීම් පැවරීම ය. මෙය දේශපාලන බලය පහළට පැවරීමක් නොවේ. 1990 දශකයේ සිට බොහෝ ඒකීය රාජ්‍යයන් පහළ මට්ටම්වලට වැඩි වැඩියෙන් වගකීම් පැවරීමේ උත්සාහයක් දක්නට ලැබේ.

ඒකීය රාජ්‍යයන්හි මධ්‍යයේ සිට පහළ මට්ටම්වලට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන ආකාර තුනකින් සිදු විය හැකි ය.

1. බලය විතැන් කිරීම (deconcentration)
   බලය විතැන් කිරීම මුළුමනින් ම පරිපාලනමය කාර්යයකි. මේ යටතේ සිදු වන්නේ මධ්‍යම ආණ්ඩුවේ කාර්ය මණ්ඩල අගනගරයෙන් පිටත වෙනත් ප්‍රදේශවල සේවය සඳහා යෙදවීම ය. එහි අරමුණ වන්නේ පරිපාලන කටයුතු පුළුල් කිරීම, ආණ්ඩුවේ පරිපාලන කටයුතු සඳහා කෙරෙන වියදම් අඩු කිරීම යනාදිය යි.

2. පරිපාලනය විමධ්‍යගත කිරීම (decentralization)
   මින් අදහස් වන්නේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ වගකීම පළාත් පාලන වැනි උපජාතික ආයතනවලට පැවරීම ය. බ්‍රිතාන්‍යය සහ ස්කැන්ඩිනේවියානු රටවල් මේ සම්බන්ධයෙන් හොඳ ම උදාහරණය යි. එවැනි රටවල් විසින් පළාත් ආණ්ඩු මධ්‍යම ආණ්ඩුවේ එකඟතාව ඇති ව හෝ නැති ව හෝ සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක කරයි. උදාහරණයක් වශයෙන්,

එක්සත් රාජධානියේ පළාත් ආණ්ඩු මධ්‍යම ආණ්ඩුව විසින් සකස් කරනු ලබන සැලසුම් ක්‍රියාවට නංවයි.

3. බලය පැවරීම (devolution)

මින් අදහස් වන්නේ ඇතැම් ව්‍යවස්ථාදායක බලතල ද ඇතුළු ව තීරණ ගැනීමේ ස්වාධීනත්වය මධ්‍යම ආණ්ඩුව විසින් පහළ මට්ටම්වලට ලබා දීම යි. ප්‍රංශයේ, ඉතාලියේ සහ ස්පාඤ්ඤයේ ප්‍රදේශීය ආණ්ඩු මේ සම්බන්ධයෙන් උදාහරණ වශයෙන් දැක්විය හැකි ය. එක්සත් රාජධානිය විසින් 1999 දී ස්කොට්ලන්තයට සහ වේල්සයට බලය බෙදා පවරන ලද පාර්ලිමේන්තු පනත් හඳුන්වා දෙන ලදි. එසේ වුව ද එරට මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවට සාමාන්‍ය පනතක් සම්මත කිරීම මඟින් එලෙස පවරන ලද බලය අහෝසි කළ හැකි ය.

- **සන්ධීය ආණ්ඩුක්‍රමය**

සන්ධීය නැතහොත් ෆෙඩරල් ආණ්ඩුක්‍රමය යනු තනි රාජ්‍යයක් තුළ ආණ්ඩු අතර පරිපාලන බලය සම්බන්ධීකරණය කිරීමේ ක්‍රමයක් නො ව, ස්වාධිපත්‍ය බලය බෙදාගෙන ක්‍රියාත්මක කරනු ලබන බහු මට්ටමේ (multilevel) පාලන ආකෘතියකි (Martin & Harrop 2013). මේ අනුව සන්ධීය ආණ්ඩුක්‍රමයක දී මධ්‍යම ආණ්ඩුව සහ සන්ධීය ක්‍රමය සකස්ව ඇති උප ඒකක එනම්, ප්‍රාන්ත හෝ පළාත් අතර, නෛතික ස්වාධිපත්‍යය බෙදා ගනු ලබයි. සන්ධීය ආණ්ඩුක්‍රමයක මේ කිසිඳු මට්ටමකට අනෙක් මට්ටම අහෝසි කිරීමේ හැකි යාවක් නොපවතී. මෙමඟින් ප්‍රාන්තවල සාපේක්ෂ ස්වාධීනත්ව තත්ත්වය ආරක්ෂා කෙරේ. ඒ නිසා ම සන්ධීය ආණ්ඩු ක්‍රමයක මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත ආණ්ඩු බහුතරයක අනුමතිය නොමැති ව සිය බලතල පුළුල් කරගත නොහැකි ය.

එක්සත්කම සහ ප්‍රදේශීය විවිධත්වය අතර සම්මුතියක් මත සන්ධීය ක්‍රමය පදනම් වේ. එය සාපේක්ෂ වශයෙන් ස්වාධීන නැතහොත් වෙනස් දේශපාලන අභිලාෂ ඇති ඒකක අතර ඇති වන සාකච්ඡා සහ කේවල් කිරීම් පදනම් කොටගෙන ඇති කෙරෙන ආණ්ඩුක්‍රමයක් ද වේ. ඕනෑ ම සන්ධීය ආණ්ඩුක්‍රමයක දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයක් පවතී.

- **සන්ධීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ**

  - ආණ්ඩු යාන්ත්‍රණය එකිනෙකට සාපේක්ෂ වශයෙන් ස්වායත්ත ආණ්ඩු මට්ටම් දෙකකින් සමන්විත වේ. එනම් ජාතික නොහොත් මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු වශයෙනි.

  - මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු, ආණ්ඩු බලතල රාශියක් හිමි කරගනී. මේවා ස්වාධීන බලතල ය. ආණ්ඩු මට්ටම් දෙකෙන් එකකට වත් අනෙක් මට්ටමේ බලතල අත්පත් කරගත නොහැකි ය.

  - සන්ධීය ආණ්ඩු ක්‍රමයක මධ්‍යම රජයට සහ ප්‍රාන්ත ඒකකවලට විශේෂිත කාර්ය පැවරේ. මධ්‍යම ආණ්ඩුව, බාහිර සම්බන්ධතා, ආරක්ෂාව, සංක්‍රමණ කටයුතු සහ මූල්‍ය කටයුතු වැනි පොදු අභ්‍යන්තර කටයුතු භාර ව සිටින අතර ප්‍රාන්ත ආණ්ඩුවලට පැවරෙන කටයුතුවල විවිධත්වයක් තිබිය හැකි ය. එසේ වුව ද පොදුවේ අධ්‍යාපනය, පළාත් පාලන කටයුතු, සෞඛ්‍ය කටයුතු, සමාජ සේවා කටයුතු වැනි කාර්ය ප්‍රාන්තවලට පැවරේ.

  - මධ්‍යම සහ ප්‍රාන්ත යන එක් එක් ආණ්ඩු මට්ටමේ පවත්නා වගකීම් සහ බලතල ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මඟින් නිශ්චිත ව දක්වා ඇත. මධ්‍යය සහ පරිධිය අතර සම්බන්ධතාව ය මෙහෙයවනු ලබන්නේ මධ්‍යයට හෝ ප්‍රාන්ත ආණ්ඩුවලට හෝ ඒක පාර්ශ්වික ව වෙනස් කළ නොහැකි විධිමත් නෛතික රාමුවක් තුළ ය. එබැවින් සන්ධීය ආණ්ඩුක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, සාපේක්ෂ වශයෙන් අනම්‍ය, සංශෝධනය කිරීම තරමක් දුෂ්කර එකක් වේ. උදාහරණ වශයෙන්

ඕස්ට්‍රේලියාවේ සහ ස්විට්සර්ලන්තයේ ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා ජනමත විචාරණ ඔස්සේ ජනතාවගෙන් අනුමතිය ලබා ගැනීම ද අවශ්‍ය කරයි.

- මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත අතර සහයෝගිතාව ගොඩ නැගීමේ අරමුණෙන් ද මධ්‍යම ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට ප්‍රාන්ත ආණ්ඩු සම්බන්ධ කර ගැනීම පිණිස ද මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලිකවාදය මත පදනම් වේ. බොහෝ රටවල සෙනෙට් මණ්ඩලයේ හෙවත් දෙවන මණ්ඩලයේ අරමුණ ප්‍රාන්ත රාජ්‍යවලට ද මධ්‍යම ආණ්ඩුවේ නියෝජනය හා බලතල ලබා දීම යි.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිමත් විධිවිධාන අර්ථනිරූපණය කරනු ලබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය විසිනි. එමගින් ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියා කරන්නේ මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ගැටුම් සමථයකට පත් කරන ඉහළ ම ආයතනය ලෙස යි. මධ්‍යම සහ ප්‍රාන්ත මට්ටමෙහි අදාළ බල ක්ෂේත්‍රය තීරණය කිරීම මගින් සන්ධීය ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න තීරණය කිරීමේ හැකි යාව පෙඩරල් අධිකරණයට පවතී.

- ඒකීය ආණ්ඩුක්‍රමය විකාශනාත්මක මාදිලියක් වන අතර සන්ධීය ආණ්ඩුක්‍රමය සුවිශේෂී තත්ත්වයන් යටතේ හිතාමතා සකස් කර ගැනුණකි. සන්ධීය ආණ්ඩුක්‍රමයක් සංස්ථාපනය කිරීම කේවෙල් කිරීම් මාලාවක් මත සිදුවන දෙයකි. ස්වාධීන ඒකක එකතු කරගන්නේ කෙසේ ද? මධ්‍යය සහ ප්‍රාන්ත අතර බලය බෙදන්නේ කෙසේ ද? යනාදි අතිමූලික කරුණු මෙවැනි කේවල් කිරීම්වල දී වැදගත් තැනක් ගනී. එමෙන් ම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට සන්ධීය ආණ්ඩුක්‍රමයක් සංස්ථාපනය කිරීමේ ක්‍රියාපටිපාටියෙහි ප්‍රධාන ස්ථානයක් හිමි වේ. කුමක් නිසා ද යත්, කේන්ද්‍රය සහ ඒකක අතර බලය බෙදීම සිදුවන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වීම නිසයි. එසේ වුව ද, ඒකීය ක්‍රමයක් නිර්මාණය කිරීමේ දී මෙවැනි අභියෝගවලට මුහුණ දීමට සිදුවන්නේ නැත.

**සන්ධීය ආණ්ඩු පිහිටුවා ගැනීමට මුල් වන හේතු**

- පෙර දී ස්වාධීන ව පැවති රාජ්‍යයන් හෝ දේශපාලන ඒකක හෝ එක් රාජ්‍යයක් වශයෙන් ඒකරාශි වීමේ අවශ්‍යතාව ය අනුව සන්ධීය රාජ්‍ය පිහිටුවා ගනු ලැබිණි. ස්විට්සර්ලන්තය සහ ඇමෙරිකා එක්සත් ජනපදය මෙයට උදාහරණ වශයෙන් දැක්විය හැකි ය. බාහිර තර්ජනයක පැවැත්ම, අන්තර්ජාතික සම්බන්ධතා මනා ව කළමනාකරණය කිරීම, නැතහොත් ආර්ථික සංවර්ධනය සන්ධීය රාජ්‍ය බිහි කිරීම සඳහා ආසන්න හේතු විය හැකි ය.

- භූමියේ විශාලත්වය සන්ධීය ආණ්ඩුක්‍රම පිහිටුවා ගැනීමට මුල් වන තවත් කරුණකි. ලෝකයේ භූගෝලීය වශයෙන් විශාල රාජ්‍යයන් පෙඩරල් ක්‍රමයක් හඳුන්වා දීමට තීරණ කිරීම මෙම කරුණ සමඟ සෑම විට ම සමපාත නොවුව ද, ඇමෙරිකා එක්සත් ජනපදය (1787), කැනඩාව (1867), බ්‍රසීලය (1891), ඕස්ට්‍රේලියාව (1901), මෙක්සිකෝව (1917) සහ ඉන්දියාව (1947) ආදි රටවල් සම්බන්ධයෙන් මෙය සත්‍යයකි. භූගෝලීය වශයෙන් විශාල රාජ්‍යයන් සංස්කෘතික වශයෙන් විවිධත්වයක් ගැනීමේ නැමියාවක් පවතින අතර ශක්තිමත් ප්‍රදේශීය සම්ප්‍රදායයන් හිමි කර ගැනීමේ ඉඩ කඩක් ද ඒවා සතුව පවතී.

- සන්ධීය ක්‍රමය පිහිටුවා ගැනීමට උනන්දු කරවන අවසාන සාධකය වන්නේ සංස්කෘතික සහ වාර්ගික විවිධත්වය යි. සන්ධීයවාදය සමාජීය බෙදීම්වලට සහ විවිධත්වයන්ට නිරන්තරයෙන් ම ආයතනික පිළිතුරක් සපයයි. උදාහරණ වශයෙන් ඉන්දියාවේ ප්‍රාන්ත රාජ්‍යයන්ගේ සීමා, භාෂාව පදනම් ව ප්‍රධාන වශයෙන් නියම කළ ද, පංජාබය සහ කාශ්මීරය වැනි ප්‍රාන්ත ආගමික වෙනස්කම් ද සැලකිල්ලට ගනී. විවිධත්වය තුළ ඒකීයත්වය (unity in diversity) යන පාඨයෙන් මෙම අදහස ප්‍රබල ව ප්‍රකාශ වේ.

**සන්ධීය ආණ්ඩුක්‍රමයේ යහපත් ලක්ෂණ**

- තනි මධ්‍යගත ආයතනයක් වෙත ස්වාධිපත්‍යය කේන්ද්‍රගත ව ඇති ඒකීය ආණ්ඩුක්‍රමයක දී මෙන් නො ව, ව්‍යවස්ථානුකූල ලෙසින් සහතික කරන ලද දේශපාලන හඬක් ප්‍රාදේශීක හා පළාත් අභිලාෂයන්ට ලබා දීමට හැකි වීම.

- මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ දෙවන මණ්ඩලය ඔස්සේ ප්‍රාන්ත ආණ්ඩු මධ්‍යම ආණ්ඩුව තුළ යම් ප්‍රමාණයක නියෝජනයක් සහ බලතල භුක්ති විඳීම. සන්ධීය බලතල ලැබූ පරිධියේ ඒකක වෙන් ව සිටින්නේ ම නැතිව, මධ්‍යම ආණ්ඩු ව්‍යුහය ඇතුළත එකතු වීම ද ඒ මඟින් සිදු වේ.

- ආණ්ඩු බලය විමධ්‍යගත ව විසිරීම හේතුවෙන් පුද්ගල නිදහස ආරක්ෂා කිරීමට ආධාර කරන සංවරණ හා තුළන ජාලයක් නිර්මාණය වෙයි.

- භින්න වූ සමාජයක් එක්සත් ව සහ ඒකාබද්ධ ව පවත්වා ගැනීම සඳහා ආයතනික යාන්ත්‍රණයක් සන්ධීය ක්‍රමයෙන් ලබා දෙයි. මේ සම්බන්ධයෙන් ගත් විට ජනවාර්ගික සහ ප්‍රාදේශීක වශයෙන් බෙදුණු සමාජයන්ට පෙඩරල් විසඳුමක් යෝග්‍ය විය හැකි ය. බෙල්ජියම් අත්දැකීම් මඟින් පෙන්වා දෙන ආකාරයට බෙදුණු සමාජයක ජනවාර්ගික විවිධත්වය යා කිරීම සඳහා සන්ධීය පාලන ක්‍රමය ප්‍රයෝජනවත් වේ.

- විශාල රාජ්‍යයක් සංවිධානය කිරීම සඳහා ස්වාභාවික සහ ප්‍රායෝගික සැලැසුමක් සන්ධීය ක්‍රමය මඟින් ලබා දෙයි.

**සන්ධීය ආණ්ඩුක්‍රමයේ අයහපත් ලක්ෂණ**

- විසි වන සියවසේ සිට සන්ධීය ආණ්ඩුක්‍රම මධ්‍යගතකරණ දිසාවට නැඹුරු වීම වැළැක්වීමට සන්ධීයවාදයට හැකි යාවක් නොමැති වී තිබේ.

- සන්ධීය ක්‍රමය හේතුවෙන් ආණ්ඩු බෙදීම් ඇති විය හැකි අතර, රාජ්‍යය තුළ කේන්ද්‍රපසාරී බලපෑම් ශක්තිමත් වනු ඇත.

- සන්ධීය ආණ්ඩු, ඒකීය සහ මධ්‍යගත ආණ්ඩු තරම් කාර්යක්ෂම සහ ශක්තිමත් ඒවා නොවෙති යන්න ද තවත් විවේචනයකි.

**සන්ධීය ආණ්ඩු ක්‍රම ගොඩ නැඟීම**

ඓතිහාසික වශයෙන් සන්ධීය ආණ්ඩුක්‍රම පිහිටුවා ගැනීමේ මාර්ග තුනක් පවතී.

1. පොදු අභිලාෂයන් හඹායාම පිණිස කලින් වෙන් ව පැවති ඒකක එකට එකතු ව මධ්‍යම අධිකාරියක් නිර්මාණය කරගැනීම.

    මේ යටතේ බොහෝ විට සන්ධීය ආණ්ඩු ගොඩනඟා ගනු ලබන්නේ ස්ථාපිත දේශපාලන ජනසමාජ ගණනාවක් වෙන් වෙන්වූ අනන්‍යතා හා ස්වාර්ථ ආරක්ෂා කරගැනීමේ අපේක්ෂාව ද සහිත ව එකට එකතු වීම මඟිනි. උදාහරණ වශයෙන් 1787 දී ඇමෙරිකාවේ ප්‍රාන්ත 13 ක නියෝජිතයන්ගේ හමු වීමකින් ඇමෙරිකා එක්සත් ජනපදය බිහි විය. ඇමෙරිකානු අත්දැකීම් මඟින් ශක්තිමත් ලෙස බලපෑම් ලද සමාන සම්මේලන 1848 දී ස්විට්සර්ලන්තයේ ද, 1867

දී කැනඩාවේ ද, 1897/98 වසරවල දී ඕස්ට්‍රේලියාවේ ද සිදු විය. මේ සඳහා පෙලඹුම් සාධක වනුයේ ආර්ථික සහ ආරක්ෂාව පිළිබඳ කරුණු ය.

2. බෙදුණු රටක් එකට එකතු වෙමින් සන්ධීය පාලන ක්‍රමයක් ලෙසින් ප්‍රතිව්‍යූහගත වීම.

මෙය කලාතුරකින් සිදු වන්නකි. බෙල්ජියම ප්‍රධාන උදාහරණය යි. ප්‍රංශ භාෂාව කතා කරන ප්‍රදේශ සහ ඕලන්ද භාෂාව කතා කරන ප්‍රදේශ අතර පැවති බෙදීම් නිසා ඇති වූ ගැටළු හේතුවෙන් 1970 සහ 1980 දශකවල සිදු කළ ව්‍යවස්ථා සංශෝධන මඟින් මෙම කණ්ඩායම්වලට වැඩි බලතල ලබා දුන් අතර, අවසානයේ දී 1995 වසරේ දී බෙල්ජියම සන්ධීය රටක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි.

3. ඒකීය රාජ්‍යයක් වාර්ගික හා සංස්කෘතික විවිධත්වය මත සන්ධීය රාජ්‍යයක් ලෙස ප්‍රතිව්‍යූහගත කිරීම.

ස්පාඤ්ඤය, මැලේසියාව සහ  දකුණු අප්‍රිකාව මෙයට උදාහරණ වේ. සම්භාව්‍ය ඒකීය රාජ්‍යයක් වූ මහා බ්‍රිතාන්‍යය ද දැන් සන්ධීය ලක්ෂණ අත්පත් කරගෙන ඇත.

**අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමය**

අර්ධ සන්ධීය ආණ්ඩු ක්‍රමයක ඒකීය ආණ්ඩුක්‍රමයක් සතු ලක්ෂණ සහ සන්ධීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ යන දෙක ම එක විට හඳුනාගත හැකි ය. මේ අනුව ඒකීය සහ සන්ධීය ආණ්ඩුක්‍රම යන වර්ග දෙකට අතරමැදි ව පවතින ආණ්ඩුක්‍රමයක් ලෙස අර්ධ සන්ධීය ක්‍රමය සැලකිය හැකි ය.

ඉන්දියාව අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් සම්බන්ධයෙන් දිය හැකි හොඳ ම උදාහරණයයි. ඉන්දියානු ආණ්ඩුක්‍රමය සලකනු ලබන්නේ සන්ධීය ආණ්ඩුක්‍රමයක් හෝ ඒකීය ආණ්ඩුක්‍රමයක් හෝ වශයෙන් නොව අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් ලෙස ය. ද්විත්ව ආණ්ඩු ආයතන ක්‍රමය සහ ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය යන ලක්ෂණ මඟින් ඉන්දියානු ව්‍යවස්ථාව මූලික වශයෙන් ම සන්ධීය ආණ්ඩුක්‍රමයක ගති ලක්ෂණ පෙන්නුම් කළ ද, ඒ සමඟ ම ඒකීය රාජ්‍යයක පවතින බොහෝ ගති ලක්ෂණ ද අන්තර්ගත කරගෙන ඇත. උදාහරණ වශයෙන් ඒකීය පුරවැසි භාවය, නිලබල ක්‍රමයේ ආධිපත්‍ය සහ මේ සියල්ලට ම ඉහළින් මධ්‍යම ආණ්ඩුවට විශාල බලතල ප්‍රමාණයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අත්කර දීම දැක්විය හැකි ය.

ඉන්දියානු ව්‍යවස්ථාව තුළ ඇති බලතල බෙදීම විමර්ශනය කරන විට පැහැදිලි වන්නේ එරට ව්‍යවස්ථාව මධ්‍යම ආණ්ඩුවට පක්ෂපාත අයුරින් ක්‍රියා කර ඇති බව යි. මේ සම්බන්ධයෙන් උදාහරණ කිහිපයක් දැක්විය හැකි ය.

උදාහරණ වශයෙන් හදිසි අවස්ථාවක් ප්‍රකාශ ඇති අවස්ථාවක ප්‍රාන්ත ආණ්ඩුවල විෂය ලැයිස්තුව සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවට නීති සම්පාදනය කළ හැකි ය. එමෙන් ම මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත ආණ්ඩුවල විධායක බලතල පාලනය කළ හැකි ය. සැබැවින් ම හදිසි අවස්ථා කාලයක දී ඉන්දියානු ව්‍යවස්ථාව ඒකීය රාජ්‍යයක ගති ලක්ෂණ පෙන්නුම් කරයි. ඉන්දියානු ව්‍යවස්ථාවෙහි හදිසි අවස්ථා වර්ග තුනක් සඳහන් වේ. එනම්

1. ජාතික හදිසි අවස්ථාව

ඉන්දියාව බාහිර ආක්‍රමණයකට හෝ අභ්‍යන්තර කැලැඹීමකට හෝ මුහුණ දුන් විටක ව්‍යවස්ථාවේ 352 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයාට හදිසි අවස්ථාවක් ප්‍රකාශ කළ හැකි ය.

2. ප්‍රාන්ත හදිසි අවස්ථාව

කිසියම් ප්‍රාන්තයක ව්‍යවස්ථා යාන්ත්‍රණය බිඳ වැටුණු අවස්ථාවක ව්‍යවස්ථාවේ 356 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයාට හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකි ය.

3. මූල්‍ය හදිසි අවස්ථාව

ඉන්දියාවේ මූල්‍ය ස්ථාවරත්වයට තර්ජනයක් ඇති වූ විටක ව්‍යවස්ථාවේ 360 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයාට හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකි ය.

ඒ හැරුණු විට සාමාන්‍ය කාලවල දී පවා මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවට ප්‍රාන්ත ව්‍යවස්ථාදායකයන්ගේ අනුමතියකින් තොර ව සරළ බහුතරයකින් නව ප්‍රාන්ත පිළිගැනීම හෝ ප්‍රාන්තවල දේශ සීමාවන් වෙනස් කිරීම හෝ කළ හැකි ය. ඇමෙරිකානු ව්‍යවස්ථාව සම්භාව්‍ය පෙඩරල් ආකෘතියක් ලෙසින් විස්තර කරන කේ. සී. වියර් ඉන්දියානු ව්‍යවස්ථාව විස්තර කරන්නේ අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් ලෙස ය. අතිරේක ඒකීය ලක්ෂණ සහිත පෙඩරල් ආණ්ඩුක්‍රමයකට වඩා අතිරේක පෙඩරල් ලක්ෂණ සහිත ඒකීය ආණ්ඩුක්‍රමයක් ලෙස ඔහු ඉන්දියානු ආණ්ඩුක්‍රමය හඳුන්වයි. මෙය ඔහු කැටි කොට දක්වන්නේ ඉන්දියානු ආණ්ඩුක්‍රමය ස්වරූපයෙන් පෙඩරල් වුව ද සාරයෙන් ඒකීය ආණ්ඩුක්‍රමයක් වන බව ප්‍රකාශ කරමිනි. එහෙත්, ප්‍රායෝගික වශනේ ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ පෙඩරල් ලක්ෂණ ශක්තිමත් වී ඇති බව ද කිව හැකි ය.

**සහසන්ධීය ක්‍රමය**

සහසන්ධීය යන්නෙන් වාචික වශයෙන් අදහස් වන්නේ එකගතාව යි. සහසන්ධීය ක්‍රමය යනු ස්වාධීන රාජ්‍ය ඒකක අතර සමීප සහයෝගයක් ඇති කරගැනීමට ඒවා අතර ඇති කරගත් එකගතාවකි. බොහෝ විට එකගතාවක් / ගිවිසුමක් මඟින් සහසන්ධීය ආණ්ඩුක්‍රමය නිර්මාණය කරගනු ලබන අතර, පසු ව පොදු ව්‍යවස්ථාවක් සම්මත කරගැනේ. ආරක්ෂාව, විදේශ කටයුතු, පොදු මූල්‍ය ඒකක වැනි බැරෑරුම් ගැටලුවලට මුහුණ දීමේ අරමුණෙන් සහසන්ධීය ආණ්ඩුක්‍රම ආණ්ඩු බිහි වී ඇත. මේ අනුව සහසන්ධීය ක්‍රමයක් යනු සියලු ඒකකවලට අදාළ ව පොදු කාර්යයන් සඳහා වූ දේශපාලන ඒකකවලින් සමන්විත සංගමයකි. එනම් විශේෂිත අරමුණු ඉටු කරගැනීමේ අපේක්ෂාවෙන් ස්වාධිපති බලය සහිත රාජ්‍ය විසින් මධ්‍යම ආණ්ඩුවට සීමිත බලයක් ලබා දෙන ආණ්ඩුක්‍රමයකි.

සහසන්ධීය ක්‍රමයක ප්‍රාන්ත ආණ්ඩු බලතලවලින් වැඩි ප්‍රමාණයක් දරන අතර මධ්‍යම ආණ්ඩුවට ඇත්තේ සුළු බලතල ප්‍රමාණයකි. මධ්‍යම ආණ්ඩුව කළ යුත්තේ කුමක් ද යන්න තීරණය කරනු ලබන්නේ ප්‍රාන්ත ආණ්ඩු විසිනි. සහසන්ධීය ක්‍රමයට ඓතිහාසික උදාහරණය ලෙස Articles of Confederation යටතේ ගොඩ නඟන ලද ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය දැක්විය හැකි ය. නූතන උදාහරණය ලෙස ස්විට්සර්ලන්තය දැක්විය හැකි ය.

**විධායක බලය සංවිධානය වීම අනුව පවත්නා ආණ්ඩුක්‍රම**

මේ යටතේ ආණ්ඩුක්‍රම වර්ග තුනකට බෙදනු ලැබේ. එනම්, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය, ජනාධිපති ආණ්ඩුක්‍රමය සහ මිශ්‍ර ආණ්ඩුක්‍රමය වශයෙනි.

- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම නිරන්තරයෙන් ම බ්‍රිතාන්‍යය ආදර්ශයට ගනී, එම ආණ්ඩුක්‍රම පුළුල් ලෙසින් බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල දක්නට ලැබේ. එමෙන් ම බටහිර යුරෝපීය රටවලින් ද සොයා ගත හැකි ය.

ජනාධිපති ආණ්ඩුක්‍රමවල විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර පැහැදිලි බෙදීමක් පැවතුන ද පාර්ලිමේන්තු ක්‍රමයෙහි මෙය පැහැදිලි ව දැකිය නොහැකි ය.

- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

  - පාර්ලිමේන්තු ක්‍රමයක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වන කැබිනට් මණ්ඩලයට විධායක බලය හිමි ය. කැබිනට් මණ්ඩලය ''දේශපාලන විධායකය'' යනුවෙන් හැඳින්වෙන්නේ එබැවිනි.

  - පාර්ලිමේන්තුවේ බහුතර සහාය ලබන පක්ෂයේ හෝ සන්ධානයේ හෝ නායකයා අගමැති බවට පත් වේ.

  - අගමැතිවරයා විසින් සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ සාමාජිකයන් අතුරෙන් තෝරාගන්නා අයගෙන් කැබිනට් මණ්ඩලය සකස් කරගනී. කැබිනට් මණ්ඩලය ආණ්ඩුවේ නාභිය බවට පත් වේ.

  - පාර්ලිමේන්තුවේ සහාය මත ආණ්ඩුව රඳා පවතී. මෙයින් අදහස් වන්නේ පාර්ලිමේන්තු ක්‍රමයක විධායකය සෘජු ලෙසින් ම ව්‍යවස්ථාදායකය මත රඳා පවතින බවත් ව්‍යවස්ථාදායකයට වගකියන බවත් ය.

  - රාජ්‍ය නායකයා සෘජු ලෙසින් ම තෝරාපත් කර ගැනීමක් සිදු නොවේ. රාජ්‍ය නායකයා එක්කෝ රජ කෙනෙකු හෝ එසේත් නැතිනම් වක්‍ර ලෙසින් තෝරාපත් කරගනු ලබන ජනාධිපතිවරයකු හෝ විය හැකි ය. බ්‍රිතාන්‍යය සහ ඉන්දියාව උදාහරණ යි.

  - අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය සාමූහික ලෙසින් පාර්ලිමේන්තුවට වගකියති.

- ජනාධිපති ක්‍රමය සමඟ සසඳන විට පාර්ලිමේන්තු ක්‍රමයේ වාසි අතුරින් එකක් වන්නේ විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ සම්මිශ්‍රණයෙන් ශක්තිමත් සහ ස්ථාවර ආණ්ඩුවක් නිර්මාණය කිරීමේ හැකියාව යි. මෙය පොදුවේ ඕස්ට්‍රේලියාවේ, කැනඩාවේ, බ්‍රිතාන්‍යයේ, ඩෙන්මාර්කයේ සහ ජපානයේ දක්නට ලැබේ.

**ජනාධිපති ආණ්ඩුක්‍රමය**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි ලෝකය තුළ ජනාධිපති ආණ්ඩුක්‍රමය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයට එක් ප්‍රධාන විකල්පයකි. එසේ වුව ද, ජනාධිපති ආණ්ඩුක්‍රමය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය මෙන් ලොව පුරා පැතිරුණු ආණ්ඩුක්‍රමයක් නොවේ. ඇමෙරිකානු එක්සත් ජනපදයේ ජනාධිපති ආණ්ඩුක්‍රමය ලතින් ඇමෙරිකාවේ බොහෝ රටවල ආකෘතියක් වශයෙන් යොදා ගෙන තිබේ. පිලිපීනය ඒ සම්බන්ධයෙන් ඇති ආසියාතික උදාහරණයකි.

ජනාධිපති ආණ්ඩුක්‍රම අතර කවර ආකාරයේ වෙනස්කම් පැවතිය ද එම ආණ්ඩුක්‍රමයේ පවතින අතිමූලික ගති ලක්ෂණ නම් ව්‍යවස්ථාදායකය සහ විධායකය වෙන වෙන ම තේරී පත්වීම (separate origin) සහ එකිනෙකින් වෙන් වූ පැවැත්ම (separate survival) ය. මේ අනුව,

- විධායකය සහ ව්‍යවස්ථාදායකය වෙන් වෙන් ව තෝරාපත් කරගනු ලබන අතර මෙම අංශවලට ව්‍යවස්ථානුකූල ස්වාධීන බලතල හිමි වේ. මේ අනුව ජනාධිපතිවරයා සෘජු

ලෙසින් ම හෝ ඇමෙරිකානු එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා තෝරාපත් කරගන්නා ආකාරයට හෝ ඡන්ද විද්‍යාලයක් මගින් පත් කරගැනේ.

- විධායක සහ ව්‍යවස්ථාදායක අංශ අතර විධිමත් පුද්ගල බෙදීමක් පවතී. ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා මෙන් ම ආණ්ඩුවේ නායකයා ද වේ.

- විධායකය ව්‍යවස්ථාදායකයට වග නොකියන අතර, ව්‍යවස්ථාදායකයට විශේෂිත දෝෂාභියෝග ක්‍රියාවලියකින් මිස ජනාධිපතිවරයා ඉවත් කළ නොහැකි ය. අනෙක් අතට ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකය ඉවත් කළ නොහැකි ය. මින් අදහස් වන්නේ මෙම අංශ දෙකෙහි නිළ කාලය නිශ්චිත කර ඇති බව ය.

- විධායක අධිකාරිත්වය ජනාධිපතිවරයාට ලබා දී ඇති අතර කැබිනට් මණ්ඩලය ජනාධිපතිවරයාට වග කියනු ලබන හුදු උපදේශකයෝ ය. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෝ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෝ නොවෙති. ව්‍යවස්ථාදායකයේ සාමාජිකයකු කැබිනට් මණ්ඩලයට පත් කළහොත් ඔහු/ඇය ව්‍යවස්ථාදායකයෙන් ඉල්ලා අස්විය යුතු ය.

- රාජ්‍ය නායකයාගේ භූමිකාව සහ ආණ්ඩුවේ නායකයාගේ භූමිකාව ජනාධිපති නිලය වෙතට ගොනු කර ඇත.

- ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ප්‍රබලතාව වනුයේ විධායක බලතලවලින් ව්‍යවස්ථාදායක බලතල වෙන් කිරීමට උත්සාහ දැරීම යි. එය සංවරණ සහ තුළන ක්‍රමය මත ගොඩ නඟා ඇත. එම තත්ත්වය පුද්ගල නිදහස සහ හිමිකම් ආරක්ෂා කිරීමට සහාය වේ. එමෙන් ම ආණ්ඩුවේ එක ආයතනයකට බලය කේන්ද්‍රගත වීමේ අවකාශය එයින් වැළැක්වේ.

**මිශ්‍ර ආණ්ඩුක්‍රමය**

විවිධ ආණ්ඩුක්‍රමවල ලක්ෂණ අන්තර්ගත ව පවතින ආණ්ඩු මිශ්‍ර ආණ්ඩුක්‍රම ලෙසින් හඳුන්වනු ලබයි. රාජාණ්ඩු සහ සමූහාණ්ඩු යන ආණ්ඩුක්‍රම ලක්ෂණ මිශ්‍ර වූ ආණ්ඩු මෙන් ම ජනාධිපති සහ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමවල ලක්ෂණවල එකතුවෙන් ගොඩ නැගුණු ආණ්ඩුක්‍රම ද පවතී.

මෙලෙස මිශ්‍ර ආණ්ඩුක්‍රම ගණනාවක් පවතින අතර ඉන් වඩාත් බහුල සහ ජනප්‍රිය මිශ්‍ර ආණ්ඩුක්‍රම ස්වරූපය වන්නේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ සහ ජනාධිපති ක්‍රමයේ මූලික අංග ලක්ෂණ සහිත අර්ධ ජනාධිපති ක්‍රමය යනුවෙන් බහුල ව හඳුන්වනු ලබන ආණ්ඩුක්‍රමය යි. අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමය එක් අතකින් පාර්ලිමේන්තුවට උත්තර දීමට බැඳී සිටින අගමැති ඇතුළු ඇමති මණ්ඩලයකින් ද තව අතකින් ජනතාවගේ සෘජු ඡන්දයෙන් තේරීපත් වන විධායක බලතල සහිත ජනාධිපති වරයකුගෙන් ද සමන්විත වේ. අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පවතී.

- ජනාධිපතිවරයා ජනතාවගේ ඡන්දයෙන් තෝරාපත් කර ගත් අයකු වීම
- ජනාධිපතිවරයාට සැලකිය යුතු විධායක බලතල පැවතීම

- විධායක බලතල සහිත අගමැතිවරයා සහ ඇමති මණ්ඩලයක් ජනාධිපතිවරයාට අභිමුඛ ව සිටීම සහ ඒ පිරිස පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්ත ඇති තෙක් ධුරය දැරීම

ද්විත්ව විධායක ක්‍රමය නමින් ද හැඳින්වෙන අර්ධ ජනාධිපති ක්‍රමය ප්‍රධානයන් දෙදෙනෙකු සහිත ක්‍රමයක් බැවින් එය නියත වශයෙන් ම පාලන අධිකාරිත්වයේ බෙදීමක් නිර්මාණය කරයි. එපමණක් ද නොව ප්‍රතිවිරුද්ධ පක්ෂ දෙකකට ජනාධිපති සහ ඇමති මණ්ඩලයේ බලය අයත් වන විටක මෙම බෙදීම ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර ගැටුම් ඇති වීමට ද හේතු විය හැකි ය. ප්‍රංශය මේ සම්බන්ධයෙන් දිය හැකි ප්‍රබල උදාහරණයකි. මීට අතිරේක ව මේ වන විට ශ්‍රී ලංකාව ද ඇතුළුව බල්ගේරියාව, ලිතුවේනියාව, මැසඩෝනියාව, මැඩගස්කරය, මාලි, මොසැම්බික්, රොමේනියාව ආදි රටවල ද ක්‍රියාත්මක වන්නේ අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රම යි (Newton Deth 2005; Sodaro 2008).

**ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමය** (Autocracy)

ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණය වන්නේ එක් පුද්ගලයකු අත රාජ්‍ය බලය සංකේන්ද්‍රණය ව තිබීම සහ ඒකතාන්ත්‍රිකයාගේ තීරණ බාහිර නෛතික අවරෝධක හෝ ජනතා පාලනය හෝ යන දෙකෙන් එකකට වත් ලක් නොවීම ය.

මෙම පාලන ක්‍රමය යටතේ පුද්ගල අයිතිවාසිකම් සාමාන්‍යයෙන් නොසලකා හරින අතර බලය නිරන්තරයෙන් ම පවත්වා ගෙන යනු ලබන්නේ බලහත්කාරයෙනි. මේ අනුව ඒක තාන්ත්‍රිකයාගේ අධිකාරිත්වය වළක්වන ව්‍යවස්ථාවක් හෝ කිසිදු නීතියක් හෝ මෙම පාලන ක්‍රමයෙහි නොපවතී. එමෙන් ම ජනතාවට ඔවුන්ගේ ආණ්ඩුව ක්‍රියාත්මක විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව තම අදහස් ප්‍රකාශ කිරීමට මැතිවරණ වැනි ප්‍රජාතාන්ත්‍රික ක්‍රම වේද නොමැත.

ඒකතාන්ත්‍රිකවාදයේ (autocracy) ප්‍රධාන ඓතිහාසික ස්වරූපයන් වන්නේ පරම රාජාණ්ඩුක්‍රමය සහ ඒකාධිපතිවාදය යි. ඒ අතර ම, ඒක බලවාදි පාලන ක්‍රමය සහ හමුදා ආඥාදායකත්වයක් සහිත පාලන ක්‍රමය ඒක තාන්ත්‍රික පාලන ක්‍රම වශයෙන් හඳුනාගත හැකි ය. එසේ වුව ද ඒක බලවාදි (totalitarian) පාලන ක්‍රම සහ හමුදා ආඥාදායක පාලන ක්‍රම සෑම විට ම ඒක තාන්ත්‍රික පාලන ක්‍රම සමඟ එකට ගමන් කරන්නේ නැත. ඒක බලවාදි පාලන ක්‍රමයක දී (ඒක බලවාදි පාලන ක්‍රමයක් යනු ජීවිතයේ සහ සිවිල් සමාජයේ සෑම පැති කඩක් ම පාලනය කරන පාලන ක්‍රමයකි) මෙන් ම හමුදා ආඥාදායකත්වයක් සහිත පාලන ක්‍රමයක දී එක් උත්තරීතර ආඥාදායකයකු විසින් එම පාලන ක්‍රමයට නායකත්වය දීම මගින් ඒක තාන්ත්‍රික පාලන ක්‍රමයක් නිර්මාණය කරගත හැකි ය. අනෙක් අතට ඒක බලවාදි හෝ හමුදා ආඥාදායකත්වයක් සහිත පාලන ක්‍රම කොමියුන, ජුන්ටා හෝ තනි දේශපාලන පක්ෂයක් හෝ වැනි සාමූහික නායකත්ව ස්වරූපයකින් ක්‍රියා කළ හැකි ය. ඇතැම් විට ඒක තන්ත්‍ර පාලන ක්‍රම ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුක්‍රම ඔස්සේ ද මතු විය හැකි ය. ඒක තන්ත්‍ර පාලන ක්‍රමයක පවතින ප්‍රධාන වාසිය වනුයේ තීරණ ගැනීම සහ තීරණ ක්‍රියාත්මක කිරීම වහා සිදු කළ හැකි වීම යි. එසේ වුවද, ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රම ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් ම නිෂේධනය කරයි. එය පූර්ව-ප්‍රජාතාන්ත්‍රික සහ නිර්-ප්‍රජාතාන්ත්‍රික දේශපාලන මාදිලියකි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් :-**

1. රාජ්‍ය බලය බෙදීම පදනම්කරගෙන පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති.
2. විධායක බලය සංවිධානය කිරීම අනුව පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති

යන තේමා දෙක යටතේ විවාද කණ්ඩායම් දෙක බැගින් සූදානම් කර විවාදයක් සැලසුම් කරගන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි**


01. Bealey Frank, Richard A. Chapman and Michael Sheehan, (1999), *Elements in Political Science*, Edinburgh: Edinburgh University Press.

02. Hague, Rod and Martin Harrop, ( 2013), *Comparative Government and Politics*, New York: Palgrave Macmillan.

03. Heywood, Andrew, (2013), *Politics*, New York: Palgrave Macmillan.

04. Lijphart, A (ed.), (1992), *Parliamentary Versus Presidential Government*, Oxford: Oxford University Press.

05. Wheare, K.C, (1966), *Modern Constitutions* , Oxford: Oxford University University Press.

## 05. දේශපාලන මතවාද

**නිපුණතාව 05 :-** දේශපාලන මතවාදවල ස්වභාවය සහ කාර්ය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

**(කාලච්ඡේද 30 යි)**

**නිපුණතා මට්ටම :-**

5.1. විවිධ දේශපාලන මතවාද හඳුනා ගනියි.

5.2. ඒවායේ මූලික ලක්ෂණ සහ දේශපාලන ක්ෂේත්‍රයේ දී ඒවා ඉටුකර ඇති කාර්ය විචාරාත්මක ව විමසයි.

**ඉගෙනුම් ඵල :-**

- දේශපාලන මතවාද අර්ථකථනය කරයි.
- එකී දේශපාලන මතවාද තුළනාත්මක ව විග්‍රහ කරයි.
- මෙම දේශපාලන මතවාද, දේශපාලනයට බලපා ඇති ආකාරය, දේශපාලන සංසිද්ධි ඇසුරින් විග්‍රහ කරයි.

**හැඳින්වීම :-**

- දේශපාලන මතවාද යන සංකල්පයෙන් අදහස් කරන්නේ, සමාජයේ දේශපාලන විඥානයට, පුද්ගලයන්ගේ හා සමාජ කණ්ඩායම්වල දේශපාලන ක්‍රියාකාරිත්වයට මෙන් ම දේශපාලන ආයතනවල ස්වභාවය හා කාර්යභාරය තීරණය කිරීමට ද බලපාන, ක්‍රමානුකූල ව ගොනුවී තිබෙන දේශපාලන අදහස් පද්ධතීන් ය. දේශපාලන දෘෂ්ටිවාද සහ දේශපාලන චින්තනය යනු එයට යෙදෙන පර්යාය පද වේ. දේශපාලන විද්‍යාවෙහි දී දේශපාලන මතවාද යන සංකල්ප භාවිත කරන්නේ ක්‍රමානුකූල ව සකස් වී තිබෙන දේශපාලන චින්තන පද්ධති සහ අදහස් සමුදාය යන අර්ථයෙනි.

- දේශපාලන මතවාදයක් ප්‍රධාන පෙළේ චින්තකයෙකුගේ හෝ චින්තකයන් කිහිප දෙනෙකුගේ හෝ ඉගැන්වීම් සහ අදහස් පද්ධතියක් මත ගොඩනැගී තිබෙන්නට පුළුවන. නැතහොත් ප්‍රධාන එක චින්තකයකු නොමැති ව, චින්තකයන් ගණනාවක් විසින් ඉදිරිපත් කරන ලද අදහස්වල වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගී තිබෙන්නක් ද විය හැකි ය.

- දේශපාලන වශයෙන් ඉතා වැදගත් කාර්ය භාරයක් සිදු කර ඇති දේශපාලන මතවාද කිහිපයක් හඳුනා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. ඒ අනුව,

  - ලිබරල් වාදය
  - සමාජ වාදය
  - සමූහාණ්ඩු වාදය
  - සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
  - පැසිස්ට් වාදය
  - ජාතික වාදය
  - නිරාගමික වාදය
  - ස්ත්‍රී වාදය

යන දේශපාලන මතවාද දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ සිදු කළා වූ කාර්යභාරය හා ඒවායේ ස්වභාවය, ලක්ෂණ හා වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙම නිපුණතාවෙන් අපේක්ෂිත ය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අත්වැලක්:-**

## 5.1 ලිබරල් වාදය

- මෙය *liber* යන ලතින් වචනයෙන් නිර්මාණය වූවකි. එහි අර්ථය වෙන්නේ 'නිදහස' යන්න යි.

- ලිබරල් දේශපාලන දර්ශනය තුළත් ආර්ථික න්‍යාය තුළත්, 'නිදහස' යන්න සංකල්පගත කෙරුණේ රාජ්‍යයේ/ආණ්ඩුවේ අනවශ්‍ය මැදිහත් වීමෙන්, ඇඟිලි ගැසීමෙන් නිදහස් වීම'' (Freedom from undue government interference) යන ලෙසිනි.

- 17 වැනි සියවසේ දී යුරෝපයේ පැවති වැඩවසම් සමාජ-ආර්ථික, දේශපාලන ක්‍රමය සහ සර්ව බලධාරී රාජාණ්ඩු ක්‍රමය පසුබිමේ ඒවාට එරෙහි ව මතු වූ අදහස් මාලාවක් හැටියට ද ලිබරල් වාදය හඳුන්වා දිය හැකි ය.

- 17 සියවස වන විට රජුගේ හිතුවක්කාර පාලන තන්ත්‍රයට එරෙහි වූ අලුත් සමාජ පන්තිවල නැගී ඒමක් ද විය. ධනවාදයේ ආරම්භක අවධිය වූ මෙකල බිහි වූ අලුත් වාණිජ හා මධ්‍යම පන්තිය, රාජ්‍යයේ හිතුවක්කාර පාලන ක්‍රමය ද, හිතුමතේ වෙළෙඳාම පාලනය කිරීම හා අයබදු ගැනීම කළ ආර්ථික පාලනය ද නො ඉවසී ය.

- මෙවැනි පසුබිමක ඔවුන්ට අවශ්‍ය 'නිදහස' වූයේ රාජාණ්ඩුවේ හිතුවක්කාර දේශපාලන සහ ආර්ථික මැදිහත් වීම්වලින් මිදීම යි. පසු ව එය ලිබරල් වාදයේ ඇති මුඛ්‍යත ම මූලධර්මයක් ව වර්ධනය වූයේ ය.

- මේ අනුව ලිබරල්වාදී සංකල්පයේ මූලික අර්ථය වූයේ රාජ්‍යයේ/ ආණ්ඩුවේ මැදිහත් වීම්වලින් සහ ඒවා පනවන සීමා/පාලනවලින් ලබන නිදහස යි. (Freedom from government's interference and constraints imposed by the government) මෙම අදහසෙහි දාර්ශනික ඇඟවීමක් සහ දේශපාලනික ඇඟවීමක් ද ගැබ් ව තිබිණි.

  I දාර්ශනික ඇඟවීම :-

  - නිෂේධනීය නිදහස (negative Freedom) ලෙස සම්භාව්‍ය ලිබරල් වාදය විසින් නිදහස යන්නට, අලුත් අර්ථයක් සපයන ලදි. මෙයින් අදහස් වන්නේ බාධා, සීමා, මැදිහත් වීම් නොමැති වීම නිසා පුද්ගලයන් අත් විඳින නිදහස යි. (Freedom from constraints, බාධා නොමැති වීමෙන් ලබන නිදහස)

  - තව දුරටත්,
    - ➤ හිතුවක්කාර ලෙස ආණ්ඩුව විසින් අත් අඩංගුවට ගනු ලැබීමෙන් තොර වීමේ නිදහස (Freedom from arbitrary arrest)
    - ➤ හිතුවක්කාර ලෙස ආණ්ඩුව පනවන අයබදුවලින් තොර වීමෙන් ලබන නිදහස (freedom from arbitrary taxatiom) යනාදි ලෙස සම්භාව්‍ය ලිබරල්වාදී දර්ශන වාදය නිදහස ''නිෂේධනීය නිදහස'' ලෙසින් සංකල්ප ගත කොට ඇත.

  II දේශපාලනික ඇඟවීම :-

  - මින් අදහස් කර ඇත්තේ රාජ්‍ය නිර්බාධවාදය යි.

- පසු කාලයේ ආර්ථික මූලධර්මයක් ලෙස වර්ධනය වූ රාජ්‍ය නිර්බාධවාදය (laissez-faire) යන්නෙන් කියැවුණේ ආර්ථික, සමාජ, දේශපාලන ක්ෂේත්‍රවලට ආණ්ඩුවේ මැදිහත් වීම අවම විය යුතු ය යන අදහස යි.

- නිදහස් ආර්ථිකය සහ නිදහස් වෙළෙඳපොළ රාජ්‍ය නිර්බාධවාදය සමඟ බැඳුණු ප්‍රධාන සංකල්ප දෙකකි.

- ආණ්ඩුවේ මැදිහත් වීම හා පාලනය අවම කරමින් නිදහස් ව ක්‍රියා කරන වෙළෙඳපොළක් මත ගොඩ නැගූ නිදහස් ආර්ථිකයක් පිළිබඳ අදහස එහි හරය වේ.

- පෞද්ගලික නිදහස යන්න, නිදහස් වෙළඳපල සහ නිදහස් ආර්ථිකය සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් ලෙස සම්භාව්‍ය ලිබරල්වාදය සැලකී ය.

★ **ලිබරල් වාදය සහ පෞද්ගලික නිදහස :-**

- පෞද්ගලික නිදහස - සම්භාව්‍ය ලිබරල් වාදයේ න්‍යායාත්මක මූලධර්මයක් වන අතර වර්තමාන ලිබරල් දේශපාලන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා චින්තනයේ මුල්ගලක් ද බඳු සංකල්පයකි.

- ලිබරල් දර්ශනවාදයේත්, සමාජ, දේශපාලන, ආර්ථික දෘෂ්ටිවාදවල සහ න්‍යායවලත් මූලික ඉගැන්වීමක් වන 'පෞද්ගලික නිදහස' (Individual Freedom) යන ප්‍රවාදය ගොඩ නඟා තිබෙන්නේ උපකල්පන කිහිපයක් මත ය.

I. සමාජය සමන්විත වන්නේ තනි තනි පුද්ගලයන්ගෙනි. එබැවින් සමාජය වනාහි තනි තනි පුද්ගලයන්ගෙන් සමන්විත වන සමාජ ඒකාය යි. (Society is a collection of individuals)

II. සමාජය සමන්විත වන එක් එක් තනි පුද්ගලයා (Individual) වනාහි නිදහස් (Free), තාර්කික ව සිතිය හැකි (rational) සහ ස්වායත්ත (autonomous) මනුෂ්‍යයෙකි.

III. සමාජය සමන්විත වන නිදහස්, තර්ක බුද්ධිය හිමි, සහ ස්වායත්ත පුද්ගලයන්ට තම මනුෂ්‍ය ශක්‍යතා උපරිම ලෙස සාක්ෂාත් කර ගැනීමට හැකිවන්නේ බාහිර, එනම් ආණ්ඩුවේ මෙන් ම සමාජයේ ද සීමා බාධක සහ මැදිහත් වීම් අවම කරමින් සහතික කෙරෙන ''නිදහස්'' පරිසරයක් තුළය. එය 'නිදහස' රජකරන පරිසරයකි.

IV. ආණ්ඩුවේ වගකීම වන්නේ පෞද්ගලික නිදහස සහතික කරන චර්යාවකින් ආණ්ඩු කිරීම යි. මෙය කළ හැක්කේ නීතියේ ආධිපත්‍යය, නිදහස, සහ ආර්ථික, සමාජ ක්ෂේත්‍රවල අවම ලෙස මැදිහත් වීම සහතික කරන ආණ්ඩු ක්‍රමයකිනි. එය ''ලිබරල්'' ආණ්ඩු ක්‍රමය යි.

★ **ලිබරල් දේශපාලන මතවාදය :-**

ප්‍රධාන චින්තකයෝ හා ඔවුන්ගේ අදහස්

- **තෝමස් හොබ්ස් (1586-1679)**

  - මොහු කිසිසේත් ම ලිබරල් චින්තකයෙක් නොවේ.

- එහෙත් ලිබරල් දේශපාලන දර්ශනයේ මූලික ප්‍රවාද වන

  (අ) තනි පුද්ගලයා රාජ්‍යයට පූර්වක ය,
  (ආ) පුද්ගලයා තාර්කික බුද්ධියක් හිමි ස්වායත්ත පුද්ගලයෙකි,
  (ඇ) රාජ්‍යය යනු මනුෂ්‍යයන්ගේ සමාජීය නිර්මාණයකි

  යන අදහස්වල ආරම්භකයා ඔහු ය.

- 1652 දී ලෙවියාතන් (*Leviathan*) නමැති දේශපාලන දර්ශනවාදයෙහි වැදගත් වන කෘතිය හොබ්ස් පළ කෙළේ අත්තනෝමතික රාජාණ්ඩු ක්‍රමය යුක්ති සහගත කිරීමට ය.

- රාජ්‍යයේ සම්භවය පිළිබඳ ව ඔහු ගොඩ නැගූ සමාජ සම්මුතිවාදය තුළ, පසු කාලයේ ලිබරල්වාදී චින්තනයට මඟ පෑදූ ඉහත අප දැක්වූ අදහස් තුන ගැබ් වී තිබිණ.

- **ජෝන් ලොක් (1632-1704)**

  - හොබ්ස්ට පසු ව එංගලන්තයේ බිහිවූ ප්‍රධාන දේශපාලන චින්තකයා වූ මොහු ලිබරල්වාදී දේශපාලන චින්තනයේ සැබෑ ආරම්භකයා ය.

  - දැඩි රාජාණ්ඩු විරෝධියකු වූ ලොක් එංගලන්තයේ රාජාණ්ඩුවාදීන් සහ පාර්ලිමේන්තුවාදීන් අතර තිබූ බල අරගලයේ දී පාර්ලිමේන්තුවාදීන්ගේ පිල නියෝජනය කෙළේ ය.

  - ලොක් 1690 දී ''ආණ්ඩුව ගැන රචනා දෙකක්'' යන ග්‍රන්ථය පළ කරමින් සම්භාව්‍ය ලිබරල් වාදයේ මූලික දේශපාලන ප්‍රස්තුතය ගොඩ නැඟී ය.

  - ලිබරල්වාදී දේශපාලන මතවාදයට ලොක් සිදු කළ එකතුවේ ප්‍රධාන තේමා පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

    I රාජ්‍යයේ බලයේ මූලාශ්‍රය මහජනතාව යි.

    II ආණ්ඩු කිරීමේ බලය පාලකයන්ට ලැබී තිබෙන්නේ මහජනතාව විසින් ඔවුන්ට කොන්දේසි සහිත ව ලබා දී ඇති භාරකරත්ව බලයකි (Trusteeship).

    III මහජනතාව ලබා දී ඇති එම භාරකාරත්ව බලයේ කොන්දේසි නොකඩවා ඉටු කිරීමට පාලකයෝ බැඳී සිටිති. මහජනතාවගේ නිදහස, ජීවිතය හා දේපළවල ආරක්ෂාව සහතික කිරීම එම කොන්දේසිවල අරමුණ යි.

    IV තමන් සමඟ එකඟ වූ පාලකයෝ එම කොන්දේසි උල්ලංඝනය කරත් නම්, ඔවුන්ට දී ඇති බලය ආපසු කැඳවීමේ අයිතිය මහජනතාවට තිබේ.

    V ආණ්ඩුවට ඇත්තේ සීමිත බලයකි. එම බලය සීමා වන මාධ්‍ය දෙකකි.

      (අ) ආණ්ඩුවේ බලාධිකාරය, මහජනතාව පාලකයන්ට දී ඇති භාරකාරත්වය ගිවිසුමේ කොන්දේසිවලින් සීමා වී තිබීම.
      (අ) පාලකයන්ට මහජනතාව ආණ්ඩු බලය පවරන්නේ සීමිත කාලපරිච්ඡේදයකට වීම.

- ලොක් දේශපාලන චින්තනයට හඳුන්වා දුන් මෙම ප්‍රවාදය හඳුන්වන්නේ ''සීමිත ආණ්ඩුව'' (Limited Government) පිළිබඳ සංකල්පය ලෙස යි.

- **මොන්ටෙස්කියු (1689-1755)**

  - ප්‍රංශ දේශපාලන චින්තකයකු වූ මොහු ලිබරල් දේශපාලන චින්තනයට කළ ප්‍රධානතම දායකත්වය වන්නේ බලතල වෙන් කිරීමේ සිද්ධාන්තය ගොඩ නැඟීම යි.

  - ක්‍රි.ව. 1748 දී ප්‍රංශ භාෂාවෙන් පල කළ ''නීතියේ ජීවය'' නමැති කෘතියෙන් මේ සිද්ධාන්තය වර්ධනය කර තිබේ.

  - මෙහි ප්‍රධානතම මූලධර්මය වන්නේ ආණ්ඩු බලය ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ආණ්ඩුවේ ප්‍රධාන ශාඛා අතර බෙදී තිබිය යුතු ය යන්න යි.

  - එසේ නොබෙදී එම බලතල එක් ආයතනයක් හෝ එක් පුද්ගලයකු හෝ වෙත කේන්ද්‍රගත වී තිබෙන කල එහි ප්‍රතිඵලය වන්නේ පුද්ගල නිදහස තරයේ ම උල්ලංඝනය කරන පාලන කේන්ද්‍රයක් බිහි වීම යි. මොන්ටෙස්ක්යු එය හඳුන්වන්නේ ''ප්‍රජාපීඩක පාලනය'' (Tyranny) ලෙස යි. එය වැළැක්වීමේ මග වන්නේ ආණ්ඩුවේ එම බලතල ඒවා ක්‍රියාත්මක කරන ශාඛා අතර පැහැදිලි ව බෙදා ගැනීමත්, එම ආයතන එකිනෙකින් ස්වාධීන ව පැවැත්වීමත් ය.

  - දේශපාලන බලය පාලකයන් විසින් ප්‍රජා පීඩක ලෙස භාවිත කිරීමේ අනතුර නිරන්තරයෙන් ම තිබෙන නිසා මහජනයාගේ නිදහස ආරක්ෂා කිරීමට නම් එම බලයට සීමාවන් පැනවිය යුතු ය යන උපකල්පනය මත මෙම සිද්ධාන්තය ගොඩ නැඟිණ.

  - මේ සඳහා මොන්ටෙස්ක්යු යෝජනා කළේ ආණ්ඩු බලය එක් පුද්ගලයෙකු හෝ ආයතනයක් හෝ වෙත කේන්ද්‍රගත වීමට ඉඩ නොතැබිය යුතු බව ය.

- **ෂෝන් ෂාක් රූසෝ** (Jean Jacques Rousseau) **(1712-1778)**

  - ප්‍රංශ ජාතිකයකු වූ රූසෝ සමාජ ගිවිසුම්වාදී සම්ප්‍රදාය ය ඉදිරියට ගෙන ගිය අයෙකි.

  - 1762 දී පළවූ ''සමාජ ගිවිසුම'' (Social Contract) ඔහුගේ ප්‍රධානතම දේශපාලන කෘතිය වේ.

  - ලොක්, මොන්ටෙස්ක්යු මෙන් ම රූසෝ ද උනන්දු වූයේ රාජ්‍යය විසින් කරනු ලබන උල්ලංඝනය කිරීම්වලින් මනුෂ්‍ය නිදහස, ආරක්ෂා කර ගැනීමට ය.

  - රාජ්‍යය මනුෂ්‍යයන්ගේ නිදහස සහ ආරක්ෂාව සහතික කිරීම පිණිස ඔවුන් ම නිර්මාණය කර ගැනුණ ද, රාජ්‍යය විසින් ම මනුෂ්‍ය නිදහසට හානි කිරීමේ අනතුර ද තිබේ. මෙම ප්‍රහේලිකාවට රූසෝ දුන් විසඳුමේ හරය වූයේ රාජ්‍ය බලය රාජ්‍යයන් තුළ සංවිධානය වී සිටින සෑම දෙනාගේ ම යහපත අරමුණු කරගත යුතු ය යන්න යි.

  - රූසෝ සංකල්ප දෙකක් මාධ්‍ය කරගනිමින් මේ ප්‍රවාදය ඉදිරිපත් කළේ ය.

    I ''පොදු කැමැත්ත'' (General Will) යන්න පළමු වැන්න වේ. රාජ්‍යය නියෝජනය කරන්නේ, පාලකයාගේ වත් සමාජයේ ටික දෙනෙකුගේ වත්, කැමැත්ත/යහපත නොව, රාජ්‍යයේ සාමාජිකයන් ව සිටින සෑම දෙනාගේ ම සාමූහික කැමැත්ත/යහපත ය යන්න එහි අර්ථය වේ.

II ''මහජන පරමාධිපත්‍ය'' යන්න දෙවැන්න වේ. පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා වන්නේ රාජ්‍යය හෝ පාලකයන් හෝ නොව මහජනතාව ය, යන්න එහි අර්ථය වේ. මහජනයා සතු පරමාධිපත්‍යය අන්සතු කළ නොහැකි ය, බෙදිය නොහැකි ය.

## 5.2. සමාජවාදය

- 19 වැනි සියවසේ යුරෝපයේ මතු වූ දේශපාලන මතවාදයකි.

- මෙය බිහි වීමට පදනම් වූයේ 17 සියවසේ සිට වර්ධනය වූ කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපීය ධනවාදී සමාජයේ ඇති වූ තියුණු පන්ති විභේදනයත්, කම්කරු පන්තිය පත් ව සිටි අතිශය දරිද්‍රතාවත් ය.

- අඩු වැටුප්-සමඟ වූ දැඩි ශ්‍රම සූරා කෑමට ගොදුරු වූ කම්කරු පන්තියේ අයිතිවාසිකම් දිනා ගැනීම අරමුණු කරගත් වෘත්තීය සමිති ව්‍යාපාරය හා අරගලය ද 19 සියවසේ මුල් භාගයේ වර්ධනය වී තිබිණ.

- සමාජවාදය යන අදහස මතු වන අවධි දෙකක් හඳුනා ගත හැකි වේ.

  I මේ අදහස පළමුවෙන් ම මතු වූයේ ධනවාදී ක්‍රමය යටතේ පැවති පෞද්ගලික දේපළ ක්‍රමය වෙනුවට පොදුවේ සමාජය සන්තක ව පවතින දේපළ ක්‍රමයක් පිළිබඳ විකල්පයක් ඉදිරිපත් කිරීමෙනි. ''දේපළ පිළිබඳ සමාජයේ පොදු අයිතිය'' ඇති කිරීම මඟින් ආර්ථික නිෂ්පාදන ක්‍රියවලිය ද සමාජයේ පොදු ක්‍රියාවලියක් බවට පත් කළ විට පෞද්ගලික දේපළ ක්‍රමය යටතේ මතු වී තිබුණු ඉතා දැඩි ආර්ථික සහ සමාජ අසමානතා අහෝසි කළ හැකි ය යන අදහස මෙහි ආරම්භක සංකල්පගත කිරීමෙන් අපේක්ෂා කෙරිණ.

  II කාල් මාක්ස් හා ෆෙඩ්රික් ඒංගල්ස් යන දෙදෙනා හවුලේ ගොඩනඟා ඉදිරිපත් කළ සමාජවාදය පිළිබඳ අළුත් මතවාදය 'මාක්ස්වාදය' ලෙස හැඳින්වේ. තමන්ගේ අලුත් න්‍යායය, සමාජවාදය පිළිබඳ පැරණි සංකල්පයෙන් වෙනස් කොට දැක්වීමට ''විද්‍යාත්මක සමාජවාදය'' යනුවෙන් ඔවුහු එය හැඳින්වූහ. එය මාක්ස්වාදී සමාජවාදය යනුවෙන් ද හැඳින්විය හැකි ය.

- 1848 දී මාක්ස් හා ඒංගල්ස් පළ කළ ''කොමියුනිස්ට් ප්‍රකාශ ය'' මඟින් ''සමාජවාදය'' පිළිබඳ මාක්ස්වාදී න්‍යායය පළමුවෙන් ක්‍රමානුකූල ව ඉදිරිපත් කරන ලදි. එහි වූ ප්‍රධාන අදහස් කිහිපයක් සාරාංශ කර දැක්විය හැකි ය.

  I ධනවාදී සමාජ-ආර්ථික ක්‍රමය කම්කරු පන්තියේ ශ්‍රම සූරාකෑම මත ගොඩ නැඟී තිබෙන සහ පවතින එකකි.

  II පෞද්ගලික දේපළ ක්‍රමය සහ නිෂ්පාදන මාර්ගවල පෞද්ගලික අයිතිය මත පදනම් වූ ධනවාදී ක්‍රමය පවත්නා තාක් ශ්‍රම සූරාකෑම සහ සමාජ අසමානතා පවතී.

  III මෙම ශ්‍රම සූරාකෑම, දරිද්‍රතාව හා සමාජ අසමානතා අහෝසි කිරීමට නම්, ධනවාදී සමාජ-ආර්ථික ක්‍රමය අහෝසි කර ඒ වෙනුවට සමාජවාදී සමාජ-ආර්ථික ක්‍රමයක් අලුතෙන් පිහිටුවිය යුතු ය.

  IV එම සමාජ ක්‍රමයේ ප්‍රධාන ම ලක්ෂණය විය යුත්තේ දේපළ සහ ආර්ථික නිෂ්පාදන මාර්ගවල පෞද්ගලික අයිතිය අහෝසි කොට, ඒවායේ පොදු සමාජමය අයිතිය ගොඩ නැඟීම ය. එවිට ආර්ථික සම්පත්වල හිමිකරුවන් වන්නේ මුළු මහත් සමාජය යි. වරප්‍රසාද ලාභී ටික දෙනෙක්

නොවේ. එවිට සමාජ සම්පත්වලින් නිපදවන දේ සැම කෙනෙකුට ම සමානව භුක්ති විඳිය හැකි ය. නිෂ්පාදනය, හුවමාරුව සහ පරිභෝජනය සමානත්වය මත ගොඩනැගෙනු ඇත. මෙහි දී සමාජය පන්තිවලට බෙදී යාම ද (පන්ති විභේදනය) තවදුරටත් නොපවතිනු ඇත.

V මෙවැනි සමාජ-ආර්ථික පරිවර්තනයක් සිදු වන්නට නම් එය සමාජ විප්ලවයක් මාධ්‍ය කොට ගෙන සාක්ෂාත් කරගත යුතු වේ. එහි නායකත්වය ඉටු කරන්නේ කම්කරු පන්තිය යි. කම්කරු පන්තියේ නායකත්වයෙන් සිදුවන ''සමාජවාදී විප්ලවය'' ධනවාදී සමාජයේ කම්කරු පන්තිය සහ ධනේශ්වර පන්තිය අතර සිදුවන පන්ති අරගලය කූටප්‍රාප්ත වන සිදුවීම් ද වෙයි.

VI සමාජවාදී විප්ලවය, රැඩිකල් දේශපාලන පරිවර්තනයකි. එහිදී සිදුවන්නේ ධනවාදී රාජ්‍යය පෙරළා දමා කම්කරු පන්තිය විසින් රාජ්‍ය බලය අත්පත් කරගනු ලැබීම යි. එමඟින් ධනේශ්වර පන්තියේ දේශපාලන බලය අහෝසි වෙයි.

VII සමාජවාදී රාජ්‍යයේ ප්‍රධාන ම කාර්යය වන්නේ ධනේශ්වර ආර්ථික ක්‍රමය, වෙනුවට දේපළ පිළිබඳ පොදු අයිතිය මත පදනම් වූ සමාජවාදී ආර්ථික හා සමාජ ක්‍රමයක් පිහිටුවීමට අවශ්‍ය රැඩිකල් පරිවර්තනවලට නායකත්වය දීම යි.

VIII සමාජවාදී සමාජය අවසානයේ දී ''කොමියුනිස්ට්'' සමාජ ක්‍රමයක් බවට පරිවර්තනය වනු ඇත. කොමියුනිස්ට් සමාජ ක්‍රමය මුළුමනින් ම සාමූහිකත්වය හා සමානත්වය මත පදනම් වූ සමාජවාදී පරිවර්තනයේ අවසාන ප්‍රතිඵලය යි.

- මේ ලක්ෂණ අනුව පැහැදිලි වන කරුණක් නම් එය ලිබරල්වාදය මෙන් ම සමාජ-ආර්ථික-දේශපාලන ව්‍යුහයන් යළි සකස් කිරීම අරමුණු කරගත් මතවාදයක් වූ බව ය. එහෙත් ලිබරල්වාදය ධනවාදයේ මතවාදය යි. සමාජවාදය ධනවාදය නිෂේධ කිරීමේ මතවාදය යි.

- විසි වැනි සියවසේ දී සමාජවාදය, දේශපාලන දෘෂ්ටියක් බවට පත් විය. ඒ වෙතින් මතු වූ ධනවාදය පිළිබඳ දැඩි විවේචනයත්, විකල්පයක්-යුරෝපයේ ද, යටත්විජිත ලෝකයේ ද මහත් ආකර්ෂණයට ලක් විය.

  නිද :- 1917 රුසියානු විප්ලය, 1949 චීන විප්ලවය, දෙවැනි ලෝක යුද්ධයෙන් පසු නැගෙනහිර යුරෝපයේ සමාජවාදී ආණ්ඩු පිහිටුවීම, 1959 කියුබානු විප්ලවය, යුරෝපයේ කම්කරු පන්ති අරගල, සමාජවාදී මතවාදයෙන් පසු ආභාසය ලැබූ ඒවා ය.

- 20 සියවසේ දී ''ලෝක සමාජවාදී ව්‍යාපාරය'' නම් වූ දේශපාලන ක්‍රියාමාර්ග හා ප්‍රයත්න වර්ධනය ද සිදු විය.

- මෙකල දේශපාලන මතවාදයක් හැටියට සමාජවාදය තවත් පරිවර්තනයකට භාජනය වේ. එය නම් මාක්ස්වාදයේ ඉගැන්වූ ''විප්ලවවාදී සමාජවාදයට'' (Revolutionary Socialism) සමාන්තර ව ''තුන්වැනි ලෝකයේ සමාජවාදය'' (Third-World Socialism) යන මතවාදය ගොඩ නැඟීම යි.

- ඉන්දියාවේ ශ්‍රී නේරු, ඊජිප්තුවේ අබ්දුල් ගමාල් නසාර් සහ ටැන්සානියාවේ ජුලියස් නියරේරේ මෙහි ප්‍රධාන ප්‍රකාශකයෝ ය.

- තුන්වැනි ලෝක සමාජවාදය ගොඩ නැඟෙන්නේ මාක්ස්වාදී-සමාජවාදී න්‍යායයේ තිබූ සමානාත්මතාව ය සහ සමාජ සාධාරණත්වය පිළිබඳ අදහස් මත ය. යටත් විජිත කාලයේ, ලිබරල් ධනවාදයෙන් තම රටවල් උරුම කරගත් ආර්ථික ඌන සංවර්ධනය හා සමාජ අසමානතාවන්ට පිළියම් නොලැබෙන

බව පිළිගත් මේ නායකයෝ පශ්චාත් - යටත්විජිත සමාජවලට වඩාත් ගැළපෙන ආර්ථික සංවර්ධන විකල්ප සෙවූහ. ධනවාදයේත්, සමාජවාදයේත් මූලධර්ම මිශ්‍ර කරගත් මේ විකල්ප හඳුන්වනු ලැබුවේ ''සමාජවාදය'' නමිනි.

## 5.3. සමූහාණ්ඩුවාදය

- මෙය ලිබරල් වාදය මෙන් ම දේශපාලන මතවාදයක් වන අතර ම දේශපාලන න්‍යාය සහ දේශපාලන දර්ශනය යන වර්ගීකරණයට ද අයත් වේ.

- දේශපාලන ප්‍රජාව, පුරවැසි භාවය, නිදහස සහ දේශපාලනය පිළිබඳ සමූහාණ්ඩුවාදී අදහස් නූතන රාජ්‍ය, එහි ස්වභාවය හා අරමුණු නිර්ණය කිරීමට වැදගත් දායකත්වයක් සපයා තිබේ.

- ලිබරල් වාදය සහ සමූහාණ්ඩුවාදය එකිනෙකට වෙනස් දේශපාලන මතවාද නොවූවත්, ඒ දෙක අතර පවතින වෙනස්කම් හඳුනාගැනීම, එම මතවාද නිශ්චිත ව හඳුනාගැනීමට ආධාර වනු ඇත.

- සමූහාණ්ඩුවාදය, දේශපාලන සංකල්පයක් ලෙසත්, දෘෂ්ටිවාදයක් ලෙසත් දිගු ඉතිහාසයකට හිමිකම් කියයි. එම ඉතිහාසය ග්‍රීක, රෝම යුගයන් දක්වා දිවයයි.

- සමූහාණ්ඩුවාදී අදහස්වල වර්ධනය අවධි 4 ක් යටතේ පෙන්වා දිය හැකි ය.

    1. සම්භාව්‍ය සමූහාණ්ඩුවාදය :- ග්‍රීක හා රෝම සමූහාණ්ඩුවාදී යුගය - ඇරිස්ටෝටල්, පොලිබියස් සහ සිසරෝ.
    2. යුරෝපයේ පුනරුද සමය :- මැකියාවෙල්ලි වර්ධනය කළ සමූහාණ්ඩුවාදී චින්තනය.
    3. දහ අට වැනි සියවසේ ප්‍රංශ සහ ඇමරිකානු සමූහාණ්ඩුවාදය - ප්‍රංශයේ රූසෝ, මොන්ටෙස්ක්යු සහ ඇමෙරිකාවේ තෝමස් ජෙෆර්සන් සහ ජේම්ස් මැඩිසන්.
    4. විසි වැනි සියවසේ සමූහාණ්ඩුවාදය :- හැනා ඇරෙන්ඩ්ට්, ක්වේන්ටින් ස්කිනර්, ෆිලිප් පෙටිට් (Hannah Arendt, Quentin Skinner and Philip Pettit) විසි වැනි සියවසේ සමූහාණ්ඩුවාදයේ ප්‍රධාන ප්‍රකාශකයෝ ය.

- සමූහාණ්ඩුවාදයේ පොදු හරාත්මක මූලධර්ම කීපයක් ම තිබේ.

    (අ) සමූහාණ්ඩුවාදය රාජාණ්ඩුවාදයට එකහෙළා විරුද්ධ ය. මෙය 18 හා 19 වැනි සියවස්වල ලිබරල්වාදයට සමාන්තර ව වර්ධනය වූවකි.

    (ආ) සමූහාණ්ඩුවාදයට අනුව පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා රජු/පාලකයා නොව මහජනතාව යි. මෙය ද සම්භාව්‍ය ලිබරල්වාදයට සමාන්තර ව බිහි වූ රාජාණ්ඩු විරෝධී ස්ථාවරයකි.

    (ඇ) රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් පත් කරගත යුතු බව අවධාරණය කරන අතර, එකී අදහස 18 සියවසෙන් පසු වර්ධනය වූ මූලධර්මයකි.

    (ඈ) පුරවැසියා දේශපාලන වශයෙන් සක්‍රිය, විපරම්කාරී, දේශපාලන සත්ත්වයකු ලෙස ක්‍රියාවලියට සහභාගි වන්නේ ය. දේශපාලනික වශයෙන් සක්‍රියව සිට පොදු යහපත වෙනුවෙන් කැප වී වැඩ කිරීම සමූහාණ්ඩුවාදී පුරවැසි භාවයේ ප්‍රධාන ලක්ෂණය යි. මෙය ඇරිස්ටෝටල් ගෙන් පටන් පැවත එන අදහසකි. මෙම ගති ලක්ෂණ ඔවුන් හඳුන්වන්නේ ''පුරවැසි යහගුණය'' (Civic virtue) යනුවෙනි.

(ඉ) පුරවැසියන් දේශපාලන ප්‍රජාවක් (Political Community) ලෙස සංවිධානගත ව සිටී මේ අරමුණ වන්නේ සැම පුරවැසියකුට ම පොදු යහපත (Common Good) සැලැස්වීම යි.

(ඊ) දේශපාලනයේ අරමුණ නිදහස යි. එය පුරවැසියන්ට සක්‍රිය ව මිසක නිෂ්ක්‍රිය ව සිටීමෙන් ලබා ගැනීමට හෝ රැක ගැනීමට හෝ හැකි දෙයක් නොවේ. පහසුවෙන් නැති විය හැකි සම්පතක් වන නිදහස රැකගත හැක්කේ පුරවැසි දේශපාලන සහභාගිත්වය යන ක්‍රියාකාරිත්වය මඟිනි. මෙය ''පුරවැසි සක්‍රියත්වය'' (Civic engagement) යන න්‍යායික පදයෙන් හැඳින්වේ.

- ලිබරල්වාදය හා සමූහාණ්ඩුවාදය එකිනෙකින් වෙනස් වන්නේ මෙම ලක්ෂණවලිනි.

**(අ) පුරවැසියා සහ දේශපාලනය.**

I. සමූහාණ්ඩුවාදයට අනුව පුරවැසි භාවය යනු හුදෙක් රාජ්‍යයේ/දේශපාලන ප්‍රජාවේ සාමාජිකත්වය ලබා ගැනීම ම නොවේ. දේශපාලන ක්‍රියාවලියට සක්‍රිය ලෙස සහභාගී වන, ඒ මඟින් පොදු යහපත වෙනුවෙන් කැප වී වැඩ කරන පුරවැසියන් සතු යහගුණයකි. ''දේශපාලනයේ යෙදීම'' යනු එම පොදු යහපතත්, නිදහස සාක්ෂාත් කර ගැනීමත් අරමුණු කර ගෙන අන්‍ය පුරවැසියන් ද සමඟ හවුලේ හෙවත් සාමූහික ව කටයුතු කිරීම යි. පුරවැසියා සක්‍රිය ව දේශපාලනය කළ යුතු අතර නිදහස රැකෙන්නේ එවැනි ක්‍රියාකාරිත්වයකිනි.

II. එහෙත්, මේ පිළිබඳ ලිබරල් අදහස මීට වෙනස් ය. පුරවැසි භාවය යනු රාජ්‍යයේ/දේශපාලන ප්‍රජාවේ සාමාජිකත්වය හිමි වීම යි. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පුරවැසියා කරන්නේ තමන්ට ලැබී තිබෙන නිදහස පෞද්ගලික ව, නිහඬ ව භුක්ති විඳීම යි. සක්‍රිය ව දේශපාලන අරගලයේ යෙදීමට පුරවැසියාට සිදුවන්නේ ලිබරල් නොවන සහ ප්‍රජාතන්ත්‍රවාදී නොවන දේශපාලන ක්‍රමයක් තුළ ය.

**(ආ) නිදහස**

I. ලිබරල්වාදය ''නිදහස'' සංකල්පගත කළේ ''පෞද්ගලික නිදහස (Personal Freedom)'' වෙනුවෙනි. එනම් රාජ්‍යයෙන්, සමාජයේත්, අන්‍යයන්ගේත් බාධා කිරීම් සහ මැදිහත් වීම් ආදියෙන් විනිර්මුක්ත ව තනි පුද්ගලයන්ට තම සිතැඟි පරිදි, අන්‍යයන්ට බාධාවක් නොවන පරිදි සිතීමේ, ක්‍රියා කිරීමේ හා ජීවත් වීමේ නිදහස යි. ඉහත සඳහන් කර ඇති පරිදි මෙය හැඳින්වෙන්නේ ''නිෂේධනීය නිදහස'' (Negative-Freedom) යනුවෙනි. එනම් බාධාවලින් තොර ව ලැබෙන නිදහස (Freedom from constraint) යන්න යි.

II. සමූහාණ්ඩුවාදයට අනුව නිදහස යනු පුරවැසියන් තම අරගල මඟින් සාක්ෂාත් කර ගන්නා සහ ආරක්ෂා කරගන්නා අයිතියකි. නිදහස යනු නිසර්ගයෙන් ම අහෝසි වීමේ තර්ජනයට මුහුණ පාන පොදු අයිතියකි. එය රැකගැනීම සඳහා ලිබරල්වාදය යෝජනා කරන නෛතික, දේශපාලන රාමුව ප්‍රමාණවත් නොවන අතර, ඒ සඳහා පුරවැසි ක්‍රියාකාරිත්වය (Civic engagement) අත්‍යවශ්‍ය බව මෙ මඟින් කියැවේ.

- අද්‍යතන සමූහාණ්ඩුවාදී චින්තනය.

  - 20 සියවසේ සමූහාණ්ඩුවාදී සම්ප්‍රදායයේ ප්‍රධාන චින්තකයන් වූ හැනා අරෙන්ඩ්ට්, ක්වෙනටින් ස්කිනර් සහ පිලිප් පෙටිට් යන තිදෙනා මතු කළ අදහස්වල ප්‍රධාන තේමා දෙකකි.

    i. දේශපාලන ආධිපත්‍යවාදයෙන් තොර ව සාක්ෂාත් කෙරෙන නිදහස (Freedom from domination)

ii. නිදහස සාක්ෂාත් කර ගැනීමේ මාධ්‍යය වශයෙන් පුරවැසි ක්‍රියාකාරිත්වය.

- 20 සියවසේ සමූහාණ්ඩුවාදය පුරවැසියාගේ දේශපාලන ක්‍රියාකාරිත්වයට සහ කාර්යභාරයට විශේෂ අවධානයක් යොමු කරන නිසා එය ''පුරවැසි සමූහාණ්ඩුවාදය'' (Civic Republicanism) යනුවෙන් ද හැඳින්වේ.

## 5.4. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය

- මෙය දහනව වන සියවසේ අග භාගයේ දී ආරම්භ වූ වර්තමානයේත් පවත්නා මතවාදයකි.
- 1860 දශකයේ ජර්මනියේ කම්කරු පන්ති ව්‍යාපාරය පදනම් කොටගෙන බිහි වූ ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය මෙහි ලා පුරෝගාමී විය.
- වෘත්තීය සමිතිවල සංවිධානය වූ යුරෝපීය රටවල කම්කරු පන්තිය පදනම් කොටගෙන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ බිහි වී ඇති ආකාරය 20 සියවසේ මුල් දශකවල දැකිය හැකි විය.
- දෙවන ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ හා ස්කැන්ඩිනේවියානු රටවල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරවලට නව පුනර්ජීවයක් ලැබිණ.
- විසි වැනි සියවසේ යුරෝපීය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයේ ප්‍රධානතම ලක්ෂණය නම් ලිබරල්වාදය සහ මාක්ස්වාදය යන චින්තන ධාරා එකක් අනෙක සමඟ අනන්‍ය නොවී, ඒවායේ සමහර අංග මිශ්‍ර කර ගොඩනැගුණු එකක් වීම ය. ධනවාදයේ සහ මාක්ස්වාදයේ සම්මිශ්‍රණයක් ලෙස ද මෙය හඳුන්වන්නේ එබැවිනි.
- සමාජ ප්‍රජාතන්ත්‍රවාදය යුරෝපයේ ආරම්භ වූයේ මාක්ස්වාදයේ ආභාසය ලබමින් සහ එය තම නිල මතවාදය ලෙස සලකමිනි. එම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂ මුලදී මාක්ස්වාදයේ ආභාසය ලැබූ ඒවා ය.
- විසි වැනි සියවසේ මුල් දශකයේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවහාරයට මාක්ස්වාදයෙන් හා විප්ලවීය සමාජවාදයෙන් වෙනස් වූ මතවාදී නැඹුරුවක් හා දේශපාලන අනන්‍යතාවයක් ලැබෙන්නට විය. එහි පුරෝගාමියා ද මෙම චින්තනය හැඩගැස්වූ ප්‍රධානතම චින්තකයා ද (1850-1932) ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක එඩ්වර්ඩ් බර්න්ස්ටයින් (Edward Bernstein) ය.
- මුල දී මාක්ස්වාදියකු වූ ඔහු, අනිවාර්ය කම්කරු පන්ති විප්ලවයක් පිළිබඳ ව අදහස පිළිගත්තේ නැත. පාර්ලිමේන්තුව මාධ්‍ය කොටගෙන, ප්‍රතිසංස්කරණ මගින් කම්කරු පන්තියට සමාජවාදී අරමුණු ඉටු කරගත හැකි ය, යන නව අදහස සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයට එක් කිරීම බර්න්ස්ටයින් ඊට කළ එකතුව විය.
- 1930 දශකයෙන් පසු ව රාජ්‍ය සුභසාධනවාදී මතවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනය සමඟ එක්විය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සමාජවාදයේ ම මෘදු ධාරාවක් ලෙස සැලකීමට පසුබිම් වූයේ මෙම චින්තනමය එකතුව යි.
- දේශපාලන චින්තනයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන මූලධර්ම මෙසේ ය.
  I. ධනවාදී සමාජ ආර්ථික ක්‍රමය විසින් ඇති කරනු ලබන ගැඹුරු ආර්ථික අසමානතා, දරිද්‍රතාව සහ සමාජ අසාධාරණයන්ට විසඳුම් ධනවාදය තුළ නොමැති නිසා එම ක්‍රමය ප්‍රතික්ෂේප කළ යුතු ය.

II. ධනවාදයට විකල්පය ලෙස මතු වූ සමාජවාදය, ධනවාදය විසින් ඇති කරන ලද ගැටලු වලට ප්‍රබල පිළිතුරු යෝජනා කළේය. එහෙත් විප්ලවීය පරිවර්තනයක් වෙතින් සමාජවාදය බිහි කිරීමේ මාක්ස්වාදී පිළිවෙත ප්‍රායෝගිකත්වයෙන් දුරස් වේ.

III. ධනවාදයේ ගැටලුවලට සමාජවාදී විසඳුම් ලබා දිය යුත්තේ ධනවාදී ක්‍රමය, සමාජ සමානාත්මතාව හා සමාජ සාධාරණත්වය පිළිබඳ සමාජවාදී මූලධර්ම අනුව ප්‍රතිසංස්කරණය කිරීමෙනි.

IV. ධනවාදය සමාජවාදී මූලධර්ම අනුව ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රතිපත්ති මය පියවර පහත සඳහන් පරිදි වේ.

1. ආර්ථික ක්ෂේත්‍රයට රාජ්‍යය මැදිහත් වීම :-
   - මෙය රාජ්‍ය නිර්බාධවාදී ලිබරල් ධනවාදී මූලධර්මයෙන් පැහැදිලි ව වෙන් වීමකි.
   - රාජ්‍යයේ මැදිහත් වීම මඟින් ආර්ථිකයේ ගමන් මඟ පාලනය කිරීමට හා හැසිරවීමට හැකි වේ.
   - එමඟින් වෙළෙඳපොළ ආර්ථිකයෙන් ඇති වන අයහපත් ආර්ථික-සමාජ ප්‍රතිඵල (සමාජ අසමානතා, දරිද්‍රතාව, සමජ අසාධාරණත්වය ආදිය) සඳහා පිළියම් යෙදිය හැකි ය.

2. මිශ්‍ර ආර්ථිකය :-
   - මේ මඟින් යෝජනා වූයේ ධනවාදී හා සමාජවාදී ආර්ථික මූලධර්ම හා ප්‍රතිපත්ති සංයෝග කිරීම යි.
   - වෙළෙඳපොළ ආර්ථිකය පවත්නා ගමන් ම එකී ආර්ථිකය රාජ්‍යය විසින් පාලනය කිරීම මිශ්‍ර ආර්ථිකයේ (Mixed Economy) ප්‍රධාන ලක්ෂණය යි.

3. සමාජ සුභසාධනය :-
   - ධනවාදී ලිබරල් ආර්ථික ක්‍රමයේ සමාජ සුභසාධනය යන සංකල්පය පවතින්නේ ම නැත.
   - එහි විශ්වාසය වූයේ වෙළෙඳපොළ බලවේග විසින් සමාජ සුභසාධනය ''බලාගන්නවා ඇති'' බව යි.
   - සමාජ ප්‍රජාතන්ත්‍රවාදය එම අදහස තරයේ ම ප්‍රතික්ෂේප කරමින්, නිදහස් වෙළෙඳපොළට කළ හැක්කේ අසමානතාව ඇති කිරීම මිස, ඒවාට විසඳුම් යෙදීම නොවන බව අවධාරණය කරයි.
   - එයට පිළියම් වශයෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනය යෝජනා කළේ ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල රජයේ ඍජු මැදිහත 'වීම මත පදනම් වූ සමාජ සුභසාධනය (Social Welfarism) යි.

4. ආදායම් සහ ධනය සමාජයේ යළි බෙදාහැරීම :-
   - ධනවාදී වෙළෙඳපළ ආර්ථිකයේ අයහපත් ප්‍රතිඵලයක් වන ආදායම් හා ධනය බෙදීයාමේ දැඩි අසමානතා සිදුවීම සහ ධනය සුළුතරයක් අත කේන්ද්‍රගත වීම යන්නට සමාජ ප්‍රජාතන්ත්‍රවාදය යෝජනා කළේ ආදායම් සහ ධනය යළි බෙදා හැරීමේ විකල්පය යි. (Redistribution of income and wealth)
   - ආදායම් බදු මඟින් ධනවතුන්ගෙන් ලබා ගන්නා ධනය සමාජ සුභසාධන ක්‍රියාමාර්ග සඳහා වැය කිරීම මේ සඳහා යොදාගෙන ඇති ප්‍රධාන උපක්‍රමය යි.

5. සාමූහික කේවල් කිරීම :-

- සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය, ඓතිහාසික වශයෙන් කම්කරු පන්තිය මත පදනම් වූවකි.

- එබැවින් කම්කරු පන්තියේ වැටුප් සහ ජීවන මට්ටම් ආරක්ෂා කර ගැනීම අරමුණු කරගෙන ස්වාමි පක්ෂය සමඟ සාමූහික ගිවිසුම්වලට එළඹීම පිළිබඳ මූලධර්මය සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණයක් වේ.

## 5.5. ෆැසිස්ට්වාදය

- ලිබරල්වාදය 17-18 සියවස්වලටත්, සමාජවාදය 19 වැනි සියවසටත්, ෆැසිස්ට්වාදය 20 සියවසේ පළමු අර්ධයටත් අයත් වූ මතවාද යි.

- දෘෂ්ටිවාදයක් මෙන් ම, දේශපාලන ව්‍යාපාරයක් ද වශයෙන් ෆැසිස්ට්වාදය බිහි වූයේ පළමු හා දෙවන ලෝක යුද්ධ අතර කාලයේ ය.

- දෙවන ලෝක යුද්ධයේ දී ඉතාලිය හා ජර්මනිය ලැබූ පරාජය සමඟ දේශපාලන මතවාදයක් ලෙස ෆැසිස්ට්වාදය තීරණාත්මක පරාජයකට භාජනය විය.

- ''ෆැසිස්ට් වාදය'' යන වචනය ඉතාලියේ බෙනිටෝ මුසෝලිනිගේ නායකත්වයෙන් බිහි වූ ඒකාධිපති, රණවාදී දේශපාලන ව්‍යාපාරය හැඳින්වීමට මුලින් ම භාවිත කෙරිණ.

- පසු ව එය ජර්මනිය සහ ජපානය තුළ බිහි වූ වර්ගවාදී, රණවාදී සහ ඒකාධිපතිවාදී දේශපාලන ව්‍යාපාර සහ රාජ්‍ය ක්‍රමය හැඳින්වීමට භාවිත කළ පොදු දේශපාලන නාමයක් බවට පත් විය.

- ජර්මන් ෆැසිස්ට්වාදය හැඳින්වුණ ජර්මන් සම්භවයක් ඇති වචනය ''නට්සිවාදය'' (Nazism) යි. එය ''ජාතික සමාජ වාදය'' (National Socialism) යන අරුත් ඇති ජර්මන් වචනයේ සංක්ෂිප්තය යි.

  - පසුබිම :-

    - ඉතාලියේ සහ ජර්මනියේ ෆැසිස්ට්වාදය බිහි වූයේ ධනවාදය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය යන මේවාට සම්පූර්ණයෙන් ම පසමිතුරු දෘෂ්ටිවාදයක් සහ දේශපාලන ව්‍යාපාරයක් ලෙසට ය.

    - පළමුවන ලෝක යුද්ධයේ පරාජය පසුබිම් කොටගෙන ඉතාලියේ සහ ජර්මනියේ ඇති වූ දැඩි දේශපාලන අර්බුදය, 1920 ගණන් වල ආර්ථික අවපාතය නිසා ඇති වූ ආර්ථික හා සමාජීම ය කඩා වැටීම ෆැසිස්ට්වාදය හා නට්සිවාදය බිහි වීමේ පසුබිමෙහි තිබිණ.

  - මතවාදය :-

    - ෆැසිස්ට්වාදයේ මූලධර්ම සහ අරමුණු ඉතා පැහැදිලි ව ප්‍රකාශ කර තිබෙන්නේ ජර්මන් නට්සි පාලකයා වූ ඇඩොල්ෆ් හිට්ලර් (Adolph Hitler) 1925-26 දී ලියූ ''මගේ සටන'' (Mein Kampf) නම් කෘතියෙනි. එය දේශපාලන සිරකරුවකු ව සිටිය දී හිට්ලර් විසින් ලියන ලද්දකි.

    - හිට්ලර් සහ ඉතාලි ෆැසිස්ට්වාදී නායක බෙනිටෝ මුසොලිනී (Benitto Mussolini) ප්‍රකාශ කළ අදහස් හා භාවිත ආශ්‍රයෙන් ෆැසිස්ට්වාදී චින්තනයේ සහ දේශපාලනයේ ප්‍රධාන ලක්ෂණ හඳුනා ගත හැකි ය.

(අ) දේශපාලන ඒකබලවාදය (Totalitarianism) :-

- ෆැසිස්ට්වාදය එක්තරා ආකාරයක ඒකාධිපති පාලන තන්ත්‍රයක් ගොඩ නැගීම ඉලක්ක කළ අතර, එය හැඳින්වීමට දේශපාලන න්‍යායයේ යොදා ගත් සංකල්පය ඒකබලවාදය යි.

- එහි අර්ථය නම් රාජ්‍යය අත්‍යන්තයෙන් ම ඒකාධිපති වීම සහ ඒකාධිපති පාලන තන්ත්‍රයක් විසින් සමස්ත සමාජය මත්, දේශපාලන ක්‍රමයත් තම පරිපූර්ණ ග්‍රහණයට හා ආධිපත්‍යයට හසුකර ගැනීම යි.

(ආ) රාජ්‍ය වන්දනය (Cult of the state) :-

- මුසෝලිනීගේ ෆැසිස්ට්වාදී අදහස් සංකල්පගත කිරීමෙන් ඇරඹුණු මෙයින් කියැවුණේ රාජ්‍යයේ ආධිපත්‍යය මුළු සමාජයත්, සෑම පුරවැසියෙකුත්, කොන්දේසි සහ ප්‍රශ්න කිරීමකින් තොර ව පිළිගැනීමත්, රාජ්‍යයේ බලාධිකාරයට සිය කැමැත්තෙන් ම යටත් වීමත් ය.

- කුමක් නිසා ද යත්, රාජ්‍යයෙන් ප්‍රකාශ වන්නේ මුළු ජාතියේ ම ශ්‍රේෂ්ඨත්වය, ගෞරවය සහ ඉරණම නිසා ය.

- ෆැසිස්ට් දේශපාලන ක්‍රමයෙහි රාජ්‍යයෙන් වෙන් වූ හා ස්වාධීන වූ පෞද්ගලික නිදහසක් නැත.

- නිදහස සාක්ෂාත් වන්නේ බලයට, අධිකාරියට සහ නායකයාට යටත් වීම මඟිනි.

(ඇ) පෞද්ගලික නිදහසක් නැත :-

- ලිබරල් වාදයේ, මූලික හරය වූයේ රාජ්‍යයේ ආධිපත්‍යයෙන් ආරක්ෂා වන පෞද්ගලික නිදහස නම්, ෆැසිස්ට්වාදය යටතේ ''පෞද්ගලික නිදහස'' යන සංකල්පය ප්‍රතික්ෂේප විය.

- පුද්ගලයකුගේ නිදහස පවතින්නේ රාජ්‍යයට, ජාතියට සහ නායකයාට කොන්දේසි විරහිත ව අවනත වීමේ පරිමාව මත ය.

(ඈ) නායක වන්දනය (Cult of the leader) :-

- නායකයාගේ බලය සහ ආධිපත්‍යයට සෑම පුරවැසියෙකුමත්, මුළු මහත් ජාතියත්, කොන්දේසි විරහිත ව සහ ස්වේච්ඡාවෙන් අවනත වීම. ෆැසිස්ට්වාදයේ විශේෂ ලක්ෂණයකි.

- ජර්මනියේ නට්සිවාදය යටතේ ඉදිරියෙන් වූ ෆූරර් (Fuhrer) යන සංකල්පය මෙම නායක වන්දනය ප්‍රකාශ කළ ෆැසිස්ට්වාදී නිර්මාණයකි.

(ඉ) අත්‍යන්ත වර්ගවාදය/ජාතිවාදය :-

- ජර්මන් නට්සිවාදයෙහි වර්ධනය වූ මෙම ලක්ෂණය වෙතින් ප්‍රකාශ වූයේ ජර්මන් ජාතිය ලෝකයේ උතුම් ම වූ ජාතිය බවත්, ලෝකයේ ඉරණම රඳා පැවතියේ ජර්මන් ජාතියේ ඉරණම මත බවත්, එබැවින් මුළු ලෝකය මත ම තම ආධිපත්‍යය පිහිටුවීමට ජාතියට ශුද්ධ වූ අයිතියක් තිබෙන බවත් ය.

- ''ජර්මන් ජාතිය ආර්ය ජාතියකි'' යන අදහස මේ වෙතින් පැන නැගුණකි. ලක්ෂ සංඛ්‍යාත යුදෙවු ජාතිකයන් ඝාතනය කිරීම ජර්මන් නට්සිවාදීන් සාධාරණය කළේ මේ විශ්වාසය පදනම් කරගනිමිනි.

(ඊ) අත්‍යන්ත රණවාදය (extreme militarism) :-

අත්‍යන්ත රණවාදය මූලයන් දෙකක් වෙතින් පැන නැගී ඇත.

I ජර්මන් ජාතිය ලෝකයේ ''උතුම්ම ජාතිය'' නිසා මුළු ලෝකය ම තමන්ගේ යටතට ගැනීමේ ලෝක ව්‍යාප්තවාදී අදහස.

II ජර්මන් සමාජය ''ආර්ය'' ජර්මන් ජාතියේ බලයට තර්ජනයක් ලෙස සැලකූ අන්‍ය වාර්ගික කණ්ඩායම්වලින් ''නිදහස්'' කිරීම. දෙවන ලෝක යුද්ධය ආරම්භ කිරීමට ජර්මන් නට්සිවාදීන් පෙලඹුණේ මෙම චින්තනය පදනම් කරගෙන ය.

(උ) ප්‍රචණ්ඩත්වය සහ භීෂණය (Terror) දේශපාලන බල මාධ්‍යයක් ලෙස භාවිත කිරීම :-

- ෆැසිස්ට් රාජ්‍යයේත්, ෆැසිස්ට් බල ව්‍යාප්තියේත් විශේෂ ලක්ෂණය වූයේ මුළු සමාජය ම තමන්ගේ ආධිපත්‍යය යටතට බලහත්කාරයෙන් අත්කර ගැනීම යි.

- තම බලයට එකඟ නොවන සෑම සමාජ/වාර්ගික කොටසක් ම යටත් කර ගැනීමට හා ශාරීරික ව විනාශ කිරීමට ෆැසිස්ට්වාදීහු සංවිධානාත්මක ව ඉදිරිපත් වූහ.

- ඒ මත ''ජන සංහාරය'' (Genocide) ෆැසිස්ට් රාජ්‍යයේ කාර්යයක් බවට පත් විය.

- ෆැසිස්ට්වාදය සමඟ එකඟ නොවූ ජනයාට තිබුණේ විකල්ප දෙකකි. එක්කෝ රටහැර යාම යි. නැත්නම් ජනසංහාරයක ඝාතනයට ලක් වීම යි.

- පළමු ලෝක යුද්ධයෙන් පසු ව ඉතාලියේ සහ ජර්මනියේ පැන නැගුණු ෆැසිස්ට්වාදය, දෙවන ලෝක යුද්ධයේ දී එම රටවල් ලද පරාජයත් සමඟ නිල වශයෙන් අවසන් විය.

- ෆැසිස්ට් වාදය මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ ඇති වූ මැකිය නොහැකි කළු පැල්ලමක් ලෙස සැලකේ.

- ෆැසිස්ට් චින්තනය අද වන විට පරාජය වී ඇතත්, ඊට ඇදී ගිය (ආකර්ෂණය වූ) කුඩා කණ්ඩායම් යුරෝපයේත්, ඇමරිකාවේත් තව මත් සිටිති.

## 5.6. ජාතිකවාදය

- 19 සහ 20 වැනි සියවස්වල වර්ධනය වූ ප්‍රධානතම දේශපාලන මතවාදයකි, ජාතිකවාදය. (Nationalism).

- එය දේශපාලන මතවාදයක් මෙන් ම, දේශපාලන හා සමාජ ව්‍යාපාරයක් ද වන අතර නූතන ලෝකයේ රාජ්‍යය, දේශපාලන ගැටුම් සහ අන්තර් රාජ්‍ය සම්බන්ධතා යන මේවා නිර්ණය කිරීමට බලපෑ ප්‍රධානතම සාධකයක් ද වේ.

- ජාතිකවාදයේ කාර්යභාරය අමතක කළහොත්, නූතන ලෝකය තේරුම් ගැනීමට නොහැකි තරමට, නූතන ඉතිහාසයේ ගමන් මඟත්, මනුෂ්‍යයන්ගේ දේපාලන ඉරණමත් හැඩ ගැස්සීමට ජාතිකවාදය දායක වී තිබේ.

- ජාතිකවාදය යන්න කෙටියෙන් දක්වන්නේ නම්, ''ජාතියක්'' යනුවෙන් තමන් ගැන ම ස්වයං-අවබෝධයක් ඇති ප්‍රජාවක් නිශ්චය දේශපාලන අරමුණක් සඳහා මෙහෙයවන ''ජාතිය'' පිළිබඳ අදහස යි.

- මතවාදයක්, චින්තන ධාරාවක් හැටියට ජාතිවාදයේ විශේෂත්ව දෙකක් පවතී.

(I) ජාතිකවාදය යනුවෙන් ක්‍රමානුකූල ඒකාග්‍ර චින්තනයක් නැත.

- එය නිශ්චිත චින්තකයකු හෝ දාර්ශනිකයකු හෝ සමඟ අනන්‍ය වී නැත. ඊට මනා චින්තකයෙක් ද නැත. මේ ගැන බෙනඩික්ට් ඇන්ඩර්සන් නම් දේශපාලන න්‍යායවේදියා 1983 දී පළ කළ *Imagined Communities* (පරිකල්පිත ප්‍රජාව) නම් කෘතියේ මනා ව පෙන්වා දී තිබේ.

- ජාතිකවාදය දේශපාලනික වශයෙන් කොතරම් බලගතු වුවත්, එය දාර්ශනික වශයෙන් දිළිඳු ය. දාර්ශනික ඒකමතිකත්වයක් එහි නැත. අනෙකුත් දේශපාලන මතවාද මෙන් තමන්ගේ ම මහා චින්තකයන් හෝ න්‍යායවේදීන් හෝ ජාතිකවාදය විසින් බිහි කරනු ලැබ නැත. ''ජාතිකවාදයට හොබ්ස් කෙනෙකු, ද ටොක්විල් කෙනෙකු, මාක්ස් කෙනෙකු තබා වේබර් කෙනෙක් ද නැත''-(ඇන්ඩර්සන්, 1983.14)

(II) මහා දාර්ශනිකයන්, චින්තකයන් විසින් නිර්මාණය නොකළත්, විවිධ සමාජවලින් බිහි වී ඇති ජාතිකවාදී මතවාදවල ව්‍යුහාත්මක සාම්‍යතා තිබීම යි.

නිදා:- සිංහල ජාතිකවාදය, ජපාන ජාතිකවාදය, ඉංග්‍රීසි ජාතිකවාදය, රුසියානු ජාතිකවදය, ආදි වශයෙන් එකිනෙකට ඍජු ව කිසිදු සම්බන්ධයක් පවා නැති ජාතිකවාදවල ව්‍යුහාත්මක සංයුතිය එක සමාන ය.

- ජාතික වාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගත හැකි ය.

  1. නූතනවාදී ප්‍රවේශය. (Modernist)
     - මෙය 18 වැනි සියවසෙන් පසු ව යුරෝපයේ කාර්මික ධනවාදයත් ජාතික රාජ්‍යයක් වර්ධනය වීමේ ක්‍රියාවලින් සමඟ සම්බන්ධ ව ගොඩනැගුණු මතවාදයකි.

  2. චිරන්තනවාදී ප්‍රවේශය - (Primordialist)
     - ජාතිකවාදය අවුරුදු දහස් ගණනක ඉතිහාසයක් ඇති, මනුෂ්‍ය ඉතිහාසය තරම් ම පැරණි සංසිද්ධියක් බව මින් ප්‍රකාශ කෙරේ.

  3. මෙවලම්වාදී ප්‍රවේශය - (Instrumentalist)
     - ජාතිය යන අදහස දේශපාලනඥයන් සහ දේශපාලන ප්‍රභූන් බලය ලබා ගැනීම සඳහා පාවිච්චි කරන මෙවලමක් බව මෙයින් කියැවේ.

- ''ජාතිය'' පිළිබඳ හැඟීමේ පදනම් සහ ජාතිකවාදය.

1. ජාතිකවාදයේ ප්‍රධානතම කාර්යය නම් ''යම්කිසි ප්‍රජාවකට තමන් සියලු දෙනා සාමූහිකව ගත් කල ''ජාතිය'' යන විශාල ප්‍රජාවට අයත් වෙති යි යන හැඟීම ගොඩ නැඟීම ය. එනම් ජාතිය යන ප්‍රජාවට අයත් වීම (Bdonging to the community called nation) යන හැඟීම යි.

2. ''ජාතියක්'' යන තනි ඒකකයක් ලෙස සිතන්නට ඔවුන් අතර පොදු බවක් පිළිබඳ ශක්තිමත් බවක් ද තිබිය යුතු ය. ජාතිකවාදීන් මෙය දක්වන්නේ 'ජාතික අනන්‍යතාව' (National

Identity) යනුවෙනි. ජාතික අනන්‍යතා කාරක නම් භාෂාව, ආගම, සංස්කෘතිය, පොදු ඉතිහාසය සහ සමහර විට පොදු භෞමික ප්‍රදේශයකට අයත් වීම යි.

3. පොදු බව පිළිබඳ හැඟීමෙන් ආරම්භ වන ජාතිකවාදය පසු ව දේශපාලන ස්වරූපයක් අත්පත් කර ගනියි. එමගින් 'ජාතිය' යන්නට දේශපාලන අනන්‍යතාවක් ලැබෙන අතර, ජනතාවට දේශපාලන ඉලක්ක ලබාදී ජාතිය දේශපාලන වශයෙන් මෙහෙයවයි. දේශපාලන නිදහස, ප්‍රදේශීය ස්වයං පාලනය, සහ ප්‍රජා කණ්ඩායම් අයිතිවාසිකම් මෙම දේශපාලන අරමුණු අතර ප්‍රධාන වේ.

4. ස්වයං තීරණ අයිතිය (Right of self-determination) ජාතිකවාදය හා සම්බන්ධ ප්‍රධාන සංකල්පයකි. ඉන් අදහස් වන්නේ තමන්ගේ දේශපාලන ඉරණම තීරණය කිරීමේ අයිතිය සෑම ජාතියකට ම හිමි ය යන අදහස යි. දේශපාලන වශයෙන් වෙන ම රාජ්‍යයක් පිහිටුවා ගනිමින් වෙන් වීම, ප්‍රදේශීය ස්වයං පාලනය - ජාතික ස්වයං තීරණ අයිතිය මගින් සාක්ෂාත් කරගන්නා අරමුණු ය.

5. දේශපාලන වශයෙන් ජාතිකවාදී මතවාදයේ කාර්යයක් වන්නේ 'ජාතියක්' ලෙස හඳුන්වන එක් ප්‍රජාවක්, අනෙකුත් ප්‍රජාවකගෙන් වෙන් කොට හඳුනා ගැනීම යි. පෙර ද කියූ පරිදි එහි නිර්ණායකයක් වන්නේ භාෂාව, ආගම, සංස්කෘතිය ආදි වූ ජාතික අනන්‍යතා කාරක ය. මෙසේ වෙනස් කොට හඳුනා ගැනීම අන්තයකට ගිය විට ''අප සහ සතුරා/සතුරන්'' යන ද්විත්ව විභේදනය ඔස්සේ ලෝකය දෙස බැලීමට ජාතිකවාදීහු පෙලඹෙති.

- ජාතිකවාදය මතවාදයක් මෙන් ම දේශපාලන ව්‍යාපාරයක් ලෙස (18 සියවස සිට වර්තමානය තෙක්) ප්‍රධාන ස්වරූප දෙකකි.
  1. ජාතික - රාජ්‍ය ජාතිකවාදය
  2. ජනවාර්ගික ජාතිකවාදය

1. ජාතික - රාජ්‍ය ජාතිකවාදය

  - මෙය ජාතිකවාදයේ සම්භාව්‍ය ස්වරූපය යි. මෙහි ප්‍රධාන ලක්ෂණය වන්නේ ජාතික-රාජ්‍ය අනන්‍යතාව පදනම් කරගැනීම යි.

  - යුරෝපයේ 18 සියවසේ ඇති වූ ජාතික රාජ්‍ය මාදිලියේ හරය ''එක් ජාතියක්-එක් රාජ්‍යයක්'' යන සමීකරණය අනුව එක් ජාතියකට අයත් වැසියෝ එම රාජ්‍යයට අයත් වෙති.

  - ජාතියට ඇති අයත් වීම, බැඳීම සහ ආදරය යනු එම ජාතියේ රාජ්‍යය සමඟ ද අනන්‍ය වීමෙන් ලැබෙන බැඳීම හා රාජ්‍යයට ආදරය කිරීම යි.
    නිදඃ- ශ්‍රී ලාංකික ජාතිය, ඉන්දියානු ජාතිය, තායිලන්ත ජාතිය වශයෙන් ප්‍රකාශ වන්නේ මෙම ජාතික-රාජ්‍යවාදී ජාතිකවාදී පරිකල්පනය යි.

2. ජනවාර්ගික ජාතිකවාදය

  - ජාතික රාජ්‍යයක් තුළ ජීවත් වන වාර්ගික ප්‍රජාවන් අතර ඇතිවන සාමූහික ප්‍රජා කණ්ඩායමක් පිළිබඳ දේශපාලන විඥානය ''වාර්ගික ජාතිකවාදය'' (Ethnic Nationalism) යනුවෙන් හැඳින්වේ.

  - ඊට ද පදනම් වන්නේ භාෂාව, ආගම, සංස්කෘතිය පොදු අනන්‍යතා සාධක ය.

- වාර්ගික ජාතිකවාදී විඥානය පැන නඟින්නේ තමා ද සාමාජිකත්වය දරන ජාතික රාජ්‍ය පවත්නා ජාතික-රාජ්‍ය ජාතිකවාදයෙන් ද තමාට සමානත්වය හා අයිතිවාසිකම් නොලැබෙන බව හා තමා වෙනස්කම්වලට භාජනය වන බව පවසන දුක් ගැනවිලි ද සමඟ ය.

- එවැනි වාර්ගික ජාතිකවාදවල දේශපාලන ඉල්ලීම්වල සමාන අයිතිවාසිකම්, ප්‍රාදේශීය ස්වයං-පාලනය සහ වෙන් වීම යන ඉලක්ක ද ඇතුළත් වේ.

- 18 සියවසේ සිට ජාතිවාදයේ ඓතිහාසික අත්දැකීම මිශ්‍ර එකකි. එය සාධනීය මෙන් ම නිෂේධනීය ප්‍රතිඵල ද අත්කර දී තිබේ.

1. ලෝකයේ නූතන රාජ්‍ය පද්ධතිය, මූලික වශයෙන් ම ජාතික-රාජ්‍යවාදී ජාතිකවාදය විසින් තීරණය කෙරේ.
2. දේශපාලන නිදහස, විමුක්තිය පිළිබඳ අදහස ජාතිකවාදය ඉතා ප්‍රබල ජන සාමූහික විඥානයට එක්කර තිබේ.
3. අත්‍යන්ත ජාතිකවාදය, රාජ්‍ය මෙන් ම ජාතිකවාදී ව්‍යාපාරය ද යුද්ධ, ජන ඝාතන/සංහාර, ප්‍රචණ්ඩත්වය සඳහා මෙහෙයවා තිබේ.

## 5.6. නිරාගාමිකවාදය (Secularism)

- නිරාගාමිකවාදය යනු ආගම සහ දේශපාලනය මිශ්‍ර නොකිරීම යි.

- රාජ්‍ය ක්ෂේත්‍රයට ආගමේ බලපෑමක් ද, ආගමික ක්ෂේත්‍රයට රාජ්‍යයේ බලපෑමක් ද නොමැතිව, ඒ දෙක එකිනෙකට වෙනස් සහ ස්වාධීන ව ක්ෂේත්‍ර දෙකක් කොට සැලකිය යුතු ය යන අදහස ප්‍රකාශ කරන මතවාදයකි.

- ආගම දේශපාලනයට පැමිණීමත්, දේශපාලනය සඳහා ආගම මාධ්‍යයක් කර ගැනීමත් පිළිබඳ පසුබිමෙහිලා, ආගමික ගැටුම් ප්‍රධාන දේශපාලන තේමාවක් ව පවතින වර්තමානයේ නිරාගමිකවාදය පිළිබඳ උනන්දුව වැඩි වී තිබේ.

- මේ සම්බන්ධ ව තියුණු සාකච්ඡාවක් ඉන්දියාවේ සිදුවෙමින් පවතින අතර, රාජ්‍යය නිරාගමික විය යුතු බව 1975 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කළ සංශෝධිතයෙන් ද කියවේ. එය ප්‍රජාතන්ත්‍රවාදය තරමට වැදගත්කමක් ලැබෙන, ඉන්දියානු ව්‍යවස්ථාවේ සහ දේශපාලන ක්‍රමයේ පදනම් මූලධර්මයක් ද වේ.

- සම්භවය :-

    - 18-19 සියවස්වල යුරෝපයේ මෙහි සම්භවය ඇති විය.

    - එය යුරෝපීය ප්‍රබුද්ධවාදී (Enlightenment) චින්තනයේ ම කොටසක් වේ.

    - ඒ නිසා ම සම්භාව්‍ය ලිබරල්වාදය හා සමාජවාදී චින්තන ධාරා නිරාගමිකවාදය සම්බන්ධ විය.

- යුරෝපීය නිරාගාමිකවාදය, මධ්‍යකාලීන යුගයේ අවසානය දක්වා කාලයේ ප්‍රධාන මතවාදයක් වූ අතර රාජ්‍යය සහ පල්ලිය අතර පැවති ආයතනික බන්ධනය මත රාජාණ්ඩුවේ ආරක්ෂකයා ලෙස පල්ලිය පෙනී සිටීමට එරෙහි ව වර්ධනය විය.

- රාජාණ්ඩු ක්‍රමයට විරුද්ධ වූ බලවේග රාජ්‍යය හා පල්ලිය අතර පැවති මේ ''අශුද්ධ සන්ධානයට ද'' එරෙහි වීමෙන් නිරාගමිකවාදය මතු වන්නේ එම අරගලයේ දෘෂ්ටිවාදීය ප්‍රතිඵලයක් ලෙසිනි.

- නිරාගාමික වාදය මතු වීමට තවත් හේතුවක් ලෙස යුරෝපීය ප්‍රබුද්ධ යුගයේ මතු වූ තර්ක බුද්ධියට මුල්තැන දීම පෙන්වා දිය හැකි ය. එය පල්ලිය පවත්වාගෙන ගිය බුද්ධිමය ආධිපත්‍යයට එරෙහි විය.

- ප්‍රබුද්ධ යුගයේ මතු වූ නිරාගමිකවාදය, සම්භාව්‍ය ලිබරල් වාදයේත්, සමාජවාදයේත්, චින්තනමය මූලාශ්‍රයයක් විය.

- ලිබරල් වාදය විසින් පුද්ගල නිදහස, සිතීමේ හා, හෘදයසාක්ෂ්‍යයේ නිදහස යන මූලධර්ම නිරාගමිකවාදයෙන් උකහා ගන්නා ලද අතර සමාජවාදය, සමාජ පීඩනයේ ආයතනයක් හැටියට ආගමේ ආධිපත්‍යයට අරගල කිරීම, එයින් උකහා ගත්තේය.

- මේ අනුව ''පල්ලිය සහ රාජ්‍යය එකිනෙකින් වෙන් කිරීම'' (Scparation of church and the state) යුරෝපීය ලිබරල්වාදී සහ සමාජවාදී සම්ප්‍රදායවල මතු වූ ප්‍රධාන සටන් පාඨයක් විය.

● ලිබරල් නිරාගමිකවාදයේ මූලධර්ම :-

I රාජ්‍යය සහ පල්ලි ආයතනික වශයෙන් වෙන් කිරීම:-
රාජ්‍යයේ ස්වභාවය සහ රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම යනාදියට ආගම මැදිහත් නො විය යුතුවාක් මෙන් ම ආගමික කටයුතු සඳහා රාජ්‍යය මැදිහත් නොවිය යුතුය යන්න මින් අදහස් වේ.

II රාජ්‍යය ආගම සමඟ අනන්‍ය නොවීම සහ ආගමික අධ්‍යයනයට හා ප්‍රචාරණයට රාජ්‍යය සම්බන්ධ නොවීම.

III රාජ්‍ය කිසි ම ආගමකට පක්ෂපාතිත්වයක් නොමැති විය යුතු ය. ආගම මනුෂ්‍යයන්ගේ පෞද්ගලික දෙයක් වන අතර එය දේශපාලනයට ගෙන ආ යුතු නැත.

IV ආගම අහෝසි කළ යුතු යයි ලිබරල් නිරාගමිකවාදය ප්‍රකාශ නොකරයි. ආගමික නිදහස පුරවැසි මූලික අයිතිවාසිකමක් වන අතර ආගමිකත්වය මත කිසි දු පුරවැසියකුට වෙනස් කමක් නොකළ යුතු බව එය අවධාරණය කරයි.

● සමාජවාදී නිරාගමිකවාදය :-

- මාක්ස්වාදීහු ආගම සමාජ පීඩනයේ ආයතනයක් ලෙසත්, ලෝකය පිළිබඳ ව සාවද්‍ය අවබෝධයක් පීඩිත ජනයාට ලබාදෙන මතවාදි පද්ධතියක් ලෙසත් හැඳින්වූහ.

- සමාජවාදී නිරාගමිකවාදයේ මූලධර්ම :-

I සමාජවාදී රාජ්‍යය සම්පූර්ණයෙන් ම ආගමෙන් වෙන් විය යුතු ය. ආගමට පැවතිය හැක්කේ රාජ්‍යයේ අවසරය මත පමණි.

II සමාජවාදී ක්‍රමයක දී ආගමික, දේශපාලන ආයතනවලට නිදහස නැත.

III සමාජවාදී ක්‍රමයක දී ආගමික ආයතනවලට පැවතීමට ඉඩ ලැබෙන්නේ සමාජවාදී රාජ්‍ය ට ඒවායින් අනතුරක් නොවන තාක් දුරටත් රාජ්‍යයේ දැඩි සුපරික්ෂාකාරීත්වය යටතේත් ය.

IV ආගමික අනන්‍යතාව මත දේශපාලන හෝ සිවිල් සමාජ සංවිධාන පිහිටුවීමට අවකාශ නැත.

- ඉන්දියානු නිරාගමිකවාදය :-

  - ලිබරල් සම්භවයක් ඇති ව ඉන්දියානු නිරාගමිකවාදය ගොඩ නැඟී ඇත.

  - ඉන්දියානු නිරාගමිකවාදයේ ප්‍රධාන ලක්ෂණ :-

I මෙහි අර්ථ දෙකක් තිබේ.

(අ). ලිබරල් නිරාගමිකවාදයේ න්‍යායාත්මක මූලධර්මය සෑම ආගමකට ම අපක්ෂපාත ව (Impartial) සැලකීම යි. හින්දි භාෂාවෙන් එය ''ධර්ම නිරපේක්ෂතා'' යනුවෙන් කියවේ.

(ආ). සෑම ආගමකට ම එක සේ සැලකීම. එනම් සෑම ආගමක් ම එක සමාන බව පිළිගැනීම යි. එය ''සර්ව ධර්ම සම්භාව'' යන සංකල්පයෙන් ප්‍රකාශ වේ.

II පුද්ගලයන්ගේ ආගමික අනන්‍යතාව නොතකා රාජ්‍යය සෑම පුද්ගලයකුට ම එක සමාන ව සැලසිය යුතු ය.

III පුරවැසි අයිතිවාසිකම් ලබා ගැනීමේ දී කිසි දු පුරවැසියකුට තම ආගමික අනන්‍යතාව බාධාවක් නොවේ.

- නිරාගමිකවාදය සහ දේශපාලනය :-

  - නිරාගමිකවාදයෙන් කෙරෙන්නේ රාජ්‍යය සහ ආගම අතර සම්බන්ධය, රාජ්‍ය ප්‍රතිපත්ති හා පුරවැසි අයිතිවාසිකම් ආගමික පදනමකින් තොර ව නිර්ණය කිරීම යි.

  - එහෙත් දේශපාලනයට ආගම සම්බන්ධ නොවිය යුතු බව ඉන් අදහස් නොවේ.

  - නිරාගමික පදනම ඇති රාජ්‍යවල ආගම පදනම් කරගත් දේශපාලන පක්ෂ සහ ව්‍යාපාර තිබෙන අතර ඉන්දියාව ඊට නිදසුන් වේ.

- නිරාගමිකවාදයේ වර්තමාන වැදගත්කම :-

  - නිරාගමිකවාදය ලෝක දේශපාලනයට අදාළ වීමට කරුණු දෙකක් බලපායි.

I ආගමික මූලධර්මවාදය පදනම් කොටගත් ආගමික රාජ්‍යය (Theocratic) බිහි වීමේ හැකියාව.

II බහු සංස්කෘතික වාදය පදනම් කොට ගෙන, ආගමික අනන්‍යතාව ඇති සුළු ජන ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

## 5.7. ස්ත්‍රීවාදය :-

- දේශපාලන මතවාදයක් ලෙස ස්ත්‍රීවාදයේ මැදිහත්වීම 1970 දශකයේ දී ආරම්භ වූවකි.

- න්‍යායික හා ක්‍රියාකාරී සමාජ ධාරාවක් ලෙස යුරෝපයේ සහ ඇමරිකාවේ ආරම්භ වූ මෙම මතවාදය පසුව යුරෝපීය නොවන සමාජවලට පැතිරිණි.

- ස්ත්‍රීවාදී ව්‍යාපාරයේත්, චින්තනයේත් ප්‍රධාන ධාරා 5 ක් හඳුනාගත හැකි ය.
  - ලිබරල් ස්ත්‍රීවාදය
  - සමාජවාදී ස්ත්‍රීවාදය
  - රැඩිකල් ස්ත්‍රීවාදය
  - පශ්චාත් නූතන ස්ත්‍රීවාදය
  - පශ්චාත්-යටත්විජිත ස්ත්‍රීවාදය

  - ලිබරල් ස්ත්‍රීවාදය :- අධ්‍යාපනය, රැකියා අවකාශ සහ සමාන වැටුප් දිනා ගැනීම මඟින් ස්ත්‍රීන්ට දේශපාලන සහ නෛතික අයිතිවාසිකම් දිනා ගැනීම.
    - තම ශරීරය පිළිබඳ තීරණ ගැනීමට ස්ත්‍රීන්ට අයිතියක් ඇත.
    - සමාන රැකියා, සමාන වැටුප් සහ සමාන අයිතිවාසිකම් ලිබරල් ස්ත්‍රීවාදයේ ප්‍රධාන සටන් පාඨ වේ.

  - සමාජවාදී ස්ත්‍රීවාදය :- සමානත්වය දිනාගැනීමේ මූලෝපාය සම්බන්ධයෙන් මෙය ලිබරල් ස්ත්‍රී වාදයෙන් වෙනස් වේ.
    - ස්ත්‍රී විමුක්තිය සඳහා වූ අරගලය සමාජවාදය සඳහා වූ අරගලය සමඟ සම්බන්ධ කළ යුතු බවත්, අනෙකුත් සමාජ කොටස් තම අයිතිවාසිකම් සඳහා කරන අරගල සමඟ ස්ත්‍රීන්ගේ අරගලය ද බද්ධ කළ යුතු බවත් අවධාරණය කෙළේ ය.

  - රැඩිකල් ස්ත්‍රීවාදය :- පිතෘ මූලිකත්වය සම්පූර්ණයෙන් අහෝසි කිරීම ස්ත්‍රී විමුක්තිය සඳහා අත්‍යවශ්‍ය බව පිළිගනී.
    - පුරුෂයා සහ ස්ත්‍රිය වශයෙන් සමාජය පීඩක සහ පීඩිත වශයෙන් දෘෂ්ටිගත කර තිබෙන්නේ පිතෘ මූලකත්වය විසිනි.

  - පශ්චාත් නූතන ස්ත්‍රීවාදය :-
    - ස්ත්‍රීන් සහ ස්ත්‍රී පීඩනය එක සමාන නොවන අතර පීඩනය ස්ත්‍රීන් අත් විඳින්නේ විවිධාකාරයෙනි. එබැවින් ස්ත්‍රීන්ගේ ඉල්ලීම් ද ඒකාකාර විය යුතු නැත. ඒවා විවිධ වේ.
    - විවිධ සමාජ පරිසරවල ස්ත්‍රී පීඩනය එම පරිසරයට හා ස්ත්‍රීන්ගේ පන්ති අසමානතාව, වර්ණ භේදය, රැකියාව වැනි කාරණ අනුව සමාන නොවන බැවින් එම වෙනස්කම් සහ විශේෂතා පදනම් කරගත් ස්ත්‍රීවාදයක අවශ්‍යතාව මෙමඟින් අවධාරණය කෙරෙයි.

  - පශ්චාත්-යටත්විජිත ස්ත්‍රීවාදය :-
    - මෙමඟින් යටත් විජිතවල පැවති නිදහස ලැබූ සමාජවල ස්ත්‍රී පීඩනයේ විශේෂතාවලට අවධානය යොමු කරමින්, ස්ත්‍රී අයිතිවාසිකම් යළි සංකල්පගත කරයි.

- වර්ගවාදයට හා යටත් විජිතවාදයට ලක්වූ මෙවැනි සමාජවල ස්ත්‍රීන්ගේ අත්දැකීම බටහිර සමාජවල ස්ත්‍රීන්ගේ අත්දැකීමට වෙනස් බැවින් ඒවාට අවධානය යොමු කරමින් ස්ත්‍රීවාදී දේශපාලන විඥානයක් ගොඩනැඟීමට මොවුහු යෝජනා කරති.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් :-**

1. කේවල ව්‍යාපෘතියක් සකස් කිරීම.

විවිධ දේශපාලන මතවාද යන මාතෘකාව ඔස්සේ පැවරුමක් සකස් කරන්න.
මෙහි දී පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

- 'මතවාදය' නිර්වචනය කිරීම.
- 'මතවාදය' හැඳින්වීම.
- ඒවා සම්බන්ධ ප්‍රධාන චින්තකයන් හා ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීම.
- දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය කෙරෙහි ඒවායින් සිදු වූ බලපෑම.
- ඒවායේ ප්‍රායෝගික වැදගත්කම/වර්තමාන ප්‍රවණතා

යන කරුණු ආවරණය වන පරිදි නිර්මාණශීලී පැවරුමක් ඉදිරිපත් කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි**

01. උයන්ගොඩ, ජයදේව (2011), ***ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ?, රාජ්‍ය පිළිබඳ දේශපාලන න්‍යාය සහ භාවිතය***, කොළඹ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

02. වර්ණපාල, විශ්වා (1996), ***දේශපාලන මතාන්තර, උසස් චින්තනය පිළිබඳ විග්‍රහය***, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

03. විරේකර්, චාර්ල්ස් (2001), ***දේශපාලන සිද්ධාන්තයේ විකාශය***, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

04. Bryson, Valorie, (2003), *Feminist Political Theory: An Introduction*, New York: Palgrave Macmillan.

05. Graham, Paul and John Hoffman (2006), *Introduction to Political Ideologies*, New York: Pearson Longman.

06. Heyhood, Andrew (2012), *Political Ideologies: An Introduction*, Basingstoke: Palgrave Macmillan.

07. Pettit, Phillp, (2002), *Republicanism: A Theory of Freedom and Government*, Oxford: Oxford University Press.

# 06. ගැටුම් හා ගැටුම් සමථනය

**නිපුණතාව 06 :-** ගැටුම්වල ස්වභාවය අවබෝධ කොටගෙන ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩ නැගීම පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි.

**(කාලච්ඡේද 40 යි)**

**නිපුණතා මට්ටම :-**

6.1. ගැටුම් සහ ගැටුම් නිරාකරණය පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික අංශ පැහැදිලි කරයි.

6.2. සාමය ගොඩනැගීමේ සහ ප්‍රතිසංධානගත වීමේ වැදගත්කම පිළිබඳ ව විචාරාත්මක ව අදහස් දක්වයි.

**ඉගෙනුම් ඵල :-**

- ගැටුම් නිර්වචනය කර වර්ගීකරණය ද කරයි.
- ගැටුම් නිරාකරණය කළ හැකි ක්‍රම අර්ථ දක්වයි.
- ගැටුම් හඳුනා ගැනීමට කල් තබා අනතුරු ඇඟවීමේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.
- ගැටුම් වළක්වා ගැනීමට මැදිහත් වෙයි.
- ගැටුම් කළමනාකරණය සඳහා සමත් අයකු ලෙස ක්‍රියා කරයි.
- ගැටුම් පරිවර්තනය විචාරාත්මක ව විමර්ශනය කරයි.
- ගැටුම් සමථන මාධ්‍ය පැහැදිලි කරයි.
- සාමය ගොඩ නැගීම යන්න හඳුන්වයි.
- ගැටුම් සමථනය සහ සාමය ගොඩනැගීම වර්තමාන ලෝකයට අදාළ වන ආකාරය පැහැදිලි කරයි.
- තම ජීවිතයේ දී අත්දකින ගැටුම්, සාධනීය ප්‍රතිඵල ඇති කරන පරිදි පරිවර්තනය කිරීමට උත්සාහ ගැනීමට කැප වෙයි.

**හැඳින්වීම :-**

- වර්තමානයේ දී ගැටුම් හා ගැටුම් සමථන අධ්‍යයනය පුළුල් බහු විෂයක අධ්‍යයන ධාරාවක් බවට පත් ව ඇත. දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, නීතිය, කළමනාකරණ අධ්‍යයනය, ජාත්‍යන්තර සම්බන්ධතා යන ක්ෂේත්‍රවල එය වැදගත් අධ්‍යයන ශාඛාවක් වී ඇත. ගැටුම සහ ගැටුම් සමථනය පිළිබඳ අධ්‍යයනය දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ දී අවධානයට යොමු වූයේ 1980 තරම් මෑත කාලයේ දී ය.

- මෙම පාඩමේ දී තේමා තුනකට අවධානය යොමු කරනු ලැබේ. එනම්

  i. ගැටුම් නිර්වචනය කර තේරුම් ගැනීම.
  ii. ගැටුම් සමථනය නිර්වචනය කර තේරුම් කිරීම.
  iii. සාමය ගොඩ නැගීම සහ ප්‍රතිසන්ධානගත වීම යන සංකල්ප නිර්වචනය කර තේරුම් ගැනීම.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අත්වැලක්**

**6.1. ගැටුම් නිර්වචනය :-**

ගැටුම් යනු මනුෂ්‍යයන්, සමාජ කණ්ඩායම්, නැතහොත් රාජ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් අතර පවත්නා සුවිශේෂ සමබන්ධතාවකි. මහාචාර්ය ක්‍රිස්ටෝෆර් මිචෙල් ඉදිරිපත් කර ඇති පහත සඳහන් නිර්වචනයෙන් මෙය තව දුරටත් පැහැදිලි කර ගත හැකි ය.

''ගැටුමක් යනු තමන් අතර එකිනෙකට නොපෑහෙන අරමුණු ඇති, නැතහොත් ඇතැයි සිතන, පාර්ශ්ව දෙකක් නැතහොත් පුද්ගලයන් හෝ සමාජ කණ්ඩායමක් හෝ වැඩි ගණනක් හෝ අතර පවත්නා සම්බන්ධතාවකි''

මහාචාර්ය ක්‍රිස්ටෝපර් මිචෙල්ගේ ***ජාත්‍යන්තර ගැටුම්වල ව්‍යුහය*** (*The Structure of International Conflict*) (1981) නම් කෘතියේ අර්ථ විග්‍රහයට අනුව ගැටුමක් යන්න එදිරිවාදිකම, තරගය, ආරාවුල, යන මේවාට වෙනස් ය. දේශපාලන හා සමාජ න්‍යායයේ පෙන්වා දී ඇති පරිදි එදිරිවාදිකම, තරගය සහ ආරවුල යන මේවා ගැටුම කරා පරිවර්තනය විය හැකි තත්ත්ව ය. ගැටුමක් එදිරිවාදිකම හා ආරාවුල යන මේවායින් වෙනස් වන්නේ එය ප්‍රචණ්ඩත්වයට සහ එයට සම්බන්ධ පාර්ශ්වවලට විනාශකාරී හා හානිදායක ප්‍රතිපල අත්කර දීමට ඇති විභවතාව නිසා ය.

තරගකාරීත්වය, එදිරිවාදිකම හා ආරාවුල යන මේවා මනුෂ්‍ය සම්බන්ධතා අතර නිරන්තරයෙන් පවතින ඒවා ය. ඒවා වැළැක්විය නොහැකි අන්තර් පුද්ගල හා අන්තර් කණ්ඩායම් සම්බන්ධතා ය. එහෙත් ගැටුම් නිරාකරණය ප්‍රවේශයෙන් කියන්නේ, වැළැක්විය යුතු වන්නේ ඒවා පාර්ශ්වවලට අන්‍යෝන්‍ය වශයෙන් හානි ඇති කරන ගැටුම් බවට වර්ධනය වීම යි.

ප්‍රාථමික මට්ටමින් බලන විට පුද්ගලයන් අතර ද ගැටුම් හට ගනී. ඒවා හට ගන්නේ මනුෂ්‍යයා එකිනෙකා සමඟ ගැටෙන අරමුණු සොයා යන විට ය.

උදාහරණ :- එක අඹ ගෙඩියක් සම්පූර්ණයෙන් හිමි කර ගැනීමේ අරමුණින් ක්‍රියා කරන ළමයින් දෙදෙනෙකු අතර ගැටුමක් ඇති විය හැකි ය. අඹ ගෙඩිය තනියම සම්පූර්ණයෙන් හිමි කරගැනීම යනු එකිනෙකට සමනය කළ නොහැකි අරමුණක් (an incompatible goal) වන නිසා ය.

එම උදාහරණය සමාජ හා ජාතික මට්ටමට ද ගෙන යා හැකි ය. සමාජ කණ්ඩායම්, ජනවාර්ගික ප්‍රජා කණ්ඩායම්, සමාජ පන්ති, ජාතීන් හා රාජ්‍ය අතර ආදි වශයෙන් ඇති වන සම්බන්ධතා වල දී ගැටුම් ඇති වන්නේ බලය, සම්පත්, ධනය, තත්ත්වය යනාදි අරමුණු අත්පත් කර ගැනීමේ දී ඔවුන් අතර තිබෙන සමනය කළ නොහැකි ව ගැටෙන අරමුණු හා අභිලාෂ නිසා ය.

ගැටුම්වල කාර්යය හඳුනාගැනීම ද මෙහි දී වැදගත් වේ.

**ගැටුම්වල කාර්යය :-**

මේ පිළිබඳ ව ප්‍රධාන ප්‍රවේශ දෙකකි.

1. ගැටුම්වල සාධනීය පැතිකඩ.
2. ගැටුම්වල නිෂේධනීය පැතිකඩ.

1904 දී ජෝජ් සිමෙල් නම් සමාජ විද්‍යාඥයා ලියූ ***ගැටුමේ සමාජ විද්‍යාව*** (*Sociology of Conflict*) නම් කෘතියට අනුව ගැටුමේ සාධනීය කාර්ය ගණනාවකි. එනම්,

- ★ සමාජය වර්ධනය නොවී එක තැන පල් වීම වැළැක්වීම.
- ★ සමාජ ප්‍රශ්නවලට අවධානය යොමු කරමින් ඒවා විසඳීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම.
- ★ පුද්ගලයන් හා සමාජ වෙනස් වීමට දායක වීම.
- ★ සමාජ කණ්ඩායම්වල ඒකාග්‍රතාව ශක්තිමත් වීම.

1956 දී ලුවිස් කෝසර් යන සමාජ විද්‍යාඥයා ලියූ ***සමාජ ගැටුමේ කාර්යය*** (*The Function of Social Conflict*) නම් කෘතියට අනුව ගැටුමේ සාධනීය ප්‍රතිඵල පහත සඳහන් පරිදි වේ.

★ ගැටුම් මනා ලෙස ඒකාග්‍ර නොවූ සමාජ කණ්ඩායම් අතර පවත්නා ආතතිය සමනය කිරීමට තුඩු දෙන බැවින් ඒවා සමාජ කණ්ඩායම් අතර ඒකාග්‍රතාව තහවුරු කිරීමට තුඩු දෙයි.

★ මාක්ස්වාදයට අනුව සමාජ ඉතිහාසයේ ඉදිරි ගමනේ ගාමක බලවේගය වන්නේ පන්ති ගැටුම යි. (Class conflict)

★ එකිනෙකට පසමිතුරු සමාජ පන්ති අතර ඉතිහාසය පුරා ම ඇති වී තිබෙන ප්‍රතිවිරෝධතා හා ගැටුම් නිසා සමාජ ඓතිහාසික පරිවර්තනයකට භාජනය වී ඇත.

2. ගැටුම්වල නිෂේධනීය පැතිකඩ

ගැටුම්වලින් නිර්මාණය කෙරෙන ප්‍රචණ්ඩත්වය, මනුෂ්‍ය ඝාතන, ජන ඝාතන, ආර්ථික හා සමාජ විනාශකාරීත්වය.

උදාහරණ -
- පළමු වන හා දෙවන ලෝක යුද්ධය.
- අන්තර් රාජ්‍ය යුද්ධ සහ අවි ගැටුම්.
- රටවල අභ්‍යන්තරයේ සිදු වන සිවිල් යුද්ධ.
- ප්‍රචණ්ඩ ජන වාර්ගික ගැටුම්.
- ලෝකයේ මහ බලවතුන් අතර අතිශයින් විනාශකාරී පරමාණු අවි සටනකට මැතක් වන තුරු තිබූ අවකාශය.
- ලෝක මට්ටමෙන් පැතිරී යන ත්‍රස්තවාදී සහ ත්‍රස්ත විරෝධී යුද්ධය

ගැටුම් නිරාකරණය සහ සමථනය පිළිබඳ ව දේශපාලන සහ ශාස්ත්‍රීය උනන්දුව මතු වූයේ විශේෂයෙන් 20 වන සියවසේ දී මනුෂ්‍ය වර්ගයා අත්දුටු ගැටුම් පිළිබඳ මෙම නිෂේධනීය අත්දැකීම් පසුබිමේ ය.

## 6.1. ගැටුම් වර්ගීකරණය :-

ගැටුම් තුන් ආකාරයකින් වර්ගීකරණය කළ හැකි ය.

1. සරල වර්ගීකරණය.
2. කෘත්‍යවාදී වර්ගීකරණය.
3. දේශපාලන වර්ගීකරණය.

### 1. සරල වර්ගීකරණය

මෙම ගැටුම් ආකාර හතරකි.

i. පුද්ගලාභ්‍යන්තර ගැටුම්.
ii. අන්තර් පුද්ගල ගැටුම්.
iii. කණ්ඩායම් ඇතුළත ගැටුම්.
iv. අන්තර් කණ්ඩායම් ගැටුම්.

i. පුද්ගලාභ්‍යන්තර ගැටුම්.

එක් එක් පුද්ගලයන්ගේ සිත් අභ්‍යන්තරයේ ඇති වන ගැටුම් මෙයට අයත් වේ. ජීවිතයේ විවිධ අවස්ථාවල දී විවිධ අරමුණු, අභිලාෂ පදනම් කොටගෙන චිත්ත අභ්‍යන්තර ගැටුම්

ඇති වීම ස්වාභාවික මනුෂ්‍ය අත්දැකීමකි.

ii. අන්තර් පුද්ගල ගැටුම්.

පුද්ගලයන් අතර ඇතිවන අන්තර් ක්‍රියාකාරිත්වයේ දී පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි ප්‍රමාණයක් හෝ අතර ඇති වන තරගය, වෙනස්කම් හා එදිරිවාදිකම් පදනම් කොට ගෙන ඇතිවන ගැටුම් ය.

iii. කණ්ඩායම් ඇතුළත ගැටුම්.

සමාජ කණ්ඩායම් අතර විවිධ අරමුණු හා අභිලාෂ මූලාශ්‍රය කොට ඇතිවන ගැටුම් මේ ප්‍රභේදයට අයත් වේ.

iv. අන්තර් කණ්ඩායම් ගැටුම්.

මේ වර්ගයට අයත් වන්නේ කණ්ඩායම් දෙකක් හෝ ගණනාවක් හෝ අතර ඇති වන ගැටුම් ය.

**2. කෘත්‍යවාදී වර්ගීකරණය**

මෙහි පදනම වන්නේ ගැටුම්වලින් සමාජයේ ඉටු කෙරෙන කාර්ය භාරය හා ඵල විපාකවල ස්වභාවය යි. මේ පදනම මත ඇමරිකානු සමාජ මනෝ විද්‍යාඥයකු වන මෝර්ටින් ඩොයිෂ් ගැටුම් කාණ්ඩ දෙකකට බෙදී ය.

(අ) සාධනීය ගැටුම් (Constructive Conflict)
(ආ) නිෂේධනීය ගැටුම් (Destructive Conflict)

(අ) සාධනීය ගැටුම්

සාධනීය කාර්යයන් ඉටු කරන හා ප්‍රතිඵල ලබා දෙන ගැටුම් මේ යටතට ගැනේ. මෙම ගැටුම්වලට සහභාගි වන පාර්ශ්වකරුවන් සිතන්නේ ගැටුම වෙතින් තමන්ට සාධනීය ප්‍රතිඵල ලැබුණු බව ය. එබැවින් ගැටුමේ ප්‍රතිඵල ගැන ඔවුහු තෘප්තියට පත් වෙති. එය ගැටුමේ සාධනීය අවසානයක් ඇති කරයි. එය විනාශකාරී නොව නිර්මාණාත්මක ය. එවැනි ගැටුමක ඇති මූලික ම නිර්මාණාත්මක කාර්ය භාරය නම්, ගැටුමට තුඩු දුන් හේතු විසඳා ගැනීමට සාමූහික ව සහ නිර්මාණාත්මක ක්‍රියා කිරීමට පාර්ශ්වකරුවන්ට අවකාශය, හැකි යාව සහ කැපවීම ලැබීම යි.

(ආ) නිෂේධනීය සහ විනාශකාරී ගැටුම්

නිෂේධනීය ගැටුමක දී පාර්ශ්වකරුවන් සිතන්නේ ගැටුම නිසා තමන්ට ලැබුණේ අවාසිදායක ප්‍රතිඵල බව ය. එවිට ඔවුහු ගැටුම ගැන අතෘප්තියට පත් වෙති. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වන්නේ සාධනීය ගැටුමක දී මෙන් ගැටුම අවසානයට පත් වීම නොවේ. එය වඩාත් පැතිරෙමින් උත්සන්න වීම යි. මහාචාර්ය ඩොයිෂ්ට අනුව නිෂේධනීය ගැටුමක් තව දුරටත් ව්‍යාප්ත වීමේ ක්‍රියාවලිය තුළ දී සිදුවන්නේ ගැටුමෙන් හා එයට තුඩු දුන් මූල හේතුවලින් ස්වාධීන වී උත්සන්න වීමේ අලුත් ජවයක් සහ ගතිකත්වයක් අත්පත් කර ගැනීම යි.

උදා :- ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම.

### 3. දේශපාලනමය වර්ගීකරණය

ලෝකයේ පවත්නා බොහෝ ගැටුම් දේශපාලන ගැටුම් ය. ඒවා පෞද්ගලික ගැටුම් නොවේ. විශාල ජන සමූහ, රාජ්‍ය ඒවාට සම්බන්ධ වෙති. ඒවා බොහෝ විට ප්‍රචණ්ඩ වී ඇත. බොහෝ විට ඒවා කාලයක් පුරා දිග්ගැස්සී, විසඳීමට දුෂ්කර ඒවා වේ. මෙම ගැටුම්වල ස්වභාවය පදනම් කරගෙන මහාචාර්ය පීටර් වොලන්ස්ටීන් (Peter Wallensteen) තුන් ආකාර වර්ගීකරණයක් ඉදිරිපත් කර ඇත.

(අ) අන්තර් රාජ්‍ය ගැටුම්
(ආ) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්
(ඇ) රාජ්‍ය නිර්මාණ ගැටුම්

**(අ) අන්තර් රාජ්‍ය ගැටුම්**

අන්තර්ජාතික දේශපාලනය තුළ අන්තර් රාජ්‍ය ගැටුම් විවිධ ස්වභාවයෙන් සහ සාධක පදනම් කොටගෙන සිදුවේ.

උදා:- රාජ්‍ය අතර දේශ සීමා හෝ සම්පත් හෝ බෙදා ගැනීම ආදිය පදනම් කොටගෙන ඇති වන ගැටුම්. සමහර විට මේවා අන්තර් රාජ්‍ය යුද්ධ බවට ද පත්වේ. අසල්වැසි රටවල් මෙන් ම ලෝක බලවතුන් ද එවැනි අන්තර් ජාතික ගැටුම්වලට සම්බන්ධ වීම 20 වන සියවසේ සිදුවූවකි. නිරවි යුද්ධ (Cold War) යුගයේ දී සිදු වූ පරිදි ලෝක බලවතුන් මෙවැනි යුද්ධවලට වක්‍රව සම්බන්ධ විය හැකි ය.

**(ආ) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්**

රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්වලට බොහෝ විට නිමිත්ත වන්නේ දේශපාලන බලය යි.
උදා :- දිග්ගැස්වූ සන්නද්ධ ගැටුම්, එනම්, සිවිල් යුද්ධ.

මෙවැනි ගැටුම්වල දී රාජ්‍ය බොහෝ විට ක්‍රියා කරන්නේ ඒවා නීතියට හා සාමයටත්, රාජ්‍ය ආරක්ෂාවටත් තර්ජන ලෙස සලකාගෙන ය. අභ්‍යන්තර ගැටුම් උත්සන්න වීම නිසා ඒවා සිවිල් යුද්ධ බවට පත්වීම ලෝකයේ පසුගිය දශක කිහිපයේ දක්නට ලැබුණු ප්‍රවණතාවකි. එවිට සිදුවන්නේ රාජ්‍ය බලය පිළිබඳ ගැටුම් දිග්ගැස්සුණු සිවිල් යුද්ධ බවට පත්වීමයි.

රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීමේ සාධක
(i) ව්‍යුහාත්මක සාධක
(ii) ආර්ථික හා සමාජ සාධක
(iii) දේශපාලන සාධක
(iv) සංස්කෘතික සාධක

(i) ව්‍යුහාත්මක සාධකः

වාර්ගික හා සමාජීය වශයෙන් බහුවිධ සමාජවල, දේශපාලන ඒකාග්‍රතාව ඇති කරගෙන පවත්වාගෙන යාමට සමත් රාජ්‍යයක් නිර්මාණය වී නොමැති වීම, එම සමාජවල ගැටුම් ඇතිවීමේ ප්‍රධාන ව්‍යුහාත්මක සාධකයකි. සමහර ජනවාර්ගික කණ්ඩායම්වල දුක්ගැනවිලිවලට සාධනීය ප්‍රතිචාර දැක්වීමට ආණ්ඩු අසමත් වන විට, නැතහොත් ප්‍රතික්ෂේප කරන විට, රාජ්‍ය දුර්වල වේ. රාජ්‍ය විරෝධී හැඟීම් එම කණ්ඩායම් අතර මුල් බැස ගනී. රාජ්‍යයෙන් තමන්ගේ අයිතිවාසිකම් ඉල්ලීම්වලට සාධනීය ප්‍රතිචාර නොලැබෙතැයි සිතන එවැනි ජන

කොටස් සහ රාජ්‍ය එකිනෙකාගෙන් ඈත් වීම දුක් ගැනවිලි විරෝධතා බවටත් විරෝධතා ගැටුම් බවටත් පරිවර්තනය වීමට තුඩු දෙයි.

(ii) ආර්ථික/සමාජ සාධකඃ

දැඩි සමාජ, ආර්ථික, අසමානතා පැවතීම, සමාජීය වශයෙන් වෙනස්කම් කරනු ලැබීම් සහ සමාජීය වශයෙන් සිදුවන ආන්තිකකරණය යන මේවා අත්විඳින සමාජ කොටස් අතර දුක් ගැනවිලි වර්ධනය වීම සාමාන්‍යයෙන් සිදුවන්නකි. එහෙත් ආණ්ඩු විසින් එම දුක් ගැනවිලි නොකඩවා නොසලකා හරිනු ලබන විට, සමාජ අසන්තුෂ්ටිය ගොඩනැගී, එය පවත්නා ක්‍රමයට එරෙහි ව විරෝධතාවක් බවට පත්වේ. විශේෂයෙන් ආර්ථික සංවර්ධන ක්‍රියාවලි නිසා ආර්ථික විෂමතා තියුණු වන විට දේශපාලන වියවුල් ඇතිවීම බොහෝ රටවල සුලබ අත්දැකීමක් වී තිබේ. වෘත්තීය සමිති සහ ශිෂ්‍ය හා තරුණ ව්‍යාපාර ආණ්ඩුව සමඟ විවෘත ගැටුම්වලට එළඹීම මෙම පසුබිමෙහි සිදුවන්නකි. රටේ ප්‍රධාන ආර්ථික සමාජ සංවර්ධන ක්‍රියාවලියෙන් සුළු ජනවාර්ගික කොටස්වලට ප්‍රතිලාභ නොලැබෙන විට ඔවුන්ගේ දුක් ගැනවිලි ජන වාර්ගික ගැටුම් බවට ද පත්වේ. ශීඝ්‍ර ආර්ථික පරිවර්තන සිදු වන විට සමාජයේ ඇතිවන ශීඝ්‍ර කාර්මිකකරණය සහ නාගරිකකරණය ද නිසා බොහෝ සමාජ කොටස් අතර ඇතිවිය හැකි අනාරක්ෂිත හැඟීම් ද සමාජ අසහනයටත් දේශපාලන රැඩිකල්කරණයටත් තුඩු දෙන බව ගැටුම් පිළිබඳ ශාස්ත්‍රීය සාහිත්‍යයේ දැක්වේ.

(iii) දේශපාලන සාධකඃ

රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් ඇතිවීමේ ප්‍රධාන දේශපාලන සාධක කිහිපයක් ම ගැටුම් අධ්‍යයන සාහිත්‍යයෙන් හඳුනාගෙන තිබේ. ඒවායින් අවධාරණය කෙරෙන කරුණු හතරක් තිබේ.

- සමහර ප්‍රජා කණ්ඩායම්වලට අසමාන ව හා වෙනස්කම් කොට සලකන දේශපාලන ආයතන පැවතීම.

- සෑම වාර්ගික සංස්කෘතික ප්‍රජා කණ්ඩායමක් ම ඇතුළත් කර ගන්නේ නැති බහිෂ්කාරක ජාතිවාදී මතවාද.

- සමාජයේ වාර්ගික හා සමාජ කණ්ඩායම් අතර ඇති තියුණු දේශපාලන තරඟය සහ ප්‍රතිවිරෝධතා.

- ආර්ථික, සමාජ සහ දේශපාලන අර්බුද අවස්ථාවල දී ගැටුම් තියුණු වන පරිදි ඒවා පාවිච්චි කරන ප්‍රභූ දේශපාලනය.

(iv) සංස්කෘතික හා මතවාදී සාධකඃ

ලෝකයේ ජාතික රාජ්‍යවල ඉතා සුලභ ගැටුම් විශේෂය වී තිබෙන ජනවාර්ගික ගැටුම්වලට තුඩු දී ඇති ප්‍රධාන හේතුව වන්නේ සංස්කෘතික සාධකය යි. බහු වාර්ගික සමාජවල සුළුතර වාර්ගික කණ්ඩායම්වල භාෂාමය, ආගමික, අධ්‍යාපන සහ වෙනත් සංස්කෘතික හිමිකම්වලට හා අනන්‍යතාවලට පිළිගැනීමක් නොලැබීමත්, ඒවා වෙනස්කම් කරනු ලැබීමට භාජනය වීමත් නිසා එම ප්‍රජාවන් අතර දුක්ගැනවිලි, අසහනය සහ අසන්තුෂ්ටිය ඇති වේ. ඒවා දේශපාලනීකරණය වීම ජනවාර්ගික ගැටුම් ඇතිවීමේ ආරම්භ යයි. ජනවාර්ගිකත්වය මත පදනම් වූ අනන්‍යතා මතවාද ජනවාර්ගික ගැටුම් තියුණු කිරීමට දායකත්වය සපයයි. බහුතර මෙන් ම සුළුතර වාර්ගික කණ්ඩායම් අතර ඇති වන එවැනි ජාතිකවාදී මතවාදවල සුලභ ලක්ෂණයක් වී තිබෙන්නේ, ඒවා අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාරක වූ මතවාද වීම යි.

එනම්, තමන් හැර අන් වාර්ගික කොටස්වලට ආරාධනා නොකරන සහ එම ප්‍රජා කොටස් තම පැවැත්මට තර්ජන බවට පත් වී ඇති සතුරන් ලෙස සලකන මතවාද යි. මෙවැනි ජාතිකවාදී මතවාද බහුවාර්ගික සමාජවල ජාතික අනුකලනයට බාධාවකි.

**රාජ්‍ය නිර්මාණ ගැටුම්**


පීටර් වොලන්ස්ටීන්ගේ අර්ථ නිරූපණය අනුව, රාජ්‍ය නිර්මාණ ගැටුම් යනු රාජ්‍යය ඇතුළත ජීවත් වන යම් කිසි ප්‍රජාවකගේ ආරක්ෂාව යන්න ප්‍රධාන ම නිමිත්ත කරගෙන, ආණ්ඩුවක් සහ තම අනන්‍යතාවන් යම් කිසි භූමි ප්‍රදේශයකට ඇති අයිතිවාසිකමත් කියා පාන විරුද්ධ කණ්ඩායම් අතර ඇති ගැටුම් ය.

මෙම අර්ථ විග්‍රහය අනුව, වර්තමාන ලෝකයේ බොහෝ බහුවාර්ගික රටවල පවත්නා ප්‍රදේශීය අනන්‍යතාව, බලය බෙදා ගැනීම මෙන් ම වෙන් වීම ද අරමුණු කරගෙන ක්‍රියා කරන ජනවාර්ගික දේශපාලන ව්‍යාපාරය හා එම රටවල ආණ්ඩු අතර ඇති ගැටුම් රාජ්‍ය නිර්මාණ ගැටුම් ය.

ගැටුම් සහ ගැටුම් සමථනය පිළිබඳ මෑත කාලීන ශාස්ත්‍රීය අධ්‍යයනවලින් පෙන්වා දී ඇති වැදගත් කරුණක් නම්, පුද්ගලික ගැටුම්වල සිට අන්තර් රාජ්‍ය ගැටුම් තෙක් බොහෝ ගැටුම් වල, එක්තරා ජීවන චක්‍රයක් පවතින බව යි.

ගැටුම් අධ්‍යයනයේ පුරෝගාමී ඇමරිකානු විද්වතකු වන ලුවිස් ක්‍රිස්බර්ග් (Louis Krisberg) මෙම අදහස ඉදිරිපත් කළ පර්යේෂකයෙකි.

<u>ගැටුම්වල ජීවන චක්‍රය (Conflict Life Cycle)</u>



මහාචාර්ය ක්‍රිස්බර්ග් කියන පරිදි, ගැටුම් යනු එක තැන වෙනස් නොවී පවතින ඒවා නොවේ. ගැටුම ඇති වී නොපෙනී යයි. මුලින් ම සාමකාමී නොවන ගැටුම් පසුව ඒවා විවිධ අවධීන් අතරින් ගමන් කරද්දී වඩාත් සාමකාමී වේ. ගැටුම් අවධි ගණනාවක් ඔස්සේ ගමන් කරන අතර එක් ගැටුමක ප්‍රතිඵලය නව ගැටුමක ආරම්භයක් වන්නට ද පුළුවන. මේ අනුව මහාචාර්ය ක්‍රිස්බර්ග් හඳුනාගෙන ඇති ගැටුමක විවිධ අවධි ගැටුමේ ජීවන චක්‍රය යන අදහසට පදනම් වී ඇති බව පෙනේ.

එම අවධි පහත සඳහන් පරිදි වේ.

♦ **ගැටුම් පාදක වන හේතු/කොන්දේසි පැවතීම** (Pre-Conditions)

මෙය පූර්ව ගැටුම් අවධිය යි. එහි ප්‍රධාන ලක්ෂණය නම්, ගැටුමක් ජනිත කිරීමට ප්‍රමාණවත් කොන්දේසි පැවතීම සහ ඒවා බොහෝ විට හඳුනාගෙන නොතිබීම යි. හඳුනාගත්තත් ඒවා ගැටුමකට තුඩු දෙන බව නොපිළිගැනීම යි. ඒවා පිළිගෙන මුල දී ම විසඳුම් දීම, ගැටුමක් මතු වීම වැළැක්වීමට සමත් වේ.

♦ **ගැටුම් පැන නැඟීම** (Emergence)

මේ අවධියේ දී සිදුවන්නේ, මුල් අවධියේ දී පැවති දුක්ගැනවිලි හා ඒවාට ලැබෙන නිෂේධනීය ප්‍රතිචාර පදනම් කොට ගෙන සමනය කළ නොහැකි අභිලාෂ සහ අරමුණු නිර්මාණය වීම යි.

♦ **ගැටුම උත්සන්න වීම** (Escalation)

මෙයින් අදහස් වන්නේ ගැටුමේ පරිමාව සහ තීව්‍රතාව යන දෙආකාරයෙන් ම ගැටුම ගුණාත්මක වශයෙන් නව අවධියකට සම්ප්‍රාප්ත වීම යි. ගැටුම ප්‍රචණ්ඩ මෙන් ම යුද්ධමය අවධියකට අවතීර්ණ වීම, ගැටුම නිසා සිදුවන මරණ සංඛ්‍යාව හා දේපළ හානිය ඉහළ යාම ගැටුම උත්සන්න වීමේ දී සිදුවේ. අභ්‍යන්තර ගැටුමක් සිවිල් යුද්ධයක් බවට පරිවර්තනය වීමත්, ගැටුමේ පාර්ශ්ව ඒක පාර්ශ්වික යුද්ධමය විසඳුම් සඳහා දැඩි ලෙස කැපවීමත් මේ අවධියේ දී සිදුවේ. සාමාන්‍යයෙන් රටවල අභ්‍යන්තර ගැටුම්වල දී මෙම අවධිය සාපේක්ෂ වශයෙන් දීර්ඝ කාලීනය. ගැටුම දේශපාලන හා සාකච්ඡාමය වශයෙන් විසඳීමට ඇති අවකාශ මෙම අවධියේ දී දුර්වල ය.

♦ **ගැටුමේ උත්සන්නතාව අඩු වීම.** (De-Escalation)

ගැටුමක් උත්සන්න අවධියකට පත් වුව ද, එම උත්සන්නතාව අඩු වීමේ ගතිකත්වය ගැටුම්වලට තිබේ. ගැටුමක උත්සන්න බව අඩු වීම ආරම්භ වන්නේ එහි උත්සන්නතාව අඩු කිරීමේ සංඥා පාර්ශ්වකරුවන් එකිනෙකට හුවමාරු කරගැනීමෙන් පසු ව ය. එවැනි තත්ත්වයකට පත් වීම නොයෙක් සාධකවල ප්‍රතිඵලයක් විය හැකි ය. පාර්ශවවලට ගැටුම් තියුණු ලෙස පවත්වා ගැනීමේ සම්පත් හා හැකි යාව අඩු වීම, අන්තර්ජාතික බලපෑම්, ගැටුම පවත්වාගැනීමට අවශ්‍ය මහජන සහයෝගය දුර්වල වීම, ගැටෙන පාර්ශ්ව ගැටුම නිසා ම හති වැටීම සහ ඒ නිසා ම ඒක පාර්ශ්වික විසඳුම් සෙවීමේ අධිෂ්ඨානය දුර්වල වීම යන මේවා බොහෝ විට දක්නට ඇති සාධක යි.

විලියම් ඒ. සාර්ට්මන් ඉදිරිපත් කර ඇති අන්‍යෝන්‍ය වශයෙන් රිදෙන හිරවීම (Mutually hurting stalemate) යන සංකල්පය ගැටුමක් උත්සන්න වීම හා උත්සන්නතාව අඩුවීම තෙක් සිදුවන ගැටුමේ පරිවර්තනය පැහැදිලි කරන න්‍යායික සූත්‍රයකි. මේ මඟින් සාර්ට්මන් පෙන්වා

දෙන්නේ, ගැටුමක උත්සන්නතාව තීව්‍ර මට්ටමකින් දිගු කාලයක් පවතින විට, යුද්ධමය වශයෙන් ඒක පාර්ශ්වික විසඳුම් ලබා ගැනීමට ඇති හැකි යාව අහෝසි වී යාමේ හැකියාව අදාළ පාර්ශ්වවලට අවබෝධ වන බව යි. කිසි දු පාර්ශ්වයකට ඒක පාර්ශ්වික ජයක් ලබාගත නොහැකි, ඉදිරියට වත් ආපස්සට වත් යා නොහැකි හිරවීමක ගැටුමේ පාර්ශ්ව කරුවෝ හසුවී සිටිති. එය අවාසි ගෙන දෙන, දෙපාර්ශවයට ම බරපතළ පාඩු ගෙන දෙන්නකි. ඒකපාර්ශ්වික විසඳුම් නොව පාර්ශ්ව දෙක ම හවුලේ සෙවිය යුතු ද්විපාර්ශ්වික සාකච්ඡාමය විසඳුම් සෙවීමට පාර්ශ්ව සූදානම් වන්නේ එවිට ය. මෙය ගැටුමේ උත්සන්නතාව අඩුවීමේ අතිමූලික පූර්ව කොන්දේසිය බව සාර්ට්මන් කියයි. ගැටුම සාකච්ඡාමය වශයෙන් විසඳීම සඳහා තුන් වැනි පාර්ශ්වයකට මැදිහත් කරුවන් වශයෙන් සහභාගි වීමට ඉඩ ලැබෙන්නේ මෙම පසුබිමෙහි ය.

♦ **ගැටුම කෙළවර කිරීම** (Termination)

රටක් අභ්‍යන්තරයේ සිදුවන ගැටුමක් සිවිල් යුද්ධයක් බවට පත් වී, ඒ නිසා ම දිග්ගැස්සී (Protracted) ඇති ගැටුමක් කෙළවර කිරීම දීර්ඝ කාලීන ක්‍රියාදාමයක ප්‍රතිඵලයකි. එවැනි සමහර ගැටුම් එක් පක්ෂයකට යුද්ධමය ජයග්‍රහණයක් අත් වීමෙන් කෙළවර විය හැකි ය. එවිට සාමාන්‍යයෙන් සිදුවන්නේ පරාජිත පාර්ශ්වය, ඔවුන් කැරලි කරුවන් නම්, විනාශයට පත්වීමත්, ඔවුන්ගේ දේශපාලන ඉල්ලීම් ඉටුකරන්නේ ද නැද්ද යන්න පිළිබඳ ව තීරණය කිරීමේ සම්පූර්ණ අයිතිය, එනම් නිෂේධ බලය, ජයග්‍රාහි පක්ෂය වන ආණ්ඩුවට හිමි වීමත් ය.

දිග්ගැස්සුණු, සිවිල් යුද ගැටුමක් කෙළවර කිරීමේ අනික් මඟ දෙපාර්ශ්වය ම එකඟ වන සාකච්ඡාමය විසඳුමකට එළඹීම යි. එය සාමාන්‍යයෙන් ''සාම ගිවිසුමක්'' (Peace Agreement) මාර්ගයෙන් සිදුවේ. තුන්වැනි පාර්ශ්වයක මැදිහත්කරණය (Mediation) ඒ සඳහා වැදගත් මෙහෙයක් ඉටු කරයි. සාම ගිවිසුමේ දී බොහෝ විට සිදුවන්නේ, ගැටුමට සම්බන්ධ පාර්ශ්ව මුල දී ජයග්‍රහණය කිරීමට අපේක්ෂා කළ ඒක පාක්ෂික (Unilateral) සහ උපරිමවාදී (Maximalist) ඉලක්ක අතහැර දමා, දෙපාර්ශවයට ම එකඟ විය හැකි ඉලක්ක තෝරා ගැනීම යි. මේ අනුව, සාකච්ඡාමය සාම ගිවිසුමක් මඟින් ගැටුමක් කෙළවර වීම, ගැටුමේ පාර්ශ්ව සහ ඉල්ලීම් අතර සිදුවන අන්‍යෝන්‍ය ඉඩ දීමක් (Mutual accommodation) සහ අතරමග සමාදානයක් (compromise) ද වෙයි.

★ **ගැටුම්වලට කළ යුත්තේ කුමක් ද?**

ගැටුම් නිරාකරණය කිරීමේ දෘෂ්ටිකෝණයෙන් බලන විට, ගැටුම්වලට ප්‍රවේශ විය යුත්තේ ඒවා සාධනීය හා නිර්මාණාත්මක ලෙස විසඳීමේ අරමුණ ඇති ව ය. ගැටුම් සමථනය පිළිබඳ ශාස්ත්‍රීය සාහිත්‍යයේ මේ සඳහා ඉදිරිපත් කර ඇති උපදේශය නම් ඒ සඳහා ඇති හොඳ ම ප්‍රවේශය වන්නේ ගැටුම්වලට තුඩු දුන් පාදක හේතු (Underlying causes) හඳුනාගෙන, ඒවාට ආමන්ත්‍රණය කිරීම යන්න යි.

සයිමන් ෆිෂර් (Simon Fisher) සහ කණ්ඩායම 2000 දී පළ කළ *Working with Conflict* (***ගැටුම සමඟ වැඩ කිරීම: ක්‍රියාකාරකම් සඳහා නිපුණතා හා උපාය මාර්ග***) නම් පොතේ, ගැටුම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී ප්‍රයෝජනවත් වන ප්‍රවේශ ගණනාවක් ම විස්තර කර තිබේ. මේ ප්‍රවේශ ගැටුම් සමථන සාහිත්‍යයේ විවිධ පර්යේෂකයන් හා ක්‍රියාකාරීන් විසින් යෝජනා කරනු ලැබූ ඒවා යි. මේවා ගැටුම් සමථන පුහුණු කරුවන් හා ක්‍රියාකාරකයන් අතර පුළුල් ලෙස භාවිත කරනු ලැබූ ඒවා ද වේ.

**(අ) ප්‍රජා සම්බන්ධතා ප්‍රවේශයඃ** (Community Relations Approach)

මේ ප්‍රවේශයේ මූලික අදහස නම්, ගැටුමක් සිදු වී තිබෙන්නේ ප්‍රජාවන් අතර සම්බන්ධතා බිඳවැටීම නිසා බව ය. ප්‍රජා කණ්ඩායම් අතර ඇතිවන අවිශ්වාසය, පසමිතුරුතාව සහ ධ්‍රැවීකරණය එහි ලක්ෂණ යි. එබැවින්, ගැටුම් සමථනයේ අරමුණු විය යුත්තේ,

- ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර සන්නිවේදනය සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
- වාර්ගික, සංස්කෘතික, සමාජීය ආදි විවිධත්වය පිළිගැනීමට හා ඉවසීමට ප්‍රජාවන් අතර ඇති හැකි යාව ප්‍රවර්ධනය කිරීම.

**(ආ) මානව අවශ්‍යතා ප්‍රවේශය** (Human Needs Approach)

ගැටුම් පිළිබඳ මානව අවශ්‍යතා න්‍යායයෙන් කියැවෙන්නේ, ගැටුම් ඇති වන්නේ මූලික භෞතික, මානසික හා සමාජීය මනුෂ්‍ය අවශ්‍යතා ඉටු නොවීම නිසා බව ය. මෙවැනි ගැටුම්වලින් අවධාරණය කරන අරමුණු වන්නේ ආරක්ෂාව, අනන්‍යතාව, පිළිගනු ලැබීම, කණ්ඩායම් ගෞරවය, දේශපාලන සහභාගිත්වය, නිදහස යන මේවා ය. මනුෂ්‍ය අවශ්‍යතා මත පදනම් වන එවැනි ගැටුම් සමථනයේ දී පහත දැක්වෙන අරමුණු අනුව කටයුතු කිරීම ප්‍රයෝජනවත් ය.

- තමන්ගේ ඉටු නොවී ඇති මානුෂීය අවශ්‍යතා හඳුනාගෙන, ඒවා ඉටු කරගැනීමට සුදුසු විකල්ප මාර්ග සෙවීමට ගැටුමට සම්බන්ධ පාර්ශ්ව උනන්දු කරවීම.
- සෑම පාර්ශ්වයක ම මූලික මානුෂික අවශ්‍යතා සාක්ෂාත් කරගත හැකි එකඟතාවලට එළඹීමට පාර්ශ්වවලට උදවු දීම.

**(ඇ) අනන්‍යතා අවශ්‍යතා ප්‍රවේශයඃ** (Identity Needs Approach)

අනන්‍යතා න්‍යාය අවධාරණය කරන්නේ, ගැටුම් ඇති වන්නේ ප්‍රජා කණ්ඩායම්වල අනන්‍යතාව තර්ජනයට පත් වී ඇත යන හැඟීම වෙතින් ය යන අදහසයි. අතීතයේ දි සිදු වූ පරාජයන්, දුක් විඳීම් සහ පසුබෑම් ඒවායේ හරයේ ම තිබේ. එවැනි ගැටුම් සමථනය සඳහා පහත සඳහන් දේ කළ යුතු වේ.

- තමන් එකිනෙකාට හැඟෙන තර්ජන සහ බිය කවරේ දැයි හඳුනා ගැනීමට පාර්ශ්වවලට උදවු කරමින්, ඔවුන් අතර සහවේදනය (empathy) සහ සංහිඳියාව (reconciliation) ගොඩනඟා ගැනීමට ආධාර වීම.
- සියලු පාර්ශ්වවල මූලික අනන්‍යතා අවශ්‍යතා පිළිගැනෙන සාමූහික එකඟතා ඇති කරගැනීම.

**(ඈ) සංස්කෘතික සන්නිවේදන ප්‍රවේශයඃ** (cultural communication Approach)

අන්තර්-සංස්කෘතික සන්නිවේදන න්‍යායයෙන් අවධාරණය කරන කරුණක් නම්, ගැටුම් ඇතිවන්නේ, එකිනෙක සංස්කෘතික සන්නිවේදන ශෛලි අතර ඇති අසංගත භාවය, එනම් නොපෑහීම, නිසා යන්න යි. ගැටුම් සමථනයේ අරමුණු ලෙස මෙම ප්‍රවේශය යෝජනා කරන්නේ.

- ගැටුමට සම්බන්ධ පාර්ශ්වවල සංස්කෘති පිළිබඳ ව ඔවුන් අතර ඇති අවබෝධය වැඩි කිරීම.

- එම කණ්ඩායම් අතර එකිනෙකා ගැන ඇති නිෂේධනීය ඒකාකාරී වටහා ගැනීම් (Negative stereotypes) ඉවත් කර ගැනීම.
- අන්තර්-සංස්කෘතික සන්නිවේදනය ශක්තිමත් කිරීම.

**(ඉ) ගැටුම් පරිවර්තනය ප්‍රවේශය:** (Conflict Transformation Approach)

ගැටුම් පරිවර්තන න්‍යායයෙහි කියන එක් මූලික අදහසක් නම්, ගැටුම් ඇති වෙන්නේ අසමානතා හා අසාධාරණය ගැබ්වී ඇති සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ව්‍යුහයන්ට ප්‍රතිචාර වශයෙන් ය යන්න යි. එවැනි ගැටුම්වල දී ගැටුම් පරිවර්තන කාර්යය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා කළ යුතු දේ මෙසේ ය.

- අසමානතාවල හා අසාධාරණවල මූල හේතුව වන ව්‍යූහ හා ප්‍රතිපත්ති රාමු වෙනස් කිරීම.
- ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර ඇති අවබෝධය සාධනීය ලෙස පරිවර්තනයකට භාජනය කිරීම.
- ප්‍රජාවන් සවිබල ගැන්වීම සහ සාමය, සාධාරණත්වය, සමාව දීම, පිළිගැනීම හා ප්‍රතිසන්ධානගත වීම (Reconciliation) ප්‍රවර්ධනය කරන ක්‍රියාවලි හා භාවිත ආරම්භ කිරීම.

**(ඊ) ගැටලු විසඳීමේ ප්‍රවේශය:** (Problem Solving Approach)

මෙම ප්‍රවේශයේ න්‍යායික පදනම නම් ගැටුම ඇති වී තිබෙන්නේ එහි පාර්ශ්ව අතර ඇති (i) එකිනෙකට නොගැළපෙන සහ අසංගත අරමුණු නිසා, සහ (ii) ගැටුම සම්බන්ධ ව ශූන්‍ය ඵෙක්‍යමය (Zero-sum) ස්ථාවර (තමන් පමණක් නිවැරදි ය, තමන්ට පමණක් සියලු ජය ලැබිය යුතු ය, ප්‍රතිවාදියා සපුරා පරාජය විය යුතු ය, විනාශ විය යුතුය යන විශ්වාසය) පවත්වාගෙන යාම නිසා ය. යන විග්‍රහය යි. එබැවින් ඒවා වෙතින් පැන නැගෙන ගැටලු විසඳීම (Problem Solving) ගැටුම් සමථනයේ අරමුණයි. ඒ සඳහා කළ යුත්තේ

- ගැටුමට පාදක වූ හේතු හා ගැටලු සහ තම පෞද්ගලිකත්වය එකිනෙකින් වෙන් කර ගනිමින්, තමන්ගේ දෘඪ ස්ථාවර මත නොව මූලධාර්මික කරුණු පදනම් කර ගෙන ගැටුම් සමථනය සඳහා සහමන්ත්‍රණයේ (Negotiation) යෙදීමට පාර්ශ්වවලට ආධාර කිරීම.
- එක් පාර්ශ්වයක් නොව සෑම පාර්ශ්වයක් ම ජයගන්නා එකඟතා ඇති කර ගැනීමට පාර්ශ්වවලට පහසුකම් සැපයීම.

## 6.2. ගැටුම් සමථන ක්‍රියාවලිය :-

- ගැටුම් සමථනය සාමාන්‍යයෙන් දීර්ඝ ක්‍රියාවලියකි.
- පෞද්ගලික මෙන් ම සමාජ දේශපාලන ගැටුම්වල ද නිරීක්ෂණය කළ හැකි කරුණක් නම්, ගැටුමක් සම්පූර්ණ ලෙස විසඳීමට දුෂ්කර වුවත් ගැටුමට සාධනීය ලෙස ප්‍රවේශ වීමේ මාධ්‍ය පවතින බව ය.
- ඒ අනුව
    - ගැටුම් ගැන කල්තබා අනතුරු ඇඟවීම.
    - ගැටුම් වැළැක්වීම.
    - ගැටුම් කළමනාකරණය.
    - ගැටුම් පරිවර්තනය.

- පශ්චාත් ගැටුම් - සාමය ගොඩ නැඟීම.
- ගැටුම් සමථනය.

- **ගැටුම් ගැන කල්තබා අනතුරු ඇඟවීම** (Early Warning)

  - මෙය 1980 සහ 1990 දශකවල වර්ධනය වූ සංකල්පයකි.
  - මෙහි මූලික අදහස නම් සමාජයේ ඇති වීමට ඉඩ තිබෙන ගැටුම් පිළිබඳ කල්තබා හඳුනාගෙන ඒවා ඇති වීම වැළැක්වීමට පියවර ගැනීම යි.
  - එසේ කිරීමේ දී ගැටුම් ඇතිවිය හැකි ස්ථාන, සමාජ කොටස් ආදිය හඳුනාගෙන ඒවා වෙතින් ගැටුම් ඇති වීමට තුඩු දිය හැකි හේතු අධ්‍යයනය කර ඒවා විසඳීමට යෝජනා සකස් කළ හැකි ය.

- **ගැටුම් වැළැක්වීම** :- (Conflict Prevention)

  - ඉහතින් දැක්වූ ''කල්තබා අනතුරු ඇඟවීම'' ගැටුම් වැළැක්වීමේ ආරම්භක පියවරකි.
  - ගැටුම් ඇති වීමට ඇති සාධක, ඉඩකඩ හා ස්ථාන හඳුනාගත් පසු ඒවා ගැටුම් බවට උත්සන්න වීම වැළැක්වීම මෙහි අරමුණ වේ.
  - ගැටුම් වැළැක්වීමේ ආකාර දෙකක් තිබේ.

  I සරල වැළැක්වීම :- (Light prevention)
    - මෙයින් කරනුයේ ගැටුමක් ප්‍රචණ්ඩ අවධියට පැමිණීම වැළැක්වීමට පියවර ගැනීම යි.
    - රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම්, සංවාද, සහමන්ත්‍රණය, සාම සාකච්ඡා, ගැටලු විසඳීමේ වැඩමුළු ආදි මාධ්‍ය මේ සඳහා යොදා ගත හැකි ය.

  II ගැඹුරු වැළැක්වීම :- (Deep prevention)
    - මෙයින් කරනුයේ ගැටුමට පාදක වන මූලහේතු සොයා ඒවාට විසඳුම් ලබා දී, ගැටුම ඇතිවීමේ ඉඩකඩ වැළැක්වීම යි.
    - ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ, සංවර්ධන ක්‍රියාමාර්ග, ආදායම් යළි බෙදා යෑමේ ක්‍රියාමාර්ග, ශුභසාධන ප්‍රතිපත්ති, දේශපාලන ආයතන ගොඩ නැඟීම ආදිය මේ සඳහා යොදාගත හැකි ක්‍රියාමාර්ග යි.

- **ගැටුම් කළමනාකරණය** :- (Conflict Management)

ගැටුම් කළමනාකරණය යන්නට අර්ථ දෙකක් තිබේ.

I ගැටුමක් සම්පූර්ණයෙන් විසඳීම දුෂ්කර, කල් ගන්නා ක්‍රියාවලියක් වී ඇති විට, ගැටුමේ ප්‍රචණ්ඩත්වය හා විනාශකාරී ප්‍රතිඵල පාලනය කර, එහි ව්‍යාප්තියේ පරිමාව සහ තීව්‍රතාව සීමා කිරීම, ගැටුම් කළමනාකරණය යි. එය ගැටුමේ පාදක මූලහේතුවලට විසඳුම සෙවීමට උත්සාහ ගන්නේ නැත. මේ ප්‍රවේශය මඟින් ගැටුම් සැලකෙන්නේ නිෂේධනීය ප්‍රතිඵල ඇති කරන්නක් ලෙසය.

II මෙම දෙවන ප්‍රවේශය ගැටුම් සැලකෙන්නේ නිෂේධනීය බලවේගයක් ලෙස නොව සමාජයේ එකිනෙකට වෙනස් අපේක්ෂා සහ අරමුණු අතර ගැටුමක් ලෙස ය. එබැවින් කළ යුතු වන්නේ ගැටුම් ප්‍රජාතන්ත්‍රවාදී සහ සාමකාමී රාමුවක් තුළ, සංවාද සහ සාකච්ඡා මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්වන ක්‍රියාවලියක් බවට පත් කිරීම යි.

මෙම මාධ්‍ය දෙකෙන් ම අපේක්ෂා කරන්නේ ගැටුමක් අර්බුදයක් බවට පත්වීම වැළැක්වීම යි.

- **ගැටුම් පරිවර්තනය** (Conflict Transformation)

  මෙම සංකල්පය තව දුරටත් විමසා බලමු,

  - මෙයින් කියැවෙන්නේ ගැටුමක් සාධනීය ලෙස සමථනය කිරීම, හුදෙක් සාම ගිවිසුමකින් හෝ එක් පාර්ශ්වයක් ජය ගැනීමෙන් හෝ අත්පත් කර හැකි අරමුණක් නොව, පරිවර්තනීය ක්‍රියාවලි ගැටුම ඇතුළතින් ම සිදුවන්නක් ද වන බව යි. එනම් ගැටුම විසින් ම ගැටුමේ ගතිකත්වය, අරමුණු අභිලාෂ ද පරිවර්තනයට ලක්වේ.

  - පීටර් වොලන්ස්ටීන් (1991) ට දක්වන්නේ, ගැටුම් පරිවර්තනය යනු ගැටුමේ ඓතිහාසික ක්‍රියාවලියේ දී ලැබෙන ඉගැනුම් සම්භාරයේ ප්‍රතිඵලය බව යි. ඒ අනුව සාර්ථක ලෙස සිදුවන ගැටුම් පරිවර්තනයක් යනු යුද්ධයේ අනතුර නැවත ඇති නොවන ආකාරයට ගැටුමේ පාර්ශ්වකරුවන්, ගැටුමට තුඩු දී ඇති නිමිති සහ ගැටුමෙන් අපේක්ෂිත අරමුණු වෙනස් වීම යි. ඒ අනුව ගැටුමක් සාධනීය ලෙස සමථනය කිරීමේ අලුත් අවකාශ විවෘත වේ.

  - ගැටුමේ පරිවර්තනය ආකාර කිහිපයකින් සිදු විය හැකි ය. ඉන් කිහිපයක් පහත සඳහන් වේ.

    ♦ පාර්ශ්වකරුවන් පරිවර්තනයට පත්වීම (Actor Transformation)
    - ගැටුමේ පාර්ශ්වකරුවන්, ආණ්ඩු, නායකයන් වෙනස්වීම සහ ඔවුන් ගැටුම දෙස දක්වන ආකල්ප වෙනස්වීමෙන් ගැටුමකට ඇති වන බලපෑම.

    ♦ නිමිති සහ න්‍යාය පත්‍රවල පරිවර්තනය (Issue and Agenda Transformation)
    - මෙහිදී සිදුවන්නේ ගැටුමට කේන්ද්‍ර වී ඇති නිමිති සහ න්‍යාය පත්‍ර වෙනස් වීම යි.
    - උපරිමවාදී අරමුණු වෙනුවට, අතරමඟ සමාදානයකට ඉඩ සපයන අරමුණු මතු වීම, ඒක පාක්ෂික ජයග්‍රහණ වෙනුවට හවුල් සමාදාන සඳහා ඉඩකඩ මතු වීම මේ මඟින් සිදුවේ.

    ♦ ගැටුමේ නීතිරීති පරිවර්තනය (Rule Transformation)
    - ගැටුමේ පාර්ශ්වකරුවන්ගේ චර්යාවේ වෙනස්කම් සිදුවීම මෙයින් අදහස් කෙරේ.

    ♦ ව්‍යුහමය පරිවර්තනය (Structural Transformation)
    - ගැටුමේ සමස්ත ව්‍යුහය, නිමිති, අරමුණු, චර්යාව, පාර්ශ්ව යනාදි සියල්ල පරිවර්තනය වීම යි.

- **පශ්චාත් - ගැටුම් සාමය ගොඩ නැඟීම** (Post Conflict - Peace Building)

  - මෙයින් හැඟවෙන කරුණ නම්, සාම ගිවිසුමක් අස්සන් කිරීම හෝ යුද්ධය අවසන් කිරීම හෝ ගැටුම් සමථනය සඳහා සපයන්නේ අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් පමණක් බව යි. මින් පසු මතුවන අභියෝගය වන්නේ ගැටුම යළි ඇති නොවන පරිදි ගැටුමේ පාදක හේතුවලට සාධනීය ලෙස ආමන්ත්‍රණය කරමින්, ආර්ථික-දේශපාලන ආදි ප්‍රතිසංස්කරණය සිදු කිරීම ය.

  - ගැටුමේ දී විනාශ වූ ප්‍රදේශ සහ සමාජ යළි ගොඩ නැඟීම, පුනරුත්ථාපනය, ප්‍රති සංවර්ධනය, ප්‍රජාවන්ට සහන සැලසීම යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීම, ප්‍රජාවන් හා රාජ්‍යය අතර

සංහිඳියාව ගොඩ නැඟීම යන මේවා පශ්චාත් ගැටුම් සාමය ගොඩ නැඟීමේ කාර්යයට අයත් වේ.

- ගැටුම් සමථනය (Conflict Resolution)

    - ගැටුම් සමථනය යනු ගැටුමක් යළි ඇති නොවන පරිදි එහි මූල හේතුවලට මෙන් ම ගැටුම් සිදුවෙද්දී මතු වූ දුක් ගැනවිලිවලට ද ආමන්ත්‍රණය කරමින් සිදු කරන සාමය ගොඩ නැඟීමේ ක්‍රියාවලියක් වෙතින් අත්පත් කර ගත යුතු අරමුණකි.

## 6.3. ගැටුම් සමථන මාධ්‍ය :-

ගැටුම් සමථන ක්‍රියාවලියේ දී ප්‍රයෝජනයට ගන්නා මූලික මාධ්‍ය 4 කි.

1. සහමන්ත්‍රණය
2. මැදිහත්කරණය
3. සාම ගිවිසුම්
4. සාමය ගොඩනැඟීම

- සහමන්ත්‍රණය (Negotiation)

    - *Getting to Say 'yes'* නම් සහමන්ත්‍රණය පිළිබඳ ව සුප්‍රසිද්ධ අත්පොත ලියූ රෝජර් ෆිෂර් (Roger Fisher) ගේ සහ විලියම් යූරි (William Ury) ගේ නිර්වචන අනුව, සහමන්ත්‍රණය යනු ''අපට අන්‍යයන්ගෙන් ලබා ගැනීමට වුවමනා දේ ලබා ගැනීම සඳහා යොදා ගන්නා මාධ්‍යයකි. ඔබ සහ අනෙක් පාර්ශ්වය අතර බෙදා ගත හැකි පොදු අභිලාෂ මෙන් ම පටහැණි අභිලාෂ ද පවතින විට, දෙපාර්ශ්වය අතර එකඟතාවක් ඇතිකර ගැනීම අරමුණු කොට ගෙන සිදුවන සන්නිවේදන හුවමාරුව සහමන්ත්‍රණය යි''

    - ''සහමන්ත්‍රණය'' යනු ගැටුමක යෙදී සිටින පාර්ශ්ව තම ගැටුම විසඳා ගැනීම සඳහා යොදා ගන්නා සාකච්ඡාමය ක්‍රියාවලියකි.

    - ''සහමන්ත්‍රණය'' යනු එකිනෙකට ගැටෙන පොදු ස්ථාවරයක් බවට පත් කර ගැනීම සඳහා ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර ඇතිවන ක්‍රියාවලිය යි.

    - සහමන්ත්‍රණය සිදු කරන ආකාර තුනක් ගැටුම් සමථකරණ සාහිත්‍යයේ දැක්වේ.

        (අ) ගැටුම් විසඳා ගැනීම් සහමන්ත්‍රණය (Problem Solving Negotiation)
        මෙහි දී සිදුවන්නේ ගැටුමේ පාර්ශ්වවලට පොදුවේ පිළිගත හැකි විසඳුමක් සොයා යෑම යි. එය පාර්ශ්ව දෙකට ම සතුටු විය හැකි, අතරමැද සමාදානකාරී විසඳුමක් හවුලේ සොයා ගැනීමේ ක්‍රියාවලියකි. එය සිදු වන්නේ ගැටුමට පාදක වූ ගැටලු විසඳීමට එකඟ වීමෙනි.

        (ආ) ආරාවුල්කාරී සහමන්ත්‍රණය (Contending Negotiation)
        මෙහි දී සිදුවන්නේ ගැටුමට සම්බන්ධ එක පාර්ශ්වයක්, අනෙක් පාර්ශ්වය මත තම ස්ථාවරය පැටවීම සඳහා සාකච්ඡාවේ යෙදීම යි. තම ස්ථාවරය නම්‍යශීල නොකර දැඩි ලෙස පවත්වා ගනිමින්, පසමිතුරු පාර්ශ්වයේ ස්ථාවරය තමන්ට වාසි ලෙස වෙනස් කිරීමට බල කිරීම මෙහි දී කෙරේ.

(ඇ) නම්‍යශීලී සහමන්ත්‍රණය (Yielding Negotiation)

මේ ක්‍රමයේ දී සිදුවන්නේ, ගැටුමට සම්බන්ධ පාර්ශ්ව, විසඳුමක් සොයා ගැනීම සඳහා තම අරමුණු හා අපේක්ෂා පිළිබඳ ව නම්‍යශීලී වීම යි.

- මැදිහත්කරණය (Mediation)

  - මැදිහත්කරණය යනු ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර විවාදයට තුඩු දී ඇති නිමිති සම්බන්ධයෙන් දෙපාර්ශ්වයට ම පිළිගත හැකි නිරාකරණයක් (Settlement) ඇති කිරීමේ අරමුණින් තුන්වැනි පාර්ශ්වයක් භාරගෙන තිබෙන අතරමැදි ක්‍රියාකාරකමකි. මැදිහත්කරණය එක අවස්ථාවක සිදුවන එක ක්‍රියාකාරකමක් නොව ක්‍රියාවලියකි. එය අවධි කීපයකින් යුක්ත වේ.

I මුල දී ගැටුම් පාර්ශ ව අතර පණිවිඩකරුවකු ලෙස ක්‍රියා කිරීම.

II ඔවුන් අතර සාධනීය අදහස් හුවමාරුවකට අවශ්‍ය සන්නිවේදන මාධ්‍යය වීම හා ඒ සඳහා ආධාර සැපයීම.

III ගැටුමට විකල්ප විසඳුම් ගැන සිතීමට ආධාර වීම.

IV ගැටුමේ පාර්ශ්ව සාකච්ඡා මේසයට ගෙන ඒම සහ සාකච්ඡාවල සභාපති කාර්ය ඉටු කිරීම.

V සහමන්ත්‍රණයේ දී ඇති වන ගැටලුකාරී කරුණු විසඳීමට පාර්ශ්වකරුවන්ට ආධාර කිරීම.

VI සහමන්ත්‍රණයේ යෙදෙන පාර්ශ්වවල ප්‍රකාශකයා ලෙස කටයුතු කිරීම.

VII සාම ගිවිසුම කෙටුම්පත කිරීමට ආධාර කිරීම.

VIII සාම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට, පාර්ශ්ව කරුවන් ඉල්ලා සිටින උදවු ලබා දීම.

**6.3.3. සාම ගිවිසුම්**

- රාජ්‍ය අභ්‍යන්තර හෝ අන්තර් රාජ්‍ය හෝ ගැටුමක් පවතින විට, සහමන්ත්‍රණයේත්, මැදිහත්කරණයේත් අපේක්ෂාව වන්නේ ගැටුමේ පාර්ශ්ව කරුවන් සාම ගිවිසුමකට නැතහොත් නිරාකරණ ගිවිසුමකට (Peace Agreement/Settlement Agreement) අස්සන් කරනු ඇත යන්න යි. සාම ගිවිසුම (Peace Accord) යන පදය ද මේ සඳහා යොදා ගැනේ.

- තුන්වැනි පාර්ශ්වයක මැදිහත්කරණය සිදුවන අවස්ථාවක සාම ගිවිසුමට ගැටුම් පාර්ශ්වකරුවන් අස්සන් කරන්නේ, එම තුන්වැනි පාර්ශ්වයේ සහභාගිත්වය සහ අනුශාසනා පරිදි ය. ගිවිසුම කෙටුම්පත් කිරීමට ද තුන්වැනි පාර්ශ්වය සහභාගී වෙයි. මැදිහත්කරණය නොමැති අවස්ථාවල පාර්ශ්ව දෙකේ විශේෂඥයෝ ගිවිසුම කෙටුම්පත් කරති.

- ගැටුමක් ඒක පාර්ශ්වික ව අවසන් වූ අවස්ථාවක, සාම ගිවිසුම අස්සන් කරන්නේ නැත. එවැනි අවස්ථාවක බොහෝ විට සිදුවන්නේ පරාජිත පාර්ශ්වය යටත් වීමේ ගිවිසුමක් අස්සන් කිරීම යි. එය සාම ගිවිසුමක් නොවේ.

- සාම ගිවිසුමක ලක්ෂණ

i ගැටුමේ පාර්ශ්ව දෙක ම, ගැටුම අත්හිටුවීමට හෝ අවසන් කිරීමට හෝ එකඟ වීම.

ii තනි ව මත් හවුලේත් ක්‍රියාත්මක කිරීමට එකඟ වන පොරොන්දු සාම ගිවිසුමේ කොන්දේසි බවට පත් කිරීම.

iii ගැටුම් සිවිල් යුද්ධයක් නම් යුද්ධය අවසන් කිරීම, නිරායුධකරණය, සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීම, යුද්ධයෙන් සරණාගතයන් වූ සිවිල් ජනයා යළි පදිංචි කරවීම, මානව අයිතිවාසිකම් කඩවීම්වලට පිළිතුරු සෙවීම ආදි කාර්යයන්ට හවුලේ එකඟ වීම.

iv කැරලිකාර පාර්ශ්වය දේශපාලන ප්‍රධාන ප්‍රවාහයට එකතු කර ගැනීම සහ එම පාර්ශ්වයේ දේශපාලන ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් දේශපාලන ප්‍රතිසංස්කරණවලට එකඟ වීම.

v ගිවිසුම් කොන්දේසි නිසි පරිදි ක්‍රියාත්මක කරන බවට ශපථ වීම සහ ඒ සඳහා ස්වාධීන නිරීක්ෂණ විධිවිධානවලට එකඟ වීම.

- සාමය ගොඩ නැගීම

සාම ගිවිසුමකට පාර්ශ්වකරුවන් එළඹීම, සාමය ගොඩ නැගීමේ දීර්ඝ ක්‍රියාවලියක ආරම්භය පමණි. විශේෂයෙන් ම ප්‍රචණ්ඩ සහ දිග්ගැස්සුණු සිවිල් යුද්ධ පැවති සමාජවල සාමය ගොඩනැගීම ද දීර්ඝ කාලීන සහ පරිවර්තනීය ක්‍රියාවලියක් වේ. සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අභියෝග දෙකකි.

i සාම ගිවිසුමේ පාර්ශව එකඟ වූ කොන්දේසි නිසි පරිදි හා පොරොන්දු වූ පරිදි ක්‍රියාත්මක කිරීම.

ii ගිවිසුම අසම්පූර්ණ ලෙස ක්‍රියාත්මක වීමේ දී ඇතිවිය හැකි ගැටුමට ආපසු යාමේ හැකි යාව පාලනය කිරීම.

## 6.4. සාමය ගොඩ නැගීම (Peace - Building)

### 6.4.1 සාමය ගොඩනැගීම, නිර්වචන සහ ප්‍රවේශ

ගැටුම් සහ සාම අධ්‍යාපන සාහිත්‍යයේ සාමය යන්න දෙයාකාරයකට සංකල්ප ගත කර ඇත. මහාචාර්ය යොහාන් ගැල්ටුං (Johan Glatung) 1964 දී හඳුන්වා දුන් එම දෙයාකාර ක්‍රමය නම්

i නිෂේධනීය සාමය (Negative Peace)

ප්‍රචණ්ඩත්වය හා යුද්ධය නොමැති වීමෙන් ඇති වන සාමය.

ii සාධනීය සාමය (Positive Peace)

මෙය ප්‍රචණ්ඩත්වය සහ යුද්ධය නොමැති වීමෙන් ලබන සාමයට වඩා ඈතට යයි. මනුෂ්‍ය ප්‍රජාව අතර අන්‍යෝන්‍ය අවබෝධය ව්‍යාප්ත වීම, සාම අධ්‍යාපනය, අන්තර්ජාතික සහයෝගිතාව, ආරවුල් විසඳාගැනීම සාර්ථක ලෙස ගැටුම් කළමනාකරණය කිරීම, සමාජ අසාධාරණකම හා අසමානතා අහෝසි කිරීමෙන් සමාජයේ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට ඇති අවකාශ අහෝසි කිරීම යන මේවා පදනම් කොටගෙන ගොඩ නඟන ලද සාමය මෙයින් අදහස් වේ.

- මීට අමතරව 1970 දශකයේ දී බිහි වූ ''ධරණීය සාමය'' (Sustainable Peace) යන අලුත් සංකල්පයේ නිර්මාතෘවරයා වන්නේ ද මහාචාර්ය ගල්තුං ය. මෙහි වාචික අර්ථය නම් ''තම භව්‍යතා ක්ෂය වන්නේ නැතිව තමන් ම පෝෂණය කර ගනිමින් ඉදිරියට යා හැකි සහ පැවතිය හැකි සාමය'' යන්න යි.

- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් ව සිටි බූත්‍රෝස් බූතෝස්-ගාලි (Boutros Boutros-Ghali) 1992 දී ඉදිරිපත් කළ ''සාමය උදෙසා න්‍යාය පත්‍රය'' (An Agenda for Peace) යන

ලේඛනයේ සඳහන් කරන ලද සාමය ගොඩනැඟීම පිළිබඳ නිර්වචනය පහත සඳහන් ය.

''රටක් නැවත වරක් ගැටුමට ආපසු යාමේ අවදානම අඩු කිරීමේ ඉලක්කය ඇති ව, ගැටුම් කළමනාකරණය සඳහා ජාතික මට්ටමේ ඇති හැකි යාවත් සෑම මට්ටමින් ම ශක්තිමත් කිරීමත්, ධරණීය සාමය සහ ධරණීය සංවර්ධනය සඳහා පදනම දැමීමත් අරමුණු කරගත් පියවර ගණනාවක් ම සාමය ගොඩනැඟීම යන්නට අඩංගු ය. සාමය ගොඩනැඟීමේ උපාය මාර්ග මනා ලෙස සංයුක්ත වූ සහ රටේ සුවිශේෂ අවශ්‍යතාවලට ගැළපෙන ඒවා විය යුතුය. ඒවා ජාතික හිමිකාරිත්වයක් මත පදනම් විය යුතු ය''

- මහාචාර්ය ජෝන් පෝල් ලෙඩරාක් (John Paul Lederach) ''සාමය ගොඩනැඟීම'' යන සංකල්පයෙන් අවධාරණය කරන්නේ දීර්ඝ කාලයක් ප්‍රචණ්ඩ ගැටුම් පැවැති සමාජයක ධරණීය සාමයක් ගොඩනැඟීමට නම් සමාජ බිම් මට්ටමෙන්, එනම් සාමාන්‍ය ජනයාගේ මට්ටමෙන්, සාමය ගොඩනැඟීමේ කර්තව්‍ය සිදු විය යුතු බව ය. පුරවැසියන්ටත්, සිවිල් සමාජ බලවේගවලටත්, රාජ්‍ය නොවන සංවිධාන වලටත් සාමය ගොඩ නැඟීම සඳහා ඇති ශක්‍යතාව මහාචාර්ය ලෙඩරාක් අවධාරණය කරයි. එයට හේතුව සාමය ගොඩ නැඟීමේ පදනම යනු ප්‍රජාවන් අතර ඇති වන ''අන්‍යෝන්‍ය විශ්වාසය'' පමණි.

### 6.4.2 ප්‍රතිසන්ධානගත වීම (Reconcilition)

සාමය ගොඩනැඟීමේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන අවස්ථාවක් ලෙස 'ප්‍රතිසන්ධානගත වීම' යන ක්‍රියාවලිය සැලකේ. සංහිඳියාව ඇති කිරීම යන යෙදුම ද ඒ සඳහා යොදාගත හැකි ය. විශේෂයෙන් ම දීර්ඝකාලීන ප්‍රචණ්ඩ ගැටුම් පැවති සමාජවල සාධනීය සාමය ගොඩනැඟීමට අත්‍යවශ්‍ය යැයි සැලකෙන ප්‍රතිසන්ධානගත වීම යන්නෙහි සරල අර්ථය නම් අතීතයේ ගැටුමට සම්බන්ධ සියලු පාර්ශ්ව මෙන් ම ගැටුම තුළ බෙදී සිටි ජනතාව ද සාමය ගොඩනැඟීම සඳහා ද එකතු වීම යි. එම එකතු වීමේ ක්‍රියාවලියේ අතීතයේ පැවති පසමිතුරුකම, වෛරය සහ අන්‍යෝන්‍ය සැකය අතහැර දමා මිත්‍රත්වය, විශ්වාසය සහ අන්‍යෝන්‍ය ගෞරවය පිළිබඳ ව හැඟීම් මත පදනම් වූ සාධනීය සම්බන්ධතා ගොඩ නැඟීම ද එයින් අපේක්ෂා කෙරේ.

ප්‍රතිසන්ධානගත වීම මට්ටමක් තුනකින් සිදුවීම අවශ්‍ය වේ.
i මනෝ විද්‍යාත්මක ක්‍රියාමාර්ග -
ප්‍රචණ්ඩත්වයේ ගොදුරු බවට පත් වූ ජනතාවට එම වේදනාකාරී අත්දැකීම් සමඟ සාධනීය ලෙස ගනුදෙනු කිරීමට ඇති හැකි යාව සහ සූදානම ගොඩ නැඟීම.

ii සමාජීය ක්‍රියාමාර්ග -
සමාජීය මට්ටමෙන් එම කාර්යය සඳහා සමාජය සූදානම් කිරීම, පළිගැනීම වෙනුවට මිත්‍රත්වය හා සමාව දීම, වෙන් වී සිටීම වෙනුවට එකතු වීම, සහ වෛරය වෙනුවට අන්‍යෝන්‍ය සහකම්පනය ගොඩනැඟීම මෙම සමාජ ක්‍රියාකාරකම්වල අරමුණු ය.

iii දේශපාලන ක්‍රියාමාර්ග -
පෞද්ගලික මට්ටමින් සිදු වන මනෝවිද්‍යාත්මක මෙන් ම සමාජමය 'සුව කිරීමේ' (Healing) ක්‍රියාවලියට සමාන්තර ව 'දේශපාලන සුව කිරීමේ' ක්‍රියාවලියක් (Political Healing) ප්‍රතිසන්ධානගත වීමට ඇතුළත් ය. ගැටුමට මූල හේතු වූ, ආර්ථික දේශපාලන හා සමාජීය සාධකවලට දේශපාලන වශයෙන් ආමන්ත්‍රණය කිරීමේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක අවශ්‍යතාව මෙයින් අවධාරණය කෙරේ.

- සාමය ගොඩ නැඟීම පිළිබඳ දකුණු අප්‍රිකානු අත්දැකීම් මඟින් අවධාරණය කළ කරුණක් නම් ප්‍රතිසන්ධානගත වීමේ ක්‍රියාවලිය, සත්‍යය සෙවීම, යුක්තිය ලබා දීම සහ සාමය යන මේවා එකිනෙකට සම්බන්ධ දේ විය යුතු බව යි.

''සත්‍යය සෙවීම'' (Truth Seeking) යන්නෙන් අදහස් වනුයේ ගැටුම පැවති සමයේ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවලියේ දී ඇත්ත වශයෙන් සිදු වූයේ කුමක්දැයි සෑම දෙනා ම විවෘත ව දැනගෙන ඒ මත ''සුව කිරීමේ ක්‍රියාවලිය'' ගොඩනැඟීම යි.

''යුක්තිය'' (Justice) අවශ්‍ය වන්නේ ගැටුම සමයේ සෑම පාර්ශවයක් විසින් ම කරන ලද මානව අයිතිවාසිකම් උල්ලංඝනවල වින්දිතයන් වූ වැසියන්ට යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීම යි.

දකුණු අප්‍රිකාවේ 1995 දී පිහිටුවනු ලැබූ සත්‍ය සෙවීමේ හා ප්‍රතිසන්ධානගත වීමේ කොමිසම (Truth and Reconciliation Commission) මේ සම්බන්ධ ව ලෝකයේ පවත්නා සුප්‍රකට උදාහරණය යි. එනම් වැරදි කරුවන් සොයා දඬුවම් කිරීමේ සාම්ප්‍රදායික නෛතික ප්‍රවේශය වෙනුවටත්, ''පළිගැනීමේ යුක්ති'' (Retributive Justice) ප්‍රවේශය වෙනුවටත් ''සුව කිරීමේ යුක්ති'' (Restorative Justice) ප්‍රවේශය ආදේශ කෙරේ. යුක්තිය පිළිබඳ ව මෙම ප්‍රතිසන්ධානගත වීමේ ප්‍රවේශයේ හරය නම්, වැරදි කරුවන්ට දඬුවම් දීම වෙනුවට මානව අයිතිවාසිකම් කඩවීම් සිදු කළ පුද්ගලයන් සහ වින්දිතයන් ද, ඔවුන් අයත් ප්‍රජාවේ සාමාජිකයන් ද, එක ම පොදු ක්‍රියාවලියක් වෙතට ගෙන්වා, සමාව ඉල්ලීම හා සමාව දීම මාධ්‍යයෙන් යුක්තිය ඉටු කිරීම යි. ක්‍රියාව කළ පුද්ගලයන් සහ වින්දිතයින් අතර හමු වීම, සාකච්ඡාව සහ සහකම්පිත සංවාදය මේ ක්‍රියාවලියේ මාධ්‍යය යි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් :-**

1. පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.

   භූමිකා රංගන සඳහා මාතෘකා බෙදා දෙන්න.

   - ගැටුම් කල්තබා අනතුරු ඇඟවීම.
   - ගැටුම් වැළැක්වීම.
   - ගැටුම් කළමනාකරණය.
   - ගැටුම් පරිවර්තනය.
   - පශ්චාත් ගැටුම් සාමය ගොඩ නැංවීම.
   - සහමන්ත්‍රණය.
   - මැදිහත්කරණය.
   - සාම ගිවිසුම්.

නියමිත දිනයක දී භූමිකා රංගන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## ආශ්‍රිත ග්‍රන්ථ


01. Coser, L., (1975), *The Function of Social Conflict*, Glencoe, Ili, Free Press.

02. Fisher, Simonetal, (2000), *Working with Conflict; Constructive and Destructive Processes*, New Haven and London: Yale University Press.

03. Fisher, Roger and William Ury, (1991), *Getting to Yes, Negotiating Agreement without Giving In*, USA: Penguin Books.

04. Ghail, Boutros-Boutros, (1992), *An Agenda for Peace*, New York: United Nations.

05. Galtung, Johan, (1964), *"An Editorial" Journal of Peace Research*, 1:1, 1-4.

06. Kriesbers, Louis, (1998), *Constructive Conflicts*: From Escalation to Resolution, Lanham, Maryland; Rowman an Littlefield.

06. Mitchel, Christopher, (1981), *The Stuccture of International Conflict*, London: Macmillan.

07. Lederach, John Paul, (1997), *Building Peace, Washington*, D.C: US Institute of peace.

08. Simmel, George, (1955), *Conflict*, NewYork: Free Press.

09. Zartman, William I, (1995), *Ripe For Resolution: Conflict and Intervention in Africa*, New York: Oxfrd University Press.

10. Wallensteen, Peter, (2002), *Understanding Conflict Resolution*: War, Peace and the Global System, London: SAGE.

## 07. ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනය

**නිපුණතාව 07 :-** ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ සමාජ, ආර්ථික සහ දේශපාලන පැතිකඩ හඳුනා ගනියි.

**(කාලච්ඡේද 50 යි)**

**නිපුණතා මට්ටම :-**

7.1. යටත් විජිතවාදය සහ යටත් විජිත පාලන ක්‍රමය ලංකාවේ සමාජ, ආර්ථික සහ දේශපාලන පරිවර්තනයට තුඩු දුන් ආකාරය විග්‍රහ කරයි.

7.2. ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ ප්‍රතිවිපාක අවබෝධ කර ගනිමින් අදහස් දක්වයි.

**ඉගෙනුම් ඵල :-**

- යටත් විජිත පරිවර්තනයේ සමාජ, ආර්ථික සහ දේශපාලන ගමන් මගේ ප්‍රවණතා සහ ප්‍රතිඵල විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ නූතන රාජ්‍යයට පදනම වැටුණු ආකාරය පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය සහ විකාශය සිදු වූ ආකාරය පෙන්වා දෙයි.
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ විශ්ලේෂණය කරයි.

**හැඳින්වීම :-**

මෙම පාඩමේ අරමුණ යටත් විජිතයක් බවට පත් වූ ශ්‍රී ලංකාව කෙරෙහි යටත් විජිත ක්‍රමය කෙසේ බලපෑවේ දැයි ගවේෂණය කිරීම යි. එහිදී ''යටත් විජිත රාජ්‍යය'' යන සංකල්පය හඳුන්වා දී, යටත් විජිත ක්‍රමය හා එහි දේශපාලනය ලංකාවේ ආර්ථික, සමාජ හා දේශපාලන යන ක්ෂේත්‍රවලට බලපෑ ආකාරය ගැන පැහැදිලි කරනු ලැබේ. මෙහි දී මතක තබා ගත යුතු වැදගත් කරුණ නම්, මෙම අධ්‍යයනය ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමයට සීමා වන බව ය.

**විෂය කරුණු පැහැදිලි කරගැනීම සඳහා අත්වැලක් :-**

ඉහත 3 වැනි පාඩමේ ''යටත් විජිත රාජ්‍යය'' යන අනුමාතෘකාව යටතේ ඇති සටහන මේ පාඩමට සම්බන්ධ කළ හැකිය.

### යටත් විජිත හා යටත් විජිත රාජ්‍යය :

ලෝක ඉතිහාසය ගවේෂණය කරද්දී යටත් විජිත බිහි වූ ආකාර දෙකක් හඳුනාගත හැකි ය. එනම්,

(1) කිසියම් රාජ්‍යයක ජනතාව නව දේශයක් සොයාගෙන එය ජනාවාස කර, මව් රාජ්‍යයේ සමාජ, දේශපාලන සහ ආර්ථික ක්‍රමවලට අනුරූප වූ සංස්ථා ගොඩ නගා ගෙන, මවු රාජ්‍යයේ ආධිපත්‍යයට යටත් ව එම නව දේශය පවත්වා ගැනීම.

(2) පෙර ජනාවාස වූ ප්‍රදේශයක් බලගතු රාජ්‍යයක් විසින් ගිවිසුමකින් හෝ යුද බලයෙන් හෝ ඈඳාගෙන, තම ආධිපත්‍යය යටතේ පාලනය කිරීම.

මෙම දෙවැනි ක්‍රමයෙන් යටත් විජිතයක් වන සමාජය විජිතකාරක රාජ්‍යයේ ආධිපත්‍යයට යටත් වේ. ශ්‍රී ලංකාව යටත් විජිතයක් බවට පත් වූයේ ද මෙම දෙවෙනි ක්‍රමයට ය.

- .තුනිවන හිකකටයි 3.2 රාජ්‍යය මාදිලි සහ වර්ගීකරණය යන විෂය අන්තර්ගතයේ යටත් විජිත රාජ්‍යය යන තේමාව යටතේ දැක්වූ විෂය කරුණු ද මීට අදාළ කරගන්න.

**යටත් විජිත රාජ්‍යය** -

යටත් විජිතකාරක රාජ්‍ය හා යටත් විජිතය අතර පවතින සබඳතාව ය විග්‍රහ කිරීම සඳහා දේශපාලන හා සමාජ විද්‍යාඥයන් විසින් භාවිතයට ගන්නා සංකල්පයක් ලෙස යටත් විජිත රාජ්‍යය (Colonial State) හඳුන්වා දිය හැකි ය. මෙහි දී යටත් විජිත රාජ්‍ය ය යනුවෙන් අදහස් කරන්නේ විජිතකාරක රාජ්‍යයේ නියෝජිතයා වශයෙන් ක්‍රියාත්මක වන යටත් විජිත සමාජය සහ එහි දේශපාලන, පරිපාලන හා යුද්ධ මය ව්‍යුහය යි. ආණ්ඩුව නියෝජනය කරන්නේ යටත් විජිත සමාජයේ මහජන අභිලාෂ නොව විජිතකාරක රාජ්‍යයේ අභිලාෂ යි. එය මවු රාජ්‍යයේ ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලන අවශ්‍යතාවලට අනුව මෙහෙයවීම එහි ප්‍රමුඛ කාර්ය භාරය වේ. එය යටත් විජිතයේ සාමය හා පිළිවෙළ පවත්වාගෙන යාමට ප්‍රමුඛත්වය දෙයි. යටත් කරගත් ජනතාවගෙන් එල්ල වන බලපෑම් මර්දනය, මතවාදී ආධිපත්‍යය, ඒ සමාජය කෙරෙහි පිහිටුවාලීමට ප්‍රමුඛත්වය ලබා දේ. යටත් විජිත රාජ්‍යයේ විශේෂ ලක්ෂණය වන්නේ යටත් විජිතකාරක රාජ්‍යයේ අවශ්‍යතා වෙනුවෙන් බලහත්කාරී ලෙස රඳා පැවතීම යි. එබැවින් යටත් විජිත රාජ්‍යයට ඇත්තේ අවම සුජාත භාවයකි. යට කී අරමුණු සඳහා යටත් විජිත රාජ්‍යයේ ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලන සංස්ථා වෙනස් කිරීමට හා පරිවර්තනය කිරීමට එය උත්සුක වෙයි.

## යටත් විජිත පරිවර්තන සහ එහි ප්‍රතිඵල :

ශ්‍රී ලංකාව 1505 සිට 1948 දක්වා බටහිර විජිතවාදී ග්‍රහණයට හසු විය. පළමු ව පෘතුග්‍රීසීහුත් දෙවනුව ලන්දේසීනුත් තුන්වනුව ඉංග්‍රීසීහු ලංකාව ග්‍රහණයට ගත්හ. මේ ජාතීන් අතරින් ලංකාව කෙරෙහි දෘඪ බලපෑමක් එල්ල කළෝ ඉංග්‍රීසීහුය. ඔවුහු 1796 සිට 1815 තෙක් ලංකාවේ මුහුදුබඩ පළාත් පාලනය කළහ, 1815 සිට මුළු ලංකාව ම තම පාලනයේ අණසකට නතු කරගත්හ. එතැන් පටන් බ්‍රිතාන්‍ය නැමති යටත් විජිත කාරකයන් (Colonizer) විසින් හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති ලංකාව නමැති විජිතකරණය වූ සමාජය කෙරෙහි දිගුකාලීන බලපෑමක් කර තිබේ.

විජිතකාරක රාජ්‍ය යටත් විජිතවල විජිත රාජ්‍යයක් ගොඩ නඟන්නේ හා යම් යම් සමාජ ආර්ථික, දේශපාලන හා පරිපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්නේ

(1) තම විජිතය පවත්වාගෙන යාමේ ආරක්ෂක හා පරිපාලන වියදම් අධික වීම සහ ඍජු ව විජිතය පාලනය කිරීම අපහසු වීම.

(2) තමන්ට අබිමුව ඇති නව සමාජයේ ඇති ජීවන රටා හා අභිලාෂ විජිතකාරකයාගේ සංස්කෘතිය සමඟ නොපෑහීම ඒවා එය වෙනස් කර ගැනීම.

(3) තමන්ට යටත් වැසි සමාජ තම මවු රාජ්‍යයේ උපරිම යහපත සඳහා භාවිතයට ගැනීම, යන මූලික අරමුණු ඉටු කර ගැනීමට ය.

★ පූර්ව යටත් විජිත ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රධාන නිෂ්පාදන මූලාශ්‍රයය වූ ඉඩම් රජුට අයත් විය. රාජකාරී ක්‍රමය එහි ප්‍රධාන ලක්ෂණය විය. සාමාන්‍ය ජනතාව තම අත්‍යාසන්න ස්වාමියා මඟින් ලබාගත් ඉඩම් යම් සේවාවක් සැපයීමට යටත් ව වගා කළහ. මේ ධුරාවලියේ පහළ තැනැත්තා ඉහළ තැනැත්තාට සේවය කිරීමේ ක්‍රමය නිසාත් තම කුටුම්බයේ අවශ්‍යතා සඳහාත් ඔවුහු ඉඩම් වගා කළහ.

★ නිශ්චිත සේවාවක් සැපයීම යන කොන්දේසිය නිසා පෞද්ගලික ව්‍යවසායේ වර්ධනය ඇනහිටි අතර නිෂ්පාදනය මූලික වශයෙන් යැපුම් මට්ටමේ පැවතීමට හේතු විණි.

ලාභ ඉපයීමේ ධනවාදී අභිප්‍රේරණයෙන් මඩනා ලද බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන්ට, පැවැති මේ ක්‍රමය බාධාවක් විය. ඔවුන් විසින් ආරම්භ කරන ලද වතු ආශ්‍රිත වාණිජ කෘෂි කර්මාන්තයට අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීමට ශ්‍රමිකයන්/ගොවියන් ඉඩමට බැඳ දමා තිබූ සමාජ ක්‍රමය (රාජකාරි ක්‍රමය) බාධා විය.

කාර්යක්ෂම ව බදු අය කර ගැනීම සහ විජිත කාරක රාජ්‍යයේ ආර්ථික අභිලාෂ ඉටු කර ගැනීම සඳහා ඉඩම් පිළිබඳ පෞද්ගලික අයිතිය හඳුන්වා දෙන ලදි. කෝල්බෲක්-කැමරන් කොමසාරිස්වරුන්ගේ ප්‍රධාන යෝජනාවලින් කැපී පෙනෙන එකක් වූයේ මෙය යි.

උදාහරණ :- මුඩු බිම් පනත.

★ රාජකාරී ක්‍රමය අහෝසි කර ඉඩම් පිළිබඳ තරගකාරී වෙළෙඳපළක් හඳුන්වා දීම.

ඉංග්‍රීසීන් විසින් ඇති කරන ලද තරගකාරී ඉඩම් වෙළෙඳපොලෙහි ආයෝජනය සිදු කෙරුණේ කෝපි, සින්කෝනා, තේ, රබර් සහ පොල් යන වාණිජ භෝගයන් කෙරෙහි ය. මේවාට කාර්මික තාක්ෂණය යොදාගත් අතර අපේක්ෂා කළ පරිදි වතු වැවිලි කර්මාන්තයට මෙරට සාම්ප්‍රදායික ජනතාව එතරම් ආකර්ෂණය වූයේ නැත. ඔවුහු තම හුරු පුරුදු යැපුම් කෘෂිකර්මයේ ම නියුක්ත වූහ. විජිත රාජ්‍යය ද විද්‍යාත්මක පරිභෝජනය, යාන්ත්‍රීකරණය හා යටිතල පහසුකම් වර්ධනය මඟින් වතු වැවිලි දිරිගැන්වී ය. එහි ප්‍රතිඵලය වූයේ ලංකාවේ ද්විත්ව ආර්ථිකයක් බිහි වීම යි. එකක් යැපුම් ආර්ථිකය යි. අනික වෙළෙඳ ආර්ථිකය යි.

★ වාණිජ කෘෂිකර්මාන්තය නිසා මෙරට ජන සමාජය සමඟ මනා ව අනුකලනය නොවූ ඉන්දීය ද්‍රවිඩ ජන කොට්ඨාසයක් ද බිහි විය. මුල දී පහතරට සිංහලයන් ඒවාට අවශ්‍ය ශ්‍රමිකයන් ලෙස කටයුතු කළ ද, වර්ධනය වන ශ්‍රම ඉල්ලුම හමුවේ විදේශික ශ්‍රමිකයන් ගෙන්වා ගැනීමට සිදු වූ බව විද්වත්හු පෙන්වා දෙති.

★ ධනවාදයට පළමු ව නිරාවරණය වූ පහත රට සිංහලයෝ වතු ආශ්‍රිත කර්මාන්තවලට අවශ්‍ය සේවා සැපයීමෙන් ද, අරක්කු රේන්ද වැනි නව ආර්ථික අවකාශ ප්‍රයෝජනයට ගැනීමෙන් ද සැලකිය යුතු මූලික ප්‍රාග්ධනයක් උපයා ගත්හ. පසුව ඔවුහු දේශීය ව්‍යවසායක පන්තියක් බවට පත් වූහ. එහි ලා ප්‍රමුඛත්වය ගත්තෝ පහතරට සිංහල ජන සමාජයේ අධිපති නොවන කුලවලට අයත් වූවෝ ය. ඔවුහු මෙරට දේශීය ධනේශ්වර පන්තියේ සමාරම්භකයෝ වෙති.

★ මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණ නම් මෙරට ධනවාදය දීර්ඝකාලීන ඓතිහාසික විකාශනයක ප්‍රතිඵලයක් නොවූ බව ය. එය යටත් විජිත රාජ්‍යය විසින් සිය ප්‍රතිපත්ති මඟින් ආරෝපණය කරන ලද එකකි. එහි ප්‍රතිඵලය වූයේ පුද්ගල ප්‍රාරම්භනය අගය කරන, සමාජ සචලතාව ප්‍රිය කරන ජන කොටසක් සහ ආචීර්ණ කල්පික ඇගයුම්වල ගැලී සිටින ජනකොටසක් යන දෙපිරිසක් එකට ජීවත් වන සමාජ ක්‍රමයක් බිහි වීම ය.

යුරෝපීය යටත් විජිතවාදීන්ගේ ප්‍රාදුර්භූතිය නිසා හර පද්ධති දෙකක් එකිනෙක මුණ ගැසිණි. යුරෝපීය සමාජය පෞද්ගලිකත්වය අගය කළ සමාජ සචලතාවට ගරු කළ සාරධර්ම සහිත එකකි. ඔවුනට හමු වූ ලාංකික සමාජය ආරෝපිත (Ascribed) සාරධර්ම මත පදනම් වූ සමාජ සචලතාව ඇහිරූ එකකි. එබැවින් මේ නුහුරු සමාජය වෙනස් කිරීමට අදාළ ඇතැම් පියවර ඔවුන් විසින් ගන්නා ලදි.

- අනිවාර්ය රාජකාරි සේවය අහෝසි කිරීම.
- විවෘත වෙළෙඳපොළක් හඳුන්වා දීම.
- වෙළෙඳ භාණ්ඩ සඳහා තීරු බදු අඩු කිරීම.

- ආණ්ඩුකාරයා සතු ව පැවති අසීමිත බලතල පුද්ගල නිදහස සීමා කරන බැවින් ව්‍යවසායක සමාජයකට ගැළපෙන පරිදි ඔහුගේ බලතල සීමා කිරීම.
- ඉඩම් බදු ක්‍රමය ඒකාකෘතික කොට බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම නතර කිරීම.
- ද්‍රව්‍යවලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීම හඳුන්වා දීම.
- දහසයක් ව පැවති පළාත් සංඛ්‍යාව පහ දක්වා අඩු කිරීම.
- ඍජු බදු වෙනුවට වක්‍ර බදු ක්‍රමයක් හඳුන්වා දීම.
- රාජ්‍ය වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
- යුරෝපීය ජාතීන්ට ලංකාවේ පදිංචි වීමට තිබූ බාධා ඉවත් කිරීම.
- සිවිල් සේවය ප්‍රතිසංවිධානය කිරීම.
- ව්‍යවස්ථා සම්පාදනය සඳහා ආණ්ඩුකාරයාට සහය වීමට ව්‍යවස්ථාදායක සභාවක් ඇති කිරීම.
- විධායක කටයුතු සඳහා විධායක සභාවක් ඇති කිරීම.
- ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රචලිත කිරීම.
- අධිකරණ ක්‍රමය ක්‍රමානුකූල ලෙස සංවිධානය කිරීම.

## 7.1 ආර්ථික හා සමාජ පරිවර්තන :

යටත් විජිත රාජ්‍යය ලංකාවේ හඳුන්වා දුන් ප්‍රතිපත්තීන්ගේ බලපෑම දෙයාකාර වේ. එනම්

i අපේක්ෂිත ප්‍රතිඵල

ii අනපේක්ෂිත ප්‍රතිඵල, මේවා සාධනීය වීමට හෝ නොවීමට හෝ ඉඩ ඇත.

ආර්ථික හා සමාජ පරිවර්තනය තල දෙකක් යටතේ සිදු විය.

I යටත් විජිත ධනවාදයේ ආරම්භය සහ ව්‍යාප්තිය.

II යටත් විජිත සමාජ පරිවර්තනය.

ආර්ථික තලයේ සිදු වූ වෙනස්කම්වල පදනම ලෙස ලංකාවේ යටත් විජිත ධනවාදී ආර්ථිකයක් සම්භව වීම පෙන්වා දිය හැකි ය. යටත් විජිත කාරක රාජ්‍ය යටත් විජිතය තමන් යටතට නතු කර ගැනීමෙන් බලාපොරොත්තු වන්නේ මවු රටේ කර්මාන්තවලට අවශ්‍ය කරන අමු ද්‍රව්‍ය හා පරිභෝජනය සඳහා අවශ්‍ය කරන ද්විතීයක කෘෂිකාර්මික ද්‍රව්‍ය සම්පාදකයකු ලෙස තබා ගැනීම හා මවු රාජ්‍යයේ කාර්මික ව්‍යවසායකයන් සඳහා වෙළෙඳපළක් ලෙස තබා ගැනීමයි. මේ ක්‍රියාවලිය සඳහා විවෘත ශ්‍රම වෙළෙඳපොළක් හා ඉඩම් වෙළඳපොලක් ඇති කිරීම සඳහා රාජකාරි ක්‍රමය අහෝසි කිරීමත් මුඩු බිම් හා කිරීටයේ ඉඩම් වැනි ආඥාපනත් හරහා පළමු ව කෝපි දෙවනුව තේ, රබර්, පොල් වැනි වාණිජ බෝග සඳහා ඉඩම් වෙළෙඳපළක් රාජ්‍යයේ මැදිහත් වීමෙන් ඇති කිරීමත් පෙන්වා දිය හැකි ය.

★ මේ අනුව ලංකාව ප්‍රාථමික කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදකයකු ලෙස ලෝක ධනවාදී ආර්ථික ක්‍රමය සමඟ සම්බන්ධ වේ. රජයේ අවධානය යොමු වන්නේ වාණිජ වතු වගාවන් සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම (උද්‍යාන, මහාමාර්ග, දුම්රිය) හා අදාළ විද්‍යාත්මක පර්යේෂණ කිරීම කෙරෙහි පමණි.

★ වෙළෙඳපොළෙහි විකිණීම සඳහා කෙරෙන මහා පරිමාණ වාණිජ කෘෂි ආර්ථිකයකින් සමන්විත වෙළෙඳපොළක් බිහි විය.

★ යටත් විජිත ප්‍රතිපත්තිය මඟින් අරමුණු නොකළ සාධනීය ප්‍රතිඵල ද තිබේ. ඒවා නම් පළමු ව අරක්කු රේන්දය මිලට ගත් හා පසු ව වතු කම්කරුවන්ට හා ව්‍යවසායකයන්ට අවශ්‍ය මූලික සේවාවන් සැපයූ (කරත්ත කරුවන් ලෙස, කුඩා කඩ හිමියන් ලෙස) යම් ප්‍රාග්ධන සමුච්චිතකරණයක් අත් කරගත් දේශීය ධනපති පන්තියක සම්භවය ය.

★ ඉහත කී සේවාවල නියුක්ත වූවෝ සාම්ප්‍රදායික සිංහල ජන සමාජයේ අධිපති නොවන කුලවලට අයත් තැනැත්තෝ ය. ඒ මඟින් සමාජ කණ්ඩායම්වල උඩුකුරු සමාජ සචලතාවක් ඇති විය. එය ශ්‍රී ලංකාවේ සමානාත්මවාදී සමාජ සාරධර්ම පෙරමුණු කරගත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් බිහි වීමට අවශ්‍ය කරන පසුබිම කරා මෙහෙයවීමක් විය.

එසේ ධනය උපයාගත් තැනැත්තෝ ඉහළ සමාජ තත්ත්වාභිලාෂයෙන් සමාජ සේවා ආශ්‍රිත කටයුතුවල යෙදෙමින් අධ්‍යාපන, සංස්කෘතික සහ සමාජ තලයේ අභිවර්ධනය සඳහා ක්‍රියා කළහ.

★ සමාජයේ පරිවර්තනයක් ලෙස රාජකාරි ක්‍රමය අහෝසි කිරීම, නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් ඇති කිරීම, කණ්ඩායම් වාදය වෙනුවට පුද්ගල වාදය රජයන නෛතික සම්බන්ධතා (වැදගත් මිනුම් දණ්ඩක් ලෙස) ඉදිරියට පැමිණීම, ඉංග්‍රීසි අධ්‍යාපනය යන මේවා සමාජ සංස්කෘතික තලවල සැලකිය යුතු ප්‍රතිසංස්කරණ බිහි වීමට පාදක විය. මේ වෙනස්කම් මඟින් නව සමාජ පන්ති ක්‍රමයක් නිර්මාණය විය. ලංකාවේ ධනපති සමාජ පන්තියක් බිහි වන්නේ කෝල්බෘක්-කැමරන් යෝජනා කළ ධනේශ්වර ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් වශයෙනි.

★ ඉංග්‍රීසි අධ්‍යාපනය සහ යටත් විජිත යුගයේ හඳුන්වා දුන් අනෙකුත් සමාජ සංස්කෘතික ප්‍රතිසංස්කරණ සමඟ අතිනත ගෙන තවදුරටත් පැවති වැඩවසම් ක්‍රමය වෙනුවට නූතන සමාජ ක්‍රමයකට පදනම වැටීම සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එක් අතකින් නූතන සිවිල් සමාජය බිහි වූ අතර යටත් විජිතවාදී ප්‍රතිසංස්කරණවලින් හෝ සෘජු ව ම බටහිර අධ්‍යාපනය වැනි ප්‍රතිසංස්කරණවලින් හෝ ප්‍රතිලාභ නො ලැබූ දේශීය අධ්‍යාපනයට සීමා වූ පන්තියක් ද බිහි විය.

★ බටහිර සමාජ ක්‍රමය මඟින් ඉල්ලා සිටියෝ බටහිර සමාජ පන්නයට බර වූ එහි දේශපාලන සාරධර්ම අනුගමනය කරන තැනැත්තෝ ය. මෙයට පහසුවෙන් හැඩ ගැසුණේ ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබූ ප්‍රමාණවත් ධනයක් උපයාගත් කණ්ඩායම් පමණි. දේශීය අධ්‍යාපනය ලැබූ අයට එසේ හැඩ ගැසීමට නොහැකි විය. ඔවුහු ආවීර්ණ කල්පික රටාවන් අනුගමනය කරමින් නව ආරයක සිවිල් සමාජයක් ගොඩ නඟා ගත්හ. එය හැඳින්විය හැක්කේ මූලාකෘතික සිවිල් සමාජය (Prototype of a Civil Society) යනුවෙනි. එහි ලක්ෂණය වන්නේ ප්‍රදේශීය වාදය, ජනවර්ගය, ආගම වැනි දෑ පදනම් කොටගත් සමාජ සංවිධාන බිහි වීම ය.

## 7.2 දේශපාලන ප්‍රතිඵල :

පූර්ව යටත් විජිත රාජ්‍යයේ දේශපාලනය සැකසී තිබුණේ රජු හෙවත් භූපති කේන්ද්‍රීය ව ය. රජු සාම්ප්‍රදායික නීතියට අනුව පාලනය ගෙන යා යුතු යයි ප්‍රතිමාණයක් පැවතියත්, එම ප්‍රතිමාණ වලංගු වූයේ භූපතිගේ අභිමතයට යටත් ව ය. එබැවින් පූර්ව යටත් විජිත රාජ්‍යයේ පාලනය අත්තනෝමතික විය. බ්‍රිතාන්‍ය පාලන යුගයේ හඳුන්වා දුන් කෝල්බෘක්-කැමරන් යෝජනා වලින් මේ තත්ත්වය පරිවර්තනයට ලක් වූ අතර, තදනුබද්ධ ප්‍රතිසංස්කරණවලින් එම වෙනස්වීම් තව තවත් ඉදිරියට ගෙන යන ලදි.

★ කෝල්බෘක් ප්‍රතිසංස්කරණ මඟින් ලංකාවේ පැවති ද්විත්ව පාලනය අහෝසි කොට මුළු රට ම එක පොදු නීති ක්‍රමයක් යටතට ගෙනවිත් පළාත් පහකට බෙදා, රටේ පරිපාලන කටයුතු මධ්‍යගත කරන ලදි. මේ ක්‍රියාවලිය වූකලි අනාගතයේ ඒක බල කේන්ද්‍රීය මධ්‍යගත ඒකීය රාජ්‍යයකට අවශ්‍ය වන පදනම දැමීමක් ද විය.

★ අනෙක් අතට ලංකාව ව්‍යවස්ථානුකූල පාලනයකට යොමු කරමින් යටත් විජිත පරිපාලන ප්‍රතිසංස්කරණ මඟින් ආණ්ඩුකාරවරයාගේ අත්තනෝමතික පාලන බලතල සීමා කොට, පුද්ගලාභිලාෂ සාධනය ළඟාකර ගත හැකි ව්‍යුහයක් නිර්මාණය කිරීමෙහි ලා අවශ්‍ය වන නෛතික හා දේශපාලන අත්තිවාරම ද කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ මඟින් දමනු ලැබිණි. එමඟින් ආණ්ඩුකාරවරයා කිරීටයට වගකිව යුතු ය යන සිද්ධාන්තය ඉස්මතු කිරීමට ද උත්සාහ කෙරිණ.

★ එමෙන් ම ආණ්ඩුකාරයා තම අභිමතය අනුව ගෙන යන පාලනය වෙනුවට ව්ධායක සභාවේ අනුමතිය ඇති ව අයවැය සකස් කළ යුතු ය යන කොන්දේසිය මඟින් වගකීම් සහගත පාලනයකට නතු කිරීමට ගනු ලැබූ උත්සාහය ඉදිරියේ දී දේශපාලන විධායකයක් ගොඩ නැඟීමෙහිලා මූල බීජය බවට පත් විය.

★ ආණ්ඩුකාරයාට නීති සම්පාදනය කිරීමට තිබූ බලය සීමා කරමින් ව්‍යවස්ථාදායක සභාව ඇති කිරීමෙන් අනාගත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකට අවශ්‍ය පදනම දැමිණි. ඉන් පසු ඇතිවූ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණවලට මඟ පෙන්වූයේ මේ පදනම යි. තව ද ලංකාවට ප්‍රථම වරට නියෝජනය පිළිබඳ සිද්ධාන්තය මේ මඟින් හඳුන්වා දෙනු ලැබිණි.

★ නීති සම්පාදනය සම්බන්ධ ව ව්‍යවස්ථාදායක සභාව ඇති වූ අතර, ආණ්ඩුකාරයා සභාවේ වැඩ කටයුතුවලට සම්බන්ධ නොවී ය. මෙයින් බලාපොරොත්තු වූයේ වගකීම් සහිත පාලන ක්‍රමයක් බිහි වීමය.

★ යටත් විජිත පරිවර්තනයේ තවත් වැදගත් අංගයක් ලෙස ලංකාවේ නීති ක්‍රමය සංශෝධනය කිරීම හා පරිපාලනය මධ්‍යගතකරණය හඳුන්වා දිය හැකි ය. මුළු ලංකාව ම එක ම අපරාධ නීති ක්‍රමයකට ගෙනා අතර ප්‍රාදේශික නීතියක් වූ උඩරට නීතිය පුද්ගල නීතියක් බවට පත් කරන ලදි. ඒ සිවිල් කටයුතු අරභයා ය.

★ ලංකාව පරිපාලන ඒකක පහකට බෙදා කච්චේරි පරිපාලන ක්‍රමය හඳුන්වා දෙන ලදි. මේ අනුව ලංකාව ඒකීය පරිපාලන ව්‍යුහයකට ගෙන ආවෝ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයෝ ය. ව්‍යවස්ථානුකූල පාලනය පිළිබඳ ව පදනම වැටීම මඟින් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ බීජය රෝපණය විය.

★ 1910 මැකලම් ආණ්ඩුක්‍රමයෙන් ප්‍රථම වරට සීමිත ඡන්ද බලය හඳුන්වාදීම හේතුවෙන් උගත්කම හා දේපළ හිමිකම අනුව සීමිත කණ්ඩායමකට ඡන්ද බලය ලැබිණි.

★ මෙය 1920 වන විට තව දුරටත් වර්ධනය කරමින් පළාත්බද නියෝජනයට මඟ පාදා දෙනු ලැබිණි.

★ 1924 ප්‍රතිසංස්කරණ මඟින් සීමිත සහ පළාත්බද ඡන්ද බලය තව දුරටත් පුළුල් කරන ලදි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියට ගෙන යාමට මෙය හේතු විය.

★ 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මඟින් වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදීමේ පදනම වැටිණ. ඒ අනුව අවුරුදු 21 ට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට ම සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කෙරිණ.

★ පැවති ව්‍යවස්ථා දායක සභාව අහෝසි කරමින් නව ව්‍යවස්ථාදායකයක් ඇති කරන ලදි. රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින් වූ, එය නියෝජිතයන් 61 දෙනෙකුගෙන් සමන්විත විය.

★ පැවති වාර්ගික නියෝජනය අහෝසි කරමින් පළාත්බද නියෝජනය ඇති කරන ලදි. මේ යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට සර්වජන ඡන්ද බලය මඟින් නියෝජිතයෝ 50 දෙනෙක් ද ආණ්ඩුකාරයාගේ නාමකරණයෙන් නියෝජිතයෝ අට දෙනෙක් ද රාජ්‍ය නිලධාරීහු තිදෙනෙක් ද පත් කරන ලදහ. මේ අය අතරින් කථානායක වරයකු ද පත් කර ගැනීමට අවකාශය ලබා දිණි.

★ ස්වදේශිකයන් ඉල්ලා සිටි කැබිනට් ක්‍රමය වෙනුවට විධායක කාරක සභා ක්‍රමය ඇති කරන ලදි. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජිතයන් 61 අතුරින් රාජ්‍ය නිලධාරීන් සහ කථානායක වරයා හැර ඉතිරි නියෝජිතයෝ 57 දෙනා විධායක කාරක සභා හතකට බෙදන ලදහ. කාරක සභා හතේ සභාපතිවරුන් හත්දෙනා සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනාගේ එකතුවෙන් අමාත්‍ය මණ්ඩලය සකස් විණි.

★ 1931 ප්‍රතිසංස්කරණය මඟින් ඇති වූ සර්වජන ඡන්ද බලය නිසා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව හුරු පුරුදු විය. මේ නිසා මැතිවරණය මඟින් තම පාලකයන් තෝරා ගැනීමට හා වෙනස් කිරීමට ලාංකික ජනතාව හුරු පුරුදු වූහ.

★ දේශපාලන බලය හසුරුවන අය ජනතාවට වගකීමට හුරු පුරුදු වූයේ සර්වජන ඡන්ද බලය හේතු කොටගෙන ය. දේශපාලනඥයන් ජනතාවට වගකීමට නැඹුරු වූයේ ජනතාවට තමන් දෙන පොරොන්දු වගකීමකින් ඉටු නොකළහොත් ජනතා සහය තමන්ට නොලැබේ ය යන අදහසිනි. ඒ අනුව ඔවුහු වගකීමේ ආණ්ඩුක්‍රමයකට හුරු පුරුදු විය.

★ ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නැංවීමට දේශපාලන පක්ෂ අවශ්‍ය නොවී ය. එමෙන් ම එම ආණ්ඩුක්‍රමය විසින් දේශපාලන පක්ෂ බිහි වීම අධෛර්යවත් කරන ලදී. එහෙත් සර්වජන ඡන්ද බලය හේතු කොටගෙන ඡන්ද දායකයන් සංවිධානය කිරීමට ඇති වන අවශ්‍යතාව නිසා දේශපාලන පක්ෂ ආරම්භ විය.

★ මේ ආණ්ඩු ක්‍රමවලින් දේශපාලන වශයෙන් ජනතාව සවිබල ගැන්වුණ හ.

★ ඩොනමෝර් ක්‍රමය මඟින් සමාජ සජීවකරණය වේගවත් විය. සමාජයේ පීඩිත ජන කොටස් සර්වජන ඡන්ද බලය මඟින් අත් කරගත් ශක්තිය යටතේ හිස එසවීමට පටන් ගත්හ.

★ දේශපාලනඥයන්ගේ පැවැත්ම ජනතාව මත රඳා පවතින දෙයක් බවට පත් වූ නිසා ජනතා සහය වැඩි වැඩියෙන් ලබා ගැනීම සඳහා දේශපාලනඥයන් එකිනෙකා පරයමින් තරඟකාරී ලෙස ශුභසාධන වැඩ කටයුතු කිරීමට පටන් ගැනීම ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ දැකිය හැකි ය.

★ මෙම ආණ්ඩුක්‍රමය යටතේ වගකීම් මෙහෙයවීමට අමාත්‍ය මණ්ඩලය පිහිටුවීම ද වැදගත් ය. ඒ අනුව ආණ්ඩුකාරයා, ඉදිරි කාලයේ දී නාමික විධායක බවට පත් විය. මෙම මණ්ඩලයට තම නිල මෙන් ම පෞද්ගලික මත ද ප්‍රකාශ කිරීමේ අයිතිය තිබිණි. මෙම අමාත්‍ය මණ්ඩලය ඩොනමෝර් මුල් යුගයේ දී ක්‍රියා කළේ කණ්ඩායම් දෙකක් වශයෙනි. මෙහි දී රාජ්‍ය නිලධාරීන් වූ රාජ්‍ය ලේකම්, නීති ලේකම් සහ මුදල් ලේකම් වෙත විශාල බලතල ප්‍රමාණයක් හිමි වූ අතර ස්වදේශීය අමාත්‍යවරුන්ට හිමි වූ බලතල පවා පාලනය කිරීමේ හැකි යාව තිබිණි. ආරම්භයේ දී මෙම මණ්ඩලය සාමූහික වගකීමකින් ක්‍රියා නොකළ ද ඩොනමෝර් යුගය අවසානයේ දී එක්සත් කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක විය.

★ විධායක කාරක සභා ක්‍රමය මඟින් සුළු ජනකොටස්වලට ද පාලන කාර්යයට සහභාගී වීමට ඉඩ ප්‍රස්තාව සැලසිණි. අනෙක් අතට පාලන කාර්යයන්හි දී පෞද්ගලික මන්ත්‍රීවරයාට

සැලකිය යුතු ස්ථානයක් හිමි විය. පොදුවේ සියලු ම මන්ත්‍රීවරුන්ට ව්‍යවස්ථාදායක කටයුතු මෙන් ම විධායක කටයුතු ද විෂයයෙහි පුහුණුවක් සහ අත්දැකීම් ලැබිණි.

★ ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ කාලයේ ඇති වූ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පරිවර්තනයේ තවත් වැදගත් අංගයක් වූයේ සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය ව්‍යාප්ත වීම යි. වමේ ව්‍යාපාරය, ජාතික ව්‍යාපාර, වෘත්තීය සමිති ව්‍යාපාර, ආගමික සංවිධාන, ස්ත්‍රී ව්‍යාපාර යන මේවායේ ව්‍යාප්තිය මෙම කාලයේ සිදුවීම සමාජ පරිවර්තනයට වැදගත් දායකත්වයක් ලබා දිනි.

මේ අනුව ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සමාජ, ආර්ථික, දේශපාලන ක්ෂේත්‍රයන්හි පරිවර්තනීය සන්ධිස්ථානයක් විය. එය නිදහසින් පසු කාලයේ වේගවත් වූ දේශපාලන පරිවර්තනය සැබෑ ලෙස ආරම්භ වූ අවධිය යි.

## යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් :-

1. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.

   - පන්තිය A සහ B ලෙස කණ්ඩායම් දෙකකට බෙදන්න.
   - එක් කණ්ඩායමකට 1833 සිට 1924 (ඇතුළු ව) දක්වා ද අනෙක් කණ්ඩායමට 1931 සිට 1948 (ඇතුළුව) දක්වා යටත් විජිත පරිවර්තනයේ ආර්ථික, දේශපාලන, සමාජ ප්‍රතිඵල යන තේමා ලබා දෙන්න.
   - තම කණ්ඩායමට ලැබුණු මාතෘකාව ඔස්සේ ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.
   - ලකුණු ප්‍රදානය කරමින් වැඩ සටහන ඉදිරියට ගෙන යන්න.

## ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි


01. ජයවර්ධන, කුමාරි (2004), ***සොක්කන් ලොක්කන් වූ වගයි,*** කොළඹ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

02. නවරත්න බණ්ඩාර (2007), ***බ්‍රිතාන්‍ය යටත් විජිතයුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය***, කොළඹ, පාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

03. ප්‍රනාන්දු, ලක්සිරි (1974), ***ජාතික ව්‍යාපාරය, ව්‍යවස්ථා වර්ධනය හා වාමාංශික ව්‍යාපාරය***, දීපානි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

04. බණ්ඩාරගේ, අසෝකා (2005), ***ශ්‍රී ලංකාවේ යටත් විජිත වාදය***, කොළඹ, ස්ට්‍රැට්ෆර්ඩ් ලේක්.

05. විතානවසම්, අතුළ (2007), ***ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය***, මහරගම, තරංජී ප්‍රින්ටර්ස්.

06. Ceylon Government Press, (1969), *Ceylon, Report of the Commission on Costitutional Reform*, Colombo, Ceylon Government Press.

07. Jennings, Ivor and H.W. Tambiah, (1952), T*he Dominion of Ceylon: The Development of It's Laws and Constitution*, London: Stevens and Sons Limited.

08. Kannangara, A.P. (2011), *A Survey of Social Change in an Imperial Regime,* Colombo: Vijitha Yapa Publications.

## 08. වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය සහ එහි වෙනස්කම්

**නිපුණතාව 08 :-** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධ ප්‍රදර්ශනය කරයි.

**(කාලච්ඡේද 50 යි)**

**නිපුණතා මට්ටම :-**

8.1. නිදහසින් පසු ව්‍යවස්ථා සම්පාදනයට පසුබිම් වූ සාධක විස්තර කරයි.
8.2. ඒ ආණ්ඩු ක්‍රමයන්හි ලක්ෂණ වෙන් වෙන් ව පැහැදිලි කරයි.
8.3. එම ආණ්ඩුක්‍රමවල ප්‍රවණතා හා ගැටලු පෙන්වා දෙයි.

**ඉගෙනුම් ඵල :-**

- 1947 සහ 1972 ව්‍යවස්ථා යටතේ සිදු වූ ව්‍යවස්ථා වර්ධනය සහ ප්‍රවණතා විග්‍රහ කරයි.
- 1947 සහ 1972 දක්වා ව්‍යවස්ථා යටතේ පැවති ව්‍යවස්ථාදායකයන්හි සංයුතිය සහ ස්වාධිපත්‍යය තුළනාත්මක ව පැහැදිලි කරයි.
- 1947 සහ 1972 ව්‍යවස්ථා යටතේ විධායකයේ ස්වභාවය සහ බලතල තුළනාත්මක ව විග්‍රහ කරයි.
- සුළු ජන අයිතිවාසිකම්වල ස්වභාවය සහ සීමාවන් පෙන්වා දෙයි.
- අධිකරණයේ ස්වාධීනත්වයේ සීමා පෙන්වා දෙයි.
- අධිකරණයේ සහ රාජ්‍ය සේවය යන ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම් විචාරාත්මක ව විග්‍රහ කරයි.

**හැඳින්වීම :-**

සෝල්බරි ව්‍යවස්ථාව වෙස්ට්මින්ස්ටර් ආකෘතියට අනුව සකස් කරන ලද්දකි. වෙස්ට්මින්ස්ටර් ආකෘතියේ ආණ්ඩුක්‍රමයක් යනු බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ සහිත ආණ්ඩුක්‍රමයකි. ඒවා නම්:-

- ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ කේන්ද්‍රීය ස්ථානය පාර්ලිමේන්තුවට හිමි වීම.
- පාර්ලිමේන්තුවට වග කියන කැබිනට් මණ්ඩලයක් පැවතීම.
- පාර්ලිමේන්තුව නෛතික වශයෙන් උත්තරීතර වීම.
- ආණ්ඩුව පාර්ලිමේන්තුව මඟින් පාලනය කිරීම.
- පාර්ලිමේන්තුවෙන් පත් වූ මන්ත්‍රීන්ගෙන් ආණ්ඩුව සකස් වීම.
- ආණ්ඩුව පාර්ලිමේන්තුවට වගකීම (පාර්ලිමේන්තුවට ඇමතිවරුන් තනි තනි ව හෝ සමූහයක් වශයෙන් හෝ ඉවත් කළ හැකි ය)
- පාර්ලිමේන්තුවේ අධිකාරිත්වයට නිසැක වශයෙන් අභියෝග කළ නොහැකි ලෙස අධිකරණයේ භූමිකාව සීමා සහිත වීම.
- කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ක්‍රමය මත පදනම් වූ ද්වි පක්ෂ ක්‍රමය.

සෝල්බරි ව්‍යවස්ථාව 1944 ඇමති මණ්ඩල කෙටුම්පතේ ඇතුළත් යෝජනා සහ සෝල්බරි කොමිසම විසින් ඉදිරිපත් කළ යෝජනා මත පදනම් ව සකස් කරන ලද කැබිනට් ආණ්ඩු ක්‍රම ආකෘතියකි. කැබිනට් මණ්ඩල පිහිටුවීමේ දී ද, පාර්ලිමේන්තුවේ ව්‍යුහය සකස් කිරීමේ දී ද, නාමික විධායකය පිහිටුවීමේ දී ද, වෙස්ට්මින්ස්ටර් ආණ්ඩු ක්‍රම ආකෘතියට අනුව සකස් වුව ද ඇතැම් අංගවලින් සෝල්බරි ආණ්ඩු ක්‍රමය බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙන් වෙනස් විය. ඒවා නම්,

- සෝල්බරි ව්‍යවස්ථාව ලිඛිත ව්‍යවස්ථාවක් වීම.
- සාපේක්ෂ වශයෙන් අනම්‍ය ව්‍යවස්ථාවක් වීම.
- ව්‍යවස්ථා විවරණ බලය සීමිත සහ අප්‍රකාශිත ලෙස අධිකරණයට හිමි වීම.

සෝල්බරි ව්‍යවස්ථාවෙන් ලංකාව බහු වාර්ගික හා බහු ආගමික සමාජයක් බව පිළිගැනිණි. ස්වාධීන අධිකරණයක් සහ ස්වාධීන රාජ්‍ය සේවයක් ඇති කිරීමට ව්‍යවස්ථාවෙන් පියවර ගෙන තිබිණි. එම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ කාලය (1947-1972) තුළ එම ව්‍යවස්ථාවට සංශෝධන අටක් සිදු කරන ලදි.

**විෂය කරුණු පැහැදිලි කරගැනීම සඳහා අත්වැලක් :-**

## 8.1. සෝල්බරි ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට පසුබිම වූ ප්‍රධාන සාධක :

- සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ලංකාව තව දුරටත් බ්‍රිතාන්‍ය කිරීටයේ රාජ්‍යයක් වශයෙන් නොපැවතිය යුතු යැයි ප්‍රබල මතයක් ගොඩනැඟීම.
- ලංකාව සමූහාණ්ඩුවක් බවට පත් කිරීමේ අවශ්‍යතාව.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව සම්බන්ධයෙන් පැවති ගැටලු.

(මෙම ගැටලු මොනවා දැයි ගුරුවරයා විසින් කෙටියෙන් දැක්විය යුතු ය)

මේ සම්බන්ධයෙන් සලකා බලා ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණයක් කිරීම සඳහා අවස්ථා දෙකක දී පියවර ගත්ත ද ඒවා සාර්ථක වූයේ නැත.

I. මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුවේ අගමැති එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා 1957 නොවැම්බර් 2 ව්‍යවස්ථා සංශෝධන කිරීම සඳහා ඒකාබද්ධ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කළේ ය. 1959 පෙබරවාරි 6 දින මෙම කමිටුව පොදු එකඟතාවකට පැමිණ තිබිණි. විශේෂයෙන් ලංකාව සමූහාණ්ඩුවක් කළ යුතු බවට හා නව ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් ඇතුළත් කිරීමේ අවශ්‍යතාව ය පිළිබඳ ව මෙම කමිටුවට නියෝජනය කළ සියලු දේශපාලන පක්ෂ අතර පොදු එකඟතාවක් තිබිණි. එහෙත් 1959 සැප්තැම්බර් මාසයේ දී බණ්ඩාරනායක ඝාතනය හේතුවෙන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ අඩාළ විය.

II. 1965 මාර්තු මස පත් වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ලංකාව සමූහාණ්ඩුවක් බවට පත් කිරීම සඳහා ව්‍යවස්ථාවට සංශෝධන ගෙන ඒමේ අදහසින් පාර්ලිමේන්තු ඒකාබද්ධ කාරක සභාවක් පත් කළ ද විපක්ෂය නව ව්‍යවස්ථාවක් සකස් කළ යුතු ය යන මතයේ දැඩි ව රැඳී සිටීම නිසා සෝල්බරි ව්‍යවස්ථාව වෙනස් කිරීමට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට හැකි යාවක් නොවී ය.

එබැවින් නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට නියත පියවර ගන්නා ලද්දේ 1970 න් පසු සමඟි පෙරමුණ ආණ්ඩුව ය. නව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් මඟින් කෙටුම්පත් කර පනවන ලද ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව 1972 මැයි මාසයේ සිට 1978 වසර දක්වා ක්‍රියාත්මක විය. එහි ප්‍රධාන ලක්ෂණ මෙසේ ය.

- කැබිනට් ආණ්ඩු ක්‍රමයක් වීම.
- වෙස්ට්මින්ස්ටර් රාජාණ්ඩු ක්‍රමය අහෝසි කොට ප්‍රථම වරට සමූහාණ්ඩු ක්‍රමයක් ඇති කිරීම.
- ජනතා පරමාධිපත්‍ය සංකල්පයට කේන්ද්‍රීය වැදගත්කමක් ලබා දීම.

- ජාතික රාජ්‍ය සභාව ජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නංවන එක ම නියෝජිතයා බවට පත් කිරීම.
- ජනතා පරමාධිපත්‍යය බලයෙන් පත් වූ අගමැති විසින් නාම මාත්‍ර විධායකයා පත් කිරීම. (සමූහාණ්ඩුව සතු වූ ලක්ෂණයකි)
- සෝල්බරි ව්‍යවස්ථාවේ තිබුණ ඇතැම් සංවරණ සහ තුළන විධිවිධාන ඉවත් කිරීම.

  උදාහරණ :- අධිකරණය සතු සීමිත ව්‍යවස්ථා විවරණ බලය අහෝසි කිරීම.
  ව්‍යවස්ථාදායකය ඒක මණ්ඩලවාදය මත පිහිටුවීම.
  රාජ්‍ය සේවාව, කැබිනට් මණ්ඩලයේ පාලනය යටතට ගැනීම.
- ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස ව්‍යවස්ථාගත කිරීම.
- රාජ්‍ය සහ බෞද්ධාගම අතර සම්බන්ධතාවට ව්‍යවස්ථාව තුළ පදනමක් ලබා දීම.
- සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීම.
- රාජ්‍ය සේවය සහ අධිකරණ සේවය වඩා සමීප ලෙසින් දේශපාලන විධායකය සමඟ සම්බන්ධ කිරීම.
- සෝල්බරි ව්‍යවස්ථාවෙන් නොසලකා හැර තිබුණු රාජ්‍යය ප්‍රතිපත්ති මූලධර්ම සහ මානව අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන 1972 ව්‍යවස්ථාවට ඇතුළත් කෙරිණි. එසේ වුව ද මේවා අධිකරණය මඟින් ක්‍රියාත්මක කරවා ගත නොහැකි විය.

## 8.2. ව්‍යවස්ථාදායකයේ සංයුතිය සහ ස්වාධිපත්‍යයː

සෝල්බරි ක්‍රමය යටතේ පාර්ලිමේන්තුව සකස් වූයේ ආයතන 3 ක එකතුවෙනි.

I. රජන (අග්‍රාණ්ඩුකාරයා)
II. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
III. සෙනෙට් සභාව

පාර්ලිමේන්තුවේ ප්‍රධාන ආයතනය වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යි. මෙම මණ්ඩලය සමන්විත විය යුතු සාමාජික සංඛ්‍යාව ව්‍යවස්ථාවේ දක්වා තිබුණේ නැත. සෑම ජන සංගණනයකට ම පසුව ඡන්ද කොට්ඨාස සීමා නිර්ණය කොමිසන් සභාව විසින් ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම මඟින් සංඛ්‍යාව තීරණය කළ යුතු යැයි ව්‍යවස්ථාවේ සඳහන් විය. සෝල්බරි ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ කාලය තුළ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව එක ම ආකාරයෙන් පැවතුණේ නැත.

- 1947-1959 කාලය තෙක් මන්ත්‍රී සංඛ්‍යාව 101 ක් විය. මින් 95 දෙනෙකු ඡන්ද කොට්ඨාස පදනමින් ජනතා ඍජු ඡන්දයෙන් ද ඉතිරි 6 දෙනා සුළු ජන කොටස් නියෝජනය කිරීම සඳහා ද පත් කරන ලදි.

- 1960 සෝල්බරි ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ ඉතිරි කාලය තුළ මන්ත්‍රී සංඛ්‍යාව 157 ක් විය. ඉන් 151 ක් ඡන්ද කොට්ඨාස පදනමින් ජනතාවගේ ඍජු ඡන්දයෙන් තේරී පත් වූ අතර ඉතිරි 6 දෙනා සුළු ජන කොටස් නියෝජනය කිරීමට පත් වූහ.

- දෙවන මණ්ඩලය වූ සෙනෙට් සභාව තිස් දෙනෙකුගෙන් සමන්විත විය. මින් 15 දෙනෙකු අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් පත් කරන ලද අතර ඉතිරි 15 දෙනා පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ නියෝජනය වූ දේශපාලන පක්ෂ විසින් තෝරා පත් කර ගන්නා ලදි.

අප පෙර ද දුටු පරිදි, ජාතික රාජ්‍ය සභාව සමන්විත විය යුතු සාමාජික සංඛ්‍යාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිත ලෙස සඳහන් කොට නොතිබිණි. එය නිර්ණය කරන ලද්දේ ව්‍යවස්ථාවේ 77 වගන්තිය යටතේ සීමා නිර්ණය කිරීමේ කොමිසම විසිනි.

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට පරම ව්‍යවස්ථාදායක බලයක් හිමි නොවී ය. එනම්,

- 29(2) වන වගන්තිය සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට හෝ බලය පාර්ලිමේන්තුවට නොතිබිණි.
- යම් පනතක් ව්‍යවස්ථාවට අනුකූල නොවේ නම් ඒ නීති බල රහිත කිරීමේ බලය අප්‍රකාශිත ව අධිකරණයට තිබීම. (ශ්‍රේෂ්ඨාධිකරණය)
- 1947 ලංකා ස්වාධීනතා පනත අනුව ලංකාවේ ඉල්ලීම හා කැමැත්ත මත ලංකාව වෙනුවෙන් නීති පැනවීමේ බලය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සතු වීම.

1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව නීති සම්පාදනය කිරීමේ බලතල සහිත එක ම ආයතනය විය. එනම්,

- ව්‍යවස්ථාවේ පස් වන වගන්තියට අනුව ශ්‍රී ලංකා සමූහාණ්ඩුවේ රාජ්‍ය බලය ක්‍රියාවට නංවනු ලබන උත්තරීතර උපකරණය වූයේ ජාතික රාජ්‍ය සභාව යි.
- 44 වන වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලතල උත්තරීතර විය.
- ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ ව්‍යවස්ථාවෙන් කොටසක් හෝ පරිච්ඡින්න කිරීමේ බලය ද, සංශෝධනය කිරීමේ බලය ද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීමේ බලය ද ඇතුළත් විය.
- 45 වන වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාවට හිමි වන ව්‍යවස්ථාදායක බලය අත්හැරීමට, පැවරීමට හෝ කිසි ම ආකාරයකින් අන් සතු කිරීමට හැකි යාවක් නොතිබිණි.
- 39 වන වගන්තියට අනුව රාජ්‍ය සභාව විසින් පනවන ලද කිසි ම නීතියක වලංගු භාවය ප්‍රශ්න කිරීමට හෝ ඒ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට හෝ අධිකරණයට හෝ වෙනත් ආයතනයකට හෝ බලය හිමි නොවී ය.

මේ කරුණු අනුව සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පැවති ව්‍යවස්ථාදායකය මෙන් නොව, 1972 ව්‍යවස්ථාදායකය පූර්ණ ස්වාධිපත්‍ය බලය සහිත ආයතනයක් විය.

## 8.3. විධායකයේ ස්වභාවය සහ බලතල :

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විධායකය කැබිනට් විධායකයක් විය. රටේ ප්‍රධාන පාලන සංස්ථාව වූයේ කැබිනට් මණ්ඩලය යි. කැබිනට් මණ්ඩලයේ නායකයා වූයේ අගමැතිවරයා ය. අගමැතිවරයා ලෙස පත් කළ යුතු වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයකගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා ය. බොහෝ අවස්ථාවල ලංකාවේ කිසිදු දේශපාලන පක්ෂයකට නිශ්චිත බහුතරය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ ලබාගත නොහැකි අවස්ථාවල අගමැතිවරයා තේරීමේ දී අග්‍රාණ්ඩුකාරවරයාට තම අභිමතය අනුව ක්‍රියා කිරීමට අවකාශය තිබිණි.

පත් කළ යුතු ඇමතිවරුන්ගේ සංඛ්‍යාව කොපමණ ද යන්න ව්‍යවස්ථාවේ සඳහන් නොවූ බැවින් එය නිශ්චය කිරීම මුළුමනින් ම සිදු වූයේ අගමැතිවරයාගේ අභිමත පරිදි ය. අගමැති සතු සෙසු රාජකාරිවලට අමතර ව ආරක්ෂක සහ විදේශ කටයුතු භාර ප්‍රධානයා ලෙස ද ක්‍රියා කළ යුතු යැයි ව්‍යවස්ථාවේ සඳහන් විය. අධිකරණ ඇමති ධුරය සඳහා සෙනෙට් මණ්ඩලයේ සාමාජිකයකු වීම අවශ්‍ය විය. ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය තීරණ කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද අතර ඉන් පසු ඒ තීරණ නිලධාරීන් මගින් ක්‍රියාවට නංවනු ලැබිණ. 46 වන වගන්තිය යටතේ රටේ පාලනය සහ විධායකය මෙහෙයවීම භාර වූයේ කැබිනට් මණ්ඩලය වෙත ය. පාර්ලිමේන්තුව කැඳවීම සහ විසුරුවා හැරීම සම්බන්ධයෙන් අග්‍රාණ්ඩුකාරවරයාට උපදෙස් දීමේ බලය අගමැති සතු විය. කැබිනට් මණ්ඩලය සාමූහික ව පාර්ලිමේන්තුවට වග කිව යුතු ය.

1972 ව්‍යවස්ථාව යටතේ දේශපාලන විධායකය වූයේ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය යි. අගමැති ජාතික රාජ්‍ය සභාවේ බහුතර විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා ය. අගමැතිවරුන් සහ අමාත්‍යාංශය තීරණය කිරීම, අමාත්‍යවරුන්ගේ විෂය සහ කාර්ය භාරය තීරණය කිරීම අගමැති සතු කාර්යය විය. අමාත්‍යවරුන් පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීමට මෙන් ම අමාත්‍ය ධුරවලින් ඉවත් කිරීමට ද, අගමැතිවරයාට බලය තිබිණි. ඉහළ අධිකරණවල විනිශ්චයකරුවන් ත්‍රිවිධ හමුදා ප්‍රධානයන් කැබිනට් ලේකම්, අමාත්‍යංශ ලේකම්වරුන්, පත් කිරීම අගමැති සතු ය.

එතෙක් පැවති ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි කොට, රාජ්‍ය සේවාවට අදාළ වගකීම් ඇමති මණ්ඩලය වෙත පැවරිණි.

## 8.4. සුළු ජන අයිතිවාසිකම් :

සෝල්බරි ව්‍යවස්ථාවෙහි සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් විධි විධාන ගණනාවක් ඇතුළත් විය. ඒවා නම්,

**29(2) වගන්තිය** -

සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඇතුළත් කරන ලද ප්‍රබල විධි විධානයක් වූයේ මෙම වගන්තිය යි. ඒ අනුව...

(අ) ආගමික නිදහස තහනම් කිරීම හෝ සීමා කිරීම හෝ නොකළ යුතු විය.
(ආ) එක් වාර්ගික හෝ ආගමික හෝ ජන කණ්ඩායමක් වෙනත් ජන කණ්ඩායමකට බල නොපාන අවහිරකම්වලට හෝ සීමා කිරීම් වලට හෝ ලක් නොකළ යුතු විය.
(ඉ) වාර්ගික හෝ ආගමික හෝ ජන කණ්ඩායමකට වෙනත් එවැනි කණ්ඩායමකට හිමි නැති වරප්‍රසාද ලබා නොදිය යුතු විය.
(ඊ) කිසියම් ආගමික මණ්ඩලයක් සංස්ථාපනය එහි පාලක වරයාගේ අනුමතිය නොගෙන වෙනස් නොකළ යුතු විය. කිසියම් ආගමික මණ්ඩලයක් නීතිය මඟින් සංස්ථාපනය කර ඇතොත් එහි පාලක මණ්ඩලයේ ඉල්ලීම් මත හැර අන් කිසි දු අයුරකින් වෙනස් කිරීමක් නොකළ යුතු විය.

- **බහු මන්ත්‍රී ආසන ක්‍රමය :-**

සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පැවති තවත් විධිවිධානයක් වූයේ බහු මන්ත්‍රී ආසන ක්‍රමය යි. මේ මඟින් අපේක්ෂා කළේ දිවයිනේ ඇතැම් ප්‍රදේශවල ප්‍රධාන ජනවර්ගය සමඟ මිශ්‍ර ව ජීවත් වන සුළු ජන කණ්ඩායම්වලට නියෝජනයක් සැපයීම ය. 1946 වසරේ දී පිහිටුවන ලද ඡන්ද කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාව විසින් බදුල්ල, බලංගොඩ, කඩුගන්නාව, අම්බලන්ගොඩ, බලපිටිය සහ මැද කොළඹ යන බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස පිහිටුවන ලදි. කෙසේ වුව ද සෝල්බරි කොමිසම විසින් බහු මන්ත්‍රී කොට්ඨාස පිහිටුවීම මඟින් අපේක්ෂා කරන ලද අරමුණු, ඒ ආකාරයෙන් ම ඉටු වූයේ නැත.

- **නාම කරණයෙන් මන්ත්‍රීවරු සය දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම :**

මෙම විධිවිධානයෙන් විශේෂයෙන් අපේක්ෂා කෙරුණේ යුරෝපීය, බර්ගර් සහ මුස්ලිම් ජනකොටස් වෙනුවෙන් මන්ත්‍රීවරුන් ස දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම ය. ව්‍යවස්ථාවේ 4(2) වන වගන්තියට අනුව අග්‍රාණ්ඩුකාරයා විසින් මෙම මන්ත්‍රීවරුන් පත් කළ යුතු වූයේ අගමැතිවරයාගේ උපදෙස්වලට අනුකූල ව ය. එබැවින් සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් පත් කළ මන්ත්‍රීවරුන්ගෙන් සැබෑ ලෙසින් ම ආරක්ෂා වූයේ නැත.

* **සෙනෙට් මණ්ඩලය :**

  සුළු ජන කොටස් සඳහා යම් ආකාරයක රැකවරණයක් සැලසීමේ විධි ක්‍රමයක් ලෙසින් දෙවෙනි මණ්ඩලයක් පිහිටුවීමට විධි විධාන ඇතුළත් කරන ලදි. සෙනෙට් මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් අඩක් අග්‍රාණ්ඩුකාරයාගේ අභිමතය පරිදි පත් කිරීමට විධිවිධාන සැලසීම මඟින් සුළු ජන කොටස්වල සාමාජිකයන්ට ඔවුන් නියෝජනය කරන සුළු ජන කොටස්වල අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කිරීමට ඉඩ සැලසීම අපේක්ෂාව විය. අගමැතිවරයා සුළු ජාතික සෙනෙට් සභිකයන් පත් කිරීමේ දී ඒ සම්බන්ධයෙන් සුළු ජන පදනම සැලකිල්ලට ගත්ත ද, ඒ සමඟ ම අගමැතිවරයා සහ ඔහුගේ දේශපාලන පක්ෂ කෙරෙහි ඇති දේශපාලන පදනම විශේෂයෙන් සැලකිල්ලට ගත් බව පැහැදිලි ව ම පෙනෙන්නට තිබිණි. මෙහි ප්‍රතිඵලය වූයේ අගමැතිවරයා විසින් පත් කරන ලද සුළු ජන කොටස්වල සෙනෙට් සභිකයන්, අගමැතිවරයා නියෝජනය කළ දේශපාලන පක්ෂවලට ළැදි පිරිසක් වීමය. මෙම තත්ත්වය නිසා ලංකාවේ සෙනෙට් මණ්ඩලය සුළුතර අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රමාණවත් යාන්ත්‍රණයක් ලෙසින් සැලකිය නොහැකි විය.

මේ හැර ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවීමෙන් රාජ්‍ය සේවය පිළිබඳ විශ්වාසයක් ඇති කිරීම ව්‍යවස්ථා සම්පාදකයන්ගේ අපේක්ෂාව විය. එමෙන් ම අධිකරණ සේවයේ ස්වාධීනත්වය සඳහා ඇති කළ විධිවිධාන ද සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහය විය.

## 8.5. රාජ්‍ය සේවය සහ අධිකරණය :

සෝල්බරි ව්‍යවස්ථාව මඟින් රාජ්‍ය සේවය පිළිබඳ වගකීම ඇමති මණ්ඩලය වෙත පවරන ලදි. එක් එක් ඇමතිවරයා යටතේ පැවති සියලු දෙපාර්තමේන්තුවල කටයුතු පිළිබඳ වගකීම අදාළ ඇමතිවරයාට මුළුමනින් ම භාර විය. දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධීකරණය කොට පරිපාලනය කිරීමේ දී ඇමතිවරයාට සහය වීමට ස්ථිර ලේකම්වරයෙක් අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් පත් කරන ලදි. ඔහු අදාළ ඇමතිවරයාගේ පාලනය යටතේ සිය කටයුතු මෙහෙයවිය. ඇමතිවරයා සහ අමාත්‍යංශ අතරත් ඇමතිවරයා හා දෙපාර්තමේන්තු අතරත් සම්බන්ධීකරණය ගොඩ නැගුණේ ස්ථිර ලේකම්වරයා මඟින් ය.

මෙම ව්‍යවස්ථාවේ විශේෂ ලක්ෂණයක් වූයේ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා නිශ්චිත විධි විධාන එමඟින් සකස් කර තිබීම යි.

රාජ්‍ය සේවකයන් පත් කිරීම, මාරු කිරීම, අස් කිරීම සහ විනය පාලනය කිරීම ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමට පවරන ලදී.

මෙලෙස රාජ්‍ය සේවා කොමිසම පත් කිරීමට හේතු දෙකකි.

I. දේශපාලන අත පෙවීම්වලින් රාජ්‍ය සේවය ආරක්ෂා ගැනීම.
II. රාජ්‍ය සේවය පිළිබඳ සුළුතර කණ්ඩායම් අතර විශ්වාසය ගොඩ නැඟීම.

වසර පහක කාලයකට අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් රාජ්‍ය සේවා කොමිසමට සාමාජිකයෝ තිදෙනෙක් පත් කරන ලදි. දේශපාලන අත පෙවීම්වලින් රාජ්‍ය සේවා කොමිසම ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථානුකූල විධිවිධාන කිහිපයක් විය. ඒවා නම්,

1. පාර්ලිමේන්තුවේ කිසි දු සාමාජිකයෙකු රාජ්‍ය සේවා කොමිසමට පත් නොකළ යුතු වීම.
2. කිසියම් සාමාජිකයකු පත් කරන අවස්ථාව වන විට ආණ්ඩුවේ සේවකයන් වශයෙන් කිසි දු ගෙවීමක් හා කිසි දු ධූරයක් දරන ලද්දේ නම් එය අවසන් කළ යුතු වීම.
3. සේවා කාලය අවසන් කිරීමෙන් පසු නැවත සේවයට පත් නොවීම.

4. සේවයෙන් ඉවත් කිරීම නියමිත හේතු දැක්වීමෙන් පසු අග්‍රාණ්ඩුකාරයා විසින් පමණක් කළ යුතු වීම.
5. කොමිසම තීරණයකට බලපෑම් කරන්නකු රුපියල් 1000 කට වැඩි නොවන දඩයකට හෝ වසරකට හෝ වැඩි නොවන සිර දඬුවමකට හෝ ඒ දඬුවම් දෙකට ම හෝ යටත් කළ හැකි වීම.

මෙසේ විධිවිධාන යෙදීමට පියවර ගත්ත ද කොමිසමේ ස්වාධීනත්වය මුළුමනින් ම ආරක්ෂා කිරීමට නොහැකි විය. ඇමතිවරුන්ගේ බලපෑම්වලට කොමිසම නතු වූ අවස්ථා තිබිණි. මේ නිසා කොමිසම නිරන්තරයෙන් විවේචනයට ලක් විය.

1972 සමූහාණ්ඩු පළමු ජනරජ ව්‍යවස්ථාව මඟින් ස්වාධීන රාජ්‍ය සේවා සංකල්පය අහෝසි කොට රාජ්‍ය සේවය ඉතා පැහැදිලි ලෙස අමාත්‍ය මණ්ඩලයේ පාලනය යටතට පත් කරන ලදි. ඒ අනුව,

- රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ විනය පාලනය අමාත්‍ය මණ්ඩලයට භාර විය.

- අගමැතිවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ඉහළ රාජ්‍ය නිලධාරීන් හැර සෙසු රාජ්‍ය නිලධාරීන් පත් කිරීමේ වගකීම මුළුමනින් ම අමාත්‍ය මණ්ඩලය සතු විය. මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයෙන් අදහස් විමසිය යුතු විය. (මෙහි දී රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය සහ රාජ්‍ය සේවා විනය මණ්ඩලයේ කාර්යයන් සහ අමාත්‍ය මණ්ඩලයේ රාජ්‍ය සේවය සමබන්ධ ඇති බලය පිළිබඳ විස්තරාත්මක ව ගුරුවරයා සාකච්ඡා කළ යුතු ය)

- සෝල්බරි ව්‍යවස්ථාව යටතේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ සෙසු විනිශ්චයකාරවරුන්, අපරාධ විනිශ්චය කොමසාරිස්වරුන් පත් කරන ලද්දේ අගමැතිවරයාගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසිනි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවකුට වයස අවුරුදු 62 වන තෙක් සේවය කළ හැකි ය. වසරකින් සේවය දීර්ඝ කිරීමේ බලය අගමැතිවරයාට තිබිණි. ඉවත් කිරීම සෙනෙට් මණ්ඩලය සහ නියෝජිත සෙනෙට් මණ්ඩලය ඉල්ලීමක් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් ඉවත් කළහොත් මිස විනිශ්චයකරුවන් ඉවත් කළ නොහැකි ය. ඔවුන්ගේ ධුර කාලය සහ ස්වාධීනත්වය සහතික කරන ලදි.

- සෙසු විනිසුරුවන් පත් කරන ලද්දේ අධිකරණ සේවා කොමිසම විසිනි. (අධිකරණ සේවා කොමිසම පිළිබඳ ගුරුවරයා සාකච්ඡා කළ යුතු ය)

- සියලු විනිශ්චයකාරුවන්ගේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතිත්වය යුක්තිය පසිඳලීම පිළිබඳ මහජන විශ්වාසය ඇති කිරීමට විධි විධාන යොදන ලදි.

1972 ව්‍යවස්ථාවට අනුව අධිකරණයට වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදි.

- රාජාධිකරණයට අභියාචනා කිරීමට පැවති අයිතිය අහෝසි කොට 1971 පිහිටුවන ලද අභියාචනාධිකරණයට ලබා දීම.

- ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවන්ගේ ධුර කාලය අඛණ්ඩ භාවය ආරක්ෂා කිරීම.

- උසාවි ක්‍රමයේ වෙනසක් ඇති කිරීමට ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරන පනතකින් සිදු කළ හැකි බව ව්‍යවස්ථාවේ 121 වන වගන්තියේ සඳහන් කරන ලදි. (1973 අංක 44 දරන යුක්තිය පසිඳලීම)

- එතෙක් පැවති උසාවි අහෝසි කොට පහත සඳහන් උසාවි ඇති කරන ලදි.
  1. අභියාචනාධිකරණය
  2. ශ්‍රේෂ්ඨාධිකරණය
  3. මහාධිකරණය
  4. දිසා අධිකරණය
  5. මහේස්ත්‍රාත් අධිකරණය

- 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතින් ශ්‍රී ලංකාවේ කලාප 16 කට බෙදා එක් එක් කලාපය තුළ මහාධිකරණයක් බැගින් පිහිටුවන ලදි.

- ඒ එක් එක් කලාපය දිසාවලට බෙදා දිසා අධිකරණය බැගින් පිහිටුවන ලදි.

- එක් එක් කලාපය කොට්ඨාසවලට බෙදා එක් එක් කොට්ඨාසයෙහි මහේස්ත්‍රාත් අධිකරණය බැගින් පිහිටුවන ලදි.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන්ගේ විශ්‍රාම යා යුතු වයස 63 ලෙස නිශ්චය කිරීම.

- අධිකරණ සේවා උපදේශක මණ්ඩලය සහ අධිකරණ සේවා විනය මණ්ඩලය පිහිටුවන ලදි.

(මේ මණ්ඩල දෙක පිළිබඳ ව ගුරුවරුන් විසින් විස්තරාත්මක ව සාකච්ඡා කළ යුතු ය)

## 8.6. මූලික අයිතිවාසිකම් :

මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා මානව හිමිකම් නීති සංග්‍රහයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයන්හි ලක්ෂණයක් වන බැවින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ඉතිහාසයේ ප්‍රථම වරට මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්තිය ලෝකයේ සෙසු රටවල මූලික අයිතිවාසිකම් වගන්ති අනුගමනය කරමින් පිහිටුවා තිබේ.

- සර්ව සාධාරණීයත්වය.
- අත්තනෝමතික ලෙස ජීවිත අහිමි කිරීමෙන් නිදහස් වීම.
- නිදහස සහ පෞද්ගලික සුරක්ෂිත භාවය.
- සිතීමේ නිදහස.
- හෘදය සාක්ෂ්‍යයේ නිදහස සහ ආගමික නිදහස.
- ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ සහ වැඩිදියුණු කිරීමේ නිදහස.
- භාෂණයේ සහ අදහස් පළ කිරීමේ නිදහස.

යනාදි අයිතිවාසිකම් ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබිණි. 1972 අයිතිවාසිකම් පිළිගැනීමක් ලබා දුන්න ද එම අයිතිවාසිකම් පරිච්ඡේදයේ දුර්වලතා කිහිපයක් පැවතිණි.

1. මෙම ව්‍යවස්ථාවෙන් සඳහන් අයිතිවාසිකම් අවසර දිය හැකි සීමාවන්ට යටත් කර තිබීම.
2. ව්‍යවස්ථාවෙන් අයිතිවාසිකම්වලට නිල පිළිගැනීම ලබා දුන්න ද අයිතිවාසිකම් උල්ලංඝනය වූ විටක ඒ සම්බන්ධයෙන් නෛතික පිළිසරණ පැතීමේ ක්‍රමයක් නොතිබීම.
3. ව්‍යවස්ථාවේ දක්වා තිබූ බොහෝ අයිතිවාසිකම් මෙරට පුරවැසියන්ට පමණක් සීමා කර තිබීම.
4. ව්‍යවස්ථාවේ පිළිගන්නා ලද අයිතිවාසිකම් ක්ෂේත්‍රය පටු එකක් විය.

5. මෙහි සඳහන් වන අයිතිවාසිකම් පැරණි ස්වාභාවික අයිතිවාසිකම් සම්ප්‍රදායයේ එන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්වලට සීමා විය.

## යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් :-

1. පිටු පෙරළනයක් සැකසීම/පවර් පොයින්ට් (ඉදිරිපත් කිරීමක්)

1947 - 1972 ව්‍යවස්ථා යටතේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය සහ ප්‍රවණතා යන තේමාව පහත සඳහන් කරුණු ඇසුරින් ගොඩ නගන්න.

- ආණ්ඩුක්‍රමයේ නව/ ව්‍යවස්ථාවේ සංයුතිය.
- විධායකයේ ස්වභාවය හා බලතල.
- සුළු ජන අයිතිවාසිකම්.
- අධිකරණය හා රාජ්‍ය සේවය.
- මූලික අයිතිවාසිකම්.

නියමිත දිනයේ දී ඉදිරිපත් කිරීම සිදු කරන්න.

## ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි


01. Coomaraswamy, Radhika, (1984), *Sri Lanka: The Crisis of the Anglo- American Constitutional Traditions in a Developing Society*, New Delhi: Vikas Publishing House Ltd.

02. Cooray, L.J.M, (1984), *Constitutional Government in Sri Lanka*, Colombo: Lake House Investments Ltd.

03. Goonesekere R.K.W, (1998 ), 'Change in Constitutional Government', in A.D.V de S Indraratna (ed.) *Fifty Years of Sri Lanka's Independence : A Socio Economic Review,* Colombo: Sri Lanka Institute of Social and Economic Studies.

04. Jennings, Ivor, (1948), *Comments on the Constitution*, London: The Associated Newspapers of Ceylon Limited.

05. Wilson, A.Jayaratnam, (1979), *Politics in Sri Lanka,* 1947-1979, London: The Macmillan Press Ltd.

06. Wilson, A.J, (1958), ' Minority Safeguards in the Ceylon Constitution' *In Ceylon Journal of Historical and Social Studies*

07. විල්සන් ඒ. ජේ. (1968) ***ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ නිබන්ධන***, කොළඹ ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම

08. විතානවසම්, අතුළ, (2007), ***ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය***, මහරගම තරංජී ප්‍රින්ට්ස්